මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission

# 2024

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# ANNUAL PERFORMANCE REPORT

# සිංහල

## පටුන


**01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය** ..................... 1

1.1. මැතිවරණ දෙපාර්තමේන්තුව ..................... 1

1.2. මැතිවරණ කොමිෂන් සභාව ..................... 1

1.3. මැතිවරණ කොමිෂන් සභාවේ දැක්ම හා මෙහෙවර ..................... 2

1.4. මැතිවරණ කොමිෂන් සභාවේ පරමාර්ථ, බලතල, කාර්යය හා කර්තව්‍යය ..................... 2

1.5. සංවිධාන සටහන හා කාර්යාල පිරිසැකැස්ම ..................... 4

**02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම** ..................... 5

2.1. මැතිවරණ කොමිෂන් සභාවේ රැස්වීම් ..................... 5

2.1.1. කොමිෂන් සභාව සමග පැවති විශේෂ සාකච්ඡා ..................... 5

2.2. ඡන්දහිමියන් ලියාපදිංචිය ..................... 5

2.2.1. ඡන්දහිමියකු ලෙස ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය කරනු ලබන මූලික සුදුසුකම් ..................... 6

2.2.2. ඡන්දහිමියකු ලෙස ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා නුසුදුසුකම් ..................... 6

2.2.3. 2021 අංක 22 දරණ ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත...... 6

2.2.3.1. 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතට (ප්‍රධාන ප්‍රඥප්තිය) සිදු කළ මූලික සංශෝධන සහ ඊට අදාල සුවිශේෂී කරුණු ..................... 7

2.2.3.2. පරිපූරක ඡන්දහිමි නාමලේඛන සම්බන්ධයෙන් ..................... 7

2.2.3.3. ඡන්දහිමියන් ලියාපදිංචියට අදාළව කටයුතු කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට ඇති නෛතික ප්‍රතිපාදන ..................... 8

2.3. ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2024 ..................... 8

2.3.1. 2024 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය අනුව ප්‍රධාන නාමලේඛනය සැකසීම ..................... 8

2.3.2. 'අ' 'ආ' ලැයිස්තු ප්‍රදර්ශනය : හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම .......... 9

2.3.3. වලංගු නාමලේඛනය (හෝ කොටසක්) සහ "අ" ලැයිස්තු හා "ආ" ලැයිස්තු ප්‍රදර්ශන ස්ථාන ..................... 9

2.3.4. හිමිකම් සහ විරෝධතා පරීක්ෂණ පැවැත්වීම හා ප්‍රමාද ඉල්ලීම් පිළිබඳව ක්‍රියා කිරීම ..................... 10

2.3.5.2024 ඡන්දහිමි නාමලේඛනයට අදාල සංඛ්‍යා සටහන් ..................... 11

2.3.6. තුලනාත්මක සංඛ්‍යා සටහන් ..................... 12

2.3.7. 2023(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සකස් කිරීම ..................... 12

2.3.8. 2024 පරිපූරක ඡන්දහිමි නාමලේඛන සකස් කිරීම. ..................... 13

2.3.9. 2024 (1) වන පරිපූරක නාමලේඛනය ..................... 13

2.3.10. 2024 (2) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය ..................... 14

2.3.11. 2024 (3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය ..................... 14

2.3.12. 2025 (1), 2025 (2) සහ 2025 (3) පරිපූරක ඡන්දහිමි නාමලේඛන සකස් කිරීම ..................... 14

2.3.13. පරිපූරක නාමලේඛනවලට අදාල සටහන් ..................... 14

2.4. ඡන්දහිමි නාමලේඛන ක්‍රියාවලිය සඳහා තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම ...... 15

2.4.1. ප්‍රතිශෝධනය පිළිබඳව කෙටි පණිවිඩ (SMS) මඟින් ජනතාව දැනුම්වත් කිරීම ..................... 15

2.5. 2025 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය ..................... 17

2.6. පාර්ලිමේන්තු මන්ත්‍රීධුර පුරප්පාඩු පිරවීම ………………………………… 17
2.7. ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ ඡන්ද විමසීම - 2024.09.21 ……. 18
2.7.1. නිවේදිත ඡන්ද කාර්යාල පිහිටුවීම ………………………………… 21
2.7.2. 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත ……… 22
2.7.3. නොමිලයේ ප්‍රවාහන පහසුකම් සැලසීම ………………………………… 23
2.7.4. ඡන්ද විමසීම නිරීක්ෂණය කිරීම ………………………………………… 23
2.7.5. ජනාධිපතිවරණයට අදාල සටහන් ………………………………… 25
2.7.6. ජනාධිපතිවරණයට අදාළ මැතිවරණ නිරීක්ෂණ කටයුතු ……………… 25
2.8. පාර්ලිමේන්තු මැතිවරණය 2024.11.14 ……………………………………… 27
2.8.1 තැපැල් ඡන්ද කටයුතු ……………………………………………… 29
2.8.2. මැතිවරණ නිරීක්‍ෂණ කටයුතු ……………………………………… 30
2.8.2.1. දේශීය නිරීක්‍ෂණ කණ්ඩායම් ………………………………… 30
2.8.2.2. විදේශීය නිරීක්‍ෂණ කණ්ඩායම් ………………………………… 30
2.8.3. නිවේදිත ඡන්ද කාර්යාල පිහිටුවීම ………………………………… 31
2.8.4. 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත ……… 31
2.8.5. ආරක්ෂක කටයුතු ……………………………………………………… 32
2.8.6. පාර්ලිමේන්තු මැතිවරණයට අදාල සංඛ්‍යා සටහන් ……………… 33
2.8.7 පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ විදේශීය නිරීක්ෂණ කටයුතු ……… 33
2.9. පළාත් සභා ඡන්ද විමසීම ……………………………………………… 35
2.10. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම ……………………………………… 35
2.10.1. ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීමේ කටයුතු ……………… 37
2.10.2. පළාත් පාලන ආයතනවල සභිකධුර පුරප්පාඩු පිරවීම ……………… 38
2.11. විශේෂ ව්‍යාපෘති ………………………………………………………….. 38
2.11.1. වතු අංශයේ සහ ආන්තික ජන කොටස් සඳහා විශේෂිත පුහුණු වැඩසටහන් පැවැත්වීම ………………………………………………………….. 38
2.11.2. ශිෂ්‍ය පාර්ලිමේන්තු සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ……… 39
2.11.3. සංක්‍රාන්ති ලිංගික කණ්ඩායම් සමග පවත්වන ලද සාකච්ඡා ……… 40
2.11.4. ප්‍රජාව තුළ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීම සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම ………………………………………………………… 40
2.11.5. පුහුණුකරුවන් පුහුණු කිරීමට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම …….. 40
2.11.6 දේශපාලනික වශයෙන් කාන්තාවන් සවිබල ගැන්වීම ……………… 41
2.11.7. ආබාධ සහිත තැනැත්තන්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීම ……… 41
2.12 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ……………………………………………… 43
2.13. උපායමාර්ගික සැලැස්ම ……………………………………………… 43
2.14. මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතට අදාළ දැනුම්වත් කිරීම් ……… 43
2.15. මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු ……………………………………………… 44
2.16. ලේඛනාගාරය ……………………………………………………………… 45
2.17. දැනුම් කළමනාකරණ ඒකකය හා කෞතුගාරය ……………………………… 45
2.18. 2024 වසර තුළ එළි දක්වන ලද ප්‍රකාශන ………………………………… 45
2.19. නීති කටයුතු ……………………………………………………………. 46
2.19.1. ශ්‍රේෂ්ඨාධිකරණය ………………………………………………….. 46
2.19.2. අභියාචනාධිකරණය ………………………………………………… 47
2.19.3. මහාධිකරණය ………………………………………………………… 47

2.19.4. දිසා අධිකරණය ………………………………………………… 47
2.19.5. මහේස්ත්‍රාත් අධිකරණය ………..…………………………………… 47
2.19.6. නීතිපති උපදෙස් විමසීම් …………………………………………… 47
2.19.7. මානව හිමිකම් කොමිෂන් සභාවට අදාළ පැමිණිලි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අදාළ විමර්ශන ……………..... 47
2.19.8. ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළ නෛතික කටයුතු සහ බී.සී පත්‍රිකා අපහරණය ………………………………………………… 48
2.20. මැතිවරණ නීති සංශෝධන ………………………………………………… 48
2.21. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ කටයුතු ........................................................................................ 49
2.22. මැතිවරණ කාර්යය සඳහා දේශපාලන පක්ෂ පිළිගැනීම ................................. 49
2.23. මැතිවරණ ආරවුල් නිරාකරණය ........................................................ 50
2.23.1. විවිධ පාර්ශ්වයන් සමඟ පවත්වන ලද සාකච්ඡා .................................. 50
2.23.2. 2024 වර්ෂයේ දී ප්‍රකාශයට පත්කරන ලද ගැසට් නිවේදන ........... 51
2.23.2.1. 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා ........... 51
2.23.2.2. 104 ආ.(5)(අ) අනුව්‍යවස්ථාව යටතේ වන මාධ්‍ය උපමාන ගැසට් නිවේදන ................................................................... 51
2.23.2.3. 2024 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමට අදාළව .......................................................................... 52
2.23.2.4. 2024 පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව ...................... 52
2.23.3. 2024 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම සහ 2024 පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ කාර්යයන් සිදු කිරීම ........... 52
2.24. වාහන පාලනය ........................................................................ 53
2.24.1. මැතිවරණ කාල සීමාව තුළ පරිපාලන කටයුතු .................................. 54
2.24.1.1. ජනාධිපතිවරණය-2024.09.21 ............................................. 54
2.24.1.2. පාර්ලිමේන්තු මැතිවරණය - 2024.11.14 ...................... 54
2.24.2. මැතිවරණ කොමිෂන් සභාවේ වාහන පිළිබඳ තොරතුරු ....................... 55
2.25. ඉදිකිරීම් හා වත්කම් ........................................................................... 55
2.25.1. ඉදිකිරීම් හා අළුත්වැඩියා ......................................................... 55
2.26. ද්‍රව්‍ය මිළදී ගැනීම, යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම /අලුත්වැඩියා කිරීම / නඩත්තු කිරීම 55
2.26.1. ඡන්ද දායකයින් ලියාපදිංචි කිරීම .............................................. 55
2.26.2. ඡන්දහිමි නාමලේඛන මුද්‍රණය ....................................................... 56
2.26.3. යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම / අලුත්වැඩියා කිරීම / නඩත්තු කිරීම ....... 56
2.26.4. කාර්යාල භාණ්ඩ මිලදී ගැනීම ......................................................... 56
2.26.5. පොදු .................................................................................. 56
2.27. තොරතුරු තාක්ෂණික කටයුතුවල ප්‍රගතිය .............................................. 57
2.27.1. තොරතුරු තාක්ෂණ අවශ්‍යතා අධ්‍යයනය, මෘදුකාංග නිර්මාණය, සංවර්ධනය හා නඩත්තු කිරීම ....................................................................... 57
2.27.2. මැතිවරණ ක්‍රියාවලියට අදාළ පාර්ශවකරුවන්හට ඊ සේවා සැපයීම ........ 59
2.27.3. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම .............................................. 61
2.28. මූල්‍ය හා විගණන තොරතුරු ........................................................ 62
2.29. අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු ........................................................ 63
2.30. ඉදිරි ඉලක්ක ........................................................................ 64

**03. පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය** .............................................. 65
3.1. මූල්‍ය කාර්යසාධනය ...................................................................................... 65
3.2. මූල්‍ය ප්‍රකාශ සටහන් ..................................................................................... 69
3.2.1. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය .............................................. 69
3.2.2. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය ............ 69
3.2.3. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන ........................................................ 70
3.2.4.මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ....................... 70
3.2.5. විගණකාධිපතිවරයාගේ වාර්තාව ........................................................... 71

**04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක** .................................................................... 78

**05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය** ......... 79
5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න .................................. 80

**06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ** .......................................................... 81
6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය .......................................................... 81
6.2. මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ මාණ්ඩලික නිලධාරීන්ගේ ආයතන කටයුතු .................................................................................................... 81
6.2.1. නව පත් කිරීම් ................................................................................... 82
6.2.2. නිදහස් කිරීම් ..................................................................................... 84
6.2.3. වැඩ බැලීම හා රාජකාරි ආවරණය කිරීම සඳහා කරන ලද පත් කිරීම් ............ 84
6.2.4. මියගිය නිලධාරීන් ............................................................................ 87
6.3. පාලන අංශයේ කටයුතු ........................................................................... 87
6.3.1. කාර්ය මණ්ඩල කටයුතු ................................................................... 88
6.3.1.1. කළමනාකරණ සේවා නිලධාරි සේවය .................................. 88
6.3.1.2. සංවර්ධන නිලධාරි සේවය .......................................................... 88
6.3.1.3. තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සේවය ................................ 88
6.3.1.4. කාර්යාල සේවක සේවය .......................................................... 88
6.3.1.5. කාර්මික නිලධාරි (සිවිල්) තනතුරට බඳවා ගැනිම ....................... 89
6.3.1.6. රාජ්‍ය සේවයෙන් ඉල්ලා අස්වීම ............................................... 89
6.3.1.7.සේවය අවසන් කිරීම ................................................................... 89
6.3.1.8. සේවයෙන් පහ කිරීම .................................................................. 89
6.3.1.9. මියයාම් ............................................................................... 89
6.3.1.10. විශ්‍රාම ගැන්වීම් ........................................................................ 89
6.3.1.11. තනතුරෙන් මුදා හැරීම .......................................................... 90
6.3.1.12. නව පත්වීම් ............................................................................... 90
6.3.1.13. දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු අනුමත කිරීම ....................... 90
6.3.1.14. නිවාඩු කළමනාකරණ පද්ධතිය පවත්වා ගෙන යාම ...................... 90
6.3.1.15. වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම ............................................. 91
6.3.1.16. වැන්දඹු, අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචිය ....................... 91

6.4. පවිත්‍රතා කටයුතු ........................................................................................ 92
6.5. ආරක්ෂක කටයුතු ........................................................................................ 92
6.6. විදේශ පුහුණු සහ ශිෂ්‍යත්ව ........................................................................... 92
6.7 විදේශ සම්මන්ත්‍රණ හා නිල චාරිකා ............................................................... 93
6.8 දේශීය පුහුණු ............................................................................................. 93
6.8.1. මැතිවරණ ක්‍රමවේද සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය (IFES) මඟින් පවත්වන ලද පුහුණු ........................................................................................ 94

**07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව** ..................................................................... 95

**08 පරිච්ඡේදය - සමාප්තිය** ........................................................................................ 101

## සටහන්


සටහන 01 - සංවිධාන සටහන ........................................................................ 105

සටහන 02 - මැතිවරණ කොට්ඨාසවලට අදාළව ඉවත් වන නම් ('අ'නම්) සහ ඇතුළත් වන නම් ('ආ' නම්) සංඛ්‍යාව ........................................................................ 106

සටහන 03 - 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වගන්තිය යටතේ හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම .................................... 107

සටහන 04 - එක් එක් මැතිවරණ කොට්ඨාසයේ බහු ලියාපදිංචි බව අනාවරණය වූ බැවින් ලියාපදිංචි නොකල නම් සංඛ්‍යාව ........................................................................ 108

සටහන 05 - 2024 ජූලි මස 01 වන දින සහතික කරන ලද 2024 වර්ෂයේ ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනට අනුව ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව ............................ 109

සටහන 06 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) අනු ව්‍යවස්ථාව අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි තෝරාපත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීන් සංඛ්‍යාව වාර්ෂිකව ගණනය කිරීම - 2024 ප්‍රධාන නාමලේඛනය .................................... 110

සටහන 07 - 2024 වර්ෂයේ ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනය සහ 2024(1) පරිපූරක නාමලේඛනය සහතික කර ඇති සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරීන්ගේ විස්තර ........................................................................ 111

සටහන 08 - ජාතික හැඳුනුම්පත් විස්තර ඉදිරිපත් කළ පුද්ගලයින් සංඛ්‍යාව .................... 112

සටහන 09 - ඡන්ද ප්‍රදේශ අනුව ප්‍රධාන නාමලේඛනයෙහි ලියාපදිංචි වී ඇති ඡන්දහිමියන් සංඛ්‍යාව පිළිබඳව තුලනාත්මක සටහන 2014 - 2024 ........................ 113

සටහන 10 - 2014 – 2024 දක්වා වර්ෂවල ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනවලදී ජාතික හැඳුනුම්පත් විස්තර ඉදිරිපත් කළ පුද්ගලයන් සංඛ්‍යාවේ ප්‍රතිශතය පිළිබඳ සංසන්දනාත්මක ප්‍රකාශය ........................................................... 120

සටහන 11 - 2001 – 2024 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනවලදී පෙර වර්ෂයට සාපේක්ෂව ඡන්දහිමියන්ගේ වැඩිවීම හා වැඩිවීමේ ප්‍රතිශතය ........................................ 121

සටහන 12 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) අනු ව්‍යවස්ථාව යටතේ එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරා පත්කර ගත යුතු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව පිළිබඳ තුලනාත්මක සටහන 2014 – 2024 ........................ 122

සටහන 13 - 2001 සිට 2024 දක්වා වලංගු ඡන්දහිමි නාමලේඛනවල ඡන්ද සංඛ්‍යාවේ වෙනස්වීම හා ඊට අදාල විස්තර................................................................ 123

සටහන 14 - මැතිවරණ කොට්ඨාස අනුව ලියාපදිංචි වී ඇති ඡන්දහිමියන් සංඛ්‍යාව පිළිබඳ තුලනාත්මක සටහන. 2023 – 2024 ....................................................... 124

සටහන 15 - 2024 පෙබරවාරි මස 01 දින සහතික කරන ලද 2023(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය අනුව ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව ................................ 125

සටහන 16 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) ව්‍යවස්ථාව අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීන් සංඛ්‍යාව (2024.02.01 දින 2023(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සහතික කළ පසු) 126

සටහන 17 - 2024 ජූලි මස 08 වන දින සහතික කරන ලද 2024(1) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය අනුව ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව ........................ 127

සටහන 18 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) ව්‍යවස්ථාව අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීන් සංඛ්‍යාව (2024.07.08 දින 2024(1) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සහතික කළ පසු) 128

සටහන 19 - 2024 ඔක්තෝබර් මස 01 වන දින සහතික කරන ලද 2024(2) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය අනුව ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව ............ 129

සටහන 20 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) ව්‍යවස්ථාව අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීන් සංඛ්‍යාව (2024.10.01 දින 2024(2) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සහතික කළ පසු) 130

සටහන 21 - ඡන්ද හිමියන් සංඛ්‍යාව අනුව ඡන්ද මධ්‍යස්ථාන වර්ගීකරණය පිළිබඳ තොරතුරු 131

සටහන 22 - තැපැල් ඡන්ද අයදුම්පත් ලැබීම පිළිබඳ විස්තර (ජනාධිපතිවරණය) ............ 132

සටහන 23 - දේශීය සිවිල් සංවිධාන නියෝජිතයන් වෙත නිරීක්ෂණ කටයුතු සඳහා අවසර ලබාදීම ........................................................................ 133

සටහන 24 - එක් එක් දිස්ත්‍රික්කයට අදාල ඡන්ද හිමියන් සංඛ්‍යාව, ගෘහයන් සංඛ්‍යාව, ඡන්ද කොට්ඨාස හා ඡන්ද මධ්‍යස්ථාන හා ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන විස්තර ...................................................................... 134

සටහන 25 - නාමයෝජනා ලැබීම පිලිබඳ අවසන් වාර්තාව (පාර්ලිමේන්තු මැතිවරණය) 135

සටහන 26 - තැපැල් ඡන්ද අයදුම්පත් වාර්තාව (පාර්ලිමේන්තු මැතිවරණය) ................... 136

සටහන 27 - දේශීය සිවිල් සංවිධානය නියෝජිතයන් වෙත නිරීක්ෂණ කටයුතු සඳහා අවසර ලබාදීම (පාර්ලිමේන්තු මැතිවරණය) ................................... 137

සටහන 28 - මැතිවරණ පැමිණිලි වර්ගීකරණය ........................................................... 138

සටහන 29 - ඡන්දහිමියන් සංඛ්‍යාව අනුව ඡන්ද මධ්‍යස්ථාන හා ඡන්ද ගණන් කිරීමේ ශාලා පිළිබඳ තොරතුරු ..................................................................... 140

සටහන 30 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 අ (ජාතික ලැයිස්තු) යටතේ පත් කළ මන්ත්‍රීවරුන් හා ඊට අදාළ විස්තර ..................................................................... 141

සටහන 31 - නිකුත් කරන ලද මාධ්‍ය නිවේදන ........................................................... 142

සටහන 32- 2024 වර්ෂයේ සේවයෙන් විශ්‍රාම ගන්වන ලද නිලධරයන්.......................... 151

## ඇමුණුම්

ඇමුණුම 01 - ඡන්දහිමියන් ගණන් ගන්නා ක්‍රමවේදය පිළිබඳව වූ 2024.01.01 දිනැති ගැසට් නිවේදන අංක 2365/05 .......................................................... 155

ඇමුණුම 02 - ඡන්දහිමි නාමලේඛනය සහතික කිරීම දක්වා වූ ඉදිරි ක්‍රියාකාරකම් සිදුකල යුතු දින වකවානු පිළිබඳ සැලැස්ම ............................................... 158

ඇමුණුම 03 - 2024 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයට අලුතින් නම් ඇතුළත් කිරීම සඳහා සුදුසුකම් ලබන තැනැත්තන්ගේ නම් සඳහන් වන 'ආ' ලැයිස්තු ප්‍රදර්ශනය කිරීම පිළිබඳව වූ 2024.04.09 දිනැති ගැසට් නිවේදන අංක 2379/16 .......... 159

ඇමුණුම 04 - ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා නාමයෝජනා කැඳවීම පිළිබඳව වූ 2024.07.26 දිනැති ගැසට් නිවේදන අංක 2394/51 ............ 162

ඇමුණුම 05 - ජනාධිපතිවරණය සඳහා ඇප මුදල් තැන්පත් කළ තැනැත්තන්ගේ නම් සඳහන් වන 2024.08.14 දිනැති මාධ්‍ය නිවේදන අංක PRE/2024/32 ....... 163

ඇමුණුම 06 - ජනාධිපතිවරණය සඳහා නාමයෝජනා භාරදෙනු ලැබූ අපේක්ෂකයින්ගේ නාමාවලිය හා ඔවුන් නාමයෝජනා කළ තැනැත්තන්ගේ නම් සඳහන් වන 2024.08.15 දිනැති ගැසට් නිවේදන අංක 2397/51 ........................ 165

ඇමුණුම 07 - ජනාධිපතිවරණයේ අපේක්ෂකයන්ට පිහිටුවිය හැකි කාර්යාල වර්ග හා ඒවාට අදාළ කොන්දේසි ...................................................................... 171

ඇමුණුම 08 – ජනාධිපතිවරණයේ ප්‍රථම වටයේ ඡන්ද ගණන් කිරීමෙන් පසු එක් එක් අපේක්ෂකයා ලබාගත් ඡන්ද සංඛ්‍යාව ............................................... 176

ඇමුණුම 09 - ජනාධිපතිවරණයේ අවසාන ප්‍රතිඵලය ............................................... 178

ඇමුණුම 10 - ජනාධිපතිවරණයට අදාළ වියදම් වාර්තා භාරදී ඇති හා භාරදී නොමැති අපේක්ෂකයන් හා නාමයෝජනා කළ තැනැත්තන් පිළිබඳව වූ 2024.10.14 දිනැති මාධ්‍ය නිවේදන අංක PRE/2024/108 ................................... 179

ඇමුණුම 11 - පාර්ලිමේන්තුව විසුරුවා හැරීම පිළිබඳව වූ 2024.09.24 දිනැති ගැසට් නිවේදන අංක 2403/13 ...................................................................... 181

ඇමුණුම 12 - එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) ව්‍යවස්ථාව යටතේ තෝරාපත් කරගත යුතු මන්ත්‍රීවරු සංඛ්‍යාව, නාමයෝජනා කළ යුතු අපේක්ෂක සංඛ්‍යාව හා ස්වාධීන කණ්ඩායම් විසින් තැන්පත් කළ යුතු ඇප මුදල් පිළිබඳව වූ 2024.09.25 දිනැති ගැසට් නිවේදන අංක 2403/22 ..... 183

ඇමුණුම 13 - පාර්ලිමේන්තු මැතිවරණයේ අපේක්ෂකයන්ට පිහිටුවිය හැකි කාර්යාල වර්ග හා ඒවාට අදාළ කොන්දේසි ......................................................... 185

ඇමුණුම 14 - එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් එක් ඡන්ද දායකයෙකු වෙනුවෙන් වියදම් කළ හැකි උපරිම මුදල පිළිබඳව වූ 2024.10.17 දිනැති මාධ්‍ය නිවේදන අංක PE/2024/27 ............................................................ 190

ඇමුණුම 15 - පිළිගත් දේශපාලන පක්ෂ මුළු දිවයිනෙහිම හා ස්වාධීන කණ්ඩායම් මැතිවරණ කොට්ඨාසයේ ලබාගත් ඡන්ද සංඛ්‍යාව ................................................ 191

ඇමුණුම 16 - පාර්ලිමේන්තුව නියෝජනය කරන පිළිගත් දේශපාලන පක්ෂ හා කණ්ඩායම් මැතිවරණ කොට්ඨාස මට්ටමෙන් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 අ (ජාතික ලැයිස්තු) යටතේ ලබාගත් මන්ත්‍රී ධූර සංඛ්‍යාව ........................ 202

ඇමුණුම 17 - මැතිවරණ කොට්ඨාස මට්ටමෙන් පත් කළ මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛන ඇතුළත් 2024.11.15 දිනැති ගැසට් නිවේදන අංක 2410/07 .................... 203

## 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1. මැතිවරණ දෙපාර්තමේන්තුව

දිවයිනේ පාලන කටයුතුවල දී ස්වදේශික ජනතාවට සහභාගිවීමේ වැඩි අවස්ථා සැලසිය යුතු යැයි 20 වන සියවසේ මුල් භාගයේ පැන නැගුණු ප්‍රබල උද්ඝෝෂණවලට ප්‍රතිචාරයක් වශයෙන් බ්‍රිතාන්‍ය කිරීටය විසින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා 1944 වසරේ දී සෝල්බරි කොමිසම පත් කරන ලදී. සෝල්බරි කොමිසම විසින් ඡන්දදායකයන් ලියාපදිංචි කිරීමත්, පාර්ලිමේන්තු ඡන්ද විමසීම පැවැත්වීමත් සඳහා වූ නීති සම්පාදනය කරන ලද අතර 1946 සැප්තැම්බර් 26 දින පාර්ලිමේන්තු ඡන්ද විමසීම් රාජ ආඥාව පනවන ලදී. පළාත් පාලන ආයතනවල ඡන්ද විමසීම පැවැත්වීම සඳහා 1946 දී පළාත් පාලන ආඥා පනත සම්මත කරන ලදී. 1946 සිට 1955 දක්වා වූ කාල වකවානුවේ දී ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමත් පාර්ලිමේන්තු ඡන්ද විමසීම් පැවැත්වීමත් සඳහා එක් කොමසාරිස්වරයෙකු යටතේ පාර්ලිමේන්තු මැතිවරණ දෙපාර්තමේන්තුවත් පළාත් පාලන ආයතනවල ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා තවත් කොමසාරිස්වරයෙකු යටතේ පළාත් පාලන මැතිවරණ දෙපාර්තමේන්තුවත් ක්‍රියාත්මක විය. එලෙස වෙන් වෙන්ව පැවති පාර්ලිමේන්තු මැතිවරණ දෙපාර්තමේන්තුව හා පළාත් පාලන මැතිවරණ දෙපාර්තමේන්තුව ඒකාබද්ධ කොට 1955 ඔක්තෝබර් 1 වැනි දින මැතිවරණ දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. එසේ ස්ථාපිත කරන ලද මැතිවරණ දෙපාර්තමේන්තුව වසර 60කට අධික කාලයක් සිය කාර්ය හා කර්තව්‍ය ඉටු කරන ලදී.

### 1.2. මැතිවරණ කොමිෂන් සභාව

2001 ඔක්තෝබර් 03 වැනිදා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 17 වැනි සංශෝධනය ගෙන එන ලද අතර එම සංශෝධනය අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් මැතිවරණ කොමිෂන් සභාව පත්කළ යුතු විය. එසේ වුව ද පත්කිරීම් පිළිබඳව ඇති වූ ගැටලු නිසා අපේක්ෂිත පරිදි මැතිවරණ කොමිෂන් සභාව පත් නොවීය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එන ලද 17 වැනි සංශෝධනය අනුව මැතිවරණ කොමිෂන් සභාවක් පත් කරන තුරු මැතිවරණ කොමසාරිස්වරයාට මැතිවරණ කොමිෂන් සභාවේ රාජකාරි හා වගකීම්ද ඉටුකිරීමට සිදුවිය. 2010.09.09 දින සම්මත කරන ලද 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් මැතිවරණ කොමිෂන් සභාවේ සංයුතිය සාමාජිකයන් පස් දෙනෙකු දක්වා වැඩි කරන ලදී. එසේ වුවද එවර ද මැතිවරණ කොමිෂන් සභාව සංස්ථාපනය නොවීය.

2015 වර්ෂයේ දී දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ස්වාධීන කොමිෂන් සභා ස්ථාපනය කිරීමට රජය විසින් පියවර ගත් අතර ඒ අනුව එතෙක් පැවති මැතිවරණ දෙපාර්තමේන්තුව අහෝසි වී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ මත අතිගරු ජනාධිපතිතුමා විසින් සභාපතිවරයකු ඇතුළු සාමාජිකයන් තිදෙනෙතුගෙන් සමන්විත මැතිවරණ කොමිසන් සභාව 2015.11.13 දින සංස්ථාපනය කරනු ලැබීය. ඒ සඳහා පත් කරන ලද සභාපති ඇතුළුව සාමාජිකයන් තිදෙනා 2015.11.17 නව කොමිෂන් සභාවේ රාජකාරී කටයුතු ආරම්භ කරන ලදී. මහින්ද දේශප්‍රිය මහතා සභාපති වශයෙන් ද ජනාධිපති නීතීඥ එන්.ජේ.අබේසේකර මහතා සහ මහාචාර්ය එස්.රත්නජීවන් එච්.හූල් මහතා කොමිෂන් සභාවේ සාමාජිකයින් වශයෙන් පත් කරන ලදී.

2020 ඔක්තෝම්බර් 29 දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද විසිවන සංශෝධනය මඟින් මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික සංඛ්‍යාව පහක් දක්වා වැඩි කරන ලදී. ඒ අනුව 2020.12.10 දින පාර්ලිමේන්තු සභාවේ නිර්දේශ මත දෙවන මැතිවරණ කොමිෂන් සභාව අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද අතර එය සභාපති ඇතුළු සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත විය. නීතීඥ නිමල්

ජී. පුංචිහේවා මහතා සභාපතිවරයා ලෙස ද මහ භාණ්ඩාගාරයේ හිටපු නියෝජ්‍ය ලේකම්වරයෙකු වූ එස්.බී.දිවාරත්න මහතා, හිටපු මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයෙකු වූ එම්.එම්.මොහමඩ් මහතා, හිටපු නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු වූ කේ.පී.පී.පතිරණ මහතා, මානව හිමිකම් ක්‍රියාකාරියෙකු වූ ජීවන් ත්‍යාගරාජා යන මහත්වරු කොමිෂන් සභාවේ සෙසු සාමාජිකයන් ලෙස ද පත් කරන ලදී. ජීවන් ත්‍යාගරාජා මහතා උතුරු පළාත් ආණ්ඩුකාරවර ලෙස 2021.10.10 දින පත්ව ගිය අතර ඒ මහතා වෙනුවට ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරිනියක වූ හිටපු උතුරු පළාත් ආණ්ඩුකාරවර පී.එස්.එම්.චාල්ස් මහත්මිය 2021.10.28 දින පත් කරන ලදී. එම කොමිෂන් සභාවේ සාමාජිකයින් පහක් වූ අතර සණ පූර්ණය සාමාජිකයන් තිදෙනෙකි.

2022.10.31 දින සම්මත වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21වන සංශෝධනයට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත තෙවන මැතිවරණ කොමිෂන් සභාව අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලදී. එම කොමිෂන් සභාවේ සභාපති ලෙස හිටපු මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයෙකු වූ ආර්.එම්.ඒ.එල්.රත්නායක මහතා ද, සාමාජිකයින් ලෙස හිටපු මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයෙකු වූ එම්.ඒ.පී.සී.පෙරේරා මහතා හා නීතිඥ අමීර් ෆායිස් මහතා පත් කරන ලද අතර ඔවුන් 2023.07.05 දින රාජකාරී ආරම්භ කරන ලදී. නීතිඥ ඒ.ෂන්මුගනාදන් මෙනෙවිය සාමාජිකාවක් ලෙස පත් කරන ලද අතර ඇය 2023.09.11 දින රාජකාරී ආරම්භ කරන ලදී. තෙවන මැතිවරණ කොමිෂන් සභාවේ පස්වන සාමාජිකයා වශයෙන් මහාචාර්ය ඩී.එම්.එස්.එස්.ලක්ෂ්මන් දිසානායක මහතා 2024.01.02 වනදින පත් කරන ලදී. ඒ අනුව මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා 2024.01.10 වනදින රාජකාරී භාරගැනීම සිදු කළ අතර කොමිෂන් සභාවේ සාමාජික සංඛ්‍යාව 05ක් වශයෙන් සම්පූර්ණ විය.

### 1.3. මැතිවරණ කොමිෂන් සභාවේ දැක්ම හා මෙහෙවර

"සර්වජන ඡන්ද බලය සුරකින දේශයක්" යන්න මැතිවරණ කොමිෂන් සභාවේ දැක්මයි.

එකී දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා "ජනතා පරමාධිපත්‍ය, සර්වජන ඡන්ද බලය හා සබැඳි ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම ආරක්ෂා කරමින් පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වන පරිදි අදාළ සියලු පාර්ශව දැනුම්වත් කෙරෙන නිදහස්, සාධාරණ හා විශ්වාසනීය මැතිවරණ ක්‍රියාවලියක් කාර්යක්ෂමව හා සඵලදායි යුතුව මෙහෙය වීම." මැතිවරණ කොමිෂන් සභාවේ මෙහෙවර වේ.

### 1.4. මැතිවරණ කොමිෂන් සභාවේ පරමාර්ථ, බලතල, කාර්යය හා කර්තව්‍යය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 (2) ව්‍යවස්ථාවෙහි සඳහන් පරිදි නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම මැතිවරණ කොමිෂන් සභාවේ පරමාර්ථය විය යුතු ය. එමෙන් ම පවත්නා මැතිවරණ නීති අනුව මැතිවරණ පැවැත්වීමටත්, වාර්ෂික ඡන්දහිමි නාමලේඛන පිළියෙල කිරීම හා ප්‍රතිශෝධනය කිරීමට ද කොමිෂන් සභාවට බලය ඇති අතර කොමිෂන් සභාවේ කටයුතු එම බලතලවලට සහ කාර්ය කර්තව්‍යවලට සීමා නොවන බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (1) ව්‍යවස්ථාවෙහි දක්වා ඇත. මේ අනුව අදාළ අණ පනත් අනුව මැතිවරණ පැවැත්වීමේ වගකීම පැවැරුණු මැතිවරණ දෙපාර්තමේන්තුවට වඩා විශේෂිත වගකීමක් මැතිවරණ කොමිෂන් සභාවට පැවරී ඇත. ඊට අදාළව දහනවවන ව්‍යවස්ථා සංශෝධනය මගින් මූලික නීතියට විශේෂ විධිවිධාන ඇතුළත් කිරීම තුළින් මැතිවරණ කොමිෂන් සභාවේ බලතල පුළුල් කර ඇත.

මැතිවරණ කොමිෂන් සභාව පිහිටුවීමේ දී කොමිෂන් සභාවට විශේෂ බලතල ලබා දී ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 අ ව්‍යවස්ථාව යටතේ අධිකරණ බලයට යටත්ව,

I. කොමිෂන් සභාවේ තීරණ, විධිවිධාන හෝ ක්‍රියා අවසානාත්මක හා තීරණාත්මක වීම හා

II. මැතිවරණ කොමිෂන් සභාවේ යම් සාමාජිකයෙකු හෝ නිලධරයකුට මැතිවරණයක් පැවැත්වීම හා සම්බන්ධ යම් නීතියක් යටතේ සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් සිවිල් නඩුවක් හෝ නඩු කටයුත්තක් පැවරිය නොහැකි වීම.

යන විශේෂ මුක්තීන් ලබා දී ඇත. මෙම මුක්තීන් ලබා දී ඇත්තේ 126 වන ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම් කඩවීම පිළිබඳ අභියාචනා අධිකරණ බලය, 130 වන ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරණය, මැතිවරණ පෙත්සම් ආදිය සම්බන්ධයෙන් ඇති අභියාචනා අධිකරණ බලය, 144 වන ව්‍යවස්ථාව යටතේ මන්ත්‍රී ධුරයකට තෝරා ගැනීමට අදාළ පෙත්සම් විභාගයට ඇති අභියාචනා අධිකරණ බලයට යටත්ව ය. තවද, මැතිවරණ ක්‍රියාවලිය මෙහෙයවීමේ දී නීති බලාත්මක කිරීම හා සුරක්ෂිත කිරීම ද ස්වකීය කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ද හැර වෙනත් වගකීමකට මැතිවරණ කොමිෂන් සභාව බැඳී නැති බව විශේෂිත කාරණයකි. මේ හැර රාජ්‍ය දේපල අවභාවිතාව වැළැක්වීම සම්බන්ධයෙන් විශේෂිත බලයක් 104 ආ (4) (අ) ව්‍යවස්ථාව යටතේ ලබා දී ඇති අතර, 104 (5) (අ) ව්‍යවස්ථාව අනුව ඡන්ද විමසීම සීමාවේ දී නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සහතික කිරීම සඳහා මාධ්‍ය ආයතන වෙත මාධ්‍ය උපමාන නියම කිරීමට හා ඊට අදාළව විධිවිධාන පැනවීමට ඉඩ සලසා ඇත. 104 ඇ ව්‍යවස්ථාව යටතේ පොලිසිය යොදවා ගැනීමට ද, 104 ඇ ව්‍යවස්ථාව යටතේ සන්නද්ධ හමුදා යෙදවීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමටද, කොමිෂන් සභාව වෙත විශේෂ බලතල ලබා දී තිබේ.

කොමිෂන් සභා ලේකම් කාර්යාලය මගින් පහත සඳහන් කාර්යයන් සිදු කෙරේ.

- කොමිෂන් සභාවේ පරිපාලන කාර්යයන්.
- ව්‍යවස්ථාපිත කාර්යයන් සම්බන්ධීකරණය හා මෙහෙයවීම.
- කොමිෂන් සභාවේ සාමාජිකයන් පිළිබඳ ආයතනික කටයුතු.
- මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයන් බඳවා ගැනීම, මාරු කිරීම හා නිදහස් කිරීම, මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල සේවයේ නියුතු දීප ව්‍යාප්ත සේවා හා මාණ්ඩලික නිලධාරීන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම් සහ විශ්‍රාම ගැන්වීම්වලට අදාළ කටයුතු.
- කොමිෂන් සභාවේ රැස්වීම් හා වාර්තා සකස් කිරීම.
- මාණ්ඩලික නිලධාරීන්ගේ ආයතන කටයුතු ඇතුළුව මානව සම්පත් සංවර්ධන කටයුතු.
- පාර්ලිමේන්තුව, ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය යන ආයතනයන් සමග සම්බන්ධීකරණ කටයුතු
- ස්වාධීන කොමිෂන් සභා, අමාත්‍යාංශ ඇතුළු රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය.
- මාණ්ඩලික නිලධාරීන්ගේ වාර්ෂික වත්කම් බැරකම් ප්‍රකාශ පිළිබඳ කටයුතු.
- කොමිෂන් සභාව වෙත පැවරෙන ඡන්ද විමසීම් නිදහස් හා සාධාරණ අන්දමින් පැවැත්වීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, උපදෙස් හා මගපෙන්වීම් ලබාදීම හා ඒ අනුව ක්‍රියා කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

## 1.5. සංවිධාන සටහන හා කාර්යාල පිරිසැකැස්ම

මැතිවරණ කොමිෂන් සභාව, මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා, මැතිවරණ මහලේකම් කාර්යාලයේ එක් එක් අංශ සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල ඇතුළත් සංවිධාන සටහන, සටහන 01 ලෙස ඇතුළත් කර ඇත.

ඉහත සංවිධාන සටහන අනුව මැතිවරණ කොමිෂන් සභාවට අයත් මැතිවරණ මහලේකම් කාර්යාලයේ, ජාතික මැතිවරණ, පළාත් පාලන ඡන්ද විමසීම්, ගිණුම්, පාලන, නීති විමර්ශණ සහ ක්‍රමසම්පාදන, අභ්‍යන්තර විගණන වශයෙන් අංශ සහ ආයතන, ප්‍රවාහන, ප්‍රසම්පාදන, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ලෙස ශාඛා ස්ථාපිත අතර සියලුම පරිපාලන දිස්ත්‍රික්ක තුළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල ද එකිනෙක සම්බන්ධවන ආකාරය දක්වා, ඒ ඒ ඒකකය ඇතුළත්වන ආකාරයට කාර්යාල පිරිසැකැස්ම සකස්කර ඇත.

## 02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### 2.1. මැතිවරණ කොමිෂන් සභාවේ රැස්වීම්

මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති කාර්යය හා කර්තව්‍යවලට අදාළව ඉදිරිපත් කරනු ලබන කොමිෂන් පත්‍රිකා සාකච්ඡා කිරීම හා තීරණ ගැනීම සහ වෙනත් නිර්දේශ අනුව කොමිෂන් සභා රැස්වීම් අවශ්‍යතාව අනුව පවත්වනු ලැබේ. මේ අනුව 2024 වර්ෂයේ පළමු කාර්තුව තුළ රැස්වීම් වාර 11 ක් ද දෙවන කාර්තුව තුළ රැස්වීම් වාර 10 ක් ද තෙවන කාර්තුව තුළ රැස්වීම් වාර 16 ක් ද සිව්වන කාර්තුව තුළ රැස්වීම් වාර 11 ක් ද වශයෙන් 2024 වර්ෂය තුළ රැස්වීම් වාර 48 ක් පවත්වා ඇත.

#### 2.1.1. කොමිෂන් සභාව සමග පැවති විශේෂ සාකච්ඡා.

මැතිවරණ කොමිෂන් සභාව විසින් කල් තබන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව පවරන ලද නඩු සඳහා අවශ්‍ය බාහිර නීතිඥ සහාය ලබා ගැනීම පිණිස නීතිපති දෙපාර්තමේන්තුව හා බාහිර නීතිඥවරුන් සමග ද විශේෂ සාකච්ඡා කීප අවස්ථාවක දීම සිදු කළ යුතු විය එමෙන් ම ඉහත කී නඩුවලට අදාළව දෙන ලද තීරණයට අනුව ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා අදාළ පාර්ශ්ව සමග විටින්විට විශේෂ සාකච්ඡා පැවැත්වීමට ක්‍රියා කරන ලදී.

මේ අතරතුර ජනාධිපතිවරණය නියමිත කාලසීමාව තුළ පැවැත්වීමට ක්‍රියා කිරීමට සිදුවීම නිසා ඊට අදාළව විශේෂ රැස්වීම්, සාකච්ඡා කොමිෂන් සභාව විසින් පවත්වන ලදී. මෙහිදී දේශපාලන පක්ෂ, අපේක්ෂකයන් සමග පවත්වන ලද සාකච්ඡාවලට අමතරව, නාමයෝජනා භාර ගැනීම ඇතුළු මැතිවරණ ක්‍රියාවලිය නිසි පරිදි පවත්වාගෙන යාමට අවශ්‍ය පාර්ශ්ව සමග සාකච්ඡා පවත්වන ලද අතර කොමිෂන් සභාවේ විශේෂ රැස්වීම් පැවැත්වීමට ද ක්‍රියා කරන ලදී.

ජනාධිපතිවරණය අවසන් වූ වහාම පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට ක්‍රියා කළ යුතුවීම නිසා ඒ සඳහා ද කොමිෂන් සභාව විසින් රැස්වීම්, සාකච්ඡා හා සම්මන්ත්‍රණ අවශ්‍ය පරිදි යොදා ගන්නා ලදී. නියමිත පරිදි විධිමත්ව, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් දෙකක් ඉතා කෙටි කාලයක් තුළ පැවැත්වීමට හැකිවීමට කොමිෂන් සභාව විසින් අදාළ පාර්ශ්ව සමග පවත්වන ලද සාකච්ඡා හා රැස්වීම් බෙහෙවින් ඉවහල් විය.

අධිකරණයේ නියමය පරිදි පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්විය යුතු වුවද ඒ සඳහා නව නීති සංශෝධන සිදුකිරීම අවශ්‍ය වූ බැවින් ඊට අදාළව නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව, රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සමග වසර අවසානයේ දී සාකච්ඡා පැවැත්වීමට ද පියවර ගන්නා ලදී.

### 2.2. ඡන්දහිමියන් ලියාපදිංචිය

සුදුසුකම් සැපිරූ සියලු පුරවැසියන්ට ජාතිය, ආගම, භාෂාව, කුලය, අධ්‍යාපන මට්ටම, දේපළ හිමිකම, උපත, උපන් ස්ථානය, වත්පොහොසත්කම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආදී කිසිඳු විශේෂත්වයකින් තොරව රටෙහි පාලන බලයට හවුල්වීමේ අයිතිය හා ඒ සඳහා නියෝජිතයින් තෝරා පත්කර ගැනීමට ඇති අයිතිය ලබාගත හැකි වනුයේ සර්වජන ඡන්ද බලය මඟිනි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන ව්‍යවස්ථාව ප්‍රකාරව සර්වජන ඡන්ද බලය සහතික කර ඇත. පරමාධිපත්‍ය ජනතාව සතු බවත්, අන්සතු කළ නොහැකි බවත්, පැවරිය නොහැකි බවත්, එකී පරමාධිපත්‍ය යන්නට පාලන බලතල, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය යන අංග ඇතුළත් වන බවත් එහි සඳහන් වේ.

ඒ අනුව රටේ පුරවැසියන්ට ජනාධිපතිවරයා තෝරා ගැනීමේ ඡන්ද විමසීමක දී, පාර්ලිමේන්තු මහ මැතිවරණයක දී, ජනමත විචාරණයක දී, පළාත් සභා ඡන්ද විමසීමක දී හා පළාත් පාලන ආයතන ඡන්ද විමසීමක දී තම ඡන්ද බලය ක්‍රියාත්මක කළ හැකිය. ඉහත සඳහන් ඡන්ද විමසීම්වල දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පුරවැසියන් අදාළ ඡන්ද විමසීමේ දී වලංගුව පවත්නා ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිව සිටීම අනිවාර්ය වේ.

මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම කටයුතු සිදුකරනු ලබනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හා 2021 **අංක** 22 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ දැක්වෙන විධිවිධාන අනුව වේ.

### 2.2.1. ඡන්දහිමියකු ලෙස ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය කරනු ලබන මූලික සුදුසුකම්

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම
- ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලබන දිනය වන **පෙබරවාරි මස 01** වන **දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබීම. (ඒ අනුව 2024 වර්ෂයේ ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමට සුදුසුකම් ලබන්නේ 2006.01.31 හෝ එදිනට පෙර උපන් තැනැත්තන්ය.)**
- ඡන්දහිමි නාමලේඛයේ ලියාපදිංචියට ඉල්ලුම් කරන ලිපිනයේ සුදුසුකම් ලබන දිනයට සාමාන්‍ය පදිංචිය තිබීම.

### 2.2.2. ඡන්දහිමියකු ලෙස ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා නුසුදුසුකම්

- බල පවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් බවට අධිකරණය මඟින් තීරණය වී තිබීම.
- අවුරුදු 02 කට නොඅඩු කාලයක් බන්ධනාගාරගත කිරීමකට යටත් කළ හැකි වරදකට අධිකරණය මඟින් වරදකරුවකු වී මාස 06 ක් හෝ ඊට වැඩි කාලයක් බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටීනම් හෝ ගතවූ සත් අවුරුදු කාලය තුළ ඒ දඬුවම සම්පූර්ණයෙන්ම විඳ සිටීම හෝ මරණ දණ්ඩනයට යටත්ව සිටීම.
- අල්ලස් චෝදනාවකට වරදකරු වී අවුරුදු 07ක කාලයක් ගත වී නොතිබීම.
- මැතිවරණ නීති උල්ලංඝනය කිරීම හේතුකොට ගෙන අධිකරණය විසින් වරදකරුවකු කර තිබීම.
- මහජන ආයතන (දූෂණ වැලැක්වීමේ) ආඥා පනත යටතේ වරදකරුවකු වී තිබීම.

**ඉහත සඳහන් නුසුදුසුකම් ඇතුළුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වන ව්‍යවස්ථාව යටතේ සඳහන් ඡන්ද බලය අහිමිවීමේ නුසුදුසුදුකම් වලට යටත් නොවූ තැනැත්තෙක් විය යුතුය.**

### 2.2.3. 2021 අංක 22 දරණ ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත.

මෙම සංශෝධන පනතේ ප්‍රධාන අරමුණ වයස අවුරුදු 18 සම්පූර්ණ කළ විගස පරිපූරක ඡන්දහිමි නාමලේඛන මඟින් ඡන්ද බලය ලබා දීම සහ ඡන්දහිමියන් ගණන් ගන්නා සුදුසුකම් ලැබීමේ දිනය සංශෝධනය කිරීම විය. 2022 වර්ෂයේ මුල්වරට ක්‍රියාත්මක වූ මෙම සංශෝධන පනතට අනුකූලව 2024 වර්ෂයේදී තෙවන වරටත් ප්‍රතිශෝධන කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

**2.2.3.1. 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතට (ප්‍රධාන ප්‍රඥප්තිය) සිදු කළ මූලික සංශෝධන සහ ඊට අදාල සුවිශේෂී කරුණු.**

- මෙම පනත 2021 ඔක්තෝම්බර් මස 13 දින සහතික කරන ලදී.
- මෙම සංශෝධිත පනත 2022 පෙබරවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වේ.
- ඡන්දහිමියෙකු ලෙස ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා සුදුසුවීම පිණිස යම් තැනැත්තෙකුගේ අටලොස්විය සම්පූර්ණ කර තිබිය යුතු දිනය ජූනි මස පළමු වන දිනය වෙනුවට පෙබරවාරි මස පළමු වන දිනය ලෙස සංශෝධනය කර ඇත.
- යම් කිසි මැතිවරණ කොට්ඨාසයක නාමලේඛනයෙහි නමක් ඇතුළත් කිරීම හෝ තබා ගැනීම සඳහාත්, සාමාන්‍යයෙන් යමෙකු පදිංචිව සිටිය යුතු සුදුසුකම් ලැබීමේ ලිපිනය සඳහාත් ඒ ආශ්‍රිත වෙනත් තීරණ ගැනීම සඳහාත් බලපැවැත්වූ ජූනි මස පළමුවන දිනය, පෙබරවාරි මස පළමු වන දිනය ලෙස සංශෝධනය කර ඇත.
- එක් එක් වර්ෂයේ ජූනි මස පළමුවන දිනයෙහි හෝ එදිනට පෙර ප්‍රතිශෝධන කටයුතු ආරම්භ කිරීම වෙනුවට පෙබරවාරි මාසයේ පළමු වන දිනයෙහි හෝ එදිනට පෙර එම සංශෝධන කටයුතු ඇරඹීමට ඉඩ සැලසිනි.
- ‘අ’ සහ ‘ආ’ ලැයිස්තු සම්පූර්ණ කිරීම ඊළගට එළඹෙන වර්ෂයේ ජනවාරි තිස් එක් වන දින හෝ එදිනට පෙර සිදුකරනු ලැබිය යුතුය යන නියමය වෙනුවට අදාළ වර්ෂයේ සැප්තැම්බර් මස තිස්වන දිනය ලෙස එය සංශෝධනය විය.

**2.2.3.2. පරිපූරක ඡන්දහිමි නාමලේඛන සම්බන්ධයෙන්**

- යම් වර්ෂයක පෙබරවාරි මස පළමු වන දිනෙන් ආරම්භ වී එම වර්ෂයේම මැයි මස තිස් එක් වන දිනෙන් අවසන් වන්නා වූ කාලසීමාව ඇතුළත;
- යම් වර්ෂයක ජූනි මස පළමු වන දිනයෙන් ආරම්භ වී එම වර්ෂයේම සැප්තැම්බර් මස තිස් වන දිනෙන් අවසන් වන්නා වූ කාලසීමාව ඇතුළත;
- යම් වර්ෂයක ඔක්තෝබර් මස පළමු වන දිනෙන් ආරම්භ වී පසුව එළඹෙන වර්ෂයේ ජනවාරි මස තිස් එක් වන දිනෙන් අවසන් වන්නා වූ කාලසීමාව ඇතුළත; අටලොස්විය සම්පූර්ණ කරන තැනැත්තෙකු ඡන්දහිමියෙකු ලෙස නාමලේඛනයට නම ඇතුළත් කරවා ගැනීමට සුදුසුකම් ලබන බවත් ඒ සඳහා උප්පැන්න සහතිකයේ පිටපතක් හෝ ජාතික හැඳුනුම්පතේ පිටපතක් සමඟ ලියාපදිංචි කිරීමේ නිලධාරීන් වෙත ඉල්ලීම් කළ හැකි බවත් සංශෝධිත පනතට ඇතුළත් කර ඇත.
- එමෙන්ම ලියාපදිංචි කිරීමේ නිලධාරි විසින් පරිපූරක ලැයිස්තු සකස් කළ යුතු බවත් , එම පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශනය කළ යුතු බවත්, මේ සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ හා භාෂාත්‍රයෙන් ප්‍රවෘත්ති පත්‍රවල දැන්වීම් පළ කළ යුතු බවත් , එම දැන්වීම් පළ කළ දින සිට දින 10ක් ඇතුළත හිමිකම් ඉල්ලීම් හා විරෝධතා දැක්වීම සිදු කළ හැකි බවත්, සංශෝධිත පනතට ඇතුළත් කර ඇත. එමෙන්ම හිමිකම් හා විරෝධතා සම්බන්ධ පරීක්ෂණ පැවැත්වීමට අදාළ විධිවිධාන හා එම පරීක්ෂණ අවසානයේ පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සහතික කරන දිනය දක්වා කාර්යයන්ට අදාළ ප්‍රතිපාදන ඇතුළත් කර ඇත.
- පරිපූරක නාමලේඛන බලාත්මක වීම සහ නිෂ්ප්‍රභා වීම පිළිබඳව සංශෝධිත පනතේ කරුණු සඳහන් කර ඇත.

**2.2.3.3. ඡන්දහිමියන් ලියාපදිංචියට අදාළව කටයුතු කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට බලය පැවරෙන නෛතික ප්‍රතිපාදන**

ඡන්දහිමියන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් මතුවන දුෂ්කරතා සහ කලින් අපේක්ෂා නොකළ කරුණු පිළිබඳව තීරණය කිරීම හෝ උචිත පරිදි වෙනස් කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන නිකුත් කිරීමට කොමිෂන් සභාවට බලතල පවරා ඇත.

## 2.3. ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2024

2021 අංක 22 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත මඟින් සිදු කළ සංශෝධන අනුව 2024 පෙබරවාරි 01 දින හෝ ඊට පෙර 2024 වර්ෂයේ ප්‍රධාන නාමලේඛනය සඳහා ඡන්දහිමියන් ගණන් ගැනීම ආරම්භ කළ යුතු විය.

### 2.3.1. 2024 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය අනුව ප්‍රධාන නාමලේඛනය සැකසීම

මෙම කාර්යය මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් පරිදි දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කිරීමේ නිලධාරීගේ සහ දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගේ මෙහෙය වීම මත දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල මඟින් සිදු කරනු ලබන අතර, ගෙයින් ගෙට ගොස් ක්ෂේත්‍රය තුළ ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා ගණන් ගන්නා නිලධාරීන් ලෙස ග්‍රාම නිලධාරීවරුන් හා ඔවුන්ට අමතරව කොළඹ මහ නගර සභා සීමාව හා මීගමුව මහ නගර සභා සීමාව තුළ විශේෂ ගණන් ගන්නා නිලධාරීන් කටයුතු කරනු ලැබේ.

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2021 සහ 2022 වර්ෂවල ගණන් ගැනීමේ නිලධාරීන් ගෙයින්ගෙට ගොස් ඡන්ද හිමියන් ගණන් ගැනීම සිදු නොකරන ලදී. එහෙත් 2023 වර්ෂයේ මෙන්ම 2024 වර්ෂයේ ද ගෙයින්ගෙට ගොස් ඡන්ද හිමියන් ගණන් ගැනීම සිදු කිරීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී.

පනතේ 12(1) වගන්තියට අනුකූලව නාමලේඛන ප්‍රතිශෝධනය ආරම්භ කරන බවද දන්වමින්, ඡන්දහිමියන් ගණන් ගන්නා ක්‍රමවේදය පිළිබඳව වූ නිවේදනය අංක 2365/02 හා 2024.01.01 දිනැති රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. ඊට අමතරව ඒ පිළිබඳ දැන්වීම දිනමිණ, තිනකරන් හා ඩේලිනිවුස් යන පුවත්පත්වල ද භාෂාත්‍රයෙන් පළකරන ලදී. (ඇමුණුම 01)

ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය සඳහා උපදෙස් ඇතුළත් චක්‍රලේඛය සියළුම දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ නිලධාරින් වන දිස්ත්‍රික් ලේකම්වරුන්ට හා සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරින් වන දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත 2023.12.04 දින නිකුත් කරන ලදී. එමගින් ඡන්දහිමියන් ගණන් ගැනීමට අදාළ නෛතික කරුණු හා ප්‍රායෝගික වැඩපිළිවෙල පිළිබඳව උපදෙස් ලබා දීම සිදු කළ අතර ඡන්දහිමි නාමලේඛනය සහතික කිරීම දක්වා වූ ඉදිරි ක්‍රියාකාරකම් සිදු කළ යුතු දින වකවානු පිළිබඳ සැලැස්ම ද ලබා දෙන ලදී. (ඇමුණුම 02)

2023(3) වන පරිපූරක නාමලේඛනය සහතික කිරීම 2024.02.01 දින සිදු කරන ලදී. නමුත් 2023(3) පරිපූරක නාමලේඛනය සකස් කිරීමේ කටයුතු 2023 දෙසැම්බර් මාසයේ අවසන් කළ බැවින්, 2023 ප්‍රධාන නාමලේඛනයට සහතික කරන ලද 2023(1), 2023(2) නාමලේඛන සහ 2023(3) පරිපූරක නාමලේඛනය සඳහා නිර්දේශිත නම් ඒකාබද්ධ කර ඡන්ද හිමියන් ගණන් ගැනීම සඳහා දත්ත මුද්‍රිත ඒකාබද්ධ ලැයිස්තු සකස් කිරීමත් ඉන් අනතුරුව 2024.01.01 දින සිට ගෙයින් ගෙට ගොස් ඡන්ද හිමියන් ගණන් ගැනීමත් සිදු කරන ලදී.

2023 වර්ෂයේ ඒකාබද්ධ ලැයිස්තුව A3 ප්‍රමාණයට මුද්‍රණය කිරීම නිසා භාවිතයේ දී ගැටළු ඇති වූ බව ගණන් ගන්නා නිලධාරීන් හා දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් දැනුම් දීම හේතුවෙන් 2024 වර්ෂයේ දී ඒකාබද්ධ ලැයිස්තු A4 ප්‍රමාණයට කුඩා කොට පොතක් ලෙස මුද්‍රණය කර ලබාදෙන ලදී.

එම ලැයිස්තුවෙහි 2024.02.01 දින වන විට වලංගු ඡන්ද හිමි නාමලේඛනවලට ඇතුළත් සියළුම ඡන්ද හිමියන්ගේ නම් සඳහන් වූ අතර, ඒවා ගෘහමූලික හෝ නිවසේ වැඩිහිටියෙකු පරීක්ෂා කර බලා එම ලැයිස්තුවෙහි අත්සන් තැබීමට නියමිත විය. ‘අ’ සහ ‘ආ’ ලැයිස්තුගත වන නම් සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා ER ලෙස හැඳින්වෙන ආකෘතියක් භාවිත කරන ලදී (2024/ER). සෑම ගෘහයකටම වලංගු නාමලේඛනයේ නම් සඳහන් වන තැනැත්තන්ගේ විස්තර සඳහන් කුඩා පත්‍රිකාවක් ලබාදීමට ද කටයුතු කරන ලදී.

ක්ෂේත්‍ර ගණන් ගැනීම සිදුකරන කාලසීමාව තුළ ග්‍රාම නිලධාරී ස්ථාන මාරුවීම් අත්හිටුවීම සහ එම කාලය තුළ ඔවුන්ගේ කාර්යාල දින සීමා කිරීම් සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ ඉල්ලීම මත රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත 2023.12.29 දිනැතිව උපදෙස් ලබා දෙන ලදී.

### 2.3.2. ‘අ’ ‘ආ’ ලැයිස්තු ප්‍රදර්ශනය : හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම

2023 ඒකාබද්ධ ඡන්දහිමි නාමලේඛනයේ නම් සඳහන්ව ඇති අයගෙන් මියගොස් ඇති හෝ පදිංචිය හැරගොස් ඇති හෝ වෙනත් හේතුවක් මත හෝ ලියාපදිංචිය සඳහා සුදුසුකම් නොලබන තැනැත්තන්ගේ, එනම් 2024 වර්ෂයේ ඉවත් කිරීමට නිර්දේශ කරන තැනැත්තන්ගේ නම් සඳහන් වන ‘අ’ ලැයිස්තු හා 2023 වර්ෂයේ ඒකාබද්ධ ඡන්දහිමි නාමලේඛනයේ නම් ඇතුළත් නොවන නමුත් වයස අවුරුදු 18 සම්පූර්ණ වීම හෝ පදිංචියට පැමිණීම හෝ වෙනත් හේතුවක් මත හෝ 2024 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයට අලුතින් නම් ඇතුළත් කිරීම සඳහා සුදුසුකම් ලබන තැනැත්තන්ගේ නම් සඳහන් වන ‘ආ’ ලැයිස්තු ප්‍රදර්ශනය 2024.04.09 දින සිට සිදු කරන ලදී. මේ පිළිබඳව අංක: 2379/16 හා 2024.04.09 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ හා භාෂාත්‍රයෙන් පුවත්පත්වල දැන්වීම් පළ කරන ලදී. (ඇමුණුම 03)

### 2.3.3. වලංගු නාමලේඛනය (හෝ කොටසක්) සහ “අ” ලැයිස්තු හා “ආ” ලැයිස්තු ප්‍රදර්ශන ස්ථාන

| ප්‍රදර්ශනය පිණිස තබනු ලබන ස්ථානය | ප්‍රදර්ශනය පිණිස තබා ඇති ඡන්දහිමි නාමලේඛනය සහ ලැයිස්තු හෝ ඒවායේ කොටස් |
|---|---|
| එක් එක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | අදාළ මැතිවරණ කොට්ඨාසයෙහි (දිස්ත්‍රික්කයේ) වලංගු ඡන්දහිමි නාමලේඛනයේ සම්පූර්ණ පිටපත සහ ඊට අදාළ “අ” සහ “ආ” ලැයිස්තුවල පිටපත් |
| එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සියලුම ඡන්ද කොට්ඨාස දැක්වෙන 2023 වර්ෂයේ වලංගු ඡන්දහිමි නාමලේඛන කොටසෙහි පිටපතක් සහ ඊට අදාළ “අ” සහ “ආ” ලැයිස්තුවල පිටපත් |
| එක් එක් පළාත් පාලන ආයතනය | අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුල පිහිටා ඇති සියලුම ඡන්ද කොට්ඨාස දැක්වෙන වලංගු ඡන්දහිමි නාමලේඛන කොටසෙහි පිටපතක් සහ ඊට අදාළ “අ” සහ “ආ” ලැයිස්තුවල පිටපත් |
| එක් එක් ග්‍රාම නිලධාරී කාර්යාලය | අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුල පිහිටා ඇති සියලුම ඡන්ද කොට්ඨාස දැක්වෙන වලංගු ඡන්දහිමි නාමලේඛන කොටසෙහි පිටපතක් සහ ඊට අදාළ “අ” සහ “ආ” ලැයිස්තුවල පිටපත් |

එක් එක් මැතිවරණ කොට්ඨාසයට අදාල වූ එකී ඡන්දහිමි නාමලේඛනයේ තමාගේ නම හෝ වෙනත් තැනැත්තෙකුගේ නමක් ඇතුළත් කරවා ගැනීමට සුදුසුකම් ඇත්තාවූ එහෙත් තමාගේ නම ඡන්දහිමි නාමලේඛනයෙන් හා "ආ" ලැයිස්තුවෙන් ඉවත් කොට හෝ "අ" ලැයිස්තුවේ ඇතුළත් කර හෝ ඇති යම්කිසිවෙකු විසින් තමාගේ නම හෝ වෙනත් තැනැත්තෙකුගේ නම නාමලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීම පිණිස හෝ තබා ගැනීම පිණිස හෝ අවස්ථාවෝචිත පරිදි තමා විසින් හෝ තමා වෙනුවෙන් වෙන කෙනෙකු විසින් හෝ හිමිකම් ඉල්ලා සිටින්නේ නම් එසේ හිමිකම් ඉල්ලා සිටින අය විසින් ඒ බව යථෝක්ත ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ උප ලේඛනයේ නියම කර ඇති "අ" සහ "ආ"ආකෘතියට සාරානුකූලව ඉල්ලුම් කළ යුතු විය. මෙම කරුණු ඇතුළත් දැන්වීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 2024 අප්‍රේල් මස 09 දින පළ කරන ලද අතර එදින සිට සති 4 ක් ඇතුළත එනම් 2024.05.06 දිනට පෙර මේ සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ලැබිය යුතු බව ප්‍රසිද්ධ කරන ලදී.

මැතිවරණ කොට්ඨාසයට අදාල වූ ඡන්දහිමි නාමලේඛනයේ හෝ "ආ" ලැයිස්තුවේ තමාගේ නම ඇතුළත්ව ඇත්තාවූ යම් කෙනෙකුට, තමාගේ නම හෝ එකී නාමලේඛනයේ හෝ "ආ" ලැයිස්තුවේ හෝ නම සඳහන් වී ඇත්තාවූ වෙන යම් කෙනෙකුගේ නමක් හෝ එකී නාමලේඛනයේ ඇතුළත් කර තිබීම ගැන හෝ එකී නාමලේඛනයේ නම ඇතුළත් කරවා ගැනීම පිණිස හෝ තබා ගැනීම පිණිස හෝ විරුද්ධතාවය දක්වා සිටීමට පුළුවන. එසේ දක්වා සිටින විරුද්ධතාවන් යථෝක්ත පනතේ උපලේඛනයේ නියම කර ඇති පරිදි "ඇ" ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකකින් යුක්ත කොට, මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය. නාමලේඛනයේ නම ඇතුළත් කිරීම ගැන සඳහන් වනු ලබන සෑම විරුද්ධතාවක්ම, දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට එනම් 2024 අප්‍රේල් මස 09 දින සිට සති 4ක් ඇතුළත එනම් 2024.05.06 දිනට පෙර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන වෙත ලැබෙන සේ එවිය යුතු බව ප්‍රසිද්ධ කරන ලදී.

හිමිකම් ඉල්ලා සිටින අයකුගේ නමක් ඡන්දහිමි නාමලේඛනයේ ඇතුළත් කිරීම ගැන දක්වනු ලබන සෑම විරුද්ධතාවයක්ම, හිමිකම් ඉල්ලා සිටින්නන්ගේ නම් ලැයිස්තුවක් අඩංගු දැන්වීමක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ප්‍රදර්ශනය කරනු ලැබූ දින සිට දින 14 ක් ඇතුළත යථෝක්ත පනතේ උපලේඛනයේ නියම කර ඇති පරිදි 'ඇ' ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකකින් යුක්තව ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය. මෙම කරුණු ඇතුළත් දැන්වීම, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල 2024 අප්‍රේල් මස 25 වන දින සහ 2024 මැයි මස 09 වන දින ප්‍රසිද්ධ කරන ලදි.

හිමිකම් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන 'අ' 'ආ' ආකෘති පත්‍ර සහ විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන 'ඇ' 'ඇ' ආකෘති පත්‍ර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් හා ග්‍රාම නිලධාරී කාර්යාලවලින් ලබා ගැනීම සඳහා පහසුකම් ලබා දෙන ලදී.

### 2.3.4. හිමිකම් සහ විරෝධතා පරීක්ෂණ පැවැත්වීම හා ප්‍රමාද ඉල්ලීම් පිළිබඳව ක්‍රියා කිරීම

'අ' 'ආ' ලැයිස්තුගත නම් සංඛ්‍යාව හා හිමිකම් භාරගැනීමේ කාලපරිච්ඡේදය අවසානයේ ලැබී ඇති හිමිකම් සංඛ්‍යාව පිළිබඳව අවධානය යොමු කළ මැතිවරණ කොමිෂන් සභාව, ඡන්දහිමියන් ගණන් ගැනීමේදී සිදුවිය හැකි දෝෂ නිවැරදි කිරීම සඳහාත්, යම් අයුරකින් ලියාපදිංචියට මගහැරී ඇති සුදුසුකම් ලැබූ ඡන්දහිමියන් විසින් ඉදිරිපත් කළ හැකි ප්‍රමාද වූ ඉල්ලීම් සම්බන්ධව සලකා, ඒවාද නාමලේඛන ගත කිරීමට අදාල උපදෙස් දිස්ත්‍රික් නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත නිකුත් කරන ලදී. 2381/49 හා 2024.04.26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ මේ සම්බන්ධයෙන් වූ එක් එක් දිස්ත්‍රික්කය සඳහා වූ දැන්වීම් සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරීන් ප්‍රසිද්ධ කරන ලදී.

ප්‍රධාන නාමලේඛනය හා පරිපූරක නාමලේඛනය සකස් කිරීමේ දී අනාවරණය වූ බහු ලියාපදිංචියට අදාළ ඡන්දහිමියන් සම්බන්ධයෙන් ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 12(7) උප වගන්තිය අනුව ක්‍රියා කරන ලදී. ඒ අනුව අදාළ ඡන්දහිමියන්ගෙන් ලියාපදිංචිවීමට කැමති එක් ලිපිනයක් විමසා දැනගැනීම ප්‍රථමයෙන් සිදු කරන ලදී. ඊට ලද පිළිතුරු අනුව සුදුසුකම් ලැබීමේ එක් කැමති ලිපිනයක පමණක් අදාළ නම් ලියාපදිංචි කිරීම සිදු කරන ලදී. මැතිවරණ කොට්ඨාසය තුළ බහු ලියාපදිංචිය හා සම්බන්ධයෙන් කරුණු විමසීම් වෙනුවෙන් පිළිතුරු නොලද විට, ලියාපදිංචි කිරීමේ නිලධාරීන්ගේ අභිමතය පරිදි අදාළ නම් එක් ලිපිනයක පමණක් ලියාපදිංචි කිරීම සිදුකරන ලදී. මැතිවරණ කොට්ඨාස දෙකක් හා සම්බන්ධ බහු ලියාපදිංචියට අදාළ ලිපිනයන් මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමු කිරීමෙන් අනතුරුව ලද තීරණ ලියාපදිංචි කිරීමේ නිලධාරීන් වෙත උපදෙස් සමඟ නිකුත් කරන ලදී. ජාතික හැඳුනුම්පත් අංක අනුව බහු ලියාපදිංචි බව අනාවරණය වුවද අදාළ නම්, පුද්ගලයන් දෙදෙනෙකුගේ බව නිරීක්ෂණය වන අවස්ථාවක දී හා තොරතුරු අනුව එක් පුද්ගලයෙක් ද යන්න සැකහැර දැනගත නොහැකි අවස්ථාවන්හි දී, තවදුරටත් ලිපිනයක් දෙකෙහිම නම තබා ගැනීමට තීරණය කරන ලදී.

ජනාධිපතිවරණය නියමිත දිනවල පැවැත්වීමේ අවශ්‍යතාවය හා ඒ අනුව මූලික කටයුතු සංවිධානය කර ගැනීමේ අවශ්‍යතාවයද සලකා බලා 2024 ප්‍රධාන නාමලේඛනය හා 2024 (1) පරිපූරක නාමලේඛනය සහතික කරන දින සංශෝධනය කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී. ඒ අනුව 2024.07.15 දින සහතික කිරීමට නියමිතව තිබූ ප්‍රධාන නාමලේඛනය 2024.07.01 දින සහතික කිරීමටත්, 2024.07.15 දින සහතික කිරීමට නියමිතව තිබූ 2024 (1) පරිපූරක නාමලේඛනය 2024.07.08 දින සහතික කිරීමටත් තීරණය කරන ලදී.

2024 වර්ෂයේ ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනය සකස් කිරීමේ කටයුතු දිස්ත්‍රික් මට්ටමෙන් අවසන් කර, එම ලේඛන 2024 ජූලි මස 01 වන දින දිවයිනේ සියලු මැතිවරණ කොට්ඨාසවල සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරීන් විසින් සහතික කරන ලදී. ඒ පිළිබඳ දැන්වීම 2024.07.01 දිනැතිව අංක 2391/03 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, භාෂාත්‍රයෙන් පුවත්පත්වල පළ කිරීමටත් කටයුතු කළ අතර මැතිවරණ කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කිරීමටත් කටයුතු කරන ලදී. සහතික කරන ලද ඡන්දහිමි නාමලේඛනය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල හා දිවයිනේ සියලුම ග්‍රාම නිලධාරී කාර්යාලවල මහජන ප්‍රදර්ශනය සඳහා තබන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98 (8) ව්‍යවස්ථාව අනුව 2024 ප්‍රධාන නාමලේඛනය සහතික කිරීමෙන් අනතුරුව මැතිවරණ කොට්ඨාස අනුව පාර්ලිමේන්තුව සඳහා මන්ත්‍රීධුර ගණනය කිරීම සිදු කළ අතර ඒ පිළිබඳව අංක: 2393/25 හා 2024.07.17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

### 2.3.5. 2024 ඡන්දහිමි නාමලේඛනයට අදාල සංඛ්‍යා සටහන්

- එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි ප්‍රවර්තන නාමලේඛනයෙහි (2023) ඉවත් කිරීමට නියමිත (‘අ’ ලැයිස්තුගත නම්) සහ 2024 ඇතුළත් කිරීමට නියමිත (‘ආ’ ලැයිස්තුගත නම්) සංඛ්‍යාව (සටහන 02)
- ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වගන්තිය යටතේ හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම සහ ඉඩදුන් හිමිකම් හා විරෝධතා (සටහන 03)
- එක් එක් මැතිවරණ කොට්ඨාසයේ බහු ලියාපදිංචිය අනාවරණය වීම මත එක් ලිපිනයකින් ඉවත් කළ ඡන්දහිමියන් සංඛ්‍යාව (සටහන 04)
- එක් එක් මැතිවරණ කොට්ඨාස මට්ටමෙන් ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව (සටහන 05)

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) අනු ව්‍යවස්ථාව අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි තෝරාපත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීන් සංඛ්‍යාව වාර්ෂිකව ගණනය කිරීම 2024 ප්‍රධාන නාමලේඛනය (සටහන 06)

- එක් එක් මැතිවරණ කොට්ඨාසයන්ට අදාළ 2024 වර්ෂයේ ප්‍රධාන නාමලේඛනය හා 2024(1) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සහතික කර ඇති සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරීන්ගේ විස්තර (සටහන 07)

- එක් එක් මැතිවරණ කොට්ඨාසයන්ට අදාළ ජාතික හැඳුනුම්පත් විස්තර ඉදිරිපත් කළ ඡන්දහිමියන් සංඛ්‍යාවේ ප්‍රතිශතය (සටහන 08)

### 2.3.6. තුලනාත්මක සංඛ්‍යා සටහන්

පසුගිය වර්ෂ කිහිපයක ඡන්දහිමියන් ලියාපදිංචි කිරිමේ පහත කරුණු පිළිබඳ තුලනාත්මක සංඛ්‍යා සටහන් පහත පරිදි වේ.

- ඡන්ද ප්‍රදේශ අනුව ප්‍රධාන නාමලේඛනයෙහි ලියාපදිංචි වී ඇති ඡන්දහිමියන් සංඛ්‍යාව පිළිබඳව තුලනාත්මක සටහන 2014 - 2024 (සටහන 09)

- ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනවලදී ජාතික හැඳුනුම්පත් විස්තර ඉදිරිපත් කළ ඡන්දහිමියන් සංඛ්‍යාවේ ප්‍රතිශතය පිළිබඳව තුලනාත්මක සටහන 2014 - 2024 (සටහන 10)

- එක් එක් වර්ෂයේ ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි ඡන්දහිමියන් සහ පෙර වර්ෂයට සාපේක්ෂව වැඩිවීම හා වැඩිවීමේ ප්‍රතිශතය සංසන්දනය 2001 - 2024 (සටහන 11)

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) අනු ව්‍යවස්ථාව යටතේ එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරා පත්කර ගත යුතු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව පිළිබඳ තුලනාත්මක සටහන 2014 – 2024 (සටහන 12)

- වලංගු ඡන්දහිමි නාමලේඛනවල ඡන්ද සංඛ්‍යාවේ වෙනස්වීම හා ඊට අදාල විස්තර (සටහන 13)

- 2023 - 2024 මැතිවරණ කොට්ඨාස මට්ටමෙන් ඡන්දහිමියන් ලියාපදිංචිය සැසඳීම (සටහන 14)

### 2.3.7. 2023(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සකස් කිරීම

ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ සංශෝධිත පනත අනුව 2023 ඔක්තෝම්බර් මස 01 දින සිට 2024 ජනවාරි මස 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ කිසියම් දිනයක දී වයස අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන තැනැත්තන්ගේ නම් ඇතුළත් පරිපූරක ඡන්දහිමි නාමලේඛනයක් සකස් කළ යුතුවේ. මෙම පරිපූරක නාමලේඛනයට අදාල ගණන් ගැනීමේ කටයුතු 2023 වර්ෂයේ ප්‍රධාන නාමලේඛනයට අදාළ නම් ගණන් ගැනීමට සමගාමීව සිදු කරන ලදි.

පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශනය කිරීම හා හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අංක: 2352/03 හා 2023.10.02 දිනැති ගැසට් පත්‍රයේ හා පුවත්පත්වල දැන්වීම් භාෂාත්‍රයෙන් පළ කරන ලදී.

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් මෙම කාල පරිච්ඡේදය තුළ අවස්ථා කිහිපයකදී අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන තැනැත්තන්ගේ විස්තර ලබාගත් අතර එම විස්තර දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් මගින් ග්‍රාම නිලධාරීන්ට යැවීමට කටයුතු කරන ලදී. ඒ සමඟ වයස් සම්පූර්ණත්වයට පත්ව, සුදුසුකම් සපුරා තිබියදීත් වසම තුළ පදිංචිව සිටින ලියාපදිංචි නැති

තැනැත්තන්ගේ නම් ලේඛනවලට ඇතුළත් කිරීමටද ග්‍රාම නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. ඊට අමතරව එක් එක් තැනැත්තන් වෙත ලියාපදිංචි වීමට කටයුතු කරන ලෙස ලිපි මගින් දැනුම් දෙන ලදී.

හිමිකම් පරීක්ෂණ පැවැත්වීමෙන් අනතුරුව පරිපූරක ඡන්දහිමි නාමලේඛනය ආරම්භයේදී සැලසුම් කළ ආකාරයට 2024.02.01 දින සහතික කිරීම සිදු කරන ලදී. මේ සම්බන්ධයෙන් අංක 2369/28 හා 2024.02.01 දිනැති ගැසට් නිවේදනය හා පුවත්පත් දැන්වීම මගින් නිවේදනය කරන ලදී. මෙම පරිපූරක නාමලේඛනයේ ලියාපදිංචි මුළු ඡන්දහිමියන් සංඛ්‍යාව 72,757ක් වේ.

සෑම ඡන්දහිමි නාමලේඛනයක්ම සහතික කළ පසු තත් කාලයේ බලපවත්නා වලංගු ඡන්දහිමි නාමලේඛනයේ ඡන්ද සංඛ්‍යාව පදනම් කරගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 97 හා 98 ව්‍යවස්ථාවන්ට අනුකූලව එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරා පත් කර ගැනීමට හිමිකම් ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාව නිශ්චය කළ යුතු වේ. මේ සම්බන්ධයෙන් නිවේදනය අංක 2374/23 හා 2024.03.06 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

**2.3.8. 2024 පරිපූරක ඡන්දහිමි නාමලේඛන සකස් කිරීම.**

ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ සංශෝධිත පනත අනුව 2024 පෙබරවාරි මස 01 දින සිට 2024මැයි මස 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ, 2024 ජූනි මස 01 දින සිට 2024 සැප්තැම්බර් මස 30 දින දක්වා කාල පරිච්ඡේදය තුළ හා 2024 ඔක්තෝබර් මස 01 දින සිට 2025 ජනවාරි මස 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ කිසියම් දිනයක දී වයස අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන තැනැත්තන් ඇතුළත් පරිපූරක ඡන්දහිමි නාමලේඛන සකස් කළ යුතු වේ.

මෙම පරිපූරක නාමලේඛනවලට අදාළ මූලික තොරතුරු ලබාගැනීම 2023 වර්ෂයේ ඡන්දහිමියන් ගණන් ගැනීමට සමගාමීව ආරම්භ කරන ලදී. සුදුසුකම් ලැබූ සෙසු තැනැත්තන් ගණන් ගැනීමේ කටයුතු 2024 වර්ෂයේ ප්‍රධාන නාමලේඛනය ගණන් ගැනීමට සමගාමීව සිදු කරන ලදී.

අවස්ථා කිහිපයකදී පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් මෙම කාල පරිච්ඡේදය තුළ අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන තැනැත්තන්ගේ විස්තර ලබාගත් අතර එම විස්තර දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස් වරුන් මගින් ග්‍රාම නිලධාරීන්ට යැවීමට කටයුතු කරන ලදී. ඊට අමතරව එක් එක් තැනැත්තන්ගේ පෞද්ගලික නිවාස වෙත ලිපි මගින් ද දැනුම් දෙන ලදී.

පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශනය කිරීම, හිමිකම් හා විරෝධතා සම්බන්ධයෙන් අංක 2381/41 හා 2024.04.26 දිනැති ගැසට් පත්‍රයේ හා පුවත්පත්වල භාෂාත්‍රයෙන් දැන්වීම පළ කරන ලදී.

**2.3.9. 2024 (1) වන පරිපූරක නාමලේඛනය**

හිමිකම් පරීක්ෂණ අවසන්කර මෙම පරිපූරක නාමලේඛනය 2024.07.08 දින සහතික කරන ලදී.

මෙම පරිපූරක ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව 76,093ක් වේ.

2024 පළමුවන පරිපූරක ඡන්දහිමි නාමලේඛණයේ වලංගු ඡන්ද සංඛ්‍යාව පදනම් කරගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 97 හා 98 ව්‍යවස්ථාවන්ට අනුකූලව එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරා පත් කර ගැනීමට හිමිකම් ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාව සම්බන්ධයෙන් නිවේදනය අංක 2393/26 හා 2024.07.17 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

### 2.3.10. 2024 (2) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය

හිමිකම් පරීක්ෂණ අවසන්කර 2024 (2) පරිපූරක නාමලේඛනය 2023.10.01 දින සහතික කරන ලදී.

මෙම පරිපූරක ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව 78,901ක් වේ.

2024 දෙවන පරිපූරක ඡන්දහිමි නාමලේඛණයේ වලංගු ඡන්ද සංඛ්‍යාව පදනම් කරගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 97 හා 98 ව්‍යවස්ථාවන්ට අනුකූලව එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරා පත් කර ගැනීමට හිමිකම් ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාව සම්බන්ධයෙන් නිවේදනය අංක 2415/60 හා 2024.12.20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී.

### 2.3.11. 2024 (3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය

2024.12.31 දින වන විට මෙම පරිපූරක නාමලේඛනයට අදාල බොහෝ කටයුතු අවසන් කර තිබුණි. පෙර සැලසුම් කළ පරිදි 2025.02.01 දින මෙම පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සහතික කිරීමට නියමිතය.

### 2.3.12. 2025 (1), 2025 (2) සහ 2025 (3) පරිපූරක ඡන්දහිමි නාමලේඛන සකස් කිරීම.

2025.02.01 සිට 2025.05.31 දක්වා සකස් කළ යුතු 2025 (1) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය 2025.06.01 සිට 2025.09.30 දක්වා සකස් කළ යුතු 2025 (2) පරිපූරක ඡන්දහිමි නාමලේඛන සහ 2025.10.01 සිට 2026.01.31 දක්වා සකස් කළ යුතු 2025 (3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සඳහා සුදුසුකම් ලබන තැනැත්තන්ගේ විස්තර 2024 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට සමගාමීව එකතු කිරීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරන ලදි.

ඒ අනුව 2024.12.31 දිනට 2025 වර්ෂයට අදාල පරිපූරක නාමලේඛන සඳහා නිර්දේශිත නම් සංඛ්‍යාව පහත දැක්වේ.

| පරිපූරක නාමලේඛනය | නිර්දේශිත නම් සංඛ්‍යාව |
|---|---|
| (1)2025 | 22463 |
| (2)2025 | 20320 |
| (3)2025 | 18488 |

### 2.3.13.පරිපූරක නාමලේඛනවලට අදාල සටහන්

- 2024.02.01 දින සහතික කරන ලද 2023(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනයට අදාලව එක් එක් මැතිවරණ කොට්ඨාස / දිස්ත්‍රික් අනුව ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව (සටහන 15)
- 2024.02.01 දින 2023(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සහතික කළ පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) ව්‍යවස්ථාව අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීන් සංඛ්‍යාව (සටහන 16)

- 2024.07.08 දින සහතික කරන ලද 2024(1) පරිපූරක ඡන්දහිමි නාමලේඛනයට අදාලව එක් එක් මැතිවරණ කොට්ඨාස / දිස්ත්‍රික් අනුව ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව (සටහන 17)
- 2024.07.08 දින 2024(1) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සහතික කළ පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) ව්‍යවස්ථාව අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීන් සංඛ්‍යාව - (සටහන 18)
- 2024.10.01 දින සහතික කරන ලද 2024(2) පරිපූරක ඡන්දහිමි නාමලේඛනයට අදාලව එක් එක් මැතිවරණ කොට්ඨාස / දිස්ත්‍රික් ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව (සටහන 19)
- 2024.10.01 දින 2024(2) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සහතික කළ පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) ව්‍යවස්ථාව අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීන් සංඛ්‍යාව - (සටහන 20)

### 2.4. ඡන්දහිමි නාමලේඛන ක්‍රියාවලිය සඳහා තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම.

ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි විම සඳහා ග්‍රාම නිලධාරී කාර්යාල, මැතිවරණ කාර්යාල වෙත යාම වෙනුවට මාර්ගගත ඉ-සේවාවක් ඔස්සේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කිරීමට මහජනතාවට අවස්ථාව ලබාදෙන ලදී.

එසේම 2021 වර්ෂයේදී හඳුන්වා දුන් සියළු පුරවැසියන් හට ඡන්දහිමි නාමලේඛන තොරතුරු ඇතුළත් ප්‍රකාශයක් තම ජංගම දුරකථනය/ පරිගණකය ඔස්සේ ලබා ගැනීමේ පහසුකම මෙම වසරේ ද එලෙසින්ම ක්‍රියාත්මක විය.

පළමු වසර සඳහා පාසල්වලට සිසුන් ඇතුළත් කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා කලාප /කොට්ඨාස අධ්‍යාපන කාර්යාල වලට නොමිලයේ හා ඉල්ලුම් කරන පාසල් වලට නියමිත ගාස්තු අයකර ඉ-සේවාවක් මගින් ඡන්දහිමියන්ගේ ලියාපදිංචි විස්තර ලබාදීමේ සේවයක් ක්‍රියාත්මක විය.

මැතිවරණ කොමිෂන් සභාවේ ඉ-සේවා පද්ධතිය වැඩිදියුණු කිරීම මගින් මහජනතාව ඇතුළු මැතිවරණ කොමිෂන් සභාවේ පාර්ශවකරුවන් වෙත පහසුවෙන් තම සේවාවන් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසිනි..

ග්‍රාම නිලධාරීන්ගේ මැතිවරණ කොමිෂන් සභාව හා සම්බන්ධ කටයුතු මැතිවරණ ඉ-සේවා හරහා මාර්ගගතව සිදු කිරීමේ පහසුකම් ලබාදුනි.

ආබාධිත පුරවැසියන්ට මැතිවරණ ක්‍රියාවලිය හා සම්බන්ධ පහසුකම් සැලසීම සඳහා මැතිවරණ ඉ-සේවා හරහා පුද්ගලයන්ගේ ආබාධිත බව පිළිබඳ දත්ත රැස්කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී. මෙමගින් මැතිවරණයකදී ඔවුන්ට අවශ්‍ය විශේෂ පහසුකම් සැලසීමට හැකියාව ලැබේ.

#### 2.4.1. ප්‍රතිශෝධනය පිළිබඳව කෙටි පණිවිඩ (SMS) මගින් ජනතාව දැනුම්වත් කිරීම.

2024 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළව මහජනතාව දැනුම්වත් කිරීම සඳහා ඩයලොග්, මොබිටෙල්, එයාර්ටෙල් සහ හච්සන් යන ජංගම සහ CDMA දුරකථන ග්‍රාහකයන් වෙත “Elections” යන ශීර්ෂ පාඨය යටතේ පහත සඳහන් කෙටි පණිවිඩය මුදල් අයකිරීමකින් තොරව 2024.03.08 දින යැවීමට කටයුතු කරන ලදී.

- **සිංහල**
  ඉදිරි ඡන්ද ලේඛන සඳහා 2008.01.31 දිනට පෙර උපන් අය ගණන් ගැනීමට ග්‍රාම නිලධාරී ඔබ නිවසට නොපැමිණියේ නම් වහාම ඔහු විමසන්න. ec.lk/vrd

- **සිංග්ලිෂ්**
  Idiri chanda lekana sandaha 2008.01.31 dinata pera upan aya ganan geneemata grama niladhari oba niwasata nopeminiye nam wahama ohu wimasanna. ec.lk/vrd

- **දෙමළ**

  எதிர்வரும் வாக்காளர் இடாப்புக்காக 2008.01.31 ஆம் திகதிக்கு முன்னர் பிறந்தவர்களைக் கணக்கெடுப்பதற்காக கிராம அலுவலர் உங்களுடைய வீட்டுக்கு வருகைதராவிட்டால் உடனடியாக அவரிடம் விசாரிக்கவும். நஉ.டம.்.எசன

- **ටැංග්ලිෂ්**
  Ethirvarum vakalar idapitkaha 2008.01.31ku munnar piranthavarkalai kanakedupathatkaha grama aluvalar varavittal udanadiyaha avarai thodarpukollavum. ec.lk/vrd

- **ඉංග්‍රීසි**
  Immediately inquire from the Grama Niladhari if he didn’t visit your house to enumerate persons born before 31.01.2008 for the next electoral registers.ec.lk/vrd

2024 ඡන්ද හිමි නාමලේඛනයට නිර්දේශ නොවූ හෝ පදිංචි ලිපිනය වෙනස් කිරීමට අවශ්‍ය එතෙක් නිර්දේශ නොවූ පුරවැසියන් දැනුම්වත් කිරීම සඳහා ඩයලොග්, මොබිටෙල්, එයාර්ටෙල් සහ හච්සන් යන ජංගම සහ CDMA දුරකථන ග්‍රාහකයන් වෙත “Elections” යන ශීර්ෂ පාඨය යටතේ පහත සඳහන් කෙටි පණිවිඩය මුදල් අයකිරීමකින් තොරව 2024.04.29 දින යැවීමට කටයුතු කරන ලදී.

- **සිංහල**

  2007.01.31 දිනට පෙර උපන් පුරවැසියන්, ඡන්ද ලැයිස්තුවේ තමාගේ නම ඇත්දැයි වහාම ග්‍රාම නිලධාරී විමසන්න. ec.lk/vrd

- **සිංග්ලිෂ්**

  2007.01.31 dinata pera upan purawasiyan, chanda leisthuwe thamage nama ethdei vahama grama niladhari wimasanna. ec.lk/vrd

- **දෙමළ**

  2007.01.31 ஆம் திகதிக்கு முன்னர் பிறந்துள்ள பிரஜைகளின் பெயர்கள் வாக்காளர் இடாப்பில் உள்ளதாவென்று உடனடியாக கிராம அலுவலரிடம் விசாரிக்கவும். நஉ.டம.்.எசன

- **ටැංග්ලිෂ්**

  2007.01.31 aam Thihathikku Munner pirandhulla Pirajaihalin peyarhal vaakkalar idappil ulladawendru Udanadiyaha Grama aluwalaridam Visarikkavum. ec.lk/vrd

- **ඉංග්‍රීසි**

  Citizens born before 31.01.2007 immediately enquire the Grama Niladhari if their name is in the electoral register. ec.lk/vrd

මෙම කෙටි පණිවිඩ මඟින් ජනතාව විශාල ලෙස දැනුම්වත් වීමක් සිදු විය. මේ සම්බන්ධයෙන් ඩයලොග් මාධ්‍ය ජාලය, මොබිටෙල් පුද්ගලික සමාගම, භාරතී එයාර් ටෙල් ලංකා සමාගම සහ හච්සන් ටෙලි කොමියුනිකේෂන් ශ්‍රී ලංකා සමාගමට අතිශය කෘතඥතාවය පළ කරමු. එමෙන්ම සම්බන්ධීකරණ කාර්ය භාරය ඉටු කළ ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ද කෘතඥතාවය පළ කරමු.

### 2.5. 2025 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය

2024.07.01 දින සහතික කරන ලද 2024 වර්ෂයේ ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනය; 2024.07.08 දින සහතික කරන ලද 2024(1) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය; 2024.10.01 දින සහතික කරන ලද 2024(2) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සමග 2024.02.01 දින සහතික කිරීමට නියමිත 2024(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සඳහා නිර්දේශිත නම් ඒකාබද්ධ කර 2025 වර්ෂය සඳහා ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා ඒකාබද්ධ ලැයිස්තු සකස් කරන ලදී.

2025 වර්ෂයේ ඡන්දහිමියන් ගණන් ගැනිම සඳහා ගණන් ගැනීමේ නිලධාරීන් ගෙයින් ගෙට නොයැමට හා 'අ' හා 'ආ' ලැයිස්තු යාවත්කාලීන කිරීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම මඟින් ප්‍රතිශෝධන කාර්යයන් සිදු කිරීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරන ලදී.

ඒ අනුව ඒකාබද්ධ ලැයිස්තුවට පදිංචිය වෙනස්වීම නිසා හෝ වයස සම්පූර්ණ වීම නිසා හෝ වෙනත් යම් හේතුවක් මත ඇතුළත් විය යුතු නම් ඇතුළත් කිරීමටත්, මියයාම, පදිංචිය හැරයාම හෝ යම් නුසුදුසුකමකට ලක්වන නම් ඉවත් කිරීමටත් ගණන් ගන්නා නිලධාරීන්ට උපදෙස් ලබාදීමට තීරණය කරන ලදී. එවැනි අවස්ථාවක දී 2025/ER ආකෘතිය ගෘහ මූලිකයා විසින් සම්පූර්ණ කර ගණන් ගන්නා නිලධාරියාට භාරදිය යුතු අතර, අනෙක් අවස්ථාවලදී එම එකාබද්ධ ලැයිස්තුවේ සඳහන් ලිපිනය යටතේම ඡන්දහිමියන් 2025 සඳහා ලියාපදිංචි කරනු ලැබේ.

2025 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය සිදු කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් හා ප්‍රතිශෝධන කාල සටහන ඇතුළත් චක්‍රලේඛය 2024.12.17 දින සියලුම දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ නිලධාරීන් හා සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරීන් වෙත නිකුත් කරන ලදී.

2025 වර්ෂයේ ඡන්දහිමියන් ගණන් ගන්නා ක්‍රමවේදය හා ප්‍රතිශෝධනය සඳහා පක්ෂ නියෝජිතයන් පත්කිරීමට අදාළ උපදෙස් 2024.12.30 වන දින සියලුම පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන් වෙත නිකුත් කරන ලදී.

### 2.6. පාර්ලිමේන්තු මන්ත්‍රිධුර පුරප්පාඩු පිරවීම.

අංක 19 බදුල්ල මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද ලොකුගස්තොට විතාරණගේ චමින්ද විජේසිරි මහතා ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව සඳහා වාසලතිලක ගෙදර නයන ප්‍රියංකර වාසලතිලක මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක: 2366/26 හා 2024.01.11 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

අංක 16 පුත්තලම මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද සනත් නිශාන්ත මහතා මියයාම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව සඳහා ඇල්.කේ. ජගත් ප්‍රියංකර මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක: 2369/08 හා 2024.01.30 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

අංක 17 අනුරාධපුර මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද එච්. නන්දසේන මහතා මියයාම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව සඳහා ඇම්.ජී. වීරසේන මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක: 2378/34 හා 2024.04.05 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද ඩයනා ගමගේ මහත්මියගේ මන්ත්‍රී ධූරය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66 (ඇ) ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු 91 (1) (ඇ) (xiii) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වීම සඳහා නුසුදුස්සෙකු වන බවත්, ඒ අනුව මන්ත්‍රී ධූරයක් දැරීමට හිමිකමක් නොමැති බවත් අංක S.C. Appeal No. 11/2024 දරන අයදුම්පත්‍රය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරනු ලැබ ඇති හෙයින් ඇති වූ පුරප්පාඩුව සඳහා මොහොමඩ් මුජිබර් රහුමාන් මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක: 2383/32 හා 2024.05.09 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

අංක 14 ත්‍රිකුණාමලය මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද ඉරාජවරෝදයම් සම්බන්දන් මහතා මියයාම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව සඳහා කදිරවේලු සන්මුගම් කුහදාසන් මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක: 2391/14 හා 2024.07.02 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

අංක 07 ගාල්ල මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද මලිගස්පේ කෝරලේගේ නලින් මනුෂ නානායක්කාර මහතා පක්ෂයෙන් පහකිරීමට එරෙහිව ඔහු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු කරන ලද අංක SC/(EXPULSION) No. 02/2023 දරන පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිශ්ප්‍රභා කිරීම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව සඳහා බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක: 2397/34 හා 2024.08.14 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

අංක 21 රත්නපුර මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද තලතා අතුකෝරල මහත්මිය ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව සඳහා කරුණාරත්න පරණවිතානගේ මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක: 2399/34 හා 2024.08.28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

අංක 01 කොළඹ මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද අනුර කුමාර දිසානායක මහතා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා ලෙස එම ධූරය 2024 සැප්තැම්බර් මස 23 වන දින සිට භාර ගන්නා ලද හෙයින් ඔහු විසින් ස්වකීය මන්ත්‍රී ධූරයෙන් ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩු සඳහා ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක: 2403/01 හා 2024.09.23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

## 2.7. ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ ඡන්ද විමසීම - 2024.09.21

2019 නොවැම්බර් මස 16 පැවති ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ ඡන්ද විමසීමේ දී, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 56 (2) වගන්තිය යටතේ ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත්කර ගන්නා ලද ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් තම ධූර කාලය අවසන් වීමට පෙර 2022 ජූලි මස 14 දින ඉල්ලා අස්වීම නිසා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 40 වන ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුව මඟින් 2022 ජූලි මස 22 දින රනිල් වික්‍රමසිංහ මහතා තෝරා පත්කර ගැනීමෙන් අනතුරුව ඔහු විසින් ජනාධිපති ධූරය භාරගන්නා

ලදී. පූර්වගාමී ජනාධිපතිවරයාගේ ඉතිරි ධූර කාලය 2024 නොවැම්බර් මස 17 දින අවසන් වන බැවින් හා ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම සඳහා ඡන්ද විමසීම, ධූරය දරන ජනාධිපතිවරයාගේ ධූරකාලය ඉකුත් වීමට පෙර මාසයකට අඩු නොවන හා මාස දෙකට වැඩි නොවන කාලසීමාවක් තුළ පැවැත්විය යුතු යැයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාවෙන් නියම වී ඇත. ඒ අනුව මැතිවරණ කොමිෂන් සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ දෙවැනි වගන්තිය යටතේ වූ දැන්වීම මැතිවරණ කොමිෂන් සභාව විසින් 2024.07.26 දින අංක: 2394/51 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අතර එම දැන්වීම මඟින් නාම යෝජනා භාර ගැනීම 2024.08.15 වන දිනට හා ඡන්ද විමසීම පැවැත්වීම 2024.09.21 දිනට නියම කරන ලදී. 2024 සැප්තැම්බර් මස 21 දින පැවැත්වීමට නියමිත වූ නමවන ජනාධිපතිවරණයට අදාළ මූලික සංවිධාන කටයුතු 2024 වර්ෂයේ ජූලි මාසයේදී ආරම්භ කිරීමට පියවර ගන්නා ලදී.

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 2 වගන්තිය යටතේ නියමය පළ කරන ලද දිනය වූ 2024.07.26 දිනයත් නාමයෝජනා කිරීමේ දිනය වූ 2024.08.15 දිනයට පෙර දිනය වූ 2024.08.14 දින මධ්‍යාහ්න දොළහට පෙර අතර වූ කාලය තුළ කාර්යාල දිනවල දී (සෙනසුරාදා හා ඉරිදා හැර) පෙ.ව. 8.30 සිට ප.ව. 4.15 දක්වා ද 2024.08.14 වන දිනයේ දී පමණක් පෙ.ව. 8.30 සිට මධ්‍යාහ්න 12.00 දක්වා ද ජනාධිපතිවරණය සඳහා අපේක්ෂකයෙකු විසින් හෝ අපේක්ෂකයෙකු වෙනුවෙන් යම් තැනැත්තෙකු විසින්, මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ දී ඇප වශයෙන් මුදල් තැන්පත් කළ යුතු විය. ඒ අනුව නියමිත කාලය තුළ පිළිගත් දේශපාලන පක්ෂ නියෝජනය කරමින් අපේක්ෂකයින් විසි දෙදෙනෙකු සහ වෙනත් දේශපාලන පක්ෂ නියෝජනය කරමින් හා ඡන්ද හිමියකු විසින් නාමයෝජනා කළ අපේක්ෂකයින් දහඅට දෙනෙකු සඳහා ඇප මුදල් තැන්පත් කරන ලදී.

නාමයෝජනා භාරගැනීම 2024.08.15 දින රාජගිරිය මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ දී සිදු කරන ලද අතර, නියමිත කාලය තුළ ඇප මුදල් තැන්පත් කරන ලද අපේක්ෂකයන් හතලිස් දෙනා අතරින්, තිස්නව දෙනෙකු විසින් නාමයෝජනා පත්‍ර මැතිවරණ කොමිෂන් සභාව වෙත ඒ සඳහා නියම කරන ලද වේලාව තුළ භාර දීම සිදු කෙරිණි. නාමයෝජනා භාර ගැනීමෙන් පසුව මැතිවරණ කොමිෂන් සභාව විසින් එම නාමයෝජනා පත්‍ර පරීක්ෂා කර, ඒවා පිළිගන්නේද නැතිද යන්න ප්‍රකාශ කිරීම කළ යුතු විය. ඒ අනුව භාරදෙන ලද සියලුම නාමයෝජනා පත්‍ර 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනතේ විධිවිධානවලට අනුකූලව භාරදී තිබූ බැවින් සියලුම නාමයෝජනා පත්‍ර පිළිගනු ලැබූ බව මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රකාශ කරන ලදී. 2024.08.15 දින පෙ.ව. 9.00 සිට පෙ.ව. 11.30 දක්වා විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා කාලය වෙන් කර තිබූ අතර විරෝධතා 03 ක් ඉදිරිපත් වී තිබුණි.

ශ්‍රී ලංකා ඉතිහාසයේ ජනාධිපතිවරණයක් වෙනුවෙන් වැඩිම අපේක්ෂකයන් සංඛ්‍යාව වූ, අපේක්ෂකයන් තිස්නව දෙනෙකු මෙම ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වීම හේතුවෙන් ඡන්ද පත්‍රිකාව දිගින් වැඩි කිරීමට සිදුවිය. ඒ අනුව ඡන්ද පත්‍රිකාව අඟල් 27 ක් පමණ දිගින් යුක්තව මුද්‍රණය කරන ලදී. ඡන්ද පත්‍රිකාවේ විශාලත්වය සැලකිල්ලට ගනිමින් මෙවර ද කාඩ්බෝඩ් ඡන්ද පෙට්ටි ඡන්ද පොළ වෙත ලබාදීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

2024 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය 2024 ජූලි මස 01 දින හා 2024 පළමු පරිපූරකය 2024 ජූලි මස 08 දින සහතික කිරීමට පියවර ගත් බැවින් ජනාධිපතිවරණය සඳහා 2024 ප්‍රධාන නාමලේඛනය සමඟ 2024 පළමු පරිපූරක නාමලේඛනය ද යොදාගත හැකි විය. ඒ නිසාම 2024.02.01 දින සිට 2024.05.31 දක්වා කාලය තුළ වයස සම්පූර්ණ කළ 76093 ක් වූ යොවුන් ඡන්දහිමියන්ට මෙම ඡන්ද විමසීමේ දී ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව උදාවිය. 2024 වර්ෂයේ ඒකාබද්ධ ඡන්දහිමි නාමලේඛනයට අනුව ඡන්දහිමියන්ගේ සංඛ්‍යාව 17,140,354 කි. ඡන්ද කොට්ඨාස 13,314 ක් වූ අතර, ගැහැණු ඡන්ද දායිකාවන් සඳහා වෙන්කරන ලද ඡන්ද පොළවල් සමඟ මුළු ඡන්ද පොළවල් සංඛ්‍යාව 13,421 ක් විය.

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 2 වගන්තිය යටතේ 2024.07.26 දින නිකුත් කල ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම අනුව අදාළ පනතේ 23 (2) වගන්තියට අනුව ඡන්ද විමසීම් රාජකාරිවලට සම්බන්ධ වන රජයේ නිලධාරීන් ඇතුළු සුදුසුකම් ලැබූ තැනැත්තන් සඳහා තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම් සැලසිය යුතුව තිබුණි. ඒ අනුව තැපැල් ඡන්ද ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමට 2024.08.05 දක්වා නියමිතව තිබූ කාලය තැපෑලේ දී සිදු විය හැකි ප්‍රමාදවීම් සහ මැතිවරණ කොමිෂන් සභාව වෙත කරනු ලැබූ ඉල්ලීම් සැලකිල්ලට ගෙන 2024.08.09 දින දක්වා දින හතරකින් දීර්ඝ කරන ලදී. මෙම ඡන්ද විමසීම වෙනුවෙන් තැපැල් ඡන්ද අයදුම්පත් 736,589 ක් අතරින් පිළිගත් තැපැල් ඡන්ද අයදුම්පත් සංඛ්‍යාව 712,319 ක් විය.

තැපැල් ඡන්ද නිකුත් කිරීම හා තැපැල් දෙපාර්තමේන්තුවට රක්ෂණ පැකැට්ටු භාරදීම 2024.08.26 සිදුකරන ලදී. සහතික කිරීමේ නිලධාරීන්ගේ කාර්යාලවලදී තැපැල් ඡන්ද සලකුණු කිරීම සඳහා 2024 සැප්තැම්බර් මස 05 හා 06 යන දෙදින වෙන් කරන ලද අතර, ඒ දිනවලට සලකුණු කළ නොහැකි වූ තැපැල් ඡන්ද පත්‍රිකා අඩංගු පැකැට්ටු සහතික කිරීමේ නිලධාරී කාර්යාල පිහිටි දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරීන් භාරගෙන ඒවා සලකුණු කිරීම සඳහා අදාළ ඡන්දහිමියන් ලියාපදිංචි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාලවල වෙත යවා 2024 සැප්තැම්බර් මස 11 හා 12 යන දිනවලදී පහසුකම් සලසන ලදී.

සාමාන්‍ය ඡන්ද පොලකදී මෙන්ම තැපැල් ඡන්ද ප්‍රකාශ කිරීමට පෙර තැපැල් ඡන්ද හිමියා විසින් සිය අනන්‍යතාවය තහවුරු කිරීම සිදුකල යුතුවේ. ඒ අනුව පසුගිය ජනාධිපතිවරණයේදී මෙන්ම ජාතික හැඳුනුම්පත, වලංගු රියදුරු බලපත්‍රය, වලංගු විදේශ ගමන් බලපත්‍රය, ජාතික හැඳුනුම්පත වෙනුවට පුද්ගලයන් ලියාපදිංචිකිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන තොරතුරු තහවුරු කිරීමේ ලිපිය හෝ මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන තාවකාලික හැඳුනුම්පත මෙම කාර්යය වෙනුවෙන් වලංගු හැඳුනුම්පත් ලෙස මැතිවරණ කොමිෂන් සභාව විසින් සලකන ලදී. කෙසේ වුවද යම් තැපැල් ඡන්ද හිමියෙකු විසින් රාජකාරී හැඳුනුම්පත ඉදිරිපත් කරන්නේ නම්, එවැනි අයගේ අනන්‍යතාවය තහවුරු කරගැනීම, අධීක්ෂණ කටයුතු සඳහා තේරීම්භාර නිලධාරීන් විසින් පත්කර ඇති නිලධාරීන්ගේ වගකීමක් විය.

1988 අංක 16 දරන පනතින් සංශෝධනය කරන ලද 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 119 ආ වගන්තිය යටතේ තමාගේ ඡන්ද මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශයේ පවතින තත්ත්වය හේතුකොට ගෙන, එම ඡන්ද මධ්‍යස්ථානයට ගොස් තමාගේ ඡන්දය දීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති ඡන්ද හිමියන්ට වෙනත් ඡන්ද මධ්‍යස්ථානයකදී ඡන්දය දීම සඳහා පහසුකම් සලසා දෙන ලෙස, නාමයෝජනා දැන්වීමේ දින සිට දින 7ක් ඇතුළත දී ඉල්ලුම් කළ හැකිය. එවැනි ඡන්ද දායකයන්ට ඡන්දය දීම සඳහා වැඩ පිළිවෙලක් සැකසිය හැකි බව දන්වමින් 2024 ජූලි මස 26 දින පුවත්පත්වල සහ www.elections.gov.lk යන වෙබ් අඩවියේ දැන්වීමක් පළකරන ලද අතර ඒ සඳහා අයදුම්පත් 2024.08.01 දින දක්වා මැතිවරණ කොමිෂන් සභාව විසින් භාරගන්නා ලදී.ඒ අනුව 2024 අගෝස්තු මස 01 දින හෝ ඊට පෙර මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය වෙත අයදුම්පත්‍ර 10 ක් ලැබී තිබූ අතර, ඒවා සියල්ල පනත ප්‍රකාරව ඉදිරිපත් කර නොතිබූ බැවින් ප්‍රතික්ෂේප කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී.

2014 අංක 14 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනතට අනුව ඡන්ද විමසීමක දී ඡන්ද පත්‍රිකාවක් නිකුත් කිරීමට පෙර ඡන්ද දායකයා ජාතික හැඳුනුම්පත අනුව හඳුනාගත යුතු වේ. එහෙත් කිසිඳු බාධාවකින් තොරව ජාතික හැඳුනුම්පත මහජනතාව වෙත ලබාගැනීමට අවශ්‍ය පහසුකම් සලසන තෙක් හා සියලුම ඡන්දදායකයන් වෙත ජාතික හැඳුනුම්පත් නිකුත් කර අවසන් වන තෙක් වෙනත් අනන්‍යතා ලේඛන ද ඡන්ද විමසීමේ කාර්යය සඳහා පිළිගැනීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කෙරිණි. ඊට අමතරව ජාතික හැඳුනුම්පත හෝ වෙනත් අනන්‍යතා ලේඛනයක් නොමැති ඡන්දදායකයන්

වෙත මැතිවරණ කොමිෂන් සභාව විසින් තාවකාලික හැඳුනුම්පත් නිකුත් කිරීමටත්, පසුගිය ඡන්ද විමසීම් සඳහා නිකුත් කරන ලද තාවකාලික හැඳුනුම්පත් නැවත වලංගුකොට ලබාදීමටත් කටයුතු කරන ලදී.

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 24 වගන්තියට අනුව ලියාපදිංචි සියලුම ඡන්දහිමියන් වෙත නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් යැවිය යුතු වේ. ඒ අනුව ඡන්දහිමියන්ගේ ලියාපදිංචි විස්තර හා ඡන්දපොළට අදාළ විස්තර සටහන් කරන ලද නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා ඡන්දහිමියන් වෙත බෙදා හැරීම සඳහා 2024 සැප්තැම්බර් මස 02 දින තැපැල් දෙපාර්තමේන්තුව වෙත භාරදෙන ලදී. ඡන්ද විමසීමේ දී තැපැල් ඡන්ද හිමියන්ගේ නම් වලට අදාළව නිල දැන්වීම් පත්වල තැපැල් ඡන්දහිමියන් බවට වූ සටහන් සහිත මුද්‍රාවක් තබා ඒවා භාරදෙන ලදී. ඡන්ද පොළභාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වෙත ලබා දී තිබූ ඡන්දහිමි නාමලේඛනවලද තැපැල් ඡන්දහිමියන් හඳුනාගැනීමට හැකි ආකාරයට සලකුණු සටහන් කර යවන ලද අතර, ඒ තුළින් හොර ඡන්ද දැමීම වැළැක්වීම අපේක්ෂා කරන ලදී. නිල ඡන්ද දැන්වීම් පත් බෙදීමේ විශේෂ දිනය ලෙස 2024 සැප්තැම්බර් මස 08 දින වෙන්කළ අතර, 2024 සැප්තැම්බර් මස 14 දින ඒවයේ අවසන් බෙදීම සිදුකරන ලදී.

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් තහවුරු කිරීම සඳහා අවශ්‍ය පියවර වශයෙන්,

- සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන වෙත මාධ්‍ය උපමාන නිකුත් කිරීම.
- රාජ්‍ය සම්පත් අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සඳහා සියලුම රාජ්‍ය ආයතන වෙත ලිඛිත දැන්වීම් කිරීම.
- මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ සහ සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරි කාර්යාලවල පැමිණිලි භාර ගැනීමේ මධ්‍යස්ථාන විවෘත කර, ඒවාට වගකිව යුතු නිලධාරීන් පත්කර, පැමිණිලි භාරගැනීම හා ඒ සඳහා ක්ෂණික විසඳුම් ලබාදීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- දේශපාලන පක්ෂ හා සියලු අපේක්ෂකයින් සඳහා ආචාරධර්ම පද්ධතියක් හඳුන්වා දීම.
- මැතිවරණ රාජකාරී සඳහා පත් කරනු ලබන පොලිස් නිලධාරීන්ට මඟ පෙන්වීම සඳහා උපදෙස් මාලාවක් පොලිස්පතිවරයා මාර්ගයෙන් ලබාදීම ආදී ක්‍රියාමාර්ග ගන්නා ලදී.

### 2.7.1. නිවේදිත ඡන්ද කාර්යාල පිහිටුවීම

ජනාධිපතිවරණය තරඟ කරනු ලබන අපේක්ෂකයන්ට, මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරීට හා පොලිස් බල ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිවරයාට ද දැනුම් දී පවත්වගෙන යාමට ඉඩ දී ඇති කාර්යාල නිවේදිත ඡන්ද කාර්යාල වේ. ප්‍රධාන වශයෙන් නිවේදිත ඡන්ද කාර්යාල වර්ග, ඒ ඒ නිවේදිත ඡන්ද කාර්යාලවලට අදාළ නෛතික තත්ත්වය පහදාදීම, නිවේදිත ඡන්ද කාර්යාල පිහිටුවීමට අදාළ උපදෙස් හා ඉල්ලුම් පත්‍ර අඩංගු ලිපියක් මැතිවරණ කොමිෂන් සභාව විසින් සියලුම ජනාධිපති අපේක්ෂකයන් ඇතුළු ඡන්ද නියෝජිතයන් හා බලයලත් නියෝජිතයන් වෙත නිකුත් කරන ලදී. මෙම උපදෙස් ලිපිය මඟින් නිවේදිත කාර්යාලවල ප්‍රචාරක පුවරු, ධජ, අපේක්ෂකයාගේ ඡායාරූප වැනි දෑ ප්‍රදර්ශනය කිරීමේ දී අනුගමනය කළ යුතු පියවර පිළිබඳව දැනුම් දෙනු ලැබූ අතර, බලයේ සිටින කණ්ඩායම් විසින් රජයට අයත් භූමි ප්‍රදේශ, ආයතන වැනි පොදු ස්ථාන මැතිවරණ ප්‍රචාරක කටයුතුවලට අයුතු ලෙස යොදාගැනීම වැළැක්වීම සඳහා රජය/ පළාත් සභා/ පළාත් පාලන ආයතන/ රාජ්‍ය සංස්ථා හෝ මණ්ඩල සතු ගොඩනැගිල්ලක, ඉඩමක, නිල නිවසක, රක්ෂිතයක පෙර කී කිසිඳු කාර්යාලයක් ස්ථාපිත කළ නොහැකි බවද දන්වන ලදී. යම්කිසි අපේක්ෂකයකුගේ කාර්යාලයක වෙනත් අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන අයුරින් හෝ පාර්ශ්වයන්ට අගතියක් වන අයුරින් ප්‍රචාරක කටයුතු කිරීම වැනි නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් ද, ඍජුවම ඡන්ද විමසීම හා සම්බන්ධ රාජ්‍ය

ආයතනයක් ආසන්නයේ නිවේදිත ඡන්ද කාර්යාලයක් පිහිටුවීමේ දී අනුගමනය කළ යුතු නියමිත දුර ප්‍රමාණයන්ද දන්වමින් එක් පක්ෂයකට, කණ්ඩායමකට මෙම කාර්යාල පිහිටුවීමේදී වාසි සහගත තත්ත්වයක් ඇතිවීම හැකිතාක් අවම කිරීමටද කටයුතු කරන ලදී.

ඉහත සඳහන් ආකාරයේ කොන්දේසි හා නියමයන් පැනවීමට සිදුව ඇත්තේ ඡන්ද විමසීම් කාලසීමාව තුළ ඡන්ද විමසීම් හා බැඳි ගැටුම්, පහරදීම්, තුවාල කිරීම්, මනුෂ්‍ය ඝාතන හා දේශපාලන පළිගැනීම් වැනි නොමනා ක්‍රියා හා මහජනතාවට ඇති විය හැකි අවහිරතා වැළැක්වීම සඳහා මෙන්ම, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය වාතාවරණය ඇති කිරීම සඳහාය.

### 2.7.2. 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත

2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 03 වන වගන්තිය ප්‍රකාරව 2024 ජනාධිපතිවරණ ඡන්ද විමසීම සඳහා තරඟ කරනු ලබන අපේක්ෂකයන් හා ඔවුන්ගේ ඡන්ද නියෝජිතයන් හෝ ඔවුන් නාමයෝජනා කළ තැනැත්තන් සමග මැතිවරණ කොමිෂන් සභාව සාකච්ඡා කරන ලදී. මෙලෙස අපේක්ෂකයන්ගේ සහ ඔවුන් නාමයෝජනාකල පුද්ගලයන්ගේ අදහස් විමසීමෙන් අනතුරුව ජනාධිපතිවරණය සඳහා තරඟකරනු ලබන අපේක්ෂකයන්ගේ මැතිවරණ ප්‍රචාරක කටයුතු වෙනුවෙන් පිළිගත් දේශපාලන පක්ෂයක්, වෙනත් දේශපාලන පක්ෂයක් හෝ අපේක්ෂකයා නාමයෝජනා කළ ලියාපදිංචි ඡන්ද හිමියෙකු සහ අපේක්ෂකයෙකු විසින් වැයකළ යුතු වියදම් සීමා මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබ ඒ සම්බන්ධ දැන්වීම 2397/66 හා 2024.08.16 දිනැතිව ගැසට් පත්‍රයේ පළකරන ලදී. මෙම වියදම් සීමාව ගණනය කිරීම සඳහා වන සූත්‍රය මැතිවරණ කොමිෂන් සභා සාමාජික මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා විසින් සකස් කරන ලදී.

ඒ අනුව තරඟ කරනු ලබන එක් අපේක්ෂකයෙකු වෙනුවෙන් වලංගු ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි එක් ඡන්ද හිමියෙකු සඳහා රුපියල් 109.00 කට නොවැඩි මුදලක් තම ප්‍රචාරක වියදම් ලෙස වියදම් කළ හැකි විය. ඒ අනුව එක් අපේක්ෂකයෙකුට තම ප්‍රචාරක වියදම් වෙනුවෙන් වියදම් කළ හැකි උපරිම වියදම් සීමාව රු. 1,868,298,586.00 ක් වේ. එහිදී තරඟකරනු ලබන අපේක්ෂකයෙකුට එකී මුදලින් 60% හෙවත් රු.1,120,979,151.60 ක මුදලක් හා දේශපාලන පක්ෂයකට හෝ නාමයෝජනා කළ ඡන්ද හිමියාට එකී මුදලින් 40% හෙවත් රු. 747,319,434.40 ක මුදලක් අදාළ ප්‍රචාරක වියදම් ලෙස වැය කළ හැක.

මැතිවරණ වියදම් ඇතුළත් වියදම් වාර්තාව, ජනාධිපතිවරණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර දින 21 ක් ඇතුළත නාමයෝජනා කළ දේශපාලන පක්ෂය හෝ ඡන්ද හිමියා සහ අපේක්ෂකයා වෙන වෙනම සකස් කොට සහතික කර මැතිවරණ කොමිෂන් සභාව වෙත භාරදිය යුතුවේ. මෙම වියදම් වාර්තා ලැබී දින 10 ඇතුළත, එකී වාර්ථා ලැබී ඇති බවත්, ඒවා මැතිවරණ කොමිෂන් සභාවේ දී යම් තැනැත්තෙකුට පරීක්ෂා කර බැලිය හැකි බවත්, අවශ්‍ය අයට එම වාර්තාවල පිටපත් ලබා ගත හැකි ආකාරයත් සඳහන් කරමින් පුවත්පත් දැන්වීමක් පළකරන ලදී.

ඒ අනුව නියමිත කාලය තුළ අපේක්ෂකයන් 35 ක් සහ අපේක්ෂකයන් නාමයෝජනා කළ දේශපාලන පක්ෂ හෝ නාමයෝජනා ඉදිරිපත් කළ ලියාපදිංචි ඡන්ද හිමියන් 28 ක් විසින් සිය වියදම් ප්‍රකාශ මැතිවරණ කොමිෂන් සභාව වෙත භාරදෙන ලදී. මෙම වාර්තා ලැබීමෙන් පසු ඒවා සියල්ල පරිලෝකනය කර මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියට ද ඇතුළත් කර ඇති අතර, අවශ්‍ය අයෙකුට පරිශීලනය කළ හැක. සිය මැතිවරණ වියදම් වාර්තා නිසි පරිදි භාරදී නොමැති අපේක්ෂකයන් 03 හා අපේක්ෂකයන් නාමයෝජනා කළ දේශපාලන පක්ෂ/ ලියාපදිංචි ඡන්ද හිමියන් 10 පිළිබඳව ශ්‍රී ලංකා පොලීසියට පැමිණිලි කිරීමෙන් අනතුරුව ඔවුනට එරෙහිව නීතිමය කටයුතු ආරම්භ කර ඇත.

### 2.7.3. නොමිලයේ ප්‍රචාරණ පහසුකම් සැලසීම

තරඟකරනු ලබන අපේක්ෂකයන් සඳහා ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 117 (1) වන වගන්තිය අනුව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මඟින් එක් අපේක්ෂකෙයකුට විනාඩි 45 බැගින් නොමිලයේ ප්‍රචාරණ පහසුකම් ලබාදෙන ලදී. එයට අමතරව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින්ද සිය ප්‍රතිපත්ති ජනතාව වෙත ඉදිරිපත් කිරීම සඳහා තරඟකරනු ලබන එක් අපේක්ෂකයකු වෙනුවෙන් පැය 1 ක ගුවන් කාලයක් වෙන්කර දෙන ලදී. නමුත් ඇතැම් අපේක්ෂකයන් විසින් මෙම පහසුකම භාවිත නොකරන ලදී.

### 2.7.4. ඡන්ද විමසීම නිරීක්ෂණය කිරීම

ඡන්ද විමසීමේ සහ ඡන්ද ගණන් කිරීමේ කටයුතු නිරීක්ෂණය සඳහා දේශීය/ විදේශීය නිරීක්ෂණ ආයතන සඳහා අවස්ථාව සලසා දෙන ලදී.

දේශීය නිරීක්ෂණ සංවිධාන අතරින් නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (PAFFREL) හා මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) යන සංවිධානවලට ඡන්ද පොළ අවට මෙන්ම ඡන්දපොළ තුළ ද නිරීක්ෂකයන් රඳවා තබමින් නිරීක්ෂණ කටයුතු කිරීමට අවසර ලබාදුන් අතර, තවත් දේශීය නිරීක්ෂණ සංවිධාන අටක් වෙනුවෙන් ඡන්ද පොළින් පිටත සිට නිරීක්ෂණ කටයුතු කිරීමට නිරීක්ෂකයින් යෙදීම සඳහා අවස්ථාව සලසන ලදී. තේරීම්භාර නිලධාරී කාර්යාලවලදී ඡන්ද ගණන් කිරීමේ කටයුතු මෙන්ම ප්‍රතිඵල වගුගත කිරීමේ කටයුතු නිරීක්ෂණයට ද නිරීක්ෂණ සංවිධානවලට ඉඩසලසන ලදී. ඊට පරිබාහිරව මැතිවරණ කොමිෂන් සභාවේ අවසන් ප්‍රතිඵලය සකස් කිරීමේ කටයුතු නිරීක්ෂණයට ද නිරීක්ෂණ සංවිධානවලට අවසර ලබාදෙන ලදී.

විදේශීය නිරීක්ෂණ සංවිධාන වශයෙන් ඉන්දියාව, රුසියාව, පිලිපීනය, භූතානය, මාලදිවයින, බංගලාදේශය සහ නේපාලය යන රටවලින් නිරීක්ෂකයන් සෘජුවම මැතිවරණ කොමිෂන් සභාවේ සම්බන්ධීකරණයෙන් සහභාගී විය. එයට අමතරව යුරෝපා සංගමය, ආසියානු මැතිවරණ නිරීක්ෂණ ජාලය හා පොදුරාජ්‍ය මණ්ඩලීය නිරීක්ෂණ කණ්ඩායම් ඡන්ද විමසීම් දිනයට පූර්වයේ සිටම තම නිරීක්ෂණ කටයුතු ආරම්භ කරන ලදී. ජනාධිපතිවරණය ප්‍රකාශයට පත්කළ අවස්ථාවේ සිටම එම සංවිධාන නියෝජනය කරමින් දිගුකාලීන නිරීක්ෂකයන් මෙරට රැඳීසිටි අතර, ඡන්ද විමසීම් දිනය ආසන්න වනවිට එම නිරීක්ෂකයන් ප්‍රමාණය ක්‍රමයෙන් වැඩිකරන ලදී.

ජනාධිපති ධූර අපේක්ෂකයෙකු ලෙස නාමයෝජනා භාරදෙන ලද, අයිඩෲස් මොහමඩ් ඉල්යාස් මහතා 2024 අගෝස්තු මස 22 දින මිය ගිය අතර, එම අපේක්ෂකයා නාමයෝජනා කළ තැනැත්තා වන කේ.එම්.එන්. සංජය සම්පත් රේමන් මහතා වෙත වෙනත් සුදුසුකම් සම්පූර්ණ කල අපේක්ෂකයෙකු නාමයෝජනා කරන ලෙස 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 22 (1) උපවගන්තිය අනුව විධාන කළ ද, වෙනත් සුදුසු අපේක්ෂකයෙකු නාමයෝජනා කිරීමට කටයුතු නොකල බැවින්, පනතේ 22(1) (ආ) උප වගන්තිය අනුව ඡන්ද පත්‍රිකාව සහ ඡන්ද විමසීමට අදාළ සෙසු සියලු ලේඛනවලින් මියගිය අපේක්ෂකයාගේ නම ඉවත් කරනු ලැබ ඇත්තාක් මෙන් සලකණු ලැබූ අතර අයිඩෲස් මොහමඩ් ඉල්යාස් මහතාට ඡන්දය ලකුණු කර ඇත්නම්, එය ප්‍රතික්ෂේපිත ඡන්දයක් ලෙස සලකා කටයුතු කරන ලෙස සියළුම ගණන් කිරීමේ නිලධාරීන් දැනුම්වත් කරන ලදී.

එසේම 2024 ජනාධිපතිවරණයට අදාළව සිදු කළ යුතු ඉදිරි කටයුතු පිළිබඳව උපදෙස්/ චක්‍රලේඛ සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් හා නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත යැවීමට කටයුතු කරන ලද අතර, මෙම මූලික කටයුතුවලට සහායවීම සඳහා මැතිවරණ කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලය ඇතුළු සියලුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට අවශ්‍ය වන ප්‍රමාණයට විශ්‍රාමික නිලධරයන්/ අනියම් සේවකයින් බඳවා ගැනීමට කටයුතු කරන ලදී. එසේම, මැතිවරණය පැවැත්වීමේ

කටයුතු සඳහා අවශ්‍ය වන සියලුම ලිපි ලේඛන/ ආකෘති ද මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී. එසේම ඡන්ද විමසීම්, ඡන්ද ගණන් කිරීම් හා ප්‍රතිඵල ප්‍රකාශ කිරීම් සම්බන්ධ සියලුම ලිපි ලේඛන/ ඡන්ද පත්‍රිකා/ කාඩ්බෝඩ් ඡන්ද පෙට්ටි/ ඡන්ද කුටි ඒ ඒ අංශය මඟින් නියමිත දින වකවානුව තුල සියලුම දිස්ත්‍රික් කාර්යාලවලට ලබාදීමට කටයුතු කරන ලදී.

ඡන්ද විමසීම හා ගණන් කිරීමේ කාර්යය සඳහා රජයේ දෙපාර්තමේන්තු/ ආයතනවල සේවයේ නියුතු නියමිත සුදුසුකම් සපුරන ලද රාජ්‍ය නිලධාරීන් යොදවනු ලැබීය. ඡන්ද ගණන් කිරීම ගණන් කිරීමේ පරිශ්‍ර 49 කදී ගණන් කිරීමේ මධ්‍යස්ථාන 1713 කදී සිදුකරන ලද අතර, එම සංඛ්‍යාවෙන් 439ක් තැපැල් ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන විය.

ඡන්ද විමසීම සඳහා අවශ්‍ය බඩුබාහිරාදිය සහ නිලධාරීන් ඡන්ද මධ්‍යස්ථාන වෙත පිටත්කර යැවීම 2024 සැප්තැම්බර් මස 20 දින සිදුකරන ලද අතර, ඊට පසු දින එනම්, 2024 සැප්තැම්බර් මස 21 දින ඡන්ද විමසීම අවසන් කොට ඡන්ද පෙට්ටි සියල්ල ගණන් කිරීමේ මධ්‍යස්ථාන වෙත ලැබීමෙන් පසුව මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් පරිදි ඡන්ද ගණන් කිරීමට අදාළ කටයුතු සිදුකොට ප්‍රතිඵලය මැතිවරණ කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම තේරීම්භාර නිලධාරීන්ගේ වගකීම විය. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් ඡන්ද ප්‍රදේශ මට්ටමේ සහ දිස්ත්‍රික් මට්ටමේ ප්‍රතිඵලය අතින් සකස් කර එය පරිලෝකනය කර උඩුගත කිරීම හා මැතිවරණ කොමිෂන් සභාවේ පරිගණක පද්ධතියට දත්ත ඇතුළුකිරීම  යන දෙයාකාරයෙන්ම මැතිවරණ කොමිෂන් සභාව වෙත ප්‍රතිඵලය සම්ප්‍රේශණය කරන ලදී. එසේම තේරීම්භාර නිලධාරීන්ගෙන් ලැබෙන ඡන්ද ගණන් කිරීමේ ශාලා මට්ටමේ ප්‍රතිඵල භාවිත කර, ඡන්ද ප්‍රදේශ මට්ටමේ ප්‍රතිඵලය හා දිස්ත්‍රික් ප්‍රතිඵලය සැකසීම මැතිවරණ කොමිෂන් සභාවේ දී ද සිදුකරන ලදී. මෙම ජනාධිපතිවරණයේ දී මැතිවරණ කොමිෂන් සභාවේ දී ප්‍රතිඵල වගුගත කිරීම, මාණ්ඩලික නිලධාරීන්ගෙන් සමන්විත කණ්ඩායමක් විසින් ප්‍රතිඵලය අතින් සැකසීම, දිස්ත්‍රික්ක මගින් ප්‍රතිඵල ලේඛන පරිලෝකනය කර ගෙන්වාගෙන මැතිවරණ කොමිෂන් සභාවේ පරිගණක අංශයෙන් ප්‍රතිඵල සැකසීම හා MS-Excel  හරහා ප්‍රතිඵල සැකසීම යන තුන් ආකාරයකින් ප්‍රතිඵල සකස් කිරීම සිදු කරන ලදී. ඒ අනුව මැතිවරණ කොමිෂන් සභාවේ අංශ තුනකින් පිළියෙල කරන ලද ප්‍රතිඵල ලේඛන සමඟ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් එවන ලද අවසන් ප්‍රතිඵලය සමඟ සසඳා පරීක්ෂා කරමින්, එම සිව් ආකාරයෙන් සැකසූ ප්‍රතිඵලය සමාන වේ නම් පමණක්, ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී විසින් සැකසූ, ඡන්ද ප්‍රදේශ හා සමස්ත දිස්ත්‍රික් අවසන් ප්‍රතිඵලය සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය ලද පසු ප්‍රචාරණය කරනු ලැබුණි. නිවැරදි බවට තහවුරු කරගැනීමෙන් පසු මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් ප්‍රතිඵලය රූපවාහිනී හා ගුවන්විදුලි මාධ්‍ය මඟින් ප්‍රචාරය කිරීමට ද කටයුතු කරන ලදී.

ඉහත කී ආකාරයෙන් මැතිවරණ කොට්ඨාස 22 කට අදාළ ප්‍රතිඵල ලේඛන ලැබීමෙන් පසුව, එක් එක් අපේක්ෂකයාගේ වාසියට දී ඇති ඡන්ද සංඛ්‍යාව මැතිවරණ කොමිෂන් සභාව විසින් ගණන් බලා, ජනාධිපතිවරයා ලෙස තේරීපත්වන අපේක්ෂකයා කවුරුන්ද යන්න මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රකාශ කළ යුතු විය. මෙම ඡන්ද විමසීමේ දී සියලුම මැතිවරණ කොට්ඨාසවල දෙන ලද වලංගු ඡන්දවලින් එක් අඩකට වැඩි සංඛ්‍යාවක් කිසිම අපේක්ෂයෙකුට නොලැබී ඇති බව තහවුරු වූ පසුව ඒ අවස්ථාවේදී මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ අවසන් ප්‍රතිඵල සැකසුම් මධ්‍යස්ථානයේ සිටි අපේක්ෂකයන්ගේ නියෝජිතයන් සමග මැතිවරණ කොමිෂන් සභාව සාකච්ඡා කර, ඉතාම වැඩි ඡන්ද සංඛ්‍යාව ලබාගත් අනුර කුමාර දිසානායක මහතා සහ ඊළඟට වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් සජිත් ප්‍රේමදාස මහතා හැර අනෙක් අපේක්ෂකයන් තරඟයෙන් ඉවත් කර, තරඟයෙන් ඉවත් කරනු ලැබූ අපේක්ෂකයන්ගේ දෙවන හා තුන්වන මනාපය තරඟයේ සිටින අපේක්ෂකයන්ගේ වාසියට ලබාදී ඇත්ද යන්න ගණනය කිරීම සිදුකරන ලෙස දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත නියෝග කරන ලදී.

ඉතිහාසයේ ප්‍රථම වතාවට 2024 ජනාධිපතිවරණයට අදාළව මනාප ගණන් කිරීම සිදුවිය. ඒ අනුව අදාළ අපේක්ෂකයන් දෙදෙනාගේ  මුල්වටයේ ප්‍රතිඵලය හා එක් එක් ගණන් කිරීමේ ශාලාවේ මනාප ගනණය

කිරීමෙන් පසු ඔවුන් ලබාගත් ඡන්ද සංඛ්‍යාව එකතුකර අවසන් ප්‍රතිඵලය ලබාගැනීමෙන් අනතුරුව, 1981 අංක 15 දරන ජනාපතිවරයා තෝරාපත් කර ගැනීම පිළිබඳ පනතේ 64 (2) වගන්තිය අනුව ඡන්ද 5,740,179 ක් ලබාගත් අනුර කුමාර දිසානායක මහතා ජනාධිපතිවරයා ලෙස තෝරාපත් කර ගනු ලැබූ බව 2024 සැප්තැම්බර් මස 22 දින මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති විසින් මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ දී ප්‍රකාශයට පත්කරන ලදී. අපේක්ෂක අනුර කුමාර දිසානායක මහතා ජනාධිපතිවරයා ලෙස තෝරාපත්කර ගත් බවට වූ නිවේදනය ඇතුලත් දැන්වීම 2024.09.22 දින අංක: 2402/26 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ එදිනම පළ කරන ලදී.

### 2.7.5. ජනාධිපතිවරණයට අදාල සටහන් / ඇමුණුම්

- නාමයෝජනා කැඳවීමේ දැන්වීම (ඇමුණුම 04)
- ඇප මුදල් තැන්පත් කළ තැනැත්තන්ගේ ලේඛනය (ඇමුණුම 05)
- නාමයෝජනා භාරදෙනු ලැබූ අපේක්ෂකයින්ගේ නාමාවලිය හා ඔවුන් නාමයෝජනා කළ තැනැත්තන්ගේ ලේඛනය (ඇමුණුම 06)
- එක් එක් මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද පොළවල් වර්ගීකරණය (සටහන 21)
- එක් එක් මැතිවරණ කොට්ඨාසයේ පිළිගත් හා ප්‍රතික්ෂේපිත තැපැල් ඡන්ද සංඛ්‍යා (සටහන 22)
- අපේක්ෂකයන්ට අදාළව පිහිටුවිය හැකි කාර්යාල වර්ග හා ඒවාට අදාළ කොන්දේසි (ඇමුණුම 07)
- නිරීක්ෂණ සංවිධාන සඳහා අවසර ලබාදීමේ සටහන (සටහන 23)
- එක් එක් දිස්ත්‍රික්කයට අදාල ඡන්ද හිමියන් සංඛ්‍යාව, ගෘහයන් සංඛ්‍යාව, ඡන්ද කොට්ඨාස හා මධ්‍යස්ථාන සංඛ්‍යාව හා ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන පිළිබඳ විස්තරය (සටහන 24)
- ප්‍රථම වටයේ ඡන්ද ගණන් කිරීමෙන් පසු එක් එක් අපේක්ෂකයා ලබාගත් ඡන්ද සංඛ්‍යාව (ඇමුණුම 08)
- අවසාන ප්‍රතිඵල (ඇමුණුම 09)
- වියදම් වාර්තා භාරදී ඇති හා භාරදී නොමැති අපේක්ෂකයන් හා නාමයෝජනා කළ තැනැත්තන් ලැයිස්තුව (ඇමුණුම 10)

### 2.7.6. ජනාධිපතිවරණයට අදාළ මැතිවරණ නිරීක්ෂණ කටයුතු

2024 වර්ෂයේ සැප්තැම්බර් මස 21 වැනි දින පැවති ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමේ කටයුතු නිරීක්ෂණය සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ ආරාධනය මත පැමිණි විදේශීය නිරීක්ෂකයන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් අංශය වෙත පවරා තිබුණි. මේ සඳහා රටවල් 06 කින් පැමිණි නියෝජිතයින් 07 ක් පළාත් 9 ආවරණය වන පරිදි නිරීක්ෂණ කටයුතු සිදු කර නිරීක්ෂණ වාර්තාව මැතිවරණ කොමිෂන් සභාව වෙත ලබා දී ඇත.

ඡන්ද විමසීම නිරීක්ෂණය සඳහා 2024.09.16 දින දිවයිනට පැමිණි විදේශීය නිරීක්ෂකයන් කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයෙහි නවාතැන් ගන්නා ලද අතර 2024.09.19 දින ඔවුන් පහත පරිදි කොළඹින් පත් කරන ලද මධ්‍යම සම්බන්ධීකරණ නිලධාරීන් සමග එක් එක් දිස්ත්‍රික්ක වෙත අනුයුක්ත කරන ලදී.

| රට | නියෝජිතයින් ගණන | අනුයුක්ත කළ දිස්ත්‍රික්කය |
|---|---|---|
| රුසියාව | 1 | ගාල්ල |
| පිලිපීනය | 2 | රත්නපුරය, මහනුවර |
| භූතානය | 1 | ත්‍රිකුණාමලය |
| මාලදිවයින | 1 | කොළඹ |
| බංගලාදේශය | 1 | අනුරාධපුරය |
| නේපාලය | 1 | යාපනය |

මෙම විදේශීය නිරීක්ෂකයන් සඳහා ඊසීඩී ග්ලෝබල් ආයතනය වෙතින් ප්‍රවාහන පහසුකම් ලබාගන්නා ලද අතර, ඔවුන් වෙනුවෙන් පෞද්ගලික ආරක්ෂකයන් ද යොදවන ලදී. එක් එක් දිස්ත්‍රික්ක මගින් අදාල දිස්ත්‍රික්කයේ දී ඔවුන්ගේ නවාතැන් පහසුකම් සඳහා සුදුසු හෝටල් වෙන්කර තිබූ අතර එහි දී දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරියා ද මෙම පිරිසට එක්විය.

ජනාධිපතිවරණයේ මැතිවරණ කටයුතු නිරීක්ෂණය සඳහා දේශීය නිරීක්ෂණ සංවිධාන 10 ක් වෙත අනුමැතිය ලබාදෙන ලද අතර, එම සංවිධාන සඳහා පහත පරිදි නිරීක්ෂණයට අවසර ලබාදෙන ලදී.

| නිරීක්ෂණ සංවිධානයේ නම | නිරීක්ෂණය සඳහා අවසර ඉල්ලා තිබූ දිස්ත්‍රික්ක | තැපැල් ඡන්ද ලකුණු කිරීමේ මධ්‍යස්ථාන නිරීක්ෂණය | ඡන්ද පොළ තුළ ස්ථිතික නිරීක්ෂකයින් පත් කිරීම | දිස්ත්‍රික් නියෝජිත / සම්බන්ධීකාරක විසින් දිස්ත්‍රික්කයේ ඕනෑම ඡන්ද පොළක් නිරීක්ෂණය කිරීම | ඡන්ද ප්‍රදේශ මට්ටමින් පත්කරන නියෝජිතයින්ට ඒ ඒ ඡන්ද ප්‍රදේශයේ/ ඡන්ද ප්‍රදේශවල ඡන්ද පොළ නිරීක්ෂණය | සංගම නිරීක්ෂකයින් යොදවා ඡන්ද පොළ නිරීක්ෂණය කිරීම | ඡන්ද මධ්‍යස්ථානයේ පරිශ්‍ර සීමාවේ සිට නිරීක්ෂණයට නිරීක්ෂකයින් යෙදවීම | ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන නිරීක්ෂණය | ඡන්ද ගණන් කිරීමේ පරිශ්‍ර සීමාව දක්වා කටයුතු නිරීක්ෂණය | සංවිධානයේ ප්‍රධානී/ විධායක අධ්‍යක්ෂක විසින් ගණන් කිරීමේ මධ්‍යස්ථාන නිරීක්ෂණය | දිස්ත්‍රික් නියෝජිතට සහ තවත් එක් නිරීක්ෂකයෙකුට දිස්ත්‍රික්කයේ ගණන් කිරීමේ මධ්‍යස්ථාන නිරීක්ෂණය කිරීම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| PAFFREL | දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| CMEV | දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| CAFFE | දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක | | | ✓ | ✓ | | ✓ | | ✓ | ✓ | ✓ |
| IRES | දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක | | | ✓ | ✓ | | ✓ | | ✓ | ✓ | ✓ |
| MDL | නැගෙනහිර පළාත සහ කොළඹ දිස්ත්‍රික්කය | | | ✓ | ✓ | | ✓ | | ✓ | ✓ | ✓ |
| NPOC | කොළඹ, ගාල්ල, මාතර, කුරුණෑගල | | | ✓ | ✓ | | ✓ | | ✓ | ✓ | ✓ |

| නිරීක්ෂණ සංවිධානයේ නම | නිරීක්ෂණය සඳහා ඉල්ලා ඇති දිස්ත්‍රික්ක | තැපැල් ඡන්ද ලකුණු කිරීමේ මධ්‍යස්ථාන නිරීක්ෂණය | ඡන්ද පොල තුළ ස්ථිතික නිරීක්ෂකයින් පත් කිරීම | දිස්ත්‍රික් නියෝජිත / සම්බන්ධීකාරක විසින් දිස්ත්‍රික්කයේ ඕනෑම ඡන්ද පොලක් නිරීක්ෂණය කිරීම | ඡන්ද ප්‍රදේශ මට්ටමින් පත්කරන නියෝජිතයින්ට ඒ ඒ ඡන්ද ප්‍රදේශයේ/ ඡන්ද ප්‍රදේශවල ඡන්ද පොල නිරීක්ෂණය | ජංගම නිරීක්ෂකයින් ඡන්ද පොල නිරීක්ෂණය | ඡන්ද මධ්‍යස්ථානයේ පරිශ්‍ර පිවිසුමේ සිට නිරීක්ෂණය | ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන නිරීක්ෂණය | ඡන්ද ගණන් කිරීමේ පරිශ්‍ර පිවිසුම දක්වා කටයුතු නිරීක්ෂණය | සංවිධානයේ ප්‍රධානී/ විධායක අධ්‍යක්ෂක විසින් ගණන් කිරීමේ මධ්‍යස්ථාන නිරීක්ෂණය | දිස්ත්‍රික් නියෝජිතට සහ තවත් එක් නිරීක්ෂකයෙකුට දිස්ත්‍රික්කයේ ගණන් කිරීමේ මධ්‍යස්ථාන නිරීක්ෂණය කිරීම |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| SLAPA | කොළඹ, ගම්පහ, ගාල්ල, කුරුණෑගල, බදුල්ල, මොණරාගල | | | ✓ | ✓ | | ✓ | | ✓ | ✓ | ✓ |
| MFFE | කොළඹ දිස්ත්‍රික්කය | | | ✓ | ✓ | | ✓ | | ✓ | ✓ | ✓ |
| TISL | කොළඹ, ගම්පහ, කළුතර, මහනුවර, මාතලේ, ගාල්ල, මාතර, හම්බන්තොට, වවුනියා, මඩකලපුව, අම්පාර, අනුරාධපුරය, රත්නපුරය,කෑගල්ල, | | | ✓ | ✓ | | ✓ | | ✓ | | |
| VIEW | දිවයිනේ සියලුම දිස්ත්‍රික්ක | | | ✓ | ✓ | | ✓ | | ✓ | | |

## 2.8. පාර්ලිමේන්තු මැතිවරණය 2024.11.14

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 10 වැනි පාර්ලිමේන්තු මැතිවරණය 2024 නොවැම්බර් 14 වැනි දින පෙරවරු 7.00 සිට පස්වරු 4.00 දක්වා ඡන්ද මධ්‍යස්ථාන 13,421 කදී සිදු කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලැබී ඇති බලතල අනුව අතිගරු ජනාධිපතිතුමා විසින් 2024.09.24 දිනැති අංක: 2403/13 දරන ගැසට් නිවේදනය මඟින් පාර්ලිමේන්තුව විසුරුවා හරින ලදී. ඒ අනුව පාර්ලිමේන්තු මැතිවරණය 2024.11.14 දින පැවැත්වීමටත්, අභිනව පාර්ලිමේන්තුව 2024.11.21 දින රැස්වීම සඳහා කැඳවන බවට ප්‍රකාශයට පත්කිරීමත් සමඟ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට අදාළ මූලික කටයුතු සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් පියවර ගන්නා ලදී.

පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ නිවේදනය ප්‍රකාශයට පත්කරන අවස්ථාව වනවිට වලංගුව පැවති 2024 ප්‍රධාන නාමලේඛනය හා 2024 පළමු පරිපූරක නාමලේඛනය අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) ව්‍යවස්ථාව යටතේ තෝරාපත් කරගත යුතු මන්ත්‍රීවරු සංඛ්‍යාව පිළිබඳ නියමය මැතිවරණ කොමිෂන් සභාව විසින් අංක 2393/26 හා 2024.07.17 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකර තිබුණි. එම ගැසට් පත්‍රයේ සඳහන් මන්ත්‍රී සංඛ්‍යාව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙන් තෝරාගත යුතු විය.

පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ නාමයෝජනා ක්‍රියාවලිය සම්බන්ධයෙන් වූ අංක 2403/13 හා 2024.09.24 දිනැති ගැසට් පත්‍රය මඟින් එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා නාමයෝජනා පත්‍රයට ඇතුළත් කළ යුතු අපේක්ෂක සංඛ්‍යාව හා ස්වාධීන කණ්ඩායම් විසින් ඇප තැන්පත් කළ යුතු තොරතුරු ප්‍රකාශයට පත් කරන ලදී. එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයා, දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී ලෙස නාමයෝජනා භාරගනු ලබන බව හා පරිපාලන දිස්ත්‍රික්ක දෙකකින් සමන්විත යාපනය මැතිවරණ කොට්ඨාසය (යාපනය හා කිලිනොච්චිය) වෙනුවෙන් යාපනය දිස්ත්‍රික් ලේකම්වරයාද, පරිපාලන දිස්ත්‍රික්ක තුනකින් සමන්විත (වවුනියාව, මන්නාරම හා මුලතිව්) වන්නි මැතිවරණ කොට්ඨාසය සඳහා වවුනියාව දිස්ත්‍රික් ලේකම්වරයාද, නාමයෝජනා භාරගනු ලබන බව අංක 2403/13 හා 2024.09.24 දිනැති ගැසට් පත්‍රයේ පළකරන ලදී.

දිවයිනේ මැතිවරණ කොට්ඨාස 22ක තේරීම්භාර නිලධාරී කාර්යාලවල දී 2024.09.24 සිට 2024.10.11 දින මධ්‍යාහ්න 12.00 දක්වා ඇප තැන්පත් භාර ගැනීමට කටයුතු කරන ලද අතර, පාර්ලිමේන්තු මැතිවරණය සඳහා 2024.10.04 සිට 2024.10.11 දින මධ්‍යාහ්න 12.00 දක්වා කාර්යාල දිනවලදී තේරීම්භාර නිලධාරීන් විසින් නාමයෝජනා භාර ගැනීමට කටයුතු කරන ලදී. නාමයෝජනා පත්‍ර වලට විරෝධතා දැක්වීම සඳහා 2024.10.11 දින මධ්‍යහන 12.00 සිට පස්වරු 1.30 දක්වා කාලය තුළ අවස්ථාව ලබාදෙන ලදී.

නාමයෝජනා භාර ගැනීමේ කටයුතු 2024.10.11 දින මධ්‍යාහ්න 12.00ට අවසන් කරන ලද අතර, මැතිවරණ කොට්ඨාස 22 වෙනුවෙන් පිළිගත් දේශපාලන පක්ෂ 49 කින් නාමයෝජනා පත්‍ර 443 ක් භාරදී තිබුණි. ස්වාධීන කණ්ඩායම් 316 කින් නාමයෝජනා පත්‍ර 316 ක් භාරදී තිබුණි. ඒ අනුව මුළු නාමයෝජනා පත්‍ර 759 ක් අදාළ තේරීම්භාර නිලධාරීන් වෙත ලැබුණු අතර, එයින් පිළිගත් දේශපාලන පක්ෂ විසින් ඉදිරිපත් කළ නාමයෝජනා පත්‍ර 36 ක් පනතේ විධිවිධාන අනුව ඉදිරිපත් කර නොතිබූ බැවින් ප්‍රතික්ෂේප කළ අතර ඒ අනුව පිළිගත් නාමයෝජනා පත්‍ර ගණන 407ක් විය. ස්වාධීන කණ්ඩායම් විසින් ඉදිරිපත් කළ නාමයෝජනා පත්‍ර 34 ක් පනතේ විධිවිධාන අනුව ඉදිරිපත් කර නොතිබූ බැවින් ප්‍රතික්ෂේප කළ අතර, පිළිගත් නාමයෝජනා පත්‍ර ගණන 282 ක් විය. ඒ අනුව නාමයෝජනා පත්‍ර 689 ක් පිළිගන්නා ලද අතර නාමයෝජනා 70 ක් ප්‍රතික්ෂේප කරන ලදී. 2024 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා පිළිගත් දේශපාලන පක්ෂ නියෝජනය කරමින් අපේක්ෂකයන් 5006 ක්ද, ස්වාධීන කණ්ඩායම් නියෝජනය කරමින් අපේක්ෂකයන් 3346 ක්ද ලෙස, තරඟ කරනු ලැබූ මුළු අපේක්ෂක සංඛ්‍යාව 8352කි. 2024.11.14 දින පාර්ලිමේන්තු මැතිවරණය පවත්වන බව අංක 2403/13 හා 2024.09.24 දිනැති ගැසට් පත්‍රයෙන් නිවේදනය කරන ලදී.

කොළඹ, වන්නි හා කෑගල්ල මැතිවරණ කොට්ඨාවල නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීමට අදාළව අදාළ පාර්ශවයන් විසින් අධිකරණ ක්‍රියාමාර්ග ගෙන තිබූ අතර, ඒ අතරින් වන්නි මැතිවරණ කොට්ඨාසයට අදාළව ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානය පක්ෂය විසින් ඉදිරිපත් කළ නාමයෝජනාව නැවත පිළිගන්නා ලෙස ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියෝග කළ බැවින්, එම නාමයෝජනාව පිළිගැනීමට සිදුවිය. එබැවින් පිළිගත් සම්පූර්ණ නාමයෝජනා පත්‍ර ගණන 690 ක් හා තරඟකරනු ලබන මුළු අපේක්ෂකයන් සංඛ්‍යාව 8361 ක් වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 අ ව්‍යවස්ථාව අනුව ජාතික ලැයිස්තු මන්ත්‍රී ධූර සඳහා පිළිගත් දේශපාලන පක්ෂ 27කින් අපේක්ෂකයන් 516 ක් හා ස්වාධීන කණ්ඩායම් 2කින් අපේක්ෂකයන් 11ක් ලෙස සම්පූර්ණ අපේක්ෂකයින් 527 දෙනෙකුගේ නම් ලැයිස්තු 2024.10.11 දින මධ්‍යාහ්න 12.00 වනවිට මැතිවරණ කොමිෂන් සභාවට භාර දී තිබූ අතර, එම ජාතික ලැයිස්තු නාමයෝජනා පිළිබඳව අංක අංක: 2405/51 හා 2024.10.11 දිනැති ගැසට් පත්‍රය මඟින් තොරතුරු පළකර ඇත.

මෙවර බොහෝ මැතිවරණ කොට්ඨාස සඳහා පසුගිය පාර්ලිමේන්තු මැතිවරණවලට සාපේක්ෂව වැඩි නාමයෝජනා පත්‍ර සංඛ්‍යාවක් ලැබී තිබුණි. ඒ අනුව ඡන්ද පත්‍රිකාව මුද්‍රණය කිරීමේ දී ඡන්ද පත්‍රිකාව දිගින් වැඩිවීම නිසා සිදුවන අපහසුතාවයන් වැලැක්වීම සඳහා එක් මැතිවරණ කොට්ඨාසයක් සඳහා නාමයෝජනා පත්‍ර 20 ට වැඩි ප්‍රමාණයක් ලැබී ඇති අවස්ථාවලදී දේශපාලන පක්ෂවල හා ස්වාධීන කණ්ඩායම්වල නම් තීරු දෙකක් ලෙස මුද්‍රණය කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී. එමෙන්ම පසුගිය 2024 ජනාධිපතිවරණයේ දී කටයුතු කළ ආකාරය අනුව ලබාගත් අත්දැකීම් ද පදනම් කරගෙන පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ද දේශපාලන පක්ෂවල හා ස්වාධීන කණ්ඩායම්වල පිළිගත් නාමයෝජනා පත්‍ර සංඛ්‍යාව අනුව ඡන්ද පත්‍රිකාවේ විශාලත්වය සැලකිල්ලට ගනිමින් මෙවර ද කාඩ්බෝඩ් ඡන්ද පෙට්ටි ඡන්ද පොළ වෙත ලබාදීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 127 වගන්තිය අනුව පූර්වයෙන් පවත්වනු ලද පාර්ලිමේන්තු මැතිවරණයේ දෙන ලද වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට එකට නොඅඩු ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් කවර හෝ පිළිගත් දේශපාලන පක්ෂයක් අදාළ මැතිවරණයේ දී ඒ මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් නාමයෝජනා පත්‍රයක් භාරදී ඇත්නම්, එම පිළිගත් දේශපාලන පක්ෂයට රජයේ ප්‍රදානයක් වශයෙන් මුදල් ආධාර ලබාගැනීමට හිමිකම ඇත්තේය. එම මුදල එම පක්ෂය විසින් ලබාගන්නා ලද එක් ඡන්දයකට ශත 50 බැගින් ගණන් බලන ලද මුදලකි. ඒ අනුව 2024 පාර්ලිමේන්තු මැතිවරණයේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂයට රජයේ මුදල් ආධාර ලබා ගැනීමට ඉල්ලුම් කළ අතර, එම පක්ෂය වෙනුවෙන් ගෙවන ලද මුළු මුදල රුපියල් 3,426,846.50 කි. හිමිකම ඇති සෙසු දේශපාලන පක්ෂ ඉල්ලුම් කර නොතිබුණි.

### 2.8.1 තැපැල් ඡන්ද කටයුතු

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 26(1) වගන්තිය අනුව තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීම 2024.10.10 දින දක්වා සිදුකරන ලදී. නියමිත කාලය තුළ ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව 759083 ක් වූ අතර එයින් පිළිගනු ලැබුයේ 737902 ක් පමණි. තැපැල් ඡන්දහිමියන්ගේ නම් ලැයිස්තු සහතික කිරීමේ කටයුතු 2024.10.16 දින සිදුකරන ලදී.

පිළිගත් තැපැල් ඡන්දහිමියන් වෙත ඡන්ද පත්‍රිකා අඩංගු රක්ෂිත කවර නිකුත් කිරීම/ තැපෑලට භාරදීම 2024.10.23 වන්නි හා කොළඹ මැතිවරණ දිස්ත්‍රික්ක හැර සෙසු දිස්ත්‍රික්කවල සිදුකරන ලදී. නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීමට අදාළ අධිකරණයේ නඩු විභාග වෙමින් පැවතීම හේතුවෙන් කොළඹ හා වන්නි මැතිවරණ දිස්ත්‍රික්කවල තැපැල් ඡන්ද නිකුත් කිරීම 2024.10.25 දින සිදුකරන ලදී.

තැපැල් ඡන්ද සලකුණු කිරීම 2024.10.30 සහ 2024.11.04 දිනවල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යාල සහ දිවයිනේ සියළුම පොලිස් ස්ථාන, විශේෂ කාර්ය බලකාය සහ විශේෂ පොලිස් ඒකකවල සිදුවිය. 2024.11.01 සහ 2024.11.04 දිනවලදී ත්‍රිවිධ හමුදා කඳවුරු සහ ඉහත සඳහන් නොකළ තැපැල් ඡන්ද හිමියන් සේවය කළ සෙසු සියළුම රාජ්‍ය ආයතනවල තැපැල් ඡන්ද සලකුණු කිරීම සිදුකළ අතර, අදාළ දිනවල ඡන්ද සලකුණු නොකරන ලද තැපැල් ඡන්දදායකයන් සඳහා නැවත සලකුණු කිරීමට අවස්ථාව ලබාදීම 2024.11.07 හා 2024.11.08 දිනවලදී සිදුකරන ලදී.

සාමාන්‍ය ඡන්ද පොලකදී මෙන්ම තැපැල් ඡන්ද ප්‍රකාශකිරීමට පෙර තැපැල් ඡන්ද හිමියා විසින් සිය අනන්‍යතාවය තහවුරු කිරීම සිදුකළ යුතුවේ. පසුගිය ජනාධිපතිවරණයේදී මෙන්ම ජාතික හැඳුනුම්පත, වලංගු රියදුරු බලපත්‍රය, වලංගු විදේශ ගමන් බලපත්‍රය, ජාතික හැඳුනුම්පත වෙනුවට පුද්ගලයන් ලියාපදිංචිකිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන තොරතුරු තහවුරු කිරීමේ ලිපිය හෝ මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන තාවකාලික හැඳුනුම්පත වලංගු හැඳුනුම්පත් ලෙස මැතිවරණ කොමිෂන් සභාව විසින් සලකන ලදී. කෙසේ වුවද යම් තැපැල් ඡන්ද හිමියෙකු විසින්

රාජකාරී හැඳුනුම්පත ඉදිරිපත් කරන්නේ නම්, ඔහුගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම අධීක්ෂණ කටයුතු සඳහා තේරීම්භාර නිලධාරීන් විසින් පත්කර ඇති නිලධාරීන් විසින් සිදුකරන ලදී.

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 27 වගන්තියට අනුව ලියාපදිංචි සියලුම ඡන්දහිමියන් වෙත නිල ඡන්ද දැන්වීම් පත්‍රිකාවක් යැවිය යුතු වේ. ඒ අනුව ඡන්දහිමියන්ගේ ලියාපදිංචි විස්තර හා ඡන්දපොළට අදාළ විස්තර සටහන් කරන ලද නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා අපේක්ෂකයන්ගේ විස්තර සමඟ ඡන්දහිමියන් වෙත බෙදා හැරීම සඳහා 2024.10.26 දින තැපැල් දෙපාර්තමේන්තුව වෙත භාරදෙන ලදී. තවද, ඡන්ද විමසීමේ දී තැපැල් ඡන්ද හිමියන්ගේ නම්වලට අදාළව නිල දැන්වීම් පත්වල අදාළ මුද්‍රා තබා භාරදෙන ලදී. ඡන්ද පොළභාර ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වෙත ලබා දී තිබූ ඡන්දහිමි නාමලේඛනවලද තැපැල් ඡන්දහිමියන්ගේ විස්තර සටහන් කර යවන ලද අතර, ඒ තුළින් හොර ඡන්ද දැමීම වැළැක්වීම අපේක්ෂා කරන ලදී. නිල ඡන්ද දැන්වීම් පත සමග අපේක්ෂකයන්ගේ මනාප අංක ඇතුළත් ලේඛනයක්ද බෙදාහරින ලදී. නිල ඡන්ද දැන්වීම් පත් බෙදීමේ විශේෂ දින ලෙස 2024.10.27 හා 2024.11.01 දින වෙන්කල අතර, 2024.10.07 දින අවසන් බෙදීම සිදුකරන ලදී.

### 2.8.2. මැතිවරණ නිරීක්ෂණ කටයුතු

#### 2.8.2.1. දේශීය නිරීක්ෂණ කණ්ඩායම්

2024.11.14 දින පැවති පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගැනීමේ මැතිවරණයේ නිරීක්ෂණ කටයුතු සඳහා ද ජනාධිපතිවරණයේදී අවසර ලබාදුන් ආකාරයටම නිරීක්ෂණ කටයුතු කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් අවසර ලබා දෙන ලදී.

#### 2.8.2.2. විදේශීය නිරීක්ෂණ කණ්ඩායම්

2024.11.14 දින පවත්වන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගැනීමේ මැතිවරණය නිරීක්ෂණය කිරීමට මැතිවරණ කොමිෂන් සභාවේ ආරාධනයෙන් රටවල් කිහිපයකින් විදේශීය මැතිවරණ නිරීක්ෂකයන් සහභාගී වන ලදී. එයට අමතරව යුරෝපා සංගමය, පොදු රාජ්‍ය මණ්ඩලීය නිරීක්ෂක කණ්ඩායම් සීමිත නිරීක්ෂයන් පිරිසක් යොදවාගෙන ස්වාධීනව සිය නිරීක්ෂණ කටයුතු පවත්වාගෙන යන ලදී.

1988 අංක 15 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනතින් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ විධි විධාන ප්‍රකාරව විශේෂ හේතූන් මත වෙනත් ඡන්ද පොළක දී ඡන්ද දීමේ පහසුකම් සැපයීමට, ඡන්ද දායකයකුට මැතිවරණ කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටිය හැකිය.

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 127 ආ(1) වගන්තිය ප්‍රකාරව තමාගේ ඡන්ද පොළ පිහිටි ප්‍රදේශයේ පවතින තත්ත්වය හේතු කොට ගෙන එම ඡන්ද පොළේ දී තමාගේ ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති යම් ලියාපදිංචි ඡන්දහිමියෙකුට තමාගේ ඡන්දය මැතිවරණ කොමිෂන් සභාව තම අභිමතය පරිදි තීරණය කරනු ලබන්නා වූ වෙනත් ඡන්ද පොළක දී දීමට අවසර දෙන ලෙස ඉල්ලමින් මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉල්ලුම් පත්‍රයක්, නාමයෝජනා දැන්වීමෙන් එක් සතියක් ඇතුළත දී ඉදිරිපත් කළ හැකි බව අංක: 2403/23 හා 2024.09.25 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කරන ලදී. ඒ අනුව 2024 ඔක්තෝබර් මස 01 දින හෝ ඊට පෙර මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය වෙත අයදුම්පත්‍ර 02 ක් ලැබී තිබූ අතර, ඒවා සියල්ල නිසිපරිදි ඉදිරිපත් කර නොතිබූ බැවින් ප්‍රතික්ෂේප කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී.

### 2.8.3. නිවේදිත ඡන්ද කාර්යාල පිහිටුවීම

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 73 වගන්තිය යටතේ, අදාළ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරීට හෝ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්ට හා කාර්යාලය පිහිටුවනු ලබන පොලිස් බල ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිට දැනුම් දී ඡන්ද කාර්යාල පිහිටුවීම සඳහා නියම කරනු ලබන කොන්දේසිවලට එකඟව පිහිටුවනු ලබන කාර්යාල, අවසරලත් නිවේදිත කාර්යාල ලෙස හඳුන්වනු ලැබේ. ඒ අනුව පවත්වාගෙන යා හැකි ඡන්ද කාර්යාල සම්බන්ධයෙන් වූ විධිවිධාන අනුව පවත්වාගෙන යාමේ හැකියාව ඇත්තේ මැතිවරණ ප්‍රචාරක කාර්යාල වර්ග හතරක් (4) සඳහා පමණක් වන අතර, එවැනි කාර්යාල පිහිටුවීමට බලය ඇති අය, කාර්යාල පවත්වාගෙන යා හැකි කාලය, කාර්යාල පිහිටුවිය හැකි බල ප්‍රදේශය, පිහිටුවිය හැකි කාර්යාල ගණන ඇතුළත් ලේඛනයක් සකස් කර තරඟකරන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් අතර බෙදා හරින ලදී. ඉහත සඳහන් කොන්දේසි හා නියමයන් පැනවීමට සිදුව ඇත්තේ ඡන්ද විමසීම් කාලසීමාව තුළ ඡන්ද විමසීම් හා බැඳි ගැටුම්, පහරදීම්, තුවාල කිරීම්, මනුෂ්‍ය ඝාතන හා දේශපාලන පළිගැනීම් වැනි නොමනා ක්‍රියා වැළැක්වීම හා මහජනතාවට ඇති විය හැකි අවහිරතා වැළැක්වීම සඳහා මෙන්ම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය වාතාවරණය ඇති කිරීම සඳහාය.

### 2.8.4. 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත

2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ විධිවිධාන සම්බන්ධව මැතිවරණය සඳහා තරඟ කරනු ලබන පිළිගත් දේශපාලන පක්ෂවල බලයලත් නියෝජිතයන් හා ස්වාධීන කණ්ඩායම් නායකයන් ද අදාළ නාමයෝජනා පිළිබඳ තීරණ දැනුම් දෙන අවස්ථාවේ දී දැනුවත් කරන ලදී. පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන් සමඟ මැතිවරණ කොමිෂන් සභාව පැවති සාකච්ඡාවේදී "අවම මුදල" පිළිබඳව ඔවුන්ගෙන් විමසන ලද අතර, තේරීම්භාර නිලධාරීන්ද ස්වාධීන කණ්ඩායම් නායකයන් ගෙන් ඒ පිළිබඳව විමසා ඔවුන්ගේ අදහස් ද මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමු කරන ලදී. එම කරුණු ද සැලකිල්ලට ගෙන එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් ලියාපදිංචි එක් ඡන්ද දායකයෙකු වෙනුවෙන් එක් එක් අපේක්ෂකයාට වියදම් කළ හැකි මුදල හා එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් ලියාපදිංචි එක් ඡන්ද දායකයෙකු වෙනුවෙන් පිළිගත් දේශපාලන පක්ෂයකට/ ස්වාධීන කණ්ඩායමකට වියදම් කළ හැකි මුදල මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණ කර අදාළ මුදල 2406/03 අංක හා 2024.10.15 දිනැති ගැසට් පත්‍රයේ පළකරන ලදී. මෙම මුදල තීරණය කිරීමේ සූත්‍රය ද මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා විසින් සකස් කරන ලදී.

"මැතිවරණ වියදම් ඇතුළත් වියදම් වාර්තාව" පාර්ලිමේන්තු මැතිවරණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර දින 21 ඇතුළත නාමයෝජනා ඉදිරිපත් කළ දේශපාලන පක්ෂයකට අදාළව පක්ෂයේ ලේකම්රයාද හෝ ස්වාධීන කණ්ඩායමකට අදාළව කණ්ඩායම් නායකයා ද එක් එක් අපේක්ෂකයාද වෙන වෙනම සකස් කොට සහතික කර අදාළ තේරීම්භාර නිලධාරීන් වෙත භාරදිය යුතුවේ. මෙම වියදම් වාර්තා ලැබී දින 10 ක් ඇතුළත, එකී වාර්තා ලැබී ඇති බවත්, ඒවා අදාළ තේරීම්භාර නිලධාරීගේ කාර්යාලයේ දී යම් තැනැත්තෙකුට පරීක්ෂා කර බැලිය හැකි බවත්, එම වාර්තාවල පිටපත් ලබා ගත හැකි ආකාරයත් සඳහන් කරමින් දැන්වීමක් පළකරන ලදී.

ඒ අනුව නියමිත කාලය තුළ අපේක්ෂකයන් 8361 අතරින් අපේක්ෂකයන් 7505 දෙනෙකු විසින් හා නාමයෝජනා ඉදිරිපත් කළ දේශපාලන පක්ෂ ලේකම්වරුන්/ ස්වාධීන කණ්ඩායම් නායකයන් 690 අතරින් දේශපාලන පක්ෂ ලේකම්වරුන්/ ස්වාධීන කණ්ඩායම් නායකයන් 556 විසින් සහ ජාතික ලැයිස්තු අපේක්ෂකයන් 527 අතරින් අපේක්ෂකයන් 453 දෙනෙකු විසින් සිය වියදම් ප්‍රකාශ මැතිවරණ කොමිෂන් සභාව වෙත භාරදෙන ලදී. මෙම වාර්තා ලැබීමෙන් පසු ඒවා සියල්ල පරිලෝකනය කර

මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියට ද ඇතුළත් කර ඇති අතර අවශ්‍ය අයට ඒවා පරිශීලනය කළ හැක.

සිය මැතිවරණ වියදම් වාර්තා නිසි පරිදි භාර දී නොමැති අපේක්ෂකයන් 856 ක්, දේශපාලන පක්ෂ ලේකම්වරුන්/ ස්වාධීන කණ්ඩායම් නායකයන් 134 ක් සහ ජාතික ලැයිස්තු අපේක්ෂකයන් 74 ක් පිළිබඳව පොලීසියට පැමිණිලි කිරීමට කටයුතු කර ඇත.

### 2.8.5. ආරක්ෂක කටයුතු

ඡන්ද විමසීමක් ප්‍රකාශයට පත් කළ අවස්ථාවේ සිට ඡන්ද විමසීම අවසන්ව ප්‍රතිඵල ප්‍රකාශ කොට, සතියක කාලයක් ගතවන තෙක්ම ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීමේ වගකීම මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් මත පොලිස්පතිවරයා වෙත පැවරේ. ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීම සඳහා මැතිවරණය ප්‍රකාශයට පත්කිරීමත් සමඟම, මැතිරණ කොමිෂන් සභා කාර්යාලයේ මෙන්ම, දිස්ත්‍රික් මට්ටමින් ද, පැමිණිලි විමර්ශන ඒකක පිහිටුවීම සිදු කරන ලදී. මීට අමතරව දිස්ත්‍රික්යේ විශාලත්වය සහ විශේෂ ආරක්ෂාවක් ලබාදිය යුතුව ඇතැයි තීරණය කරනු ලබන ප්‍රදේශ කේන්ද්‍ර කොට ගෙන අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හෝ වෙනත් රාජ්‍ය අයතනවල විශේෂ සම්බන්ධීකරණ ඒකක පිහිටුවීමට ද පියවර ගන්නා ලදී.

17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් තහවුරු කිරීම සඳහා අවශ්‍ය පියවර වශයෙන්, සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන වෙත මාධ්‍ය උපමාන නිකුත් කිරීම, රාජ්‍ය සම්පත් අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සඳහා සියලුම රාජ්‍ය ආයතන වෙත ලිඛිත දැන්වීම් කිරීම, මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ සහ සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරි කාර්යාලවල පැමිණිලි මධ්‍යස්ථාන විවෘත කර, වගකිව යුතු නිලධාරීන් පත්කර, පැමිණිලි භාරගැනීම හා ඒ සඳහා ක්ෂණික විසඳුම් ලබාදීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම, අපේක්ෂක ආචාරධර්ම පද්ධතියක් හඳුන්වා දීම, මැතිවරණ රාජකාරී සඳහා පත් කරනු ලබන පොලිස් නිලධාරීන්ගේ මඟ පෙන්වීමේ උපදෙස් මාලාවක් පොලිස්පතිවරයා මාර්ගයෙන් ලබාදීම වැනි ක්‍රියාමාර්ග ගන්නා ලදී.

එමෙන්ම, ඡන්ද පොළ හා ඡන්ද ගණන් කිරීමේ කටයුතුවල ආරක්ෂාව සඳහා පොලිස් නිලධරයන් යොදාගන්නා ලද අතර, සාපේක්ෂව පූර්ව මැතිවරණ ප්‍රචන්ඩ ක්‍රියා අවම මැතිවරණයක් ලෙස 2024 පාර්ලිමේන්තු මැතිවරණය ඉතිහාසයට එක්වේ. මැතිවරණ දිනය දක්වා ජාතික මැතිවරණ පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථානයට පැමිණිලි 1206 හා දිස්ත්‍රික් මැතිවරණ පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථාන වෙත පැමිණිලි 2616 ක් හා සමස්ත පැමිණිලි 3822 ක් ලැබී තිබුණි.

එමෙන්ම, 2024 පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව සිදු කළ යුතු ඉදිරි කටයුතු පිළිබඳව උපදෙස්/ චක්‍රලේඛ සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් හා නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත යැවීමට කටයුතු කරන ලද අතර, මෙම මූලික කටයුතුවලට සහාය වීම සඳහා මැතිවරණ කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලය ඇතුළු සියලුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට අවශ්‍ය වන ප්‍රමාණයට විශ්‍රාමික නිලධරයන්/ අනියම් සේවකයින් බඳවා ගැනීමට කටයුතු කරන ලදී. එසේම, මැතිවරණය පැවැත්වීමේ කටයුතු සඳහා අවශ්‍ය වන සියලුම ලිපි ලේඛන/ ආකෘති ද මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී. එසේම ඡන්ද විමසීම්, ඡන්ද ගණන් කිරීම් හා ප්‍රතිඵල ප්‍රකාශ කිරීම් සම්බන්ධ සියලුම ලිපි ලේඛන/ ඡන්ද පත්‍රිකා/ කාඩ්බෝඩ් ඡන්ද පෙට්ටි/ ඡන්ද කුටි ඒ ඒ අංශය මඟින් නියමිත දින වකවානුව තුල සියලුම දිස්ත්‍රික් කාර්යාලවලට ලබාදීමට කටයුතු කරන ලද අතර, 2024 පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව දිවයිනේ ඡන්ද පොළවල් 13421 ක ඡන්ද විමසීම් 2024.11.14 දින සාර්ථකව පැවැත්වීමට කටයුතු කරන ලදී. දිවයිනේ සාමාන්‍ය ඡන්ද ගණන් කිරිමේ ශාලා 1582 ක් හා තැපැල් ඡන්ද ගණන් කිරීමේ ශාලා 452 ක් යනාදී වශයෙන් එකතුව 2034 ක ඡන්ද ගණන් කිරීමේ කටයුතු සාර්ථකව සිදු කරන ලදී.

2024 ප්‍රධාන නාමලේඛනය හා 2024 (1) ඡන්දහිමි නාමලේඛනය අනුව ලියාපදිංචි මුළු ඡන්ද සංඛ්‍යාව 17,140,354 ක් වන අතර, එම ලේඛනය පදනම් කරගෙන, 2024.11.14 දින පවත්වන ලද පාර්ලිමේන්තු මැතිවරණයේ දී මුළු ප්‍රකාශිත ඡන්ද ප්‍රමාණය 11,815,246 (68.93%)කි. එම ප්‍රකාශිත ඡන්ද අතරින් 11,148,006 (94.65%) වලංගු ඡන්ද වූ අතර, 667,240 (5.65%) ප්‍රතික්ෂේපිත ඡන්ද විය. තරඟ කළ පිළිගත් දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම් අතරින් ඡන්ද 6,863,186 ක් (61.56%) ලබාගත් ජාතික ජන බලවේගය පක්ෂය මැතිවරණ කොට්ඨාස අනුව ආසන 141ක් හා ජාතික ලැයිස්තු මන්ත්‍රීධූර 18 ක් වශයෙන් මන්ත්‍රීධූර 159 ක් ලබාගෙන මැතිවරණය ජයග්‍රහණය කර, ආණ්ඩුබලය හිමිකර ගන්නා ලදී.

### 2.8.6. පාර්ලිමේන්තු මැතිවරණයට අදාල සංඛ්‍යා සටහන් / ඇමුණුම්

- පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ ගැසට් පත්‍රය (ඇමුණුම 11)
- එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) ව්‍යවස්ථාව යටතේ තෝරාපත් කරගත යුතු මන්ත්‍රීවරු සංඛ්‍යාව, නාමයෝජනා කළ යුතු අපේක්ෂක සංඛ්‍යාව හා ස්වාධීන කණ්ඩායම් විසින් තැන්පත් කළ යුතු ඇප මුදල් (ඇමුණුම 12)
- නාමයෝජනා කළ දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් සම්බන්ධ දත්ත (සටහන 25)
- එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් ලද තැපැල් ඡන්ද අයදුම්පත් සංඛ්‍යාව හා පිළිගත්, ප්‍රතික්ෂේප අයදුම්පත් සංඛ්‍යාවන් (සටහන 26)
- පිහිටුවිය හැකි කාර්යාල වර්ග හා ඒවාට අදාළ කොන්දේසි (ඇමුණුම 13)
- නිරීක්ෂණ සංවිධාන සඳහා අවසර ලබාදීමේ සටහන (සටහන 27)
- එක් එක් මැතිවරණ කොට්ඨාසය වෙනුවෙන් එක් ඡන්ද දායකයෙකු වෙනුවෙන් වියදම් කළ හැකි උපරිම මුදල සහිත සටහන (ඇමුණුම 14)
- මැතිවරණ පැමිණිලි වර්ගීකරණය (සටහන 28)
- එක් එක් මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද මධ්‍යස්ථාන හා ගණන් කිරීමේ මධ්‍යස්ථාන සටහන (සටහන 29)
- පිළිගත් දේශපාලන පක්ෂ මුළු දිවයිනෙහිම හා ස්වාධීන කණ්ඩායම් මැතිවරණ කොට්ඨාසයේ ලබාගත් ඡන්ද සංඛ්‍යාව (ඇමුණුම 15)
- පාර්ලිමේන්තුව නියෝජනය කරන පිළිගත් දේශපාලන පක්ෂ හා කණ්ඩායම් මැතිවරණ කොට්ඨාස මට්ටමෙන් හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 අ (ජාතික ලැයිස්තු) යටතේ ලබාගත් මන්ත්‍රී ධූර සංඛ්‍යාව (ඇමුණුම 16)
- මැතිවරණ කොට්ඨාස මට්ටමෙන් පත් කළ මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛන ඇතුළත් ගැසට් පත්‍රය (ඇමුණුම 17)
- 99 අ ව්‍යවස්ථාව, යටතේ මන්ත්‍රීවරුන් පත් කිරීම පිළිබඳ ගැසට් පත්‍ර ලැයිස්තුව (සටහන 30)

### 2.8.7 පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ විදේශීය නිරීක්ෂණ කටයුතු

2024 නොවැම්බර් මස 14 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයේ මැතිවරණ කටයුතු නිරීක්ෂණ සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ ආරාධනය මත පැමිණි විදේශීය නිරීක්ෂකයන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් අංශය වෙත වගකම පවරා තිබූ අතර මේ සඳහා රටවල් 05 කින් පැමිණි නියෝජිතයින් 10 ක් පළාත් 7 ආවරණය වන පරිදි නිරීක්ෂණ කටයුතු සිදුකර තම වාර්තාව මැතිවරණ කොමිෂන් සභාව වෙත ලබා දී ඇත.

ඡන්ද විමසීම නිරීක්ෂණය සඳහා 2024.11.11 දින දිවයිනට පැමිණි විදේශීය නිරීක්ෂකයන් කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයෙහි නවාතැන් ගන්නා ලද අතර 2024.11.12 දින ඔවුන් පහත පරිදි කොළඹින් පත් කරන ලද මධ්‍යම සම්බන්ධීකරණ නිලධාරීන් සමග එක් එක් දිස්ත්‍රික්කය වෙත අනුයුක්ත කරන ලදී.

| රට | නියෝජිතයින් ගණන | අනුයුක්ත කළ දිස්ත්‍රික්කය |
|---|---|---|
| රුසියාව | 1 | ත්‍රිකුණාමලය |
| බංගලාදේශය | 2 | මාතලේ, පොළොන්නරුව |
| ඉන්දියාව | 3 | මාතර, නුවරඑළිය, යාපනය |
| ඉන්දියාව (කේම්බ්‍රිජ්) | 1 | කොළඹ |
| මාලදිවයින | 2 | බදුල්ල, ගම්පහ |
| නෙදර්ලන්තය (කේම්බ්‍රිජ්) | 1 | කළුතර |

මෙම විදේශීය නිරීක්ෂකයන් සඳහා ඊසීඩී ග්ලෝබල් ආයතනය වෙතින් ප්‍රවාහන පහසුකම් ලබාගන්නා ලද අතර, ඔවුන් වෙනුවෙන් පෞද්ගලික ආරක්ෂක නිලධාරීන් යොදවන ලදී. අදාල දිස්ත්‍රික්කයේ දී ඔවුන්ගේ නවාතැන් පහසුකම් සඳහා සුදුසු හෝටල් වෙන්කර තිබූ අතර එහි දී දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරියා ද මෙම පිරිසට එක්විය.

පාර්ලිමේන්තු මැතිවරණයේ මැතිවරණ කටයුතු නිරීක්ෂණය සඳහා දේශීය නිරීක්ෂණ සංවිධාන 10 ක් වෙත අනුමැතිය ලබාදෙන ලද අතර, එම සංවිධාන සඳහා පහත පරිදි නිරීක්ෂණයට අවසර ලබාදෙන ලදී.

| නිරීක්ෂණ සංවිධානයේ නම | තැපැල් ඡන්ද ලකුණු කිරීමේ මධ්‍යස්ථාන නිරීක්ෂණය කිරීම | ඡන්ද පොල තුළ ස්ථිතික නිරීක්ෂකයින් පත් කිරීම | දිස්ත්‍රික් නියෝජිතයට / සම්බන්ධීකාරකට/ දිස්ත්‍රික්කයේ ඕනෑම ඡන්ද පොලක් නිරීක්ෂණය කිරීමට ඉඩදීම | ඡන්ද ප්‍රදේශ මට්ටමින් පත්කරන නියෝජිතයින්ට ඒ ඒ ඡන්ද ප්‍රදේශයේ/ ඡන්ද ප්‍රදේශවල ඡන්ද පොල නිරීක්ෂණය කිරීම | ජංගම නිරීක්ෂකයින් සඳහා ඡන්ද පොල නිරීක්ෂණය කිරීමට ඉඩදීම | ජංගම නිරීක්ෂකයින් ඡන්ද මධ්‍යස්ථානයේ පරිශ්‍රයේ සිට ගණන් නිරීක්ෂණය කිරීම | ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන නිරීක්ෂණය කිරීම | ජංගම නිරීක්ෂකයින්ට ඡන්ද ගණන් කිරීමේ පරිශ්‍රයේ සිට නිරීක්ෂණයට ඉඩදීම | දිස්ත්‍රික්කයේ සම්බන්ධීකාරකට ප්‍රතිඵල නිකුත් කිරීමේ මධ්‍යස්ථානයේ නිරීක්ෂණය කිරීමට ඉඩදීම |
|---|---|---|---|---|---|---|---|---|---|
| PAFFREL | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| CMEV | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| CAFFE | | | ✓ | ✓ | | ✓ | | ✓ | ✓ |
| IRES | | | ✓ | ✓ | | ✓ | | ✓ | ✓ |
| MDL | | | ✓ | ✓ | | ✓ | | ✓ | ✓ |
| NPOC | | | ✓ | ✓ | | ✓ | | ✓ | ✓ |

| නිරීක්ෂණ සංවිධානයේ නම | තැපැල් ඡන්ද ලකුණු කිරීමේ මධ්‍යස්ථාන නිරීක්ෂණය කිරීම | ඡන්ද පොල තුළ ස්ථිතික නිරීක්ෂකයින් පත් කිරීම | දිස්ත්‍රික් නියෝජිතට / සම්බන්ධීකාරකට/ දිස්ත්‍රික්කයේ ඕනෑම ඡන්ද පොලක් නිරීක්ෂණය කිරීමට ඉඩදීම | ඡන්ද ප්‍රදේශ මට්ටමින් පත්කරන නියෝජිතයින්ට ඒ ඒ ඡන්ද ප්‍රදේශයේ/ ඡන්ද ප්‍රදේශවල ඡන්ද පොල නිරීක්ෂණය කිරීම | ජංගම නිරීක්ෂකයින් සඳහා ඡන්ද පොල නිරීක්ෂණය කිරීමට ඉඩදීම | ජංගම නිරීක්ෂකයින් ඡන්ද මධ්‍යස්ථානයේ පරිශ්‍රයේ සිට පමණක් නිරීක්ෂණය කිරීම | ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන නිරීක්ෂණය කිරීම | ජංගම නිරීක්ෂකයින්ට ඡන්ද ගණන් කිරීමේ පරිශ්‍රයේ සිට  නිරීක්ෂණයට ඉඩදීම | දිස්ත්‍රික්කයේ සම්බන්ධීකාරකට ප්‍රතිඵල නිකුත් කිරීමේ මධ්‍යස්ථානයේ නිරීක්ෂණය කිරීමට ඉඩදීම |
|---|---|---|---|---|---|---|---|---|---|
| SLAPA | | | ✓ | ✓ | | ✓ | | ✓ | ✓ |
| MFFE | | | ✓ | ✓ | | ✓ | | ✓ | ✓ |
| TISL | | | ✓ | ✓ | | ✓ | | ✓ | ✓ |
| VIEW | | | ✓ | ✓ | | ✓ | | ✓ | ✓ |

### 2.9. පළාත් සභා ඡන්ද විමසීම.

1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත 2017 අංක 17 දරන සංශෝධන පනතින් සංශෝධනය කර කොට්ඨාස ක්‍රමය යටතේ පළාත් සභා ඡන්ද විමසීම පැවැත්වීම සඳහා පළාත් සභා කොට්ඨාස සීමා නිර්ණය කිරීමට ඉදිරිපත් වූ වාර්තාව, පාර්ලිමේන්තුවේ සම්මත නොවීම හේතුවෙන් අපේක්ෂිත නව පළාත් සභා ඡන්ද විමසීම් ක්‍රමය සඳහා වූ ඉදිරි නීති සම්පාදන කටයුතු ද ඇණහිටින ලදී මේ නිසා ධුර කාලය අවසන් වූ පළාත් සභා වලට මහජන නියෝජිතයින් තෝරා පත්කර ගැනීමක් සිදු නොවූ අතර, පළාත් සභා පරිපාලනය පළාත් ආණ්ඩුකාරවරු යටතේ සිදුවෙමින් පවතී. එනමුත් මැතිවරණ කොමිෂන් සභාව, අදාළ පරිදි ඡන්ද විමසීම පැවැත්වීමට අවශ්‍ය  මූලික කටයුතු සම්පාදනය කිරීමට පියවර ගෙන ඇත.

### 2.10. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම

2023 වර්ෂයේ පැවැත්වීමට කටයුතු කරන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව ගොනු කොට තිබූ මූලික අයිතිවාසිකම් අයඳුම්පත් සම්බන්ධයෙන් 2024.08.22 දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදුන් තීන්දුව අනුව එම ඡන්ද විමසීම හැකි ඉක්මනින් පැවත්වීමට කටයුතු කළ යුතුව තිබුණි. මෙම නඩු තීන්දුව ලබාදීමට පෙර 2024 ජනාධිපතිවරණයේ ඡන්ද විමසීමේ කටයුතු ආරම්භ කර තිබූ බැවින්, එකී කටයුතු අවසන් වූ වහාම පළාත් පාලන  ආයතන ඡන්ද විමසීම පැවත්වීමට කොමිෂන් සභාව අවශ්‍ය කටයුතු සම්පාදනය කරනු ලබන බව 2024.08.28 දින අංක LAE/2023/57 මාධ්‍ය නිවේදනයෙන් ප්‍රකාශයට පත් කෙරිණි. එසේ වුව ද,  2024.09.21 දින පැවති ජනාධිපතිවරණයෙන් තේරී පත් වූ ජනාධිපතිවරයා විසින් 2024.09.24 වන දින පාර්ලිමේන්තුව විසුරුවා හැර පාර්ලිමේන්තු මැතිවරණය සඳහා දින නියම කර ගැසට් නිවේදනය නිකුත් කරන ලදී. පාර්ලිමේන්තු මැතිවරණයට සූදානම්වන කාලය තුළ නිල කාලය අවසන් වූ  ඇල්පිටිය ප්‍රාදේශීය සභාව සඳහා නියෝජිතයන් පත්කර ගැනීමට පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 25 වගන්තිය අනුව මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එම ඡන්ද විමසීම පවත්වන ලදී. පාර්ලිමේන්තු මැතිවරණ කටයුතු අවසන් වූ වහාම  හැකි ඉක්මනින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවත්වීමට දින නියම කිරීමට කටයුතු කරනු ලබන බව LAE/2023/58 මාධ්‍ය නිවේදනයෙන් මැතිවරණ කොමිෂන්

සභාව ප්‍රකාශයට පත් කරන ලදී. 2024 වර්ෂයේ පළාත් පාලන ඡන්ද විමසීම පැවැත්වීමට අදාළව ප්‍රකාශයට පත් වූ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවෙන් පසු, 2023 වර්ෂයේ නොපවත්වා අඩාල වූ ඡන්ද විමසීම් කටයුතු නැවත ඇරඹීමේදී ඇතිවිය හැකි වූ ගැටලුකාරී තත්ත්වයන් සම්බන්ධයෙන් විවිධ පාර්ශ්වයන් විසින් කොමිෂන් සභාවට මෙන්ම අමාත්‍ය මණ්ඩලය වෙතද කරුණු ඉදිරිපත් කෙරිණි.

2023 වර්ෂයේ පැවැත්වීමට කටයුතු කරන ලද හා 2022 වර්ෂයේ සහතික කරන ලද ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචිව සිටි ඡන්ද දායකයන්ට අමතරව මේ වන විට විශාල පිරිසකගේ නම් ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත් වී ඇති බැවින් ඔවුන්හට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය මෙන්ම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම වෙනුවෙන් ඉදිරිපත් වීමේ අයිතිය ද අහිමි වී යාම කෙරෙහි විවිධ පාර්ශ්ව සැලකිල්ල යොමුකරන ලදී. ඡන්ද විමසීම සඳහා නාමයෝජනා ලබා දී ඇති අපේක්ෂකයන් බොහෝ දෙනෙක් මේ වන විට විදේශ ගතවීම, මිය යාම වැනි හේතූන් මත නාමයෝජනා පත්‍රවලට ඇතුළත් වී ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව අඩුවීම සහ 2023 වර්ෂයේ පැවති දේශපාලන පක්ෂ බෙහෝමයක මේ වන විට යම් යම් පරිපාලනයේ වෙනස්කම් සිදුව තිබීම හා දේශපාලන පක්ෂවලින් ඉදිරිපත් වූ අපේක්ෂකයන් මේ වන විට වෙනත් දේශපාලන පක්ෂ හා සම්බන්ධවී කටයුතු කිරීම වැනි ගැටලුද ඇති බවට බොහෝ දෙනා විසින් පෙන්වා දෙන ලදී.

2023 අංක 30 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් හඳුන්වා දුන් 25% ක තරුණ අපේක්ෂ්ක කෝටා ක්‍රමය පවත්නා නීති අනුව ස්ථාවරව ක්‍රියාත්මක නොවන බවද පෙනී ගිය කරුණකි.

ඒ අනුව, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 24/2093/816/004 දරන " 2023 වර්ෂයේ පැවැත්වීමට නියමිතව තිබූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා කැඳවන ලද නාමයෝජනා ආපසු කැඳවීම සහ නව නාමයෝජනා කැඳවීම සඳහා විධිවිධාන සැලසීම" යන මැයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන විෂයභාර අමාත්‍යතුමන් විසින් ඉදිරිපත් කරන ලද 2024.12.01 දරන සංදේශය අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී සභාගත කිරීමෙන් පසු අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලා පහත තීරණයන්ට එළැඹ තිබුණි.

i. 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා කැඳවා ඇති නාමයෝජනා ආපසු කැඳවීමටත්,
ii. එකී නාමයෝජනා ඉදිරිපත් කළ අපේක්ෂකයන් විසින් තැන්පත් කර ඇති ඇප මුදල දැනට බල පවත්නා පොලී අනුපාතය අදාළ කර ගනිමින් එකී පොලියද සමග ආපසු ගෙවීමටත්,
iii. අනතුරුව, 2024 ඡන්ද හිමි නාමලේඛනය පදනම් කර ගනිමින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වීම සඳහා නැවත නාමයෝජනා කැඳවීමටත්,

මැතිවරණ කොමිෂන් සභාවට බලය ලැබෙන සේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පතක් සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් ලබාදීමටත් යෝජනා කර තිබුනි.

ඒ අනුව, මේ වන විට නීති කෙටුම්පත් සම්පාදක විසින් එම විශේෂ විධිවිධාන පනත් කෙටුම්පත සකස් කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

### 2.10.1. ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීමේ කටයුතු

2019 වර්ෂයේ පවත්වන ලද ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ ඡන්ද විමසීමෙන් පසු ඇරඹුනු එකී ප්‍රාදේශීය සභාවේ නිල කාලය 2023 නොවැම්බර් මස 04 දිනයෙන් අවසන් විය. රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා විසින් අංක 2341/29 හා 2023.07.19 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනයෙන් ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ සභිකයන්ගේ ධුර කාලය දීර්ඝ කිරීම හේතුවෙන් එම ධුර කාලයන් 2024 නොවැම්බර් මස 04 වන දිනයෙන් අවසන් වීමට නියමිතව තිබුණි. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 25 වන වගන්තියෙන් මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කරමින් මැතිවරණ කොමිෂන් සභාව විසින් ඇල්පිටිය ප්‍රාදේශීය සභාව සඳහා ඡන්ද විමසීම පැවැත්වීමට අවශ්‍ය කටයුතු කරන ලදි.

ඒ අනුව, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 12ආ වගන්තිය අනුව සහතික කර ඇති ඡන්ද හිමි නාමලේඛනය ප්‍රදර්ශනය කර ඇති බව නිවේදනය කරමින් අංක 2398/32 හා 2024.08.22 දිනැති ගැසට් නිවේදනය නිකුත් කිරීමෙන් අනතුරුව නාම යෝජනා කැඳවීමේ දැන්වීම ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී විසින් 2024.08.26 දින දැන්වීම් පුවරුවල ප්‍රදර්ශනය කරන ලද අතර, නාම යෝජනා කාල සීමාව 2024 සැප්තැම්බර් 09 දින සිට 2024 සැප්තැම්බර් 12 දින මධ්‍යාහ්න 12 දක්වා විය.

ඒ අනුව, පිළිගත් දේශපාලන පක්ෂ 9 ක් සහ ස්වාධීන කණ්ඩායම් 2 ක් විසින් නාම යෝජනා පත්‍ර 11 ක් ලබා දෙන ලද අතර ඉන් දේශපාලන පක්ෂයක සහ ස්වාධීන කණ්ඩායමක නාම යෝජනා පත්‍ර ප්‍රතික්ෂේප විය.

2024.10.26 දින පැවති ඡන්ද විමසීම සඳහා ලියාපදිංචි ඡන්ද දායකයන් 55643 ක් ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ලැබූ අතර, ඉන් 36825 ක් ඡන්දය ප්‍රකාශ කර තිබුනි. ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවෙන් 520 ක් ප්‍රතික්ෂේපිත ඡන්ද වූ අතර, වලංගු ඡන්ද සංඛ්‍යාව 36305 ක් විය.

මෙම ඡන්ද විමසීමේ දී ජාතික ජන බලවේගය විසින් ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ කොට්ඨාස 17 න් කොට්ඨාස 15ක් ජයග්‍රහණය කරන ලද අතර, සමගි ජන බලවේගය විසින් කොට්ඨාස 2ක් ජයග්‍රහණය කරන ලදී. ඇල්පිටිය ප්‍රාදේශීය සභාව සඳහා සභික සංඛ්‍යාව 28 ක් වුව ද අවසන් ප්‍රතිඵලය අනුව නිර්මාණය වූ එල්ලන ආසන 2 ක් ද සමඟ (Over Hang) එම සභාවේ සභික සංඛ්‍යාව 30 ක් විය.

ඒ අනුව, ලබාගත් ඡන්ද සංඛ්‍යාව අනුව ඇල්පිටිය ප්‍රාදේශීය සභාව සඳහා පහත පරිදි සභිකයන් තේරී පත් විය.

| | | |
|---|---|---|
| ජාතික ජන බලවේගය | සභික ධුර | 15 |
| සමගි ජන බලවේගය | සභික ධුර | 06 |
| ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ | සභික ධුර | 03 |
| පොදුජන එක්සත් පෙරමුණ | සභික ධුර | 02 |
| ස්වාධීන කණ්ඩායම | සභික ධුර | 02 |
| පොදුජන එක්සත් නිදහස් සන්ධානය | සභික ධුර | 01 |
| ජාතික ජනතා පක්ෂය | සභික ධුර | 01 |

### 2.10.2. පළාත් පාලන ආයතනවල සභිකධුර පුරප්පාඩු පිරවීම

පළාත් පාලන ආයතනවල සභිකයන් මියයාම, ඉල්ලා අස්වීම, පක්ෂ සාමාජිකත්වය අහිමි වීම, අවසර නොලබා සභා රැස්වීම්වලට සහභාගී නොවීම,සමහර සභිකයන් සභාවල සභාපති තනතුරට පත්වීම, සභාවේ අයවැය පරාජය වීම සහ ආණ්ඩුකාරවරයා විසින් සමහර සභිකයින් ඉවත් කිරීම ආදී හේතූන් මත සභික ධුර පුරප්පාඩු සිදු වන අතර එම සභික ධුර පුරප්පාඩු පිරවීමේ නෛතික ක්‍රියාවලිය පළාත් පාලන අංශය විසින් සිදු කරනු ලබයි.

ඒ අනුව, 2024 ඔක්තෝබර් 26 දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වන කාල සීමාව තුලදී, පාර්ලිමේන්තුවට තේරීපත්වීම හේතුවෙන් එහි සභාපතිවරයා ඉල්ලා අස්වීම නිසා ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය හා සභික ධුරයක් හිස් වූ අතර එම පුරප්පාඩු පිරවීම සඳහා වන නෛතික ක්‍රියාවලීන් සම්පූර්ණ කර ඇත.

### 2.11. විශේෂ ව්‍යාපෘති

2022-2025 දක්වා වූ සිවු අවුරුදු උපාය මාර්ගික සැලැස්ම අනුව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් අංශය වෙත පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීම පවරා තිබුණි. ඒ අනුව එම වැඩසටහන්වල ප්‍රගතිය පහත පරිදි දැක්වේ.

### 2.11.1.වතු අංශයේ සහ ආන්තික ජන කොටස් සඳහා විශේෂිත පුහුණු වැඩසටහන් පැවැත්වීම.

මේ යටතේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල හරහා පවත්වා ඇති වැඩ සටහන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| දිස්ත්‍රික්කය | වැඩසටහන/ ව්‍යාපෘතිය | පවත්වන ලද ස්ථානය | දිනය |
|---|---|---|---|
| කොළඹ | වතු අංශයේ ජනතාව දැනුම්වත් කිරීම | කිරිවන්දල උතුර, පෙන්රිච්වත්ත ප්‍රජා ශාලාව | 2024.03.02 |
| කළුතර | වතු අංශය හා ආන්තික ජන කොටස් | නිව් වැමිල් වත්ත, මිල්ලනිය | 2024.02.20 |
| | වතු අංශය හා ආන්තික ජන කොටස් | ගීකියන කන්ද වත්ත දෙමළ විද්‍යාලය | 2024.03.04 |
| නුවරඑළිය | වතු අංශය හා ආන්තික ජන කොටස් | KTS ශාලාව , උඩුපුස්සැල්ලාව | 2024.03.13 |
| මුලතිව් | ධීවර ප්‍රජාව දැනුවත් කිරීම | තුනුක්කායි ගම්මානය | 2024.04.17 |
| මඩකලපුව | අභිකුණ්ඨික ගෝත්‍රික ප්‍රජාව දැනුවත් කිරීම | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වාකරේ. | 2024.05.28 |
| කුරුණෑගල | වතු ආන්තික ජන කොටස් දැනුවත් කිරීම | ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල , රිදීගම | 2024.06.08 |
| අනුරාධපුරය | ආන්තික ජන කණ්ඩායම් (අභිකුණ්ඨික) | මිහින්තලේ පොතාන වසම | 2024.04.01 |
| බදුල්ල | වතු අංශ හා ආන්තික ජන කොටස් දැනුම්වත් කිරිම | කන්දෙගෙදර සංස්කෘතික මධ්‍යස්ථානය | 2024.05.09 |
| | වතු අංශ හා ආන්තික ජන කොටස් දැනුම්වත් කිරිම | දික්වැල්ල වත්ත ඉහළ කොටස - හාලිඇල | 2024.05.11 |
| | වතු අංශ හා ආන්තික ජන කොටස් දැනුම්වත් කිරිම | ඇටම්පිටිය - හාලිඇල | 2024.05.11 |
| | වතු අංශ හා ආන්තික ජන කොටස් දැනුම්වත් කිරිම | ඩැමේරියා වත්ත - පස්සර | 2024.06.20 |
| මොණරාගල | ආන්තික ජන කොටස් දැනුම්වත් කිරිම | මුප්පනේවැලි වත්ත - මොණරාගල | 2024.05.13 |

**2.11.2. ශිෂ්‍ය පාර්ලිමේන්තු සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

මේ යටතේ දිස්ත්‍රික් කාර්යාල පවත්වා ඇති වැඩසටහන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| දිස්ත්‍රික්කය | දිනය | වැඩසටහන් පවත්වන ලද ස්ථානය සහ සහභාගී වූ කණ්ඩායම් |
|---|---|---|
| කොළඹ | 2024.07.17 | කොළඹ 10 ආනන්ද විද්‍යාලය - සිසුන් |
| ගම්පහ | 2024.04.09<br>2024.06.19 | වේයන්ගොඩ බණ්ඩාරනායක විද්‍යාලය - සිසුන්<br>නිට්ටඹුව සංඝබෝධි මධ්‍ය මහා විද්‍යාලය - සිසුන් |
| මහනුවර | 2024.03.28<br>2024.04.01 | ගම්පොළ වික්‍රමබාහු ජාතික පාසල - ගුරුවරුන් හා කලාප අධ්‍යාපන කාර්යාලීය නිලධාරීන්<br>දෙනුවර කලාප අධ්‍යාපන කාර්යාලය - ගුරුවරුන් හා කලාප අධ්‍යාපන කාර්යාලීය නිලධාරීන් |
| මාතලේ | 2024.03.22 | කන්දේනුවර දෙමළ මහා විද්‍යාලය - සිසුන් |
| නුවරඑළිය | 2024.03.18 | පදියපැලැල්ල මහා විද්‍යාලය - සිසුන් |
| ගාල්ල | 2024.03.27<br>2024.03.28 | ගාල්ල, අම්බලන්ගොඩ කලාපයේ තෝරාගත් පාසැල් 04 ක 10 ශ්‍රේණියෙන් ඉහළට ඉගෙනුම ලබන සිසුන් 800<br>ගාල්ල, අම්බලන්ගොඩ කලාපයේ තෝරාගත් පාසැල් 03 ක 10 ශ්‍රේණියෙන් ඉහළට ඉගෙනුම ලබන සිසුන් 1000 |
| මන්නාරම | 2024.03.23 | කලාප අධ්‍යාපන කාර්යාලය - ප්‍රජා අධ්‍යාපන ගුරු පුහුණු වැඩමුළුව |
| මඩකලපුව | 2024.06.04 | තාලංකුඩා උසස් තාක්ෂණ විද්‍යාලය - සිසුන් |
| අම්පාර | 2024.03.12<br>2024.03.13<br>2024.03.14 | අම්පාර කලාප අධ්‍යාපන කාර්යාලය - ප්‍රජා අධ්‍යාපන විෂය භාර ගුරුවරුන්<br>මහඔය කලාප අධ්‍යාපන කාර්යාලය- ප්‍රජා අධ්‍යාපන විෂය භාර ගුරුවරුන්<br>දෙහිඅත්තකණ්ඩිය කලාප අධ්‍යාපන කාර්යාලය - ප්‍රජා අධ්‍යාපන විෂය භාර ගුරුවරුන් |
| පොළොන්නරුව | 2024.06.05 | මැදිරිගිරිය ජාතික පාසල - සිසුන් |
| බදුල්ල | 2024.03.07 | මඩොල්සිම, බටවත්ත දෙමළ විද්‍යාලය - සිසුන් හා ගුරුවරුන් |
| මොණරාගල | 2024.04.02<br>2024.07.24 | මො/ යශෝධරා බාලිකා විද්‍යාලය, බිබිල - සිසුන්<br>මො/බකිනිගහවෙල මුස්ලිම් විද්‍යාලය - සිසුන් |

ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තු නිලවරණය - 2023 අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධරයන්ගේ ආරාධනාව මත මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තු නිලවරණය 2024.03.25 දින මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ දී පැවත් වූ අතර මෙහි දී කථානායක, අග්‍රාමාත්‍ය, සභා නායක, නියෝජ්‍ය කථානායක, නියෝජ්‍ය කාරක සභා සභාපති යන තනතුරු සහ අමාත්‍යාංශ 10 ක සඳහා අමාත්‍ය හා නියෝජ්‍ය අමාත්‍ය ධුර සඳහා නිලවරණය පවත්වන ලදී. දිවයිනේ අධ්‍යාපන කලාප ආවරණය වන සේ අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් තෝරාගත් අපේක්ෂකයන් 137ක් ඉහත තනතුරු සඳහා නාමයෝජනා  ලබා දුන් අතර ජාතික මැතිවරණයක්, ඡන්ද විමසීමක් අවස්ථාවේ දී සිදුකරන ක්‍රියාවලිය පිළිබඳ සිසුන් සඳහා ප්‍රායෝගික අත්දැකීමක් ලබා දෙමින් ඒ හා සමාන ආකාරයටම මෙහිදී නිලවරණය පවත්වා ප්‍රතිඵල ලබා දීමට කටයුතු කෙරුණි. මෙය පළමුවරට පැවත් වූ ජාතික ශිෂ්‍ය පාර්ලිමේන්තු නිලවරණය වීම විශේෂ කරුණකි.

### 2.11.3.සංක්‍රාන්ති ලිංගික කණ්ඩායම් සමග පවත්වන ලද සාකච්ඡා

සංක්‍රාන්ති ලිංගික කණ්ඩායම් සමග ඔවුන් සම්බන්ධයෙන් මැතිවරණ ක්‍රියාවලියට අදාළව පවතින ගැටළු පිළිබඳව මැතිවරණ කොමිෂන් සභා නිලධාරීන් සමග පහත පරිදි සාකච්ඡා පැවැත්වීමට ක්‍රියාකර ඇත.

| පවත්වන ලද ස්ථානය | පවත්වන ලද දිනය |
|---|---|
| මැතිවරණ කොමිෂන් සභාව - ප්‍රධාන ශ්‍රවණාගාරය | 2024.03.15 |
| මැතිවරණ කොමිෂන් සභාව - ප්‍රධාන ශ්‍රවණාගාරය | 2024.08.02 |

### 2.11.4. ප්‍රජාව තුළ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීම සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම.

2025 අවසන් භාගයේ ප්‍රජාව තුළ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික මට්ටමින් පර්යේෂණ සම්මන්ත්‍රණ දෙකක් පහත පරිදි පැවැත්වීමට ක්‍රියා කර ඇත.

මැතිවරණ කොමිෂන් සභාව විසින් දෙවන වරට සංවිධානය කරනු ලබන වාර්ෂික පර්යේෂණ සැසියට අදාළව **ඡන්ද බලය ආරක්ෂා කිරීම හා ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රවර්ධනය කිරීම** සහ ඒ ආශ්‍රිත තේමාවන් ඔස්සේ පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම සඳහා 2024 අප්‍රේල් මස මැතිවරණ කොමිෂන් සභා නිල වෙබ් අඩවිය ඔස්සේ විවෘත ආරාධනයක් සිදු කරන ලද අතර, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල මගින් හා දිවයින පුරා පිහිටි විශ්ව විද්‍යාල පද්ධතිය ආවරණය කරමින් ද මේ සඳහා දැනුම්වත් කිරීම් සිදු කරන ලදි. එම කාල සීමාව තුළ විශ්ව විද්‍යාල පද්ධතිය තුළ පැවති වාතාවරණය හේතුවෙන් හා තවදුරටත් මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන සියලුම පිරිස් සඳහා පහසුවක් වන පරිදි නැවත 2024 ජූනි මස පුවත්පත් දැන්වීමක් මගින් දැනුවත් කිරීම සිදු කරන ලදි.

විද්‍යුත් තැපැල ඔස්සේ පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දුන් අතර, ඒ අනුව ඒ සඳහා සිංහල දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍ය 3 ම නියෝජනය කරමින් පර්යේෂණ පත්‍රිකා 34 ක් ලැබුණි.

2024 ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීමට කටයුතු කිරීම හේතුවෙන් මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම තාවකාලිකව අත්හිටවීමට සිදු වූ නමුත්, නැවත එය ආරම්භ කරමින් විද්වත් මඩුල්ලක් හමුවේ පර්යේෂණ පත්‍රිකා ඇගයීමට කටයුතු කර සම්මන්ත්‍රණය පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.

### 2.11.5. පුහුණුකරුවන් පුහුණු කිරීමට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

සිවිල් සංවිධාන හා ග්‍රාමීය ජන සංවිධාන සඳහා “ඡන්ද බලය අන්සතු කළ නොහැකි අයිතියකි” යන තේමාව යටතේ පුහුණුකරුවන් සංචිතයක් ස්ථාපනය කිරීම හා එම කණ්ඩායමට ප්‍රජා නායකයන් / වැවිලි ප්‍රදේශවල ප්‍රමුඛ ක්‍රියාකරුවන් ඇතුළත් අතර, පුහුණුකරුවන් 1210 දෙනෙකු 2024 වර්ෂය තුළදී පුහුණු කිරීමට ක්‍රියා කර ඇත. මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම සඳහා පහසුකම්කාරකයන් (Facilitators) ලෙස ඔවුන් යෙදවීමට ක්‍රියාකර ඇත.

**2.11.6 දේශපාලනික වශයෙන් කාන්තාවන් සවිබල ගැන්වීම.**

ප්‍රජාතන්ත්‍රීය අයිතිවාසිකම් සුරැකීමෙහිලා කාන්තාවන්ගේ කාර්යභාරය මැයෙන් සියලුම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි රාජ්‍ය සේවයේ නියුතු කාන්නා නිලධරයන්, දේශපාලනයේ නියුතු දේශපාලන ප්‍රමුඛ ක්‍රියාකාරීන් 2562 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පුහුණු වැඩමුළු 29 ක් පැවැත්වීමට ක්‍රියා කර ඇත.

**2.11.7. ආබාධ සහිත තැනැත්තන්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීම.**

ආබාධ සහිත තැනැත්තන්ගේ ඡන්ද අයිතිය සුරැකීම වෙනුවෙන් පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

මැතිවරණ කොමිෂන් සභාවේ සහභාගීත්ව උපායමාර්ගික සැලසුම 2022- 2025ට අනුව පරමාර්ථ, අරමුණු සහ ඉලක්ක තුළ 01 වන අවධාරිත ක්ෂේත්‍රය : දැනුම්වත් කිරීම් හා සජීවිකරණය යටතේ පුරවැසියන් සහ ඡන්ද හිමියන් යන දෙපාර්ශවය ඡන්දයේ බලය හා ප්‍රජාතන්ත්‍රීය අයිතිය පිළිබඳව ප්‍රමාණවත් ලෙස දැනුම්වත්ව සිටිති යන්න පරමාර්ථය ඉටු කර ගැනීම සඳහා, නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා කාන්තාවන් සහ තරුණයින් බලමුලු ගැන්වීමේ ඉලක්ක යටතේ,

- වර්ෂ 2025 වන විට ආබාධිත හා ආන්තික ජන කණ්ඩායම් සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් 50ක් පවත්වා, ඔවුන් ක්‍රියාකාරි ලෙස මැතිවරණ ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීම

- වර්ෂ 2025 දී ආබාධ සහිත හා ආන්තික ජන කොටස් මැතිවරණ ක්‍රියාවලියට ක්‍රියාකාරීව සහභාගී වීම වළකාලන සියලු ප්‍රධාන බාධක විසදාලීම·

| ඉලක්කය | 2024 වර්ෂයේ ප්‍රගතිය |
|---|---|
| වර්ෂ 2025 වන විට ආබාධිත හා ආන්තික ජන කණ්ඩායම් සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් 50ක් පවත්වා, ඔවුන් ක්‍රියාකාරි ලෙස මැතිවරණ ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීම | ආබාධ සහිත ඡන්දදායකයින් දැනුම්වත් කළ වැඩසටහන් සංඛ්‍යාව 85 -<br>• මාර්ගගත ක්‍රමය ඔස්සේ දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාව - 07<br>• දේශපාලන හා මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ දැනුම්වත් කිරීම 03<br>• මැතිවරණයට අදාළ වචන ඇතුළත් කර සංඥා භාෂා කෝෂය පිළිබඳ දැනුම්වත් කිරීම - 05<br>• පූර්ණ ආබාධ සහිත තැනැත්තන් සඳහා තාවකාලික හැඳුනුම්පතක් නිකුත් කිරීම පිළිබඳ දැනුම්වත් කිරීම - 04<br>• පුහුණු වැඩසටහන් හා ක්ෂේත්‍ර අධ්‍යනය අවස්ථා ලබා දීම - 06<br>• ඡන්ද පත්‍රිකාව මඟපෙන්වන ස්පර්ශක රාමුව පිළිබඳ දැනුම්වත් කිරීම/ පුහුණු කිරීම - 55<br>• විද්‍යුත් මාධ්‍ය (රූපවාහිනි) හරහා වැඩසටහන් සඳහා සහභාගී වෙමින් දැනුම්වත් කිරීම් - 03<br>• මුද්‍රිත මාධ්‍ය හරහා - 05<br>• ජනාධිපතිවරණ ක්‍රියාවලිය පිළිබඳ දැනුම්වත් කිරීම - දිස්ත්‍රික්ක 25 (වැඩසටහන් 25) |

| | |
|---|---|
| වර්ෂ 2025 දී ආබාධ සහිත හා ආන්තික ජන කොටස් මැතිවරණ ක්‍රියාවලියට ක්‍රියාකාරීව සහභාගී වීම වළකාලන සියලු ප්‍රධාන බාධක විසඳාලීම | • මැතිවරණයට අදාළ වචන ඇතුළත් කර සංඥා භාෂා කෝෂය නිර්මාණය කිරීම (වචන 324)<br>• පූර්ණ ආබාධ සහිත තැනැත්තන් සඳහා තාවකාලික හැඳුනුම්පතක් නිකුත් කිරීම (4358) සහ ඡන්ද මධ්‍යස්ථානය තුළ අනන්‍යතාව තහවුරු කරන සහතිකයක් ලෙස පිළිගැනීම.<br>• අවසන් ජනාධිපතිවරණයේදී සහ පාර්ලිමේන්තු මැතිවරණයේදී දී ඡන්ද මධ්‍යස්ථාන 441ක ප්‍රවේශ පහසුකම් සකස් කිරීම<br>• ශ්‍රවණාබාධ සහිත ඡන්දදායකයින්ට ඡන්ද පොළ තුළ දී ඇතිවිය හැකි සන්නිවේදන බාධකය අවම කරලීම සඳහා ඡන්ද ස්ථානාධිපතිවරුන්ට සංඥා භාෂා පිළිබඳ මූලික පුහුණුවක් ලබාදීම (ජනාධිපතිවරණයේ දී ඡන්ද මධ්‍යස්ථානවල රාජකාරි නියුතු ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් 12,000 ආසන්න සංඛ්‍යාවක් සඳහා අදාළ පුහුණුව ලබා දී ඇත)<br>• ඡන්ද පොළ දැන්වීම් සංඥා භාෂාවෙන් ප්‍රදර්ශනය කිරීම (සියලුම ඡන්ද පොළ තුළ - 13314)<br>• ජනාධිපතිවරණ හා පාර්ලිමේන්තු මැතිවරණ යන ඡන්ද විමසීම්වලදී දෘෂ්‍යාබාධිත ඡන්ද හිමියන් සඳහා ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීමට පහසුවන මඟපෙන්වීමක් ලෙස ස්පර්ශක රාමුවක් ඡන්දපොළවල භාවිතය සඳහා ලබාදීම. (සියලු ඡන්ද පොළ තුළ - 13314)<br>• සහායකයකු කැටුව යාම අවස්ථාව ලබාදීම<br>• පෞද්ගලික ප්‍රවාහන පහසුකම් සලසාදීමට අවස්ථාව ලබාදීම<br>• ඡන්ද මධ්‍යස්ථානය තුළ ත්‍රීරෝද රථ මඟින් නොමිලේ ප්‍රවාහන පහසුකම සැලසීම - 1247<br>• සංඥා භාෂා පරිවර්තන සහිතව ඡන්ද ප්‍රතිඵල විකාශනය කිරීම<br>• දෘෂ්‍යාබාධ තැනැත්තන්ගේ පහසුව සඳහා මැතිවරණ පනත්, හඬපට ආකෘතියෙන් සකස් කිරීමේ වැඩසටහනේ මූලික පියවරක් ලෙස ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත හඬපට ආකෘතියට සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවෙන් සකස්කර සෝදුපත් පරීක්ෂා කර ඇත. එය මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියට උඩුගතකර දෘෂ්‍යාබාධ සහිත තැනැත්තන් ඇතුළු අවශ්‍ය අනෙකුත් සියුල දෙනාට ලබා ගත හැකි වන පරිදි ප්‍රසිද්ධ කිරීමට කටයුතු කර ඇත. ජනාධිපතිවරණය සඳහා පිළිගත් අපේක්ෂකයින්ගේ නම් සහ ලකුණු ඡන්ද පත්‍රිකාවේ දැක්වෙන පිළිවෙළට දෘශ්‍යාබාධ සහිත තැනැත්තන්ට හඳුනාගැනීමේ පහසුව සඳහා සිංහල හා දෙමළ මාධ්‍යයෙන් හඬපට ආකාරයෙන් පටිපත කර ඔවුන්ගේ වට්ස්අප් සමූහ වෙත මුදා හරින ලදී. |

**2.12 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

මැතිවරණ කොමිෂන් සභාවේ එක් එක් අංශ විසින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව කාර්තුමය වශයෙන් ප්‍රගතිය සමාලෝචනය කොට ප්‍රගති වාර්තා සකස් කිරීම හා එම වාර්තා මුදල් අමාත්‍යාංශයට යොමු කිරීම.

**2.13. උපායමාර්ගික සැලැස්ම**

මැතිවරණ කොමිෂන් සභාව සඳහා සිවු අවුරුදු (2022 – 2025) දක්වා වූ කාල සීමාව සඳහා වූ දෙවන උපායමාර්ග සැලැස්මට අදාළව 2024 වර්ෂයේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ අතර, උපාය මාර්ග සැලැස්ම - 2024 සැලැස්මට අනුව ව්‍යාපෘති/ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල මඟින් සිදු කරනු ලබන අංශයට අදාළ වැඩසටහන් සඳහා අනුමැතිය ලබාදීම් සිදු කරන ලදී.

**2.14. මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතට අදාළ දැනුම්වත් කිරීම්.**

මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන්, කොළඹ දිස්ත්‍රික් රාජ්‍ය නිලධාරීන්, නිරීක්ෂණ සංවිධාන දැනුම්වත් කිරීමේ වැඩසටහන් 2024.01.16, 22 සහ 23 දිනවල දී පවත්වන ලදී.

සියලුම පිළිගත් දේශපාලන පක්ෂවල ලේකම්වරුන් සහ නියෝජිතයන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් 2024.02.27 සහ 2024.03.06 දිනවල දී පවත්වන ලදී.

විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය ආයතන ප්‍රධානීන් දැනුම්වත් කිරීමේ වැඩසටහන 2024.03.28 දින පවත්වන ලදී.

2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ විධිවිධාන පිළිබඳව දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් ලේකම්වරු, රාජ්‍ය නිලධාරීන්, නිරීක්ෂණ සංවිධාන, සිවිල් සංවිධාන දැනුවත් කිරීමේ වැඩසටහන් Westminster Foundation for Democracy ආයතනයේ ද දායකත්වයෙන් පහත සඳහන් මැතිවරණ කොට්ඨාස / දිස්ත්‍රික් ආවරණය වන පරිදි පවත්වන ලදී.

2024.06.14 - මහනුවර, මාතලේ, නුවරඑළිය

2024.06.20 - යාපනය , කිළිනොච්චි, වන්නි

2024.06.27 - පොළොන්නරුව, අනුරාධපුරය

2024.06.28 - මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය

2024.07.05 - රත්නපුරය, කෑගල්ල

2024.07.15 - කුරුණෑගල, ගම්පහ, පුත්තලම

2024.07.18 - ගාල්ල, කලුතර, මාතර, හම්බන්තොට

2024.07.19 - බදුල්ල, මොණරාගල

එමෙන්ම 2024 ජනාධිපතිවරණයට හා පාර්ලිමේන්තු මැතිවරණයට සමගාමීව සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ප්‍රාදේශීය මාධ්‍යවේදීන්, පොලිස් නිලධාරීන්, මැතිවරණ ආරවුල් නිරාකරණ ඒකකවල රාජකාරියේ නිරත නිලධාරීන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල නිලධාරීන් සඳහා මාධ්‍ය උපමාන සහ මැතිවරණ නීති බලාත්මක කිරීම පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවක් මැතිවරණ

කොමිෂන් සභාව, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලීසිය හා ශ්‍රී ලංකා පුවත්පත් ආයතනය එක්ව පහත පරිදි පවත්වන ලදී.

2024.09.07 - අනුරාධපුරය

2024.09.08 - පොළොන්නරුව

2024.09.15 - පුත්තලම

2024.11.07- වවුනියා

2024.11.08- ත්‍රිකුණාමලය

**2.15. මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු**

ජනාධිපතිවරණය 2024 සහ පාර්ලිමේන්තු මැතිවරණය 2024 ඉලක්ක කර ගනිමින් මැතිවරණ කොමිෂන් සභාවේ, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේ සහභාගීත්වයෙන් දිස්ත්‍රික් මට්ටමින් ප්‍රාදේශීය මාධ්‍යවේදීන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් පැවැත්වූ අතර, ඒ සඳහා සම්පත්දායකත්වය ලබාදීම සිදු කරන ලදී.

2024 වර්ෂයේ පවත්වන ලද ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ ඡන්ද විමසීම සහ පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව විවිධ පාර්ශ්ව, ක්ෂේත්‍ර රාශියක් දැනුම්වත් කිරීම සඳහා මාධ්‍ය නිවේදන 200කට වැඩි සංඛ්‍යාවක් නිකුත් කරන ලද අතර, ඒවා ප්‍රධාන වශයෙන් පහත ක්ෂේත්‍රයන්ට අදාළ විය. ඒ පිළිබඳ තොරතුරු (සටහන 31) හි ඇතුළත් කර ඇත.

- නාමයෝජනා හා ඇප මුදල් තැන්පත් කිරීම
- තැපෑලෙන් ඡන්දය දීම
- රාජ්‍ය දේපළ අවභාවිතයට වළක්වාලීම.
- දේශපාලන පක්ෂ අපේක්ෂකයන් සඳහා ආචාර ධර්ම.
- මාධ්‍ය ආයතන සඳහා මාධ්‍ය උපමාන.
- මැතිවරණ ප්‍රචාරන කටයුතු.
- නිල ඡන්ද දැන්වීම්පත්.
- ඡන්දය දීම සඳහා නිවාඩු ලබාදීම.
- ඡන්දය දීමේදී අනන්‍යතාව තහවුරු කිරීම.
- මැතිවරණ ප්‍රචාරණ කටයුතු හා කාර්යාල.
- මැතිවරණ පැමිණිලි හා ආරවුල් නිරාකරණය.
- ඡන්දය දීම සඳහා විවිධ පහසුකම්.
- අපේක්ෂකයින් සඳහා ප්‍රචාරණ පහසුකම්
- ඡන්දය සලකුණු කිරීමේ ක්‍රමය.
- මැතිවරණ රාජකාරී හා මැතිවරණ ප්‍රතිඵල විකාශය.

මෙම මාධ්‍ය නිවේදන ද භාෂාත්‍රයෙන්ම නිකුත් කරනු ලැබූ අතර සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන වෙත යොමු කරන ලදී. එම ආයතනවලට අයත් මාධ්‍ය මගින් නිවේදනයේ සඳහන් කරුණු පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීමට කටයුතු සම්පාදනය කර තිබුණි. එසේම මාධ්‍ය නිවේදන මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ (www.elections.gov.lk) ද පළ කරන ලදී.

එමෙන්ම ඡන්ද විමසීම් සහ මැතිවරණ කටයුතු පිළිබඳව සියලුම ආයතන ප්‍රධානීන් සහ මාධ්‍යවේදීන් සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වන ලද අතර, එම සාකච්ඡා මැතිවරණ කොමිෂන් සභාවේ දී සහ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ දී පවත්වන ලදී.

සියලුම මාධ්‍ය ආයතනවල ප්‍රධානීන්,කර්තෘවරුන්, ප්‍රවෘත්ති සංස්කාරකවරුන් සහ මාධ්‍යවේදීන් ඇතුළත් WhatsApp සමූහයක් හරහා අදාළ සියලුම තොරතුරු ලබා දීමේ ක්‍රමවේදයක් ද ස්ථාපිත කොට ක්‍රියාත්මක කරන ලදී.

ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීමේ ඡන්ද විමසීමට සහ පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ ව්‍යවස්ථාපිත හා අත්‍යාවශ්‍යයෙන්ම දැනුම්වත් කළ යුතු කරුණු පිළිබඳව මහජනයා දැනුම්වත් කිරීම පිණිස නිවේදන 08 ක් භාෂාත්‍රයෙන්ම ප්‍රසිද්ධ පුවත්පත්වල පළ කරන ලදී.

### 2.16. ලේඛනාගාරය

මැතිවරණ කොමිෂන් සභාවේ ලේඛනාගාරයේ කාර්යයන් නව පරිශ්‍රයක ස්ථාපිත කොට වඩාත් සංවිධිත අයුරින් පවත්වාගෙන යාමට ක්‍රියාකර ඇත. එහි ඇති ලිපි ලේඛන වඩාත් සුරක්ෂිත කර ගැනීම හා ඒවා අවශ්‍ය වන පරිදි ඕනෑම පාර්ශ්වයකට පහසු පරිශීලනය කිරීම සඳහා නිසි පරිදි ගබඩා කර තබා ගැනීමේ වැඩපිළිවෙලක් ආරම්භ කරන ලදී.

### 2.17. දැනුම් කළමනාකරණ ඒකකය හා කෞතුගාරය

මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යයන් පිළිබඳව හා තොරතුරු ලබාගැනීම සඳහා විද්‍යාර්ථීන්, පර්යේෂකයින්, දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන් හා මැතිවරණ නිරීක්ෂණ සංවිධාන නියෝජිතයින් විසින් නිරන්තරයෙන් විමසීම් කරනු ලබන අතර, බොහෝ අවස්ථාවල දී කොමිෂන් සභාව වෙත පැමිණ තොරතුරු ලබාගැනීම සිදුකරනු ලබයි. එබැවින් මෙම කාර්යයන් වඩාත් ඵලදායී හා කාර්යක්ෂම අයුරින් ක්‍රියාත්මක කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් දැනුම් කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කර ඇති අතර. තොරතුරු අවශ්‍ය තැනැත්තන්ට මෙම ඒකකයට පැමිණ ඔවුනට අදාළ තොරතුරු ලබාගැනීමේ පහසුකම් සලසා ඇත. ඉදිරියේ දී මෙම කාර්යයන් වඩාත් පහසුකරලීම සඳහා පැමිණෙන පරිශීලකයන් සඳහා රැදී සිටීමේ ස්ථාන, පරිගණක, මල්ටි මීඩියා පහසුකම් හා ඉ තොරතුරු ලබා ගැනීම දක්වා වූ පහසුකම් ලබා දීමට කොමිෂන් සභාව කටයුතු කර ඇත.

### 2.18. 2024 වසර තුළ එළි දක්වන ලද ප්‍රකාශන

මැතිවරණ කොමිෂන් සභාවේ 2017-2020 දක්වා වූ සිවු අවුරුදු සහභාගීත්ව උපාය මාර්ගික සැලැස්මේ හඳුනාගන්නා ලද අවධාරිත ක්ෂේත්‍ර යටතේ කොමිෂන් සභාවේ කාර්යයන් හා කර්තව්‍යන් අළලා කාර්තුමය වශයෙන් කතිරයේ බලය නමින් (News Letter) පුවත් සඟරාවක් එළි දක්වන ලදී. එහි කතිරයේ බලය පුවත් සඟරාවේ හත්වන වෙළුමේ තුන්වන කලාපය (ඔක්තෝම්බර් - දෙසැම්බර් 2023), අටවන වෙළුම පළමු කලාපය (ජනවාරි - අප්‍රේල් 2024), අටවන වෙළුමේ දෙවන කලාපය (මැයි - අගෝස්තු 2024) ,සමාලෝචිත වර්ෂයේ අවසන් කලාපය (සැප්තැම්බර් - දෙසැම්බර් 2024) කලාපය මුද්‍රණය කර ඇත.






2025 අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය භාර්යයන් සහ ක්‍රියාකාරකම් ඇතුළත් 2024 ප්‍රගති වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

### 2.19. නීති කටයුතු

2024 වර්ෂයේ මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා සහ සාමාජික මහතුන් ද මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් ද වගඋත්තරකරුවන් ලෙස නම් කරමින් අලුතින් ගොනු කරන ලද නඩු කටයුතු 27 ක් මැතිවරණ කොමිෂන් සභාව වෙත වාර්තා වී ඇත. මෙම අධිකරණ ක්‍රියාමාර්ග සඳහා වගඋත්තරකරුවන් ලෙස නම් කර ඇති මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් වෙනුවෙන් පෙරකලාසි සකස් කිරීම, නිරීක්ෂණ සකස් කිරීම, නඩු කටයුතුවලට අවශ්‍ය වන ලේඛන නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම මැතිවරණ කොමිෂන් සභාවේ නීති විමර්ශන හා සැලසුම් අංශය විසින් සිදු කර ඇත. එමෙන්ම අවශ්‍ය අවස්ථාවන්හී දී නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග සාකච්ඡා සඳහා සහභාගී වී ඇත.

#### 2.19.1. ශ්‍රේෂ්ඨාධිකරණය

මැතිවරණ කොමිෂන් සභාවට එරෙහිව මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධයෙන් පෙත්සම් 13 ද, රිට් පෙත්සම් 10 ක් ද වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද නඩු කටයුතු සංඛ්‍යාව 23 ක් වේ.

ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද නඩු අතරින්, 2024 ජනාධිපතිවරණය පැවැත්වීම තුළින් සිය මූලික අයිතිවාසිකම් කඩවන බව සඳහන් කරමින් SC/FRA/177/2024 හා SC/FRA/191/2024 අංක දරන නඩු ද, 2024 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා 2024.11.14 වන දින නම් කිරීමට එරෙහිව SC/FRA/292/2024 හා SC/FRA/295/2024 අංක දරන නඩු ද, 2024 පාර්ලිමේන්තු මැතිවරණයේ නාමයෝජනා ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් SC/Writ/11/2024, SC/Writ/12/2024, SC/Writ/13/2024, SC/Writ/14/2024 හා SC/Writ/15/2024 අංක දරන නඩු ද ගොනුකර ඇත.

එසේම පාර්ලිමේන්තු මැතිවරණයේ රංජන් රාමනායක මහතාගේ නාමයෝජනා පත්‍රය භාරගැනීම හා මැතිවරණයට ඉදිරිපත් වීම සඳහා අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් නඩු 1 ක් ද, (නඩු අංක SC/FRA/296/2024) මුජිබර් රහුමාන් මහතා ජාතික ලැයිස්තු අපේක්ෂකයකු වශයෙන් පත් කිරීම සම්බන්ධයෙන් නඩු 1 ක් ද, (නඩු අංක SC/FRA/160/2024) 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ නාමයෝජනා අවලංගු කිරීමකින් තොරව ඡන්දය පැවැත්වීම සම්බන්ධයෙන් නඩු කටයුතු 3 ක් ද, (නඩු අංක SC/FRA/309/2024, SC/FRA/328/2024, SC/FRA/335 /2024) ගොනුකර ඇත.

තවද ඡන්ද හිමි නාමලේඛනයෙන් නම ඉවත් කිරීම සම්බන්ධ SC/Writ/02/2024, SC/Writ/03/2024) අංක දරන නඩු ද, ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ වාර්ෂික සම්මේලන වාර්තාව පිළිගැනීම සම්බන්ධයෙන් SC/Writ/04/2024 අංක දරන නඩුවද, සිරදඬුවම් විඳිනු ලබන පුද්ගලයින් හට ඡන්ද අයිතිය ලබා දීම සම්බන්ධයෙන් SC/Writ/08/2024 අංක දරන නඩුවද, ලංකා ජනතා පක්ෂය අක්‍රිය කිරීමට එරෙහිව ගොනුකරන ලද SC/Writ/09/2024 අංක දරන නඩුවද , 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් කාල සීමාව තුළ ප්‍රජා උපදේශන කමිටු පිහිටුවීම සම්බන්ධයෙන් SC/FRA/139/2024, SC/FRA/143/2024 අංක දරන නඩු ද, වරාය අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂවරයා සේවයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් SC/FRA/299/2024 අංක දරන නඩුවද හා 2024 ජනාධිපතිවරණ කාලසීමාව තුළ නීතිවිරෝධී ලෙස විනිවිදභාවයකින් තොරව මත්පැන් බලපත්‍ර අලුතින් නිකුත් කිරීම තුළින් තම මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවට සඳහන් කරමින් SC/FRA/318/2024 අංක දරන නඩුවද වශයෙන් 2024 වර්ෂයේදී නඩු කටයුතු ගොනුකර ඇත.

### 2.19.2. අභියාචනාධිකරණය

අභියාචනාධිකරණයේ ගොනු කරන ලද නඩු කටයුතු 03 ක් ලැබී ඇති අතර, එම නඩු අතරින් 2024 පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව නාමයෝජනා ප්‍රතික්ෂේපවීම සම්බන්ධව නඩු කටයුතු 02ක් ද, (නඩු අංකය CA/WRIT/664/2024, CA/WRIT/666/2024) වරාය අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂවරයා සේවයෙන් ඉවත් කිරීම සම්බන්ධව නඩු කටයුතු 1ද (නඩු අංකය CA/WRIT/637/2024) වශයෙන් ගොනුකර ඇත.

### 2.19.3. මහාධිකරණය

2024 වසරේ මැතිවරණ කොමිෂන් සභාව පාර්ශ්වකරුවකු ලෙස නම් කරමින් මහාධිකරණයේ කිසිදු නඩුකරයක් ගොනු කර නොමැත.

### 2.19.4. දිසා අධිකරණය

දිසා අධිකරණයේ ගොනු කරන ලද නඩු සංඛ්‍යාව 01 ක් වන අතර, එම නඩුව 2024 ඡන්ද හිමි නාමලේඛනයට නම ඇතුළත් නොකිරීම සම්බන්ධයෙන් ගොනුකර ඇත. (වලස්මුල්ල දිසා අධිකරණ නඩු අංක SPL-01)

### 2.19.5. මහේස්ත්‍රාත් අධිකරණය

2024 වසරේ මැතිවරණ කොමිෂන් සභාව පාර්ශ්වකරුවන් ලෙස නම් කරමින් මහේස්ත්‍රාත් අධිකරණයේ කිසිදු නඩුකරයක් ගොනු කර නොමැත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරනු ලැබූ ඉහත කී නඩු අතුරින් නඩු 14 ක් ගරු අධිකරණය විසින් අවසන් තීන්දු ලබාදීමෙන් සහ පෙත්සම්කරුවන් විසින් ඉල්ලා අස්කර ගැනීම හේතුවෙන් අවසන්ව ඇති අතර නඩු 9 ක් මේ වන විටත් ගරු අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී. අභියාචනාධිකරණයේ ගොනුකර ඇති නඩු 3 අතුරින් නඩු 2 ක් මේ වන විට අවසන්ව ඇති අතර එක් නඩුවක් පමණක් විභාග වෙමින් පවතී. දිසා අධිකරණයේ පවරා ඇති නඩුව තවදුරටත් ගරු අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

### 2.19.6. නීතිපති උපදෙස් විමසීම්

නෛතික තත්ත්ව පිළිබඳ නීතිපති උපදෙස් විමසීම් 06 ක් යොමු කර ඇති අතර, ඒ සඳහා ගරු නීතිපතිතුමා විසින් ලබාදුන් උපදෙස් පිළිබඳව අදාළ පාර්ශ්ව දැනුම්වත් කර ඇත.

### 2.19.7. මානව හිමිකම් කොමිෂන් සභාවට අදාළ පැමිණිලි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අදාළ විමර්ශන

මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින් ලැබුණු පැමිණිලි 05 ක් සඳහා අදාළ පාර්ශ්ව වෙතින් තොරතුරු විමසීම් සහ අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වන විට සිදු කර ඇත. එමෙන්ම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අදාළ විමර්ශන 04 ක් සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීම ද සිදු කර ඇත.

### 2.19.8. ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළ  නෛතික කටයුතු සහ බී.සී පත්‍රිකා අපහරණය

ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන 2024 ට අදාළව සිරදඬුවම් විඳින තැනැත්තන් 92 දෙනෙකු අසාධු ලේඛන ගත කිරීමට උපදෙස් ලබා දී ඇත. ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන 2024 ට අදාළව ඉදිරිපත් කරන ලද හිමිකම් ඉල්ලීම් සහ විරෝධතා දැක්වීම්වලට අදාළව උපදෙස් ලබාදීම් 30 ක් සිදු කර ඇත.

### 2.20. මැතිවරණ නීති සංශෝධන

මැතිවරණ නීති සංශෝධනය සඳහා  හිටපු අගවිනිසුරුවරයකු වන ප්‍රියසාත් ඩෙප් මහතාගේ ප්‍රධානත්වයෙන් පත් කළ කමිටු වාර්තාවේ නිර්දේශ සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාවේ නිරීක්ෂණ යොමු කර ඇත.

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා විසින් 2022 ජුලි මස 06 වන දින පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කරන ලද 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ අදහස් හා යෝජනා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් කාර්යාංශය වෙත යොමු කරන ලදී.
නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග පැවති සාකච්ඡාවේ දී මතු වූ ගැටළු සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ යෝජනා ඇතුළත් සංශෝධිත කෙටුම්පත ජනාධිපති ලේකම් වෙත ඉදිරිපත් කරන ලදී.

නීති කොටුම්පත් සම්පාදක විසින් සකස් කර ජනාධිපති ලේකම් වෙත ඉදිරිපත් කරන ලද මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පතට අදාළව මැතිවරණ කොමිෂන් සභාවේ යෝජනා ද ඉදිරිපත් කළ පසු ඒ පිළිබඳව අවධානය යොමුකොට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලෙස ජනාධිපති ලේකම් වෙත දන්වා ලිපි යොමු කරන ලදී.

"උචිත ලකුණින් "  සලකුණු කිරීමේ පියවර සියලු මැතිවරණ පනත්වලින් ඉවත් කිරීම සඳහා සකස් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයක්  යොමු කරන ලදී. ඒ සඳහා 2024.03.26 දින අමාත්‍ය මණ්ඩල තීරණය ලැබි ඇති අතර, එම පනත් කෙටුම්පතෙහි සඳහන් යෝජනා සම්බන්ධයෙන් ලැබී ඇති  අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළව ඉදිරි කටයුතු සිදු කර ඇත.

මැතිවරණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත්කර ඇති යෝජනා පිළිබඳව අවධානය යොමුකරමින් මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සම්මත කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනාධිපති ලේකම් වෙත ලිපි යොමු කර ඇත.[මෙම මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පතෙහි ඡන්ද විමසීම් දිනයේ දී ඡන්ද පොළට පැමින ඡන්දය ප්‍රකාශ කළ නොහැකි ඡන්ද දායකයින් වෙනුවෙන් විශේෂ සහ ජංගම ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවීම, පූර්ව ඡන්ද ප්‍රකාශ කිරීම සඳහා අවස්ථාව සලසා දීම, දේශපාලන පක්ෂ සහ අපේක්ෂකයින් විසින් පිළිපැදිය යුතු ආචාරධර්ම සහ මාධ්‍ය උපමාන පිළිබඳව ප්‍රතිපාදනයන් ඇතුළත්ව ඇති අතර ඡන්දය ප්‍රකාශ කිරීමේ හිමිකම සහිත සියළු පුරවැසියන්ගේ ඡන්ද අයිතිය සුරැකීම සහ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් සඳහා මැතිවරණ නීතිය පුළුල් කිරීම මෙම සංශෝධන තුළින් අපේක්ෂා කෙරේ.]

ඡන්ද විමසීම් සඳහා ඇප තැන්පත් මුදල් විධිමත් කිරීම සඳහා වූ නීති සංශෝධනය කිරීම සම්බන්ධව සකස්කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් යොමු කළ අතර, 2024.04.26 වන දින ඒ සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය ලැබි ඇති අතර, එමගින් ඉහත සංශෝධන සඳහා අනුමැතිය හිමිව ඇත.

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ ඇප මුදල් සංශෝධනය සම්බන්ධයෙන් ගරු නීතිපතිවරයා විසින් ඉදිරිපත් කර ඇති නිරීක්ෂණයන් සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ ස්ථාවරය අධිකරණ බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් දී ඇත.

## 2.21. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ කටයුතු

2024.01.01 දින සිට 2024.12.31දක්වා කාලය තුළ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතට අදාළව විමසීම් කරන ලද තොරතුරු ඉල්ලීම් 194 කින් 190 ක් සඳහා තොරතුරු ලබා දී ඇති අතර,තොරතුරු ඉල්ලීම් 04 ක් සඳහා මේ වන විට අවශ්‍ය තොරතුරු ලබාගැනීමට අදාළ අංශ වෙත යොමු කර ඇත.

## 2.22. මැතිවරණ කාර්යය සඳහා දේශපාලන පක්ෂ පිළිගැනීම

රටක පාලනය සඳහා නියෝජිතයන් තෝරා ගැනීමට මෙන්ම දේශපාලන පරිසරය හුරු පුරුදු කිරීමට දේශපාලන පක්ෂ ක්‍රමය සිදුකරන්නේ විශාල කාර්ය භාරයකි. එම නිසා නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය තුළ දේශපාලන පක්ෂ වල භූමිකාව ඉතා වැදගත් වේ.දේශපාලන පක්ෂයක් යනු කිසියම් ප්‍රතිපත්තියක් මත රාජ්‍ය බලය ලබා ගැනීම සඳහා උත්සාහකරන දේශපාලන සංවිධානයකි. මෙම දේශපාලන ක්‍රියාකාරී සංවිධාන මැතිවරණ කාර්යය වෙනුවෙන් දේශපාලන පක්ෂ ලෙස මැතිවරණ කොමිෂන් සභාව විසින් පිළිගැනීම සඳහා නෛතික විධිවිධාන 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7වන වගන්තියේ දක්වා ඇත.

ඒ අනුව, යම් දේශපාලන ක්‍රියාකාරී සංවිධානයක් මැතිවරණ කොමිෂන් සභාව විසින් පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකණු ලැබීමට ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙසට දන්වමින් සෑම වර්ෂයකම ජනවාරි මාසයේ 31 දිනට ප්‍රථම ප්‍රසිද්ධ දැන්වීමක් මැතිවරණ කොමිෂන් සභාව විසින් පළ කරනු ලැබේ. අදාළ ක්‍රියාකාරී සංවිධානය එම දැන්වීමේ සඳහන් නියමිත කාලය තුළ දී තම ඉල්ලීම ඉදිරිපත්කළ යුතු අතර එම කාල සීමාවේ කුමන හෝ මැතිවරණයක් සඳහා දින ප්‍රකාශ කර ඇත්නම් , මෙම ක්‍රියාවලිය එම මැතිවරණ කාල සීමාව අවසන් වී දින 30ක් ගත වන තෙක් අත් හිටුවනු ලැබේ. ඒ අනුව 2023.01.04 දින පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023 ප්‍රකාශයට පත් කළ බැවින් සහ එය 2024.01.01 වන විටත් එකී නාමයෝජනා බලාත්මකව පවත්නා හෙයින් පළාත් පාලන ඡන්ද විමසීම පවත්වා අවසන් වී දින 30ක් ගත වන තෙක් දේශපාලන පක්ෂ පිළිගැනීමට අයදුම්පත් කැඳවීමක් සිදු නොවීය.

දේශපාලන ක්‍රියාකාරී සංවිධානයක් පිළිගත් දේශපාලන පක්ෂ ලෙස සලකනු ලැබීමට මැතිවරණ කොමිෂන් සභාව වෙත අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය. එම අයදුම්පතක සමග, මැතිවරණ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඡන්ද ලකුණු අතරින් තමන් තෝරා ගන්නා ලකුණක්, පක්ෂ ව්‍යවස්ථාව, අනිවාර්යයෙන්ම එක් කාන්තා නියෝජිතයෙක් හෝ ප්‍රධාන තනතුරකට ඇතුළත් කරන ලද පක්ෂ නිලධාරී ලැයිස්තුව, පක්ෂයේ පසුගිය වසර හතරේ විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශ, පක්ෂයේ තත්කාලීන ප්‍රතිපත්ති ප්‍රකාශය යන තොරතුරු ඉදිරිපත් කළ යුතුය. ඉල්ලීම් සමඟ එය ඉදිරිපත් කිරීමේ දිනයට අවම වශයෙන් අවුරුදු හතරක කාලයකට පෙරාතුව සිට ක්‍රියාකාරීව දේශපාලන කටයුතු වල නියැලී සිටි බවට සනාථ කෙරෙන තොරතුරු ඉදිරිපත් කිරීම අවශ්‍යතාවයකි. එසේ නොමැතිනම් පක්ෂය නියෝජනය කරමින් තරඟ වැදුණු අපේක්ෂකයන් දෙදෙනෙකු අතරින් අවම වශයෙන් එක් අපේක්ෂකයකුවත් එම ඉල්ලීම් ඉදිරිපත් කරන ලද දිනයට පෙරාතුව පවත්වන ලද පාර්ලිමේන්තු මහ මැතිවරණයේ දී ජයග්‍රහණය කර ඇති බව සනාථ කළ යුතුය. එසේත් නොමැතිනම්, විවිධ පළාත් සභා පහකට පක්ෂය විසින් නම් කරන ලද අවම වශයෙන් වූ අපේක්ෂකයන් පස් දෙනෙකු අතරින් තිදෙනෙකු

මෙම ඉල්ලීම් ඉදිරිපත් කරන ලද දිනයට පෙරාතුව පවත්වන ලද පළාත් සභා ඡන්ද විමසීමේ දී ජයග්‍රහණය කර ඇති බවට තොරතුරු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. කොමිෂන් සභාව ඒ සම්බන්ධයෙන් සෑහීමකට පත්විය යුතු ය.

පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(4)(ආ) වගන්තියට අනුකූලව මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂවල නම් ඇතුළත් ලයිස්තුවක් අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරනු ඇත. 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ කාර්යයන් සඳහා අති විශේෂ ගැසට් පත්‍රය මඟින් "දේශපාලන පක්ෂ වෙත වෙන් කර දී ඇති ලකුණු" සහ "දේශපාලන පක්ෂ සඳහා වෙන් කර දී නොමැති ලකුණු" ප්‍රකාශයට පත් කරනු ඇත. ඒ අනුව 2024 ජනාධිපතිවරණය සඳහා පිළිගත් දේශපාලන පක්ෂවල නම් ඇතුළත් ලැයිස්තුවක් 2024.07.29 දිනැතිව අංක 2395/08 දරන ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇති අතර, 2024.07.29 දිනැතිව අංක 2395/07 දරන ගැසට් පත්‍රය මඟින් පිළිගත් දේශපාලන පක්ෂ ලකුණු ඉදිරිපත් කර ඇත. එමෙන්ම 2024.09.21 දින පැවැති පාර්ලිමේන්තු මැතිවරණය සඳහා 2024.10.04 දිනැතිව අංක 2404/64 ට අනුව පිළිගත් දේශපාලන පක්ෂ සලකුණු සහ 2024.10.04 දිනැතිව අංක 2404/63 අනුව පිළිගත් දේශපාලන පක්ෂවල නම් ඉදිරිපත් කර ඇත.

### 2.23. මැතිවරණ ආරවුල් නිරාකරණය

#### 2.23.1. විවිධ පාර්ශ්වයන් සමඟ පවත්වන ලද සාකච්ඡා

- මැතිවරණ නීති සංශෝධනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් එවන ලද යෝජනා සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම සඳහා නීති සංශෝධන කමිටු සාමාජිකයන් සමග සාකච්ඡාවන් කිහිපයක් පැවැත්වීම.

- දැනට පවත්නා මැතිවරණ නීති සංශෝධනය සම්බන්ධයෙන් සාකච්ඡාවන් කිහිපයක් මැතිවරණ නීති සංශෝධනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීමේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව සහ මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වීම. අංක 124 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත - ඉම්තියාස් බාකිර් මාකාර් මහතා ඉදිරිපත් කරන ලද පෞද්ගලික මන්ත්‍රී යෝජනාව සම්බන්ධයෙන් නීති සංශෝධන කමිටු සාමාජිකයන් සමග සාකච්ඡාවක් ද මීට සමගාමීව පැවැත්වීම.

- මැතිවරණ ආරවුල් කළමනාකරණ ඒකකය පිහිටුවීම හා ඊට අදාළ කටයුතු පිළිබඳ මැතිවරණ නිරීක්ෂණ සංවිධාන හා පොලිසිය සමග පැවැත්වීම.

- ඉදිරි මැතිවරණවල දී ශ්‍රී ලංකා පොලිසියේ සහාය හා ක්‍රියාකාරිත්ව ලබා ගැනීම සහ  මැතිවරණ ආරවුල් නිරාකරණ ඒකකය  වෙත පැමිණිලි ලබා ගැනීමේ දී තොරතුරු තාක්ෂණ පද්ධතිය යොදා ගැනීම හා ඊට අදාළ කාර්යයන් පිළිබඳව  සාකච්ඡා කිහිපයක් පැවැත්වීම.

- සමාජ මාධ්‍ය හා අන්තර්ජාලයේ ව්‍යාප්තවන දූස් තොරතුරු හා හානිකර අන්තර්ගත පිළිබඳ (Disinformation and Harmful Content) නිරීක්ෂණය හා පාලනය සඳහා කටයුතු කිරීම සම්බන්ධව TikTok ආයතනය විසින් සංවිධානය කරන ලද සාකච්ඡාවක් සඳහා සහභාගී වීම. මේ සඳහා විවිධ පාර්ශ්වයන් සහභාගී විය.

- 2024 ජනාධිපතිවරණය සහ 2024 පාර්ලිමේන්තු  මැතිවරණය අරමුණ කර ගනිමින් සමාජ මාධ්‍ය නාලිකාව/ ජාලය/ ගිණුම ශ්‍රී ලාංකික සමාජ මාධ්‍ය පරිශීලකයින් සහ සමාජය වෙත කරනු ලබන බලපෑම  සම්බන්ධයෙන්  හා මැතිවරණ කාල සීමාව තුළ ඡන්ද හිමියන් වෙත තොරතුරු අදහස් හා

මතවාද සන්නිවේදනයේ දී සමාජ මාධ්‍ය භාවිතයෙන් සිදු කරනු ලබන ඉදිරිපත් කිරීම් පිළිබඳව හා එහිදී අනුගමනය කරනු ඇතැයි අපේක්ෂිත නීති, මාධ්‍ය උපමාන, ආචාර ධර්ම පිළිබඳව දැනුම්වත් කිරීම සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය ක්‍රියාකරුවන් සමඟ සාකච්ඡාවක් පැවැත්වීම.

**2.23.2. 2024 වර්ෂයේ දී ප්‍රකාශයට පත්කරන ලද ගැසට් නිවේදන.**

**2.23.2.1. 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා,**

ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී රජයට හෝ රාජ්‍ය සංස්ථාවලට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළ පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන පරිදි හෝ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්යයට බාධාවන පරිදි ඍජුව හා වක්‍ර ලෙස හෝ යොදා ගැනීම වැළැක්වීම සඳහා වූ විධාන ගැසට් නිවේදන

- 2024.01.08 දිනැති අංක 2366/02 දරණ විධාන ගැසට් පත්‍රය මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023 ට අදාළ ගැසට් නිවේදනය ඉදිරි මාස 03 ක කාලයක් වලංගු බවට වන ගැසට් නිවේදනය
- 2024.04.09 දිනැති අංක.2379/15 දරන ගැසට් අංක මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023 ට අදාළ විධාන ගැසට් නිවේදනය ඉදිරි මාස 03 ක කාලයක් වලංගු බවට වන ගැසට් නිවේදනය
- 2024.07.10 දිනැති අංක 2392/28 දරන ගැසට් අංක මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023 ට අදාළ විධාන ගැසට් නිවේදනය ඉදිරි මාස 03 ක කාලයක් වලංගු බවට වන ගැසට් නිවේදනය
- 2024.10.11 දිනැති අංක 2405/44 දරන ගැසට් අංක මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023 ට අදාළ විධාන ගැසට් නිවේදනය ඉදිරි මාස 03 ක කාලයක් වලංගු බවට වන ගැසට් නිවේදනය

**2.23.2.2. 104 ආ.(5)(අ) අනුව්‍යවස්ථාව යටතේ වන මාධ්‍ය උපමාන ගැසට් නිවේදන**

- 2024.01.08 දිනැති අංක 2366/03 දරණ මාධ්‍ය උපමාන ගැසට් පත්‍රය මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023 ට අදාළ ගැසට් නිවේදනය ඉදිරි මාස 03 ක කාලයක් වලංගු බවට වන ගැසට් නිවේදනය
- 2024.04.09 දිනැති අංක 2379/14 දරන ගැසට් අංක මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023 ට අදාළ මාධ්‍ය උපමාන ගැසට් නිවේදනය ඉදිරි මාස 03 ක කාලයක් වලංගු බවට වන ගැසට් නිවේදනය
- 2024.07.10 දිනැති අංක 2392/27 දරන ගැසට් අංක මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023 ට අදාළ මාධ්‍ය උපමාන ගැසට් නිවේදනය ඉදිරි මාස 03 ක කාලයක් වලංගු බවට වන ගැසට් නිවේදනය
- 2024.10.11 දිනැති අංක 2405/45 දරන ගැසට් අංක මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023 ට අදාළ මාධ්‍ය උපමාන ගැසට් නිවේදනය ඉදිරි මාස 03 ක කාලයක් වලංගු බවට වන ගැසට් නිවේදනය

**2.23.2.3. 2024 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමට අදාළව**

- ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී රජයට හෝ රාජ්‍ය සංස්ථාවලට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළ පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන පරිදි හෝ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්යයට බාධාවන පරිදි ඍජුව හා වක්‍ර ලෙස හෝ යොදා ගැනීම වැළැක්වීම සඳහා වූ විධාන ඇතුළත් 2024.07.26 දිනැති අංක 2394/56 දරන ගැසට් නිවේදනය

- 2024.07.26 දිනැති අංක 2394/57 දරන මාධ්‍ය උපමාන ගැසට් නිවේදනය

- ඡන්ද විමසීම්වල දී තරග කරනු ලබන දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයන් විසින් අනුගමනය කළ යුතු ආචාර ධර්ම පද්ධතිය ඇතුළත් 2024.07.26 දිනැති අංක 2394/58 දරන ගැසට් නිවේදනය නිකුත් කිරීම.

**2.23.2.4. 2024 පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව**

- ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී රජයට හෝ රාජ්‍ය සංස්ථාවලට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළ පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන පරිදි හෝ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්යයට බාධාවන පරිදි ඍජුව හා වක්‍ර ලෙස හෝ යොදා ගැනීම වැළැක්වීම සඳහා වූ විධාන ඇතුළත් 2024.09.25 දිනැති අංක 2403/19 සහ 2025.09.25 අංක 2403/21 දරන ගැසට් නිවේදන.

- 2024.09.25 දිනැති අංක 2403/20 දරන මාධ්‍ය උපමාන ගැසට් නිවේදනය නිකුත් කිරීම

**2.23.3. 2024 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම සහ 2024 පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ කාර්යයන් සිදු කිරීම**

- ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමට අදාළව 2024.07.26 දින සිට සුදුසුකම්ලත් කාර්ය මණ්ඩලයකින් සමන්විතව ජාතික මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානය පිහිටුවන ලදී. මෙම ඒකකය තුළ සමාජ මාධ්‍ය හා අන්තර්ජාලයේ ව්‍යාප්තවන දූස් තොරතුරු හා හානිකර අන්තර්ගත ව්‍යාජ පුවත් නිරීක්ෂණය කිරීම සඳහා වූ ඒකකයක් පිහිටුවීමට හා ඒ සඳහා සුදුසුකම්ලත් නිලධාරී මණ්ඩලයක් (මාණ්ඩලික) පත්කිරීමට ද කටයුතු කරන ලදී.

- 2024.08.10 දින සිට 2024.08.18 දින දක්වා වූ කාල සීමාව තුළ මැතිවරණ ආරවුල් නිරාකරණය සම්බන්ධව සහකාර තේරීම්භාර නිලධාරීන් හා පොලිස් නිලධාරීන් දැනුම්වත් කිරීමේ පුහුණු වැඩසටහන් සියලුම දිස්ත්‍රික් ආවරණය කරමින් පහත ආකාරයට පැවැත්වීමට කටයුතු කරන ලදී.

| | | |
|---|---|---|
| 2024.08.10 | - | අනුරාධපුරය, පොලොන්නරුව, වවුනියාව, මන්නාරම, යාපනය, කිලිනොච්චිය, මුලතිව්, ගාල්ල, මාතර, හම්බන්තොට |
| 2024.08.11 | - | බදුල්ල, මොණරාගල, නුවරඑළිය, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර |
| 2024.08.12 | - | රත්නපුර, කෑගල්ල, කුරුණෑගල, පුත්තලම, මහනුවර, මාතලේ |
| 2024.08.17 | - | ගම්පහ |
| 2024.08.18 | - | කොළඹ, කළුතර |

- 2024 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම් දින - 2024.09.21 දින මැතිවරණ කාල සීමාව තුළ දී පැමිණිලි අංශයේ දෛනික නිරීක්ෂණ කටයුතු සඳහා ජාතික මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානයේ පැමිණිලි අංශය තුළ පිහිටුවන ලද ඒකකය තුළ දේශපාලන පක්ෂ නියෝජිතයන්, නිරීක්ෂණ කණ්ඩායම් සහ පොලිස් නිලධාරීන්ගේ සහභාගි වීමට අවස්ථාව ලබා දෙන ලදී.

- 2024 ජනාධිපතිවරණ කාලසීමාව තුළ දී PAFFREL සංවිධානයේ නියෝජිතයෙකු බැගින් ජාතික මැතිවරණ ආරවුල් නිරාකරණ ඒකකය තුළ සහ සියලුම දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් නිරාකරණ ඒකක තුළ පැමිණිලි නිරීක්ෂණ කටයුතු සඳහා සහභාගී වීමට අවස්ථාව සලසා දෙන ලදී.

- 2024.10.18 දින සිට 2024.11.03 දින දක්වා පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව මැතිවරණ ආරවුල් නිරාකරණය සම්බන්ධව සහකාර තේරීම්භාර නිලධාරීන් හා පොලිස් නිලධරයන් දැනුම්වත් කිරීමේ පුහුණු වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වීම (මෙම වැඩසටහන් පොලිස් දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී)

  2024.10.18 - කුරුණෑගල
  2024.10.19 - අනුරාධපුර, පොලොන්නරුව, වව්නියාව, කිලිනොච්චිය, මන්නාරම, මුලතිව්
  2024.10.20 - යාපනය
  2024.10.23 - ගාල්ල, රත්නපුර, මාතර
  2024.10.24 - කළුතර
  2024.10.25 - ගම්පහ
  2004.10.26 - මහනුවර, මාතලේ
  2024.10.27 - නුවරඑළිය, බදුල්ල, මොණරාගල
  2024.10.28 - පුත්තලම
  2024.10.29 - කොළඹ
  2024.11.02 - ත්‍රිකුණාමලය
  2024.11.03 - මඩකලපුව, අම්පාර

- 2024 පාර්ලිමේන්තු මැතිවරණ දිනයට අදාළව මැතිවරණ කාල සීමාව තුළ දී පැමිණිලි අංශයේ දෛනික නිරීක්ෂණ කටයුතු සඳහා ජාතික මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානයේ පැමිණිලි අංශයේ පිහිටුවන ලද ඒකකය තුළ දේශපාලන පක්ෂ නියෝජිතයන්, නිරීක්ෂණ කණ්ඩායම් සහ පොලිස් නිලධාරීන්ගේ සහභාගි වීමට අවස්ථාව ලබා දෙන ලදී.

- 2024 පාර්ලිමේන්තු මැතිවරණ කාලසීමාවේ PAFFREL සංවිධානයේ නියෝජිතයෙකු බැගින් ජාතික මැතිවරණ ආරවුල් නිරාකරණ ඒකකය තුළ සහ සියලුම දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් නිරාකරණ ඒකක තුළ, පැමිණිලි නිරීක්ෂණ කටයුතු සඳහා යෙදවීමට අවස්ථාව සලසා දෙන ලදී.

### 2.24. වාහන පාලනය

මැතිවරණ කොමිෂන් සභාව සතු වාහන 61 ක් පවතින අතර ඉන් දිස්ත්‍රික් කාර්යාල සතුව වාහන 28 ක් ද ප්‍රධාන කාර්යාලය සතුව වාහන 33 ක් ද ඇත. ප්‍රධාන කාර්යාලය සතු වාහන වල වාර සේවාවන් සහ අළුත්වැඩියා කටයුතු ප්‍රවාහන අංශය මඟින් ඉටු කරනු ලැබේ. ඒ අනුව 2024 වර්ෂය තුලදී ප්‍රධාන කාර්යාලයේ වාහන වල සේවාවන් සහ අළුත්වැඩියා කටයුතු සඳහා වියදම රු.16,089,895.74 ක් ද වාහන වලට සැපයූ ඉන්ධන සඳහා වූ වියදම රු. 7,581,854.57 විය. (මැතිවරණ කාලසීමාවල දී වියදම් මීට ඇතුළත් නොවේ.)

නියමිත කාලසීමාව තුළ දී සියළුම වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට ද කටයුතු කරන ලදී.

2025 වර්ෂය සඳහා වාහන රක්‍ෂණය කිරීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර ඒ අනුව පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී. නැමැති රක්ෂණ සමාගම තෝරා පත් කර ගෙන ඇත.

**2.24.1. මැතිවරණ කාල සීමාව තුළ පරිපාලන කටයුතු**

2024.09.21 දින ජනාධිපතිවරණය ද, 2024.11.14 වැනි දින පාර්ලිමේන්තු මැතිවරණය ද පැවැත්විණි. පූර්ව මැතිවරණ රාජකාරිවල නිරත වූ ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්ට/ සේවකයින්ට රාජකාරි නිමවීමෙන් පසු රාත්‍රී කාලයේ දී තම නිවෙස් කරා යාමට සහ පසු දින නැවත සේවයට වාර්තා කිරීමට ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා කාර්, වෑන් සහ කැබ් රථ සහ ගබඩා ද්‍රව්‍ය ප්‍රවාහනයට අවශ්‍ය අමතර ලොරි රථ කීපයක් ද වෙනත් රාජ්‍ය ආයතන වලින් ලබා ගැනීමට සිදු විය.

වෙනත් රාජ්‍ය ආයතන වලින් ප්‍රධාන කාර්යාලයට තාවකාලික ලබා ගත් වාහන පිළිබඳව විස්තර පහත පරිදි වේ.

**2.24.1.1. ජනාධිපතිවරණය-2024.09.21**

වෙනත් රජයේ ආයතන වෙතින් තාවකාලික පදනම මත ලබා ගත් වාහන පිළිබඳ තොරතුරු

| | | |
|---|---|---|
| කැබ් රථ සංඛ්‍යාව | - | 05 |
| වෑන් රථ සංඛ්‍යාව | - | 08 |
| ලොරි රථ සංඛ්‍යාව | - | 02 |
| කාර් රථ සංඛ්‍යාව | - | 03 |
| ජීප් රථ සංඛ්‍යාව | - | 04 |
| **එකතුව** | | **22** |

මෙම වාහන වලට සහ ප්‍රධාන කාර්යාලය සතු වාහන වලට ඉන්ධන සැපයීම වෙනුවෙන් වියදම රුපියල් 14,023,185.78 ද සේවා සහ අළුත්වැඩියා කටයුතු සඳහා වියදම රුපියල් 12,613,970.43 ක් ද විය.

**2.24.1.2. පාර්ලිමේන්තු මැතිවරණය - 2024.11.14**

වෙනත් රජයේ ආයතන වෙතින් තාවකාලික පදනම මත ලබා ගත් වාහන පිළිබඳ තොරතුරු

| | | |
|---|---|---|
| කැබ් රථ සංඛ්‍යාව | - | 10 |
| වෑන් රථ සංඛ්‍යාව | - | 07 |
| ලොරි රථ සංඛ්‍යාව | - | 04 |
| කාර් රථ සංඛ්‍යාව | - | 03 |
| ජීප් රථ සංඛ්‍යාව | - | 02 |
| **එකතුව** | | **26** |

මෙම වාහන වලට සහ ප්‍රධාන කාර්යාලය සතු වාහන වලට ඉන්ධන සැපයීම වෙනුවෙන් වියදම රුපියල් 5,322,659.50 ද සේවා සහ සුළු අළුත්වැඩියා කටයුතු සඳහා වියදම රුපියල් 7,221,468.45 ක් ද විය.

### 2.24.2. මැතිවරණ කොමිෂන් සභාවේ වාහන පිළිබඳ තොරතුරු

2024.12.31 දිනට මැතිවරණ කොමිෂන් සභාව සතුව පැවති වාහන පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | වාහන වර්ගය | සංඛ්‍යාව | කාර්යාලය | | | |
|---|---|---|---|---|---|---|
| | | | ප්‍රධාන කාර්යාලය | | දිස්ත්‍රික් කාර්යාල | |
| | | | සංචිත | වෙන්කල | සංචිත | වෙන්කල |
| 1 | කැබ් | 34 | 8 | - | 26 | - |
| 2 | කාර් | 19 | 9 | 8 | 1 | 1 |
| 3 | වෑන් | 03 | 3 | - | - | - |
| 4 | ජීප් | 01 | - | 1 | - | - |
| 5 | ලොරි | 01 | 1 | - | - | - |
| 6 | කෘ කැබ් | 01 | 1 | - | - | - |
| 7 | යතුරු පැදි | 01 | 1 | - | - | - |
| 8 | බස් | 01 | 1 | - | - | - |
| එකතුව | | 61 | 24 | 9 | 27 | 1 |

### 2.25. ඉදිකිරීම් හා වත්කම්

### 2.25.1. ඉදිකිරීම් හා අළුත්වැඩියා

**වැය විෂය - 2001**

මැතිවරණ මහලේකම් කාර්යාලයේ ජාතික මැතිවරණ ශාඛාවේ බිත්ති අල්මාරිය සඳහා පියන් සකසා සවිකිරීම, උතුරු පර්යන්ත ගොඩනැගිල්ලේ බිම් මහලේ අලුත්වැඩියා කිරීම, දත්ත මධ්‍යස්ථානයේ නව විදුලි තතැදීම්, අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) නිල කාමරය ප්‍රතිස්ථාපනය, මැතිවරණ මහලේකම් කාර්යාලයේ දුරකථන රැහැන් ක්‍රමවත්ව ප්‍රතිස්ථාපනය කිරීමට අදාළ හදිසි අලුත්වැඩියා කිරීම් හා උතුරු පර්යන්ත ගොඩනැගිල්ලේ සුරක්ෂිතාගාරයේ යකඩ රාක්ක සවිකිරීම ඇතුළු අලුත්වැඩියාවන් සිදුකර ඇත.

එමෙන්ම ගම්පහ, කළුතර, මහනුවර, නුවරඑළිය, ගාල්ල, වවුනියාව, මන්නාරම, ත්‍රිකුණාමලය, කුරුණෑගල, පොළොන්නරුව, බදුල්ල සහ කෑගල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල අලුත්වැඩියා කිරීම් සහ ගම්පහ සහ මහනුවර දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් නිල නිවාස සහ නුවරඑළිය, හම්බන්තොට, අම්පාර සහ කෑගල්ල දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් නිල නිවාස අලුත්වැඩියා කිරීම්, මෙන්ම ත්‍රිකුණාමලය සංචාරක බංගලාවේ හදිසි අලුත්වැඩියා කිරීම් ද සිදුකර ඇත.

### 2.26. ද්‍රව්‍ය මිළදී ගැනීම, යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම /අලුත්වැඩියා කිරීම / නඩත්තු කිරීම

### 2.26.1. ඡන්ද දායකයින් ලියාපදිංචි කිරීම

වාර්ෂිකව පවත්වනු ලබන ඡන්ද දායකයින් ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා බීසී ආකෘති පත්‍ර වෙනුවට “අ” හා “ආ” තොරතුරු පමණක් රැස්කිරීමට අදාළව ER ආකෘති පත්‍ර මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී. ER ආකෘති පත්‍ර **ලක්ෂ 22 ක්** පමණ රජයේ මුද්‍රණාලයෙන් මුද්‍රණය කිරීමෙන් පසුව දිස්ත්‍රික් කාර්යාල වෙත බෙදාහැරීමට කටයුතු කරන ලදී. 2022 වර්ෂයේ සිට හඳුන්වාදුන් පරිපූරක නාම ලේඛනයක් සකස්

කිරීමට අදාළව YC ආකෘති පත්‍ර **ලක්ෂ 10** ක් පමණ මුද්‍රණය කර දිස්ත්‍රික් කාර්යාල වෙත බෙදාහැරීමට ද, හිමිකම් විරෝධතා ආකෘති පත්‍ර හා දැන්වීම ද මුද්‍රණය කර බෙදාහැරීමට ද කටයුතු කරන ලද අතර ඒ වෙනුවෙන් රුපියල් මිලියන 4.44 ක් පමණ වැය කරන ලදී.

### 2.26.2. ඡන්දහිමි නාමලේඛන මුද්‍රණය

2024 ඡන්දහිමි නාමලේඛනය මෙවර පුද්ගලික ආයතනවලින් මුද්‍රණය කිරීමට කටයුතු කර ඇති අතර එම මුද්‍රණ කටයුතු අවසන් කිරීමෙන් පසුව අදාළ දිස්ත්‍රික් කාර්යාලවලට බෙදාහැරීමට කටයුතු කරන ලදී. මැතිවරණ දෙකක් පැවැත්වීමට සිදුවූ බැවින් ඡන්ද විමසීම්වලට අදාළ පරිදි නාම ලේඛන දෙවරක් මුද්‍රණය කිරීමට ද සිදුවිය. ඒ සඳහා වූ වියදම වශයෙන් රු. මිලියන 34.35ක් පමණ ගෙවීම් කිරීමට කටයුතු කර ඇත.

### 2.26.3. යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම / අලුත්වැඩියා කිරීම / නඩත්තු කිරීම

ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල සඳහා යන්ත්‍රසූත්‍රවල අවශ්‍යතාවය පැනනැගී ඇතත් සීමිත ප්‍රතිපාදන හේතුවෙන් යන්ත්‍රසූත්‍ර මිලදී ගැනීම සීමා කිරීමට සිදුවුණි. ඒ අනුව පරිගණක යන්ත්‍ර සහ යූපීඑස් යන්ත්‍ර වැනි භාණ්ඩ පමණක් සුළු ප්‍රමාණයෙන් මිලදීගැනීමට කටයුතු කරන ලදී. ඒ සඳහා රු. මිලියන 6.7 ක් වියදම් කරන ලදී.

කාර්යාලවල භාවිතා කරන පරිගණක මුද්‍රණ යන්ත්‍ර සහ ඡායාපිටපත් යන්ත්‍ර සඳහා අවශ්‍ය ටෝනර් හා ඩ්‍රම් යුනිට් සහ අනුපිටපත් යන්ත්‍ර සඳහා තීන්ත සහ මාස්ටර් මිලදී ගැනීමට රු. මිලියන 96.74ක මුදලක් වැය කර ඇත. මෙම වියදම ඡන්ද විමසීම් දෙකකට අදාළ කාර්යයන් සඳහා අධික සංඛ්‍යාවක් මිලදී ගැනීමට සිදුවීමෙන් ඇති වූ වියදමකි.

ප්‍රධාන කාර්යාලය මාසික දුරකථන සහ අන්තර්ජාල පහසුකම් සඳහා නොවැම්බර් මස දක්වා වූ කාලයට අදාළ බිල්පත් සඳහා රු. මිලියන 16.74 ක් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට ගෙවා ඇත.

ප්‍රධාන කාර්යාලයේ තොරතුරු තාක්ෂණ අංශයට අදාළව ෆයර්වෝල් ඇතුළු විවිධ මෘදුකාංග සඳහා වන බලපත්‍ර මිලදී ගැනීම හා සවිකිරීම සඳහා රු. මිලියන 62.96ක් වැය කිරීමට සිදුවිය.

### 2.26.4. කාර්යාල භාණ්ඩ මිලදී ගැනීම

ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලවලට අවශ්‍ය කාර්යාල භාණ්ඩ මිලදී ගැනීමට අදාළව රු. මිලියන 6 පමණ මුදල් ප්‍රතිපාදන පමණක් ලැබී තිබූ නිසා, කෙටුම්පත් අයවැය ඇස්තමේන්තුවට ඉදිරිපත් කර තිබුණු අවශ්‍යතා මත, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට හැකි පමණින් ප්‍රතිපාදන බෙදා දී අවශ්‍යතාවය සපයා ගැනීමට හැකිවිය. ඒ අනුව රු.මිලියන 5.84ක මුදල වැයකර කාර්යාල භාණ්ඩ මිලදීගෙන තිබුණි.

### 2.26.5. පොදු

ඡන්දහිමි නාමලේඛන මුද්‍රණය, ඡන්දදායකයින් ලියාපදිංචි කිරීමේ කටයුතු සහ කාර්යාලයේ අනෙකුත් ලිපිද්‍රව්‍ය අවශ්‍යතා අනුව සහ ජනාධිපතිවරණය ඇතුළු ඡන්ද විමසීම් දෙකකට අදාළව ලිපිකවර හා නොමැකෙන තීන්ත පෑන් ඇතුලු ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමට ද සිදුවිය. ඒ සඳහා රු. මිලියන 455.3ක පමණ වියදම් කරන ලදී.

ප්‍රධාන කාර්යාලයේ ජල අවශ්‍යතාවය සඳහා රු.965,543.80ක් වියදම් කරන ලද අතර දුරකථන, අන්තර්ජාල සහ වීපීඑන් සම්බන්ධතාව වෙනුවෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට රු.මිලියන 20.17ක පමණ මුදලක් ගෙවන ලදී.

දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වාහනවලට අවශ්‍ය ටයර් මිලදී ගැනීමේ කටයුතු ප්‍රාදේශිය මට්ටමින් සිදුකිරීමට අනුමැතිය ලබාදී තිබූ අතර දිස්ත්‍රික්කයෙන් මිලදී ගැනීමට නොහැකි වූ කාර්යාලවලට සහ මැතිවරණ මහලේකම් කාර්යාලයේ වාහන සඳහා අවශ්‍යතාව මත ටයර් මිලදී ගෙන සැපයීම සිදුකරන ලදී. එම වාහන සඳහා අවශ්‍ය බැටරි ද මිලදී ගැනීමට කටයුතු කරන ලදී.ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කරමින් රු. මිලියන 3.29 ක් පමණ වියදම් කරන ලදී.

ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලවල ඡන්ද විමසීම් අවස්ථාවලදී පාවිච්චි කළ ඡන්ද පත්‍රිකා හා භාවිතයෙන් ඉවත්කළ කඩදාසි රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 අනුව රජයේ කඩදාසි සංස්ථාවට භාරදීමට කටයුතු කරන ලදී. ඒ වෙනුවෙන් 2024 වර්ෂය තුළ කඩදාසි සංස්ථාවෙන් රු. ලක්ෂයක පමණ මුදලක් ලැබුණු අතර මිලියන 6.39 ක පමණ මුදලක් තවදුරටත් ලැබිය යුතුව ඇත.

මැතිවරණවලට අදාළව දිස්ත්‍රික් කාර්යාලවලින් ලැබුණු ඡන්ද පෙට්ටි අළුත්වැඩියා කිරීම සඳහා රජයේ කර්මාන්ත ශාලාවට භාරදීමට කටයුතු කරන ලද අතර ඒ සඳහා රු. මිලියන 2.3ක පමණ මුදල ගෙවීම් කරන ලදී.

ඡන්ද විමසීම්වලට අදාළව නිලඡන්ද දැන්වීම් පත්‍රිකා ද පුද්ගලික ආයතන තුනකින් මුද්‍රණය කිරීමට සිදු වූ අතර ඊට අදාළ ලිපිලේඛන ඇතුළු මුද්‍රණ කටයුතු සඳහා රු.මිලියන 156 ක් පමණ වැය කර ඇත. ඡන්ද විමසීම් සඳහා මුද්‍රණ කටයුතු වෙනුවෙන් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල සතු යන්ත්‍රසූත්‍ර හිඟතාවය හේතුවෙන් පරිගණක යන්ත්‍ර, ලැප්ටොප් යන්ත්‍ර, පරිගණක මුද්‍රණ යන්ත්‍ර සහ ඡායාපිටපත් යන්ත්‍ර කුලී පදනම මත ලබාගැනීමට ද සිදුවිය. ඒ සඳහා රුපියල් මිලියන 3.35ක මුදලක් වැය කරන ලදී.

ප්‍රධාන කාර්යාලයේ ගිනි ආරක්ෂණ පද්ධතිය නවීකරණය කිරීමේ කටයුතු මෙම වර්ෂයතුළ ආරම්භ කරන ලද අතර ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ජාතික ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත භාරදෙන ලදී. එම කටයුතු සඳහා රු. මිලියන 20ක පමණ ප්‍රතිපාදන අදාළ දෙපාර්තමේන්තුව වෙත නිදහස් කර ඇති අතර එම කටයුතු මේවන විටත් සිදුවෙමින් පවතී.

### 2.27. තොරතුරු තාක්ෂණික කටයුතුවල ප්‍රගතිය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මගින් මැතිවරණ කොමිෂන් සභාවේ කටයුතු නව්‍යකරණය කොට ආයතනයේ නිලධාරීන්ට තොරතුරු තාක්ෂණ යෙදුම් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස සකස් කර දීම සහ අදාළ පාර්ශ්වකරුවන්ට අවශ්‍ය තොරතුරු තාක්ෂණ සේවාවන් ආරක්ෂාකාරී ලෙස ලබාදීම මැතිවරණ කොමිෂන් සභාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයට පැවරී ඇති වගකීමකි. නව්‍ය තොරතුරු තාක්ෂණ අවශ්‍යතා අධ්‍යයනය සහ සැලසුම් කිරීම, ව්‍යාපෘති වාර්තා සැකසීම හා අනුමත කර ගැනීම, ව්‍යාපෘති පරීක්ෂාව, ස්ථාපනය කිරීම සහ නිලධාරීන් පුහුණුව මෙන්ම මැතිවරණ කොමිෂන් සභාවේ සියළුම තොරතුරු ආරක්ෂණ කටයුතු සිදු කිරීම මෙම අංශයේ වගකීමකි.

සෑම මැතිවරණ අවස්ථාවකදීම එම කටයුතුවල ආරම්භයේ සිට අවසාන ප්‍රතිඵලය සකස් කිරීම දක්වා වූ ක්‍රියාවලිය විධිමත්ව, නිවැරදිව හා කාර්යක්ෂමව ඉටුකරලීමටත්, වාර්ෂික ඡන්දහිමි නාමලේඛණ ප්‍රතිශෝධනය සහ එම ලේඛණ සැකසීමත් යන කාර්යයන් ඉහළ කාර්යක්ෂමතාවයකින් ඉටුකිරීමටත්, අදාළ පාර්ශ්වයන්ට සේවාවන් පහසුවෙන් සලසාදීමටත් මෙම අංශයේ සේවාවන් මඟින් මහත් පිටුවහලක් ලැබී ඇත.

#### 2.27.1. තොරතුරු තාක්ෂණ අවශ්‍යතා අධ්‍යයනය, මෘදුකාංග නිර්මාණය, සංවර්ධනය හා නඩත්තු කිරීම

2024 සැප්තැම්බර් 21 දින පැවති ජනාධිපතිවරණයේ ප්‍රතිඵල වගුගත කිරීම සහ මාධ්‍ය වෙත නිකුත් කිරීම සඳහා නවමු ඊ ප්‍රතිඵල සැකසුම් පද්ධතියක් සකස් කරන ලදී. ඒ අනුව මැතිවරණ කොමිෂන් සභාව මගින්ම සංවර්ධනය කරන ලද ප්‍රතිඵල පද්ධතියක් මඟින් ප්‍රතිඵල නිකුත් කිරීමට හැකියාව ලැබුණි. මෙම ඊ ප්‍රතිඵල පද්ධතිය දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වන ප්‍රතිඵල වගුගත කිරීමේ පද්ධතිය, ප්‍රතිඵල එසැනින්

මාධ්‍ය වෙත නිකුත් කිරීමේ පද්ධතිය හා උපස්ථ ප්‍රතිඵල පද්ධතියකින් ද සමන්විත වූ අතර, එය නිකුත් කරන ප්‍රතිඵල ජනතාවට පහසුවෙන් ලබා ගත හැකි සහ අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යා හැකි ප්‍රතිඵල වෙබ් අඩවියකින්ද සමන්විත විය.

මෙම ප්‍රතිඵල පද්ධතිය, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සඳහා යොදා ගත හැකි වන ලෙස වැඩි දියුණු කර 2024 ඔක්තෝබර් 26 දින පැවති ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීමේ ප්‍රතිඵල නිකුත් කිරීමද භාවිතයට ගන්නා ලදි.

මැතිවරණ කොමිෂන් සභාව මගින්ම සංවර්ධිත මෙම නවමු ප්‍රතිඵල පද්ධතිය තවදුරටත් වැඩි දියුණු කොට 2024 නොවැම්බර් මස 14 දින පැවති පාර්ලිමේන්තු මැතිවරණයේ ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා යොදා ගන්නා ලදී. ඒ මගින් ඉතා අඩු කාලයක් තුළ ප්‍රතිඵල නිකුත් කිරීමට හැකි විය. අපේක්ෂකයන්ගේ මනාප ප්‍රතිඵලද නිකුත් කිරීමට හැකිවන පරිදි මෙම ප්‍රතිඵල පද්ධතිය වැඩි දියුණු කර ඩිජිටල් ආකාරයෙන් මනාප ප්‍රතිඵල සකසා මාධ්‍ය වෙත නිකුත් කිරීමටද කටයුතු කෙරිණි.

ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වූ අපේක්ෂකයන්ගේ නාමයෝජනා පත්‍රවල ඇතුළත් වූ තොරතුරු වගුගත කොට පසුව පරිශීලනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කරන ලද අතර, එම තොරතුරු ඊ සේවාව හරහා පරිශීලනයට හැකිවන පරිදි ලබා දීම සිදුකරන ලදි.

ඒ ආකාරයටම පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව ඉදිරිපත් වූ නාමයෝජනා පත්‍රවල තොරතුරු වගුගත කිරීමට හැකිවන පරිදි ක්‍රමවේදයක් සකසා අපේක්ෂකයන්ගේ තොරතුරු ඊ සේවාව හරහා පරිශීලනයට හැකිවන පරිදි ලබා දීම සිදු කරන ලදි. මැතිවරණයේ ඉදිරි කටයුතු සඳහා මුද්‍රණ කටයුතු, වාර්තා ලබා ගැනීම, සංඛ්‍යා දත්ත ලබා ගැනීම, නාමයෝජනා පරීක්ෂා කිරීම ඇතුලු නාමයෝජනා මගින් සිදුකරනු ලබන ඉදිරි කටයුතු සිදු කළ හැකි වන පරිදි වැඩි දියුණු කොට අදාළ කාර්යන් සිදු කරන ලදි.

මධ්‍යගත ඡන්ද මධ්‍යස්ථාන පද්ධතියේ ධාරිතා පරීක්ෂාවක් සිදු කර එහි යාවත්කාලීන කිරීම් සිදුකොට 2024 වර්ෂයේ පැවති මැතිවරණ සඳහා යොදා ගැනීම සිදුකරන ලදි.

නිලධාරි සංගණනය සඳහා මුද්‍රිත දත්ත පත්‍රිකා වෙනුවට සම්පූර්ණයෙන්ම ඊ සේවාව භාවිතා කිරීම සිදුකළ හැකි වන පරිදි මාර්ගගත නිලධාරි සංගණනය සඳහා වන ඊ සේවාව වැඩි දියුණු කරන ලදි. ඒ අනුව එහි නියමු ව්‍යාපෘතියක් ලෙස 2024 ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය මහනුවර, වව්නියාව සහ මුලතිව් දිස්ත්‍රික්කයන්හි කඩදාසි භාවිතයකින් තොරව ඊ සේවා හරහා සම්පූර්ණයෙන්ම නිලධාරි සංගණනය සිදුකරන ලදි.

ඊ සේවාව භාවිතයෙන් ලබා ගන්නා දත්ත මගින් නිලධාරි සංගණනයට අදාළ ඉදිරි කටයුතු සිදුකළ හැකිවන නිලධාරි සංගණන අභ්‍යන්තර තොරතුරු පද්ධතිය වැඩි දියුණු කරන ලදි.

මාර්ගගත ක්‍රමයට තැපැල් ඡන්ද අයදුම් කිරීමේ වැඩසටහන වැඩි දියුණු කරන ලද අතර ස්වයං මාර්ගගත අයදුම් කිරීම (Self-Online Applying), ආයතනික මාර්ගගත අයදුම් කිරීම (Certifying Officer Online Applying) සහ දත්ත මුද්‍රණය කර ගැනීමේ ක්‍රමය (අර්ධ මාර්ගගත ක්‍රමය) ( Semi Online Data Printing Applying) යන ක්‍රම 03 මගින් මාර්ගගත තැපැල් ඡන්ද අයදුම් කිරීමේ පහසුකම් ලබා දෙන ලදි.

තැපැල් ඡන්ද කළමණාකරන පද්ධතිය වැඩි දියුණු කිරීම මගින් තැපැල් ඡන්ද ක්‍රියාවලිය වඩාත් පහසු කිරීම සිදුකරන ලදි.

මැතිවරණ ආරවුල් නිරාකරණ කළමනාකරන පද්ධතිය (Electoral Dispute Resolution Management System) වැඩිදියුණු කරමින් භාවිතා කිරීමට ඉඩපහසුකම් සලසන ලද අතර, එය භාවිතය පිලිබඳ සියළුම තාක්ෂණික උපදෙස් අදාළ පාර්ශව වෙත ලබා දීම සිදුකරන ලදී.

පසුගිය වර්ෂවල දී ඉටු කළ ආකාරයටම 2024 වර්ෂයේ සාමාන්‍ය ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට හා පරිපූරක නාමලේඛන වලට අදාළ ව වැඩසටහන් හඳුන්වා දීම හා යාවත්කාලීන කිරීම සිදු කරන ලද අතර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ඡන්ද ප්‍රදේශ භාර නිලධාරීන්ගේ කටයුතු පහසු කිරීම සඳහා පරිගණක වැඩසටහන් සකස් කිරීම/ වැඩිදියුණු කරන ලදී.

ප්‍රධාන ඡන්ද හිමි නාමලේඛනය සහ සහතික කළ පරිපූරක නාම ලේඛන භාවිතා කරමින් ඉදිරි ප්‍රතිශෝධන කටයුතු සහ මැතිවරණ වලදී ඒකාබද්ධ ඡන්ද හිමි නාමලේඛන සකස් කර ගැනීමට සකස් කළ පරිගණක වැඩසටහන යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම සිදු කරන ලදී.

ප්‍රතිශෝධන කටයුතු සඳහා ඒකාබද්ධ නාම ලේඛන භාවිතයෙන් නව දත්ත මුද්‍රිත ගණන් ගැනීමේ ආකෘති පත්‍ර, බහු ලියා පදිංචි ලැයිස්තු ආදිය මුද්‍රණය සඳහා සකස් කළ පරිගණක වැඩසටහන යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම සිදු කරන ලදී.

දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයීය නිලධාරීන්ට පරිගණක වැඩසටහන මගින් ඡන්ද හිමි නාම ලේඛන ප්‍රතිශෝධනයේ කටයුතු සිදු කිරීමේදී අවශ්‍ය තාක්ෂණික උපදෙස් හා මග පෙන්වීම් ලබා දීමත්, ඡන්ද හිමි නාමලේඛන උපුටන ලබා ගැනීමේදී අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීමත් වර්ෂය පුරා අදාළ කාලවලදී අඛණ්ඩව සිදු කරන ලදී.

මීට අමතරව මැතිවරණ කොමිෂන් සභාවේ අභ්‍යන්තර පරිපාලන කටයුතු පහසු කිරීම සඳහා පරිගණක වැඩසටහන් නිර්මාණය කරන ලද අතර ඒවා 2024 වසර තුළ දී වැඩිදියුණු කරමින් පවත්වාගෙන යන ලදී.

1. ප්‍රධාන කාර්යාලයේ සියළුම නිලධාරීන්ට මාර්ගගතව නිවාඩු අයදුම් කිරීම සඳහා නිවාඩු කළමනාකරණ පද්ධතියක් (Leave Management System) පවත්වා ගෙන යාම.
2. මැතිවරණ කොමිෂන් සභාවේ රථවාහන කළමනාකරණ පද්ධතිය (Vehicle Management System) සංවර්ධනය කරමින් පවත්වා ගෙන යාම.
3. ගිණුම් කටයුතු සිදු කිරීම සඳහා වියදම් කළමනාකරණ පද්ධතිය (Expenditure Management System) සංවර්ධනය කරමින් පවත්වා ගෙන යාම.
4. උපාය මාර්ග අධීක්ෂණ පද්ධතිය (Strategic Plan Monitoring System) සංවර්ධනය කරමින් පවත්වාගෙන යාම.
5. ප්‍රසම්පාදන සැලැස්ම අධීක්ෂණ පද්ධතිය (Procurement Plan Monitoring System) සංවර්ධනය කිරීම.
6. පෞද්ගලික දත්ත ගබඩා කිරීමේ වැඩසටහන (HRIM)

දේශපාලන පක්ෂ තොරතුරු කළමනාකරණය සඳහා වන නව පරිගණක වැඩසටහනක් හඳුන්වා දෙන ලදි. මේ මගින් පක්ෂ තොරතුරු පරිගණක වැඩසටහනක් හරහා කළමණාකරනය කර ගැනීමේ පහසුකම් ලබා දෙන ලදි.

### 2.27.2. මැතිවරණ ක්‍රියාවලියට අදාළ පාර්ශවකරුවන්හට ඊ සේවා සැපයීම

මෙරට ප්‍රමුඛතම තොරතුරු තාක්ෂණ සම්මාන උළෙල වන බ්‍රිතාන්‍ය පරිගණක සංගමයෙහි (BCS) ශ්‍රී ලංකා අංශය මගින් 26 වන වරට සංවිධානය කරන ලද ජාතික තොරතුරු තාක්ෂණ සම්මාන - 2024 (National ICT Awards – NBQSA 2024) සම්මාන උළෙලේ දී රාජ්‍ය අංශයේ සංවිධානයක් වෙත එම රාජ්‍ය ආයතනය මගින් එහි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පරිසරය සකස් කිරීම, පෝෂණය කිරීම සහ සංවර්ධනය කිරීම වෙනුවෙන් සිදු කරන ලද අසමසම සේවාවන් වෙනුවෙන් පිරිනැමෙන Public Sector Most Outstanding ICT Achievement Award යටතේ වන ඉහලම සම්මානය සහ මහජනතාව සඳහා වැඩිදියුණු කළ රාජ්‍ය සේවාවන් සැපයීම හෝ මහජන සේවාවන් වැඩි දියුණු කිරීම සඳහා වන

ඩිජිටල් මුලපිරීම් සඳහා කැප වූ අසමසම තොරතුරු තාක්ෂණ නවෝත්පාදනයන් සඳහා වන Digital Government in Public Sector and Government අංශය යටතේ පිරිනමන ලද ඉහලම සම්මානය ලෙස රිදී සම්මානය මැතිවරණ කොමිෂන් සභාව මගින් හඳුන්වා දෙන ලද මැතිවරණ ඊ සේවාව සඳහා පිරිනමන ලදි.

- ඔෟනායි රාජ්‍යයේ පැවති Asia Pacific ICT Alliance Awards (APICTA) ජාත්‍යන්තර සම්මාන උළෙල නියෝජනය කිරීමේ අවස්ථාව මැතිවරණ ඊ සේවාවට හිමිවිය.

- තව ද ඉදිරියේ පැවැත්වීමට නියමිත World Summit Award 2024 තරගාවලිය සඳහා මැතිවරණ ඊ සේවාව මේ වන විට තේරී පත්වී ඇත.

දේශපාලන පක්ෂ අපේක්ෂකයින්, රාජ්‍ය ආයතන, රාජ්‍ය නිලධාරීන්, ඡන්ද දායකයින් ඇතුළු සියළු පාර්ශවකරුවන් වෙත ඊ සේවා සැපයීම වසර පුරා අඛණ්ඩව සිදු කරන ලදී. මෙහිදී ප්‍රධාන අංශ 5 යටතේ සේවාවන් ලබා දීම සිදු කරන ලදී. මේ පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමේ කටයුතු සිදු කරන ලදී.

1. යොවුන් පුරවැසියන් ලියාපදිංචි කිරීම (අවුරුදු 18 සම්පූර්ණ කළ විගස හෝ 18 සම්පූර්ණ වීමට ආසන්න)
2. මුල්වරට ලියාපදිංචි කිරීම
3. පදිංචි ස්ථානය වෙනස් කිරීම සඳහා ඉල්ලුම් කිරීම
4. දත්ත දෝෂ නිවැරදි කරවා ගැනීමට ඉල්ලුම් කිරීම
5. හිමිකම් අයදුම් කිරීම
6. පදිංචි තොරතුරු වල වෙනසක් නොමැති නම් තහවුරු කිරීමේ සේවාව

විදේශගත පුරවැසියන් සඳහා මාර්ගගතව ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීමට නව ඊ සේවාවක් අත්හදා බැලීමේ මට්ටමෙන් හඳුන්වා දීම සිදුකරන ලදී.

ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි පුරවැසියන් හට තමාගේ පදිංචිය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කිරීමට 2015 වසරේ සිට මේ දක්වා සහතික කළ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි තොරතුරු ඇතුළත් ඡන්දහිමි ලියාපදිංචි ප්‍රකාශය දවසේ ඕනෑම අවස්ථාවක අන්තර්ජාල පහසුකම් සහිත සුහුරු ජංගම දුරකතනයක්, පරිගණකයක් හෝ වෙනත් එවැනි උපකරණයන් හරහා මෙම සේවාව මුදල් ගෙවීමකින් තොරවම ලබා ගැනීමට සේවා සැපයීම සිදුකර ඇත.

ග්‍රාම නිලධාරි ඊ සේවාව වැඩි දියුණු කිරීම මගින් ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළ ග්‍රාම නිලධාරීන්ගේ කටයුතු මැතිවරණ ඊ සේවාව හරහා වඩාත් පහසුවෙන් සිදුකර ගැනීමට අවස්ථාව ලබා දීම සිදුකරන ලදී.

මැතිවරණයකදී ආබාධ සහිත පුද්ගලයින්ට අවශ්‍ය පහසුකම් ලබා ගැනීමට ඉල්ලීම් කිරීම සඳහා සකස් කළ **ආබාධ සහිත පුද්ගලයින්ගේ ද්වාරය** යන සේවාව සාර්ථක ලෙස පවත්වාගෙන යනු ලබයි.

මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය භාෂා ත්‍රිත්වයෙන්ම යාවත්කාලීන කර අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ විශේෂයෙන් ම දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම සම්බන්ධ තොරතුරු, දේශපාලන පක්ෂ ලැයිස්තුව, මාධ්‍ය නිවේදන, මාධ්‍ය උපමාන , ගැසට් හා චක්‍රලේඛ ආදී තොරතුරු වර්ෂය පුරා භාෂා ත්‍රිත්වයෙන් මැතිවරණ නිල වෙබ් අඩවියේ යාවත්කාලීන කිරීම සිදු කෙරේ.

එසේම පුළුල් ලෙස සමාජය තුළ ව්‍යාප්ත වූ සමාජ මාධ්‍ය ජාල භාවිතා කරමින් මහජනතාව වෙත යාවත්කාලීන තොරතුරු කඩිනමින් ලබා දීම මගින් මැතිවරණ ක්‍රියාවලිය කාර්යක්ෂමව කර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණ භාවිතය ඉවහල් කර ගැනීම සිදු කෙරේ.

මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හා නිල සමාජ මාධ්‍යජාල ආබාධිත පුද්ගල හිතකාමී ලෙස පවත්වා ගෙන යාමට අවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා කටයුතු සිදු කිරීම.

රජයේ පාසල් සඳහා පළමු වසරට ළමුන් ඇතුළත් කිරීමේ දී අවශ්‍ය ඡන්දහිමි නාමලේඛන විස්තර මැතිවරණ කොමිෂන් සභාව අනුමත කළ මිල ගණන් යටතේ මාර්ගගත ක්‍රමයට ආරක්ෂාකාරී ලෙස පාසල් වෙත ලබා දීම සිදු කරන ලදී. එසේම මෙම පහසුකම කොට්ඨාස අධ්‍යාපන කාර්යාල හා කලාප අධ්‍යාපන කාර්යාල වෙත නොමිලේ ලබා දීම සිදු කරන ලදී.

එයට අමතරව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යනාදියට මෙන්ම සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ අස්වැසුම වැඩසටහන සඳහා ඡන්දහිමි නාමලේඛන ලියාපදිංචි තොරතුරු මාර්ගගත ක්‍රමයට ලබා දීමට අදාළ තාක්ෂණික සහය ලබා දීම සිදු කරන ලදී.

මැතිවරණ කොමිෂන් සභාවේ සියළු පාර්ශවකරුවන් මැතිවරණ ක්‍රියාවලිය හා සම්බන්ධිත කරුණු පිළිබඳව දැනුම හා අධ්‍යාපනය ලබා දීම සඳහා අධ්‍යාපනය සහ මැතිවරණ දායකත්වය සඳහා වන පද්ධතිය (VEEE) පවත්වාගෙන යාම හා සංවර්ධනය කිරීම සිදු කරන ලදී.

මාර්ගගත ලියා පදිංචිය ඇතුළු මැතිවරණ ඊසේවා භාවිතයේදී ජනතාවට මතුවන ගැටළු විසඳා ගැනීමට අදාළ නිලධාරීන් සම්බන්ධ කර ගැනීම සඳහා වට්ස් ඇප් හා ඊ මේල් ගිණුමක් සකස් කර පවත්වා ගෙන යාම 2024 වර්ෂයේ දී ද සිදු කරන ලදී.

වෙබ් අඩවිය හා සමාජ මාධ්‍ය ජාලා හරහා ලැබෙන මහජන පැමිණිලි නියමිත පාර්ශව වෙත යොමු කර ඒ සඳහා පිළිතුරු ලබා දීම වැනි කටයුතු ද වර්ෂය පුරා අඛණ්ඩව සිදු කරන ලදී.

ඊ සේවා භාවිතාකරුවන් හට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම සන්නිවේදන මෘදුකාංග භාවිතයෙන් වඩාත් කාර්යක්ෂම ලෙස සිදුකරන ලදි.

මීට අමතරව ප්‍රධාන කාර්යාලයේ හා සියළුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල කාර්යාලයීය ඊ මේල් සේවාව ආරක්ෂිත ක්‍රමවේදයන්ට යටත්ව පවත්වාගෙන යාම සිදු කරන ලදී.

### 2.27.3 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා නඩත්තු කටයුතු

ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල පවතින තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම වර්ෂය පුරා අඛණ්ඩව සිදු කරන ලදී. එහිදී ප්‍රධාන කාර්යලයේ පිහිටුවා ඇති දත්ත මධ්‍යස්ථානයේ සේවා පවත්වා ගැනීම, උපස්ථ ලබා ගැනීම ආදී කටයුතු ඉටුකිරීම සහ නඩත්තු කටයුතු අදාළ ආයතන මඟින් ඉටු කරවා ගන්නා ලදී.

මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ අංශ ඇතුළු දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල පරිගණක, පරිගණක උපාංග, පරිගණක ජාල, වී.පී.එන්. ජාලය, ෆයර්වෝල් සහ ADSL අන්තර්ජාල පද්ධති ආරක්ෂාකාරී ලෙස පවත්වා ගෙන යාම හා නියමිත පරිදි නඩත්තු කටයුතු සිදු කිරීම වසර පුරා අඛණ්ඩව ඉටු කිරීම.

2024 වර්ෂය සඳහා SLCERT ආයතනය හා එක්ව මැතිවරණ කොමිෂන් සභාවේ තොරතුරු තාක්ෂණ විගණනයක් (IT General Control Review) සිදු කරන ලද අතර එහි සියළු තොරතුරු ඇතුළත් සමාලෝචන වාර්තාව මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා වෙත භාර දීම සිදු කරන ලදී.

මැතිවරණ කොමිෂන් සභාව සඳහා තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තිය, අඛණ්ඩ ව්‍යාපාර සැලැස්ම සහ ආපදා කළමණාකරන සැලැස්ම සකස් කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.

මාර්ගගත ක්‍රමවේදයන් භාවිතා කරමින් ප්‍රධාන කාර්යාලය, සියළුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල හා බාහිර පාර්ශවයන් සඳහා රැස්වීම් පැවැත්වීම සඳහා වූ Video Conferencing තාක්ෂණික සහය ලබා දීම සිදු කරන ලදී.

ප්‍රධාන කාර්යාලයේ ආරක්ෂක කැමරා පද්ධතිය (CCTV) පුළුල් කිරීම හා ඒ සම්බන්ධ කටයුතු වර්ෂය තුළ අඛණ්ඩව සිදු කරන ලදී.

### 2.28. මූල්‍ය හා විගණන තොරතුරු

2024 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අනුව හා පරිපූරක ඇස්තමේන්තු මඟින් වැය ශීර්ෂ 020 යටතේ මැතිවරණ කොමිෂන් සභාව වෙත රු. මිලියන 16,254 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. එයින් රු. මිලියන 16,111 ක් පුනරාවර්තන වියදම් වෙනුවෙන් ද රු. මිලියන 143 ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ද වෙන් කර ඇත. 2024 වර්ෂයේ පුනරාවර්ථන වියදම රු. මිලියන 14,338ක් වූ අතර ප්‍රාග්ධන වියදම රු. මිලියන 89.6ක් විය. ප්‍රතිශතයක් ලෙස පුනරාවර්ථන වියදම 89% වේ. ප්‍රතිශතයක් ලෙස ප්‍රාග්ධන වියදම 62.6% වේ. ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනය රු. මිලියන 15,000ක් වූ අතර දරණ ලද වියදම රු. මිලියන 13,245කි. එය ප්‍රතිශතයක් ලෙස 88.3% වේ. 2023 වර්ෂය හා සසඳා බලන විට එම වර්ෂයේ පුනරාවර්තන වියදම රු. මිලියන 1,632 ක් විය. 2023 වර්ෂයේ ප්‍රාග්ධන වියදම හා සසඳා බලන විට එම වර්ෂයේ ප්‍රාග්ධන වියදම රු. මිලියන 45.9ක් විය.

2024 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන පිළියෙල කිරීම සඳහා රු. මිලියන 236.2 ක් පමණ වැය වී ඇති අතර ගණන් ගන්නා නිලධාරීන්ට දීමනා වැඩිවීම නිසා තවදුරටත් ගෙවීමට ඇති රු. මිලියන 24.6 ක මුදල එකතු වූ විට සම්පූර්ණ වියදම දළ වශයෙන් රු. මිලියන 260.8 ක් පමණ වේ. 2023 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන සකස් කිරීමේ වියදම වූ රු. මිලියන 181.4 සමඟ සසඳා බැලීමේ දී මෙම වර්ෂයේ රු. මිලියන 79.4 ක වැඩිවීමක් පෙන්නුම් කළ ද මෙම වර්ෂයේ වියදම තුළ 2023 වර්ෂය වෙනුවෙන් දරණ රු. මිලියන 28.5ක පමණ වියදමක් ද ඇතුලත්ව ඇත.

2024 වර්ෂයේ දී ආපදා ණය/ විශේෂ අත්තිකාරම්/ උත්සව අත්තිකාරම් ඉල්ලුම් කළ නිලධාරීන් හා සේවකයින් වෙනුවෙන් රු. මිලියන 17.8 ක පමණ ණය අත්තිකාරම් මුදල් ලබා දී ඇත. 2024 වර්ෂයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ උපරිම වියදම් සීමාව රු. මිලියන 18කි. පසුගිය වර්ෂය හා සසඳා බලන විට 2024 වර්ෂයේ ලබා දී ඇති ණය අත්තිකාරම් ප්‍රමාණය රු. මිලියන 12.1ක අඩුවීමක් පෙන්නුම් කෙරේ. 2023 වර්ෂයේ උපරිම වියදම් සීමාව රු. මිලියන 30කි.

2024 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන උපුටන නිකුත් කිරීමේ ආදායම රු. මිලියන 6.1 කි. 2023 වර්ෂයේ මෙම ආදායම රු. මිලියන 4.5 ක් වූ අතර 2023 වර්ෂය හා සසඳා බැලීමේ දී 2024 වර්ෂයේ රු. මිලියන 1.6 කින් ආදායම වැඩි වී තිබේ.

ඡන්දහිමි නාමලේඛනය පොත් වශයෙන් ලබාදීම සීමාකර ඇත. සංයුක්ත තැටි වශයෙන් පිළියෙල කරනු ලබන අතර ඒවා අලෙවි කිරීමේදී 2024 වර්ෂයේ රු. මිලියන 2ක ආදායමක් උපයාගෙන ඇත. 2023 වර්ෂයේ මෙම ආදායම හා සසඳා බලන විට 2024 වර්ෂයේ රු. මිලියන 0.5 කින් ආදායම වැඩි වී ඇත.

2024 වර්ෂය තුලදී විවිධ විෂයයන් යටතේ විගණන විමසුම් 08 ක් ජාතික විගණන කාර්යාලයෙන් ඉදිරිපත් කර ඇත. එම විගණන විමසුම් 08 සඳහාම පිළිතුරු ලබාදී ඇත.

## 2.29. අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු

මැතිවරණ කොමිෂන් සභාවේ අධීක්ෂණය යටතේ පවතින මැතිවරණ මහලේකම් කාර්යාලයේ සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල අභ්‍යන්තර විගණන කටයුතු ඉටු කිරීමේ දී ජාතික විගණන පනත, මුදල් රෙගුලාසි හා කළමනාකරණ විගණන චක්‍රලේඛවල දක්වා ඇති නියමයන් අනුව අභ්‍යන්තර විගණන අංශයට පැවරී තිබූ ව්‍යවස්ථාපිත රාජකාරි 2024 වර්ෂය තුළ දී ඉටු කරන ලදි.

ඒ අනුව ජාතික විගණන පනතේ 41(2) වගන්තියෙහි දක්වා ඇති විධිවිධාන පරිදි 2024 වර්ෂය තුළ කළමනාකරණ විගණන කමිටු 4 ක් සංවිධානය කරන ලදි.

මැතිවරණ කොමිෂන් සභාව තුළ ඵලදායී කාර්යසාධනයක් තහවුරු කිරීම සඳහා ඒ ඒ විගණන ක්ෂේත්‍රවලට අයත් වඩාත්ම අවදානම් සහිත ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීම සඳහා අවධානය යොමු කරන ලදි. ඒ අනුව 2024 වර්ෂයේ දී සිදු කරන ලද විගණන කාර්යයන් පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත. නිකුත් කරන ලද සියලුම අභ්‍යන්තර විගණන වාර්තා සම්බන්ධයෙන් ජාතික විගණන පනතේ 40(4)(3) උප වගන්තිය පරිදි කටයුතු කර තිබේ.

| මැතිවරණ කාර්යාලයේ එක් එක් අංශය සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂණ සංඛ්‍යාව | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන පරීක්ෂණ සංඛ්‍යාව | සිදු කරන ලද විමර්ශන සංඛ්‍යාව | 2024 ප්‍රතිශෝධනයට අදාළව සිදු කරන ලද ස්ථානීය පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|---|---|
| 8 | 18 | 8 | - |

| මැතිවරණ කාර්යාලයේ එක් එක් අංශය සම්බන්ධයෙන් නිකුත් කරන ලද විගණන වාර්තා සංඛ්‍යාව | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල සම්බන්ධයෙන් නිකුත් කරන ලද විගණන වාර්තා සංඛ්‍යාව | නිකුත් කරන ලද විමර්ශන වාර්තා සංඛ්‍යාව | 2024 ප්‍රතිශෝදනයට අදාළව නිකුත් කරන ලද ස්ථානීය පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|---|---|
| 8 | 12 | 8 | - |

2024 වර්ෂය තුළ පවත්වන ලද ජාතික මැතිවරණ සම්බන්ධයෙන් පශ්චාත් විගණන විමසුම් අවම කිරීම අරමුණු කර ගනිමින් විගණන ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය වන පරිදි චක්‍රලේඛ 2 ක් අභ්‍යන්තර විගණන අංශය විසින් නිකුත් කරන ලදි. තව ද මැතිවරණ කටයුතු සඳහා ඍජු දායකත්වයක් සපයනු ලබන සහ මැතිවරණ කොමිෂන් සභාව විසින් මුදල් ප්‍රතිපාදන වෙන් කර දෙනු ලබන රජයේ ආයතන දෙක වන තැපැල් දෙපාර්තමේන්තුව සහ පොලිස් දෙපාර්තමේන්තුව වෙත ද වියදම් කළමනාකරණය සහ විධිමත් වාර්තාගතකරණය පිළිබඳ පූර්වෝපායයන් සහ උපදෙස් ලබා දෙන ලදි. ඒ අනුව වඩාත් පාලනයක් සහිතව මැතිවරණ වියදම් දැරීමට අවශ්‍ය මූලික මගපෙන්වීම් මෙම අංශය විසින් සිදු කර ඇත.

2024 වර්ෂයේ දී නාමලේඛන ප්‍රතිශෝධනය පිළිබඳ විගණන ක්ෂේත්‍රය අවධාරනය වන පරිදි පිරික්සුම් ලැයිස්තු සංශෝධනය කරන ලද අතර විගණන පරීක්ෂාවල දී ඒ සම්බන්ධයෙන් වැඩි භාරයක් ලබා දී තිබේ. ඒ අනුව සෑම විගණන වාර්තාවක් සඳහාම නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය පිළිබඳ පූර්ණ පරීක්ෂාවක් අන්තර්ගත කිරීමට පියවර ගන්නා ලදි.

2024 වර්ෂයේ තුන්වැනි, හතරවැනි කාර්තු තුළ පැවති ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණයේ මූලික සංවිධාන සහ පශ්චාත් මැතිවරණ රාජකාරි හේතුවෙන් එම කාලය තුළ අභ්‍යන්තර විගණන කටයුතු අවශ්‍යයෙන්ම සීමා කළ යුතු විය. ඒ අනුව අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැලැස්ම සංශෝධනය කිරීමට සිදු වූ අතර වර්ෂාවසානය වන විට එකී සංශෝධිත විගණන සැලැස්ම සම්බන්ධයෙන් පසුගිය ජාතික මැතිවරණවලට අදාළව මැතිවරණ ආරවුල් නිරාකරණය පිළිබඳව වූ

ස්ථානීය පරීක්ෂණ හා හදිසි විමර්ශන ද සමග 100% ක ක්‍රියාත්මක ප්‍රගතියක් අත්පත් කර ගැනීමට මෙම අංශයට හැකි විය.

ඒ අතර 2024 වර්ෂයේ දී පවත්වන ලද ජාතික මැතිවරණ දෙක සම්බන්ධයෙන් සියලුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල ආවරණය වන පරිදි වෙන් වෙන් වශයෙන් අතුරු විගණන වාර්තා ලබා දීම සඳහා ඉහත සංශෝධිත විගණන සැලස්මට ප්‍රතිපාදන එක් කරන ලදි. ඒ අනුව 2024.12.31 දින වන විට දිස්ත්‍රික් කාර්යාල 6 කට අදාළව අතුරු විගණන කාර්යයන් අවසන් කර ඇත.

## 2.30. ඉදිරි ඉලක්ක

ඉදිරියේදී, ව්‍යවස්ථාපිතව පැවරී ඇති ඡන්දහිමි නාමලේඛණ ප්‍රතිශෝධනයට අදාළ කටයුතු මෙන්ම, සුදුසුකම්ලත් කිසිවෙකු අත්නොහැරෙන පරිදි, සියලු දෙනා ඇතුළත් ඡන්ද විමසීම් පැවැත්වීම.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්
මැතිවරණ කොමිෂන් සභාව
තැ.පෙ. අංක 02
සරණ මාවත, රාජගිරිය.
10107.

ඒසීඒ-එෆ්

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු. | | සටහන | තත්‍ය 2024 රු. | තත්‍ය 2023 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 7,800,394,000 | 1,505,552,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 19,375,496 | 190,666,068 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 35,094,414 | 37,733,317 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **7,854,863,910** | 1,733,951,385 | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **7,854,863,910** | **1,733,951,385** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | | 100,000,000.00 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **7,854,863,910** | **1,633,951,385** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | | | ඒසීඒ-2(ii) |
| 599,457,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 593,328,155 | 517,551,350 | |
| 15,508,560,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 13,742,335,691 | 1,110,798,244 | |
| 3,000,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 2,892,376 | 3,236,630 | |
| - | පොලී ගෙවීම් | 8 | | | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | | | |
| **16,111,017,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **14,338,556,222** | **1,631,586,224** | |
| | **මූලධන වියදම්** | | | | |
| 101,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 29,742,803 | 23,716,420 | ඒසීඒ-2(ii) |
| 40,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 58,577,962 | 21,172,320 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | | - | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | | - | |
| 2,000,000 | හැකියා වර්ධනය | 14 | 1,300,337 | 985,006 | |
| - | වෙනත් මූලධන වියදම් | 15 | | - | |
| **143,000,000.00** | **මුළු මූලධන වියදම් (උ)** | | **89,621,102** | **45,873,746** | |
| | තැන්පතු ගෙවීම් | | 9,210,475 | 27,789,880 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 27,091,269 | 38,584,411 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **36,301,744** | **66,374,291** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 14,464,479,068 | 1,743,834,261 | |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | (6,609,615,158) | (109,882,876) | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | (6,609,615,158) | (109,882,876) | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | | | ඒසීඒ-3 |
| | | | - | - | |

## 2024 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | කතය 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 2,463,295,691 | 2,414,086,816 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 89,536,422 | 97,539,567 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | |
| **මුළු වත්කම්** | | **2,552,832,113** | **2,511,626,383** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (84,697,432) | (66,529,266) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 2,463,295,691 | 2,414,086,816 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 174,233,854 | 164,068,833 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **2,552,832,113** | **2,511,626,383** |

පිටු අංක 01 සිට 22 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 23 සිට 30 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2024.12.16** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **06/2024** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම: සමන් ශ්‍රී රත්නායක, මැතිවරණ කොමසාරිස් ජනරාල්, මැතිවරණ කොමිෂන් සභාව, සරණ මාවත, රාජගිරිය.
තනතුර:
දිනය: 25.02.18

ගණන්දීමේ නිලධාරී
නම: සමන් ශ්‍රී රත්නායක
තනතුර: මැතිවරණ කොමසාරිස් ජනරාල්
දිනය: මැතිවරණ කොමිෂන් සභාව, සරණ මාවත, රාජගිරිය.

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම: කේ. එස්. පී. පෙරේරා, ප්‍රධාන මූල්‍ය නිලධාරී, මැතිවරණ කොමිෂන් සභාව, සරණ මාවත, රාජගිරිය
දිනය:

## 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| මුළු බදු ලැබීම් | | | |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | | |
| ලාභ | | | |
| ආදායම් නොවන ලැබීම් | | 80,621,056 | 35,005,539 |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | | |
| අග්‍රිම ලැබීම් | | 7,800,394,000 | 1,505,552,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 39,960,375 | 38,865,735 |
| තැන්පතු ලැබීම් | | 19,375,496 | 190,666,068 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | | **7,940,350,927** | **1,770,089,342** |
| | | | |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 7,826,547,036 | 1,560,464,848 |
| සහනාධාර සහ මාරුකිරීම් | | 2,892,376 | 3,236,630 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 1,226,479 | 2,220,643 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | - | 100,000,000 |
| අත්තිකාරම් ගෙවීම් | | 26,737,839 | 37,883,802 |
| තැන්පතු ගෙවීම් | | 9,210,475 | 27,789,880 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | | **7,866,614,205** | **1,731,595,804** |
| | | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | | **73,736,722** | **38,493,538** |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| පොළී | | | |
| ලාභාංශ | | | |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | 375,031 | 138,992 |
| උපණය අයකර ගැනීම් | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | | **375,031** | **138,992** |
| | | | |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | | |
| මූලධන වියදම් | | 74,111,754 | 38,632,530 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | | **74,111,754** | **38,632,530** |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | | **(73,736,723)** | **(38,493,538)** |
| | | | |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | | **(0)** | **0** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| දේශීය ණය ගැනීම් | | - | - |
| විදේශීය ණය ගැනීම් | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | | **-** | **-** |
| | | | |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | | **-** | **-** |
| | | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | | **-** | **-** |
| | | | |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | | **-** | **-** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | | **-** | **-** |

# අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය

| | | |
|---|---|---|
| **වෙනත් ආයතන විසින්, වාර්තාකරණ ආයතනය** වෙනුවෙන් එකතු කරන ලද ආදායම | - | |
| **අනෙකුත් ශීර්ෂ** වෙනුවෙන් **වාර්තාකරණ ආයතනය** විසින් දරන ලද වියදම් | 1,226,479 | |
| **අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය** විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද හර කිරීම් | 3,967,061 | |
| **අනෙකුත් ශීර්ෂ** විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම් | 353,430.00 | 5,546,970 |
| **අඩු කළා :** | | |
| **අනෙකුත් ආදායම් ශීර්ෂ** වෙනුවෙන්, **වාර්තාකරණ ආයතනය** විසින් එකතු කරන ලද ආදායම් | 80,996,088 | |
| **වෙනත් ආයතන විසින්, වාර්තාකරණ ආයතනය** වෙනුවෙන් දරන ලද වියදම් | 6,524,626,158 | |
| **අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතනය** විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද බැර කිරීම් | 9,186,452 | |
| **අනෙකුත් ශීර්ෂ** විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද හර කිරීම් | 353,430 | 6,615,162,128 |
| **2024** දෙසැම්බර් **31** දිනට අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය | | **(6,609,615,158)** |

*** ඉහත සඳහන් අයිතමවලට අමතරව අදාළ වන අයිතමයන් ගැලපීම් කළ හැක.**

### 3.2 මූල්‍ය ප්‍රකාශ සටහන්

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව රු. | අවසන් ඇස්තමේන්තුව රු. | ප්‍රමාණය රු. | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % |
| 20.02.02.99 | පොලිය - අනෙකුත් | මිලියන 4.50 | මිලියන 4.5 | මිලියන 4.078 | 91 |
| 20.03.02.99 | විකුණුම් හා ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් | මිලියන 0.04 | මිලියන 0.04 | මිලියන 0.04 | 100 |
| 20.03.99.00 | විකුණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම් | මිලියන 13 | මිලියන 13 | මිලියන 50.68 | 390 |
| 20.02.01.01 | නිල නිවාස කුලී | මිලියන 1.32 | මිලියන 1.32 | මිලියන 1.69 | 128 |
| 20.04.01.00 | වැන්දඹු අනත්දරු | මිලියන 20 | මිලියන 20 | මිලියන 22.49 | 112 |
| 20.06.02.02 | ප්‍රාග්ධන විකුණුම් (අනෙකුත්) | මිලියන 0.75 | මිලියන 0.75 | මිලියන 0.38 | 51 |

#### 3.2.1. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

අදාළ නැත

#### 3.2.2. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ග | වෙන්කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම රු. | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසන් ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන රු. | අවසාන ප්‍රතිපාදන රු. | | |
| (1) පුනරාවර්තන | 16,050,000,000 | 16,111,017,000 | 14,338,556,222 | 89 |
| | | | | |
| (2) ප්‍රාග්ධන | 143,000,000 | 143,000,000 | 89,621,102 | 63 |

**3.2.3.** මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසන් ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසන් ප්‍රතිපාදන | | |
| 1 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | | 1226 | 1226 | 1226 | 100 |

**3.2.4.** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | **2024.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | **2024.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 273,109,710 | 273,109,710 | | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 860,878,109 | 860,878,109 | | 100% |
| 9153 | ඉඩම් | 1,253,839,612 | 1,253,839,612 | | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | 75,468,258 | 75,468,258 | | 100% |
| 9180 | බදු දෙනලද වත්කම් | - | - | | |
| | | | | | |

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PIC/B/EC/2/24/11

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025 ජුනි 05 දින

05 JUN 2025

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී,
මැතිවරණ කොමිෂන් සභාව

**ශීර්ෂය 020-මැතිවරණ කොමිෂන් සභාවේ 2024දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්වාගනනය කළ මතය**

ශීර්ෂය 020- මැතිවරණ කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය,එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මැතිවරණ කොමිෂන් සභාවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ , මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගනනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව මැතිවරණ කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මැතිවරණ කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරියාගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියළුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන් දීමේ නිළධාරිගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්,වියදම්,වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන,වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්,ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර,එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 පුනරාවර්තන වියදම්

සමාලෝචිත වර්ෂයේ පවත්වා තිබූ මැතිවරණයන් සඳහා රජයේ ආයතන 06 ක් වෙත මූ.රෙ. 208 මගින් වැය විෂයය අංක 020-1-1-7-1409 යටතේ වියදම ලෙස එකතුව රු.6,505,190,348 ක් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණද එම ආයතන වල වියදම් වාර්තා අනුව එම වටිනාකම රු5,191,270,652 ක් වූයෙන් රු1,313,919,696 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.6.2 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව මූලධන වත්කම් අත්කර ගැනීම සඳහා වූ වියදම රු.58,577,962 ක් වුවද භාණ්ඩාගාර මුද්‍රිත සටහන අනුව මූල්‍ය නොවන වත්කම් වටිනාකම රු.49,208,875 ක් වූයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ මූල්‍ය නොවන වත්කම් වටිනාකම රු.9,369,087 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2022 සහ 2023 වර්ෂයන්වල අපහරණය කර තිබූ ඇස්තමේන්තු වටිනාකම රු.8,097,278 ක් වූ මූල්‍ය නොවන වත්කම්හි පිරිවැය නිශ්චිතව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් අපහරණය කළයුතු ලෙස හඳුනාගන්නා ලද මූල්‍ය නොවන වත්කම් අයිතම 132 ක පිරිවැය හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබූ රු.18,050,592 ක් වූ මුද්‍රණ යන්ත්‍ර 230ක වටිනාකම ද්විගණනය වීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරණ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.2 ඡේදයට අනුකූල නොවන ලෙස ලැමිනේටින් යන්ත්‍ර 04ක්, ෆැක්ස් යන්ත්‍ර 58ක් සහ ජංගම දුරකථන 83ක් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් තුල වෛද්‍ය උපකරණ ලෙස රු.5,639,000 ක් වටිනා Thermo Meter 725 ක් දක්වා තිබුණද භෞතිකව එම ශේෂය 475 ක් වූයෙන් අයිතම 250 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

(අ) මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිසි පරිදි පිළියෙල නොකිරීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 05 ක හා මූලධන වැය විෂයයන් 04 ක සියයට 08 සිට සියයට 99 දක්වා ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ආ) වැය ශීර්ෂ 03ක වාර්ෂික අයවැය ප්‍රතිපාදනය සියයට 03 සිට සියයට 254 දක්වා පරාසයක මු.රෙ66 මඟින් මාරුකර ගැනීමෙන් වාර්ෂික අයවැයගත ප්‍රතිපාදනය වැඩිකරගෙන තිබුණි.

(ඇ) 2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරණ අයවැය චක්‍රලේඛයේ 13 වගන්තියට අනුකූල නොවන ලෙස 2024 වර්ෂය තුළ සිදුකර තිබූ මුළු මාරුකිරීම් ප්‍රමාණය වූ රු.25,700,000 න් රු.20,900,000 ක් වූ සියයට 81ක ප්‍රමාණයක් නොවැම්බර් මස 30 දිනට පසුව ඉදිරිපත් කර තිබුණි.

## 3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල මුදල් ඇත්නම් විනා වැඩක්,සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට නොබැඳී සිටිය යුතු වුවද මැතිවරණ කොමිෂන් සභාව විසින් වැය විෂයයන් 03ක් සඳහා රු. 2,203,560 ක් ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 94(2) ප්‍රකාරව එළඹිය හැකි උපරිම බැඳීම් සීමා ලෙස වැය විෂයයන් 12 ක එකතුව රු.934,057,655 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එය විගණනය විසින් ගණනය කිරීමේ දී රු.341,911,163 ක් වූ අතර ඒ අනුව වෙනස රු.592,146,492 ක් විය.

(ඇ) වැය විෂය අංක 020-1-1-0-1409,020-1-1-2-1409 හා 020-1-1-7-1409 සඳහා මු.රෙ. 94(2) අනුව එළඹිය හැකි උපරිම බැඳීම් සීමාව ලෙස රු.671,255,675 ක් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණද එම සීමාව ඉක්මවා රු.944,234,600 ක් සඳහා බැඳීම්වලට එළඹ තිබුණි.

## 3.3 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණය |
|---|---|
| (අ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලනචක්‍රලේඛයේ 3.1 වගන්තිය | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව 2024 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාව සතු වාහන 59 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 892 | ඇප තැබීමට අවශ්‍ය සියලුම නිලධාරීන්ගේ සංශෝධිත වාර්තාවක් අදාල ආකෘතිය ප්‍රකාරව සෑම වර්ෂ 03කටම පසුව යෙදෙන පෙබරවාරි 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් එසේ සිදු කර නොතිබුණි. |
| (ii)මුදල් රෙගුලාසි 454(2) | රජයේ ගොඩනැගිලිවල සියලු විදුලි උපාංග සහ උපකරණ පිළිබඳව බඩු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

**3.4 තැන්පතු ගිණුම්**

2023 මාර්තු 09 දින පැවැත්වීමට නියමිතව තිබූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම වෙනුවෙන් දේශපාලන පක්ෂ විසින් රු.162,606,500 ක ඇප මුදල් නාම යෝජනා භාර දීමේ දී තැන්පත් කර තිබුණු අතර එම ඡන්ද විමසීම අවලංගු වීම හේතුවෙන් 2025 පෙබරවාරි 17 දිනැති අංක 01 දරණ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය මඟින් එසේ ලබාගත් ඇප තැන්පතු මුදල් ආපසු ගෙවිය යුතු බව දක්වා තිබුණද 2025 මැයි 20 වන දින දක්වාම එම තැන්පතු වලින් රු.16,079,000 ක් පමණක් නැවත ගෙවීමට කටයුතු කර නොතිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යයසාධන වාර්තාව**

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16.2 වගන්තියට අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු සමාලෝචිත වර්ෂයේ කාර්ය සාධන වාර්තාවේ කෙටුම්පත ඉදිරිපත් කර නොතිබුණි.

**4.2 ප්‍රසම්පාදන සැලැස්ම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරනරාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 වන වගන්තිය අනුව ආයතනයට පැවරී ඇති විෂයන් අනුව ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සැකසිය යුතු වුවත් පිරිසිදු කිරීම් හා ආරක්ෂක සේවා සැපයීම සඳහා වූ රු.25,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද එය ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත්කර නොතිබුණි.

(ආ) උක්ත චක්‍රලේඛයේ 4 වන වගන්තිය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය අනුව 2024 වර්ෂය සඳහා සවිස්තර ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත්කර නොතිබුණි.

**4.3 ප්‍රසම්පාදනයන්**

(අ) 2024 වර්ෂයේ පැවැත්වූ ජනාධිපතිවරණය සඳහා කාඩ්බෝඩ් ඡන්ද පෙට්ටි 14,250 ක් රු.34,817,758 කටද මහ මැතිවරණය සඳහා ඡන්ද පෙට්ටි 14,150 ක් රු.43,628,339 කට ද මිලදී ගෙන තිබූ අතර ඡන්ද පෙට්ටි 135 ක් ඉතිරි වී තිබුණි. ඡන්ද පෙට්ටි තෙමීමෙන් ආරක්ෂා කිරීමට පොලිතින් උර සඳහා රු.8,068,865 ක් ද ගෙවීම් කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය තුල ලී ඡන්ද පෙට්ටි අළුත්වැඩියා කිරීමට ද රු.2,199,530 ක වියදමක් දරා තිබුණද ලී ඡන්ද පෙට්ටි 430 ක් පමණක් භාවිතා කර තිබුණි.

(ආ) 2021 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව ගිනි ආරක්ෂණ පද්ධතියක් සවි කිරීම සඳහා රු.5,000,000 ක ප්‍රතිපාදන වෙන් කරවාගෙන තිබුණි. එම කාර්යය ඉටු නොවීම මත 2024 වර්ෂයේ රු.25,000,000 කට ප්‍රතිපාදන වෙන් කර ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සමඟ රු.17,739,130 ක VAT රහිත ඇස්තමේන්තුවක් මත 2024 සැප්තැම්බර් 30 දින වනවිට නිම කිරීමට 2024 ජුනි 07 වන දින ගිවිසුමකට එළඹ තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී රු.9,369,087 ක වියදමක් මු.රෙ.208 යටතේ දරා තිබුණද වියදම සනාථ කිරීමට ඉටුකල වැඩවලට අදාල බිල්පත් හෝ වෙනත් වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොවුණි. එසේම 2025 මැයි 20 දින තෙක්ම අදාල කාර්යය නිම කර නොතිබුණි.

## 4.4 අත්තිකාරම් ගිණුම්

2024 දෙසැම්බර් 31 දිනට සේවය හැරගිය හා වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගෙන් වර්ෂ 01ත් 03ත් අතර කාලයට අදාළ පිළිවෙලින් රු.501,190 ක් හා රු152,730 ක ණය ශේෂයන් සමාලෝචිත වර්ෂය තුළදී ද අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.5 වත්කම් කලමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 ජුලි 28 දිනැති අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව වත්කම් CIGAS පද්ධතිය මඟින් ගිණුම්ගත කර ඇතත් එම චක්‍රලේඛයේ 09 ඡේදය ප්‍රකාරව වත්කම් හඳුනාගැනීම සඳහා වර්ගීකරණ කේතයන් භාවිතා නොකිරීම හේතුවෙන් භෞතිකව අදාල වත්කම් නිශ්චිතවම තහවුරු කරගත නොහැකි වී තිබුණි.

(ආ) 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවන් අනුව භාණ්ඩ අයිතම 45 ක භාණ්ඩ ඒකක 128 ක ඌනතාවයක් දක්වා තිබුණද එම ඌනතා සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන තුල වටිනාකම රු.132,888,960 ක් වූ ඡන්ද පෙට්ටි 35,905 ක් දක්වා තිබුණද 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ඡන්ද පෙට්ටි ගණන 26,607 ක් වූයෙන් ඡන්ද පෙට්ටි 9,298 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 5. මානව සම්පත් කළමනාකරණය

## 5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

2024 දෙසැම්බර් 31 දින වන විට කොමිෂන් සභාවේ සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව 100 ක් එනම් අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 12 ක් විය.මෙම පුරප්පාඩු සංඛ්‍යාව තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 08, තෘතීය මට්ටමේ පුරප්පාඩු 04 ක්, ද්විතීය මට්ටමේ පුරප්පාඩු 55 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 33ක් විය.

ඒ.ජී.ඒ.හෙල්මිණි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති (වැ.බ) වෙනුවට

**04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක**

ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස තත්‍ය නිමැවුම (%) | | |
|---|---|---|---|
| | **100%-90%** | **75%-89%** | **50%-74%** |
| | 95% | | |

## 05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

| අරමුණු අංකය | අරමුණු සහ ඉලක්ක | ඉලක්ක | කාල රාමුව | ආයතනයේ ක්‍රියාකාරී දර්ශකය | ප්‍රගතිය/ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| 05. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම. | 5.1. ජාතික මට්ටමේ / ව්‍යවස්ථාදායකයේ කාන්තා නියෝජනය සාක්ෂාත් කර ගැනීම. | 5.1.1.ව්‍යවස්ථාදායකයේ අදාළ නීති සංශෝධන | 2021 - 2025 | කාන්තා නියෝජනය 25% වන බවට වග බලා ගැනීම | අදාළ යෝජනා මැතිවරණ නීති සංශෝධනය සඳහා වූ පාර්ලිමේන්තු තේරීම්කාරක සභාවට ඉදිරිපත් කිරීම. |
| | 5.5 දේශපාලන, ආර්ථික හා සමාජ්‍ය ජීවිතයේ සියලුම අවස්ථාවන්හි තීරණ ගැනීමේදී කාන්තාවන්ට නායකත්වය සහ සමාන අවස්ථා සැලසීම හා ඵලදායී අන්දමින් සහභාගී වීම තහවුරු කිරීම. | 5.5.1 අ. දේශපාලන පක්ෂවල විධායක සභාවේ කාන්තා නියෝජනය ඉහළ දැමීමට ක්‍රියා කිරීම. | 2021 - 2025 | | පාර්ලිමේන්තු තේරීම්කාරක සභාවට යෝජනා ඉදිරිපත් කර ඇත. |
| | | 5.5.2. මැතිවරණ කොමිෂන් සභාවේ විධායක ශ්‍රේණිවල තනතුරු හොබවන කාන්තාවන්ගේ ප්‍රමාණය වැඩි කිරීම. | 2021 - 2025 | - | ක්‍රියාකරමින් පවතී. |
| 10. රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩු කිරීම | 10.2 2030 වන විට වයස, ලිංගිකත්වය, ආබාධිතබව, ජන වර්ගය, ජාතිය, ආගම හෝ ආර්ථික හෝ වෙනත් තත්ත්වයන් පිළිබඳව තැකීමකින් තොරව සියලුදෙනාගේ සමාජ, ආර්ථික සහ දේශපාලනික අන්තර්කරණය සවිබල ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම. | සියලු දෙනා ඇතුළත් මැතිවරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම. | 2021 - 2025 | සුදුසුකම්ලත් සියලු පුරවැසියන් ඇතුළත් ඡන්දහිමි නාම ලේඛණය සකස් කිරීම. | ක්‍රියාකරමින් පවතී. |
| 16. තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම. | 16.7. සියලුම මට්ටම්වලදී ප්‍රතිචාරාත්මක, සියලුදෙනා අන්තර්ගත වූ සහභාගීත්වයෙන් යුත් සහ නියෝජනයෙන් යුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් පැවතීම තහවුරු කිරීම. | 16.7.2. ස්ත්‍රී පුරුෂභාවය, වයස, ආබාධ සහිත බව හා ජන කණ්ඩායම් අනුව තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ තමන් ද අන්තර්ගත බවට සහ තම අදහස් වලට ප්‍රතිචාර දක්වන බවට විශ්වාසයක් සහිත ජනගහනයේ ප්‍රමාණය ඉහළ දැමීම. | 2021 - 2025 | සියලු පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම. | ක්‍රියාකරමින් පවතී. |

| අරමුණු අංකය | අරමුණු හා ඉලක්ක | ඉලක්ක | කාල රාමුව | ආයතනයේ ක්‍රියාකාරී දර්ශකය | ප්‍රගතිය/ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| 17. ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගීතාවයේ පුනර්ජීවනය. | 17.8. 2017 වන විට අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල් සඳහා තාක්ෂණ බැංකු හා විද්‍යාව තාක්ෂණය හා නවෝත්පාදන ධාරිතාවන් ගොඩනැංවීමේ යාන්ත්‍රණ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සහ විශේෂයෙන් තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන තාක්ෂණයන්හි නව තාක්ෂණය භාවිතා කිරීම වැඩිදියුණු කිරීම. | මැතිවරණ ක්‍රියාවලිය සඳහා නූතන තාක්ෂණ ක්‍රමවේද යොදා ගැනීම. | 2021 - 2025 | – ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම.<br>– මැතිවරණ ක්‍රියාවලියට දායකත්වය දක්වන සියලුම රජයේ නිලධාරීන්ගේ දත්ත පද්ධතිය සකස් කිරීම.<br>– ඒ අනුව මැතිවරණ රාජකාරි සඳහා අනුයුක්ත කිරීම.<br>– ඡන්දහිමි නාමලේඛනය සකස් කිරීමේදී ඇතිවන ගැටළු විසදා ගැනීම සඳහා ඇමතුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම. | කටයුතු සිදුකර ඇත |
| | 17.16 විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල්ද ඇතුළුව සියලුම රටවලට තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා විවිධ පාර්ශවයන්ගේ හවුල්කාරීත්වයෙන් දැනුම, පළපුරුද්ද, තාක්ෂණය සහ මූල්‍ය සම්පත් සජීවීකරණය සහ බෙදා ගැනීම ඔස්සේ තිරසර සංවර්ධනය සඳහා වූ ජගත් හවුල්කාරීත්වය වැඩිදියුණු කිරීම | සියලු පාර්ශවකරුවන් ඇතුළත් දත්ත පද්ධතියක් සැකසීම. | 2021 - 2025 | – මැතිවරණ නීතිය පිළිබඳව නිලධරයන්, ආරක්ෂක අංශ හා මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | ඒ ඒ වර්ෂයට අදාළව ක්‍රියා වර්ෂයට අදාළව ක්‍රියාකරමින් පවතී. |

**5.1** හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| 05 පරිච්ඡේදය බලන්න | - | | | | 85% |

**06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ**

**6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය**

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 57 | 46 | 11 |
| තෘතීයික | 21 | 15 | 06 |
| ද්විතියික | 525 | 472 | 53 |
| ප්‍රාථමික | 212 | 179 | 33 |

මැතිවරණ කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලය, පහත සඳහන් තනතුරුධාරී නිලධාරී මණ්ඩලයකින් සමන්විතය. මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති ඇතුළු සාමාජිකයින් පස් දෙනා හැරුණුවිට කොමිෂන් සභාව සඳහා ලේකම්වරයෙක් සිටී. ඒ හැර මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට, මැතිවරණ කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (ශ්‍රී ලං.ප.සේ.) නිලධාරීන්, ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ (ශ්‍රී ලං.ග.සේ.) නිලධාරීන්, නීති නිලධාරීන් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ (ශ්‍රී.ලං.තො.ස.තා.සේ.) නිලධාරීන්, ශ්‍රී ලංකා සැලසුම් සේවයේ (ශ්‍රී ලං.සැ.සේ.) නිලධාරීන්, භාෂා පරිවර්තක නිලධාරීන්ගෙන් රාජ්‍ය කළමනාකරණ සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන්, හා මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩලයේ රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරීන්, සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්, තොරතුරු තාක්ෂණ සහකාර නිලධාරීන්, ලේඛන සහකාරවරුන්, කාර්යාල කාර්ය සහයකයින් හා රියදුරන් ඇතුළත් වේ. ඒ අනුව 2024.12.31 දිනට මැතිවරණ කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලයේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

| | සංඛ්‍යාව |
|---|---|
| මාණ්ඩලික නිලධාරීන් (මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයින් හැර අනෙකුත් මාණ්ඩලික නිලධාරීන් ඇතුළුව) | 60 |
| කළමනාකරණ සේවා නිලධාරීන් | 365 |
| සංවර්ධන නිලධාරී | 57 |
| කාර්මික නිලධාරී (සිවිල්) | - |
| තොරතුරු තාක්ෂණ සහකාර | 10 |
| ලේඛන සහකාර | 38 |
| පිළිගැනීමේ නිලධාරී | 01 |
| කාර්යාල කාර්ය සහායක | 132 |
| රියදුරු | 47 |
| රිය ශෝධක | - |

**6.2. මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ මාණ්ඩලික නිලධාරීන්ගේ ආයතන කටයුතු**

මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතු මාණ්ඩලික නිලධාරීන් සම්බන්ධයෙන් අදාළ කාලය තුළ සිදු කරන ලද වෙනස්කම් පහත සඳහන් පරිදි වේ.

**6.2.1. නව පත් කිරීම.**

මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතුව සිටි මාණ්ඩලික නිලධාරීන්ගේ, තනතුරුවල පැවැති පුරප්පාඩු හා ස්ථාන මාරුවීම් අනුව ඇති වූ පුරප්පාඩු පිරවීමට අදාළව 2024.01.01 සිට 2024.12.31 දින දක්වා මැතිවරණ කොමිෂන් සභාව විසින් සිදු කරන ලද පත් කිරීම පහත දැක්වේ.

❖ **පුරප්පාඩුව පැවැති ගම්පහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ගම්පහ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් තනතුර :-**

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/4699 හා 2023.12.27 දිනැති ලිපිය මගින් මෙම කොමිෂන් සභාවට වෙත ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ ඩබ්.ඒ.ආර්.වික්‍රමසිංහ මහතා 2024.01.01 වන දින සිට ගම්පහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට අනුයුක්ත කරන ලද අතර, 2024.01.22 සිට ගම්පහ දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් වශයෙන් පත්කරන ලදි.

❖ **පුරප්පාඩුව පැවැති ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ සහකාර මැතිවරණ කොමසාරිස් තනතුර :-**

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/4699 හා 2023.12.15 දිනැති ලිපියෙන් ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ ආර්.සසීලන් මහතා 2024.01.22 දින සිට ක්‍රියාත්මක වන පරිදි ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් පත් කරන ලදි.

❖ **පුරප්පාඩුව පැවැති කුරුණෑගල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ පරිපාලන නිලධාරී තනතුර:-**

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක PA/MAS/SU/42996 හා 2024.03.01 දිනැති ලිපියෙන් ස්ථාන මාරු කරන ලද කළමනාකරණ සේවා නිලධාරී අධිශ්‍රේණියේ කේ.ඒ.එම්.විජේසේන මහත්මිය 2024.03.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි කුරුණෑගල පරිපාලන නිලධාරී වශයෙන් පත් කරන ලදි.

❖ **පුරප්පාඩුව පැවැති පොලොන්නරුව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ සහකාර මැතිවරණ කොමසාරිස් තනතුර :-**

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/6597 හා 2024.02.01 දිනැති ලිපියෙන් ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ එන්.පී.පී.අයි.ආර්.ගුණරත්න මහතා 2024.03.18 දින සිට ක්‍රියාත්මක වන පරිදි පොලොන්නරුව දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් පත් කරන ලදි.

❖ **පුරප්පාඩුව පැවැති මැතිවරණ කොමිෂන් සභාවේ නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ(ක්‍රම සම්පාදන) තනතුර :-**

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක MPA/PSD/C2/234 හා 2024.04.08 දිනැති ලිපියෙන් ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ II ශ්‍රේණියේ කේ.සී.ඩී.සේරසුන්දර මහත්මිය 2024.04.29 දින සිට ක්‍රියාත්මක වන පරිදි නියෝජ්‍ය අධ්‍යක්ෂ(ක්‍රමසම්පාදන) වශයෙන් පත් කරන ලදි.

❖ **පුරප්පාඩුව පැවැති හම්බන්තොට දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ සහකාර මැතිවරණ කොමසාරිස් තනතුර :-**

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/6441 හා 2024.06.14 දිනැති ලිපියෙන් ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියේ වී.ඩී.ජේ.ලක්මාල් මහතා 2024.07.11 දින සිට ක්‍රියාත්මක වන පරිදි හම්බන්තොට දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් පත් කරන ලදි.

❖ **පුරප්පාඩුව පැවැති මැතිවරණ කොමිෂන් සභාවේ සහකාර මැතිවරණ කොමසාරිස්(පාලන) තනතුර:-**

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/5592 හා 2024.07.26 දිනැති ලිපියෙන් ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ පී.රගුනාදන් මහතා 2024.07.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි මැතිවරණ කොමිෂන් සභාවේ සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන) වශයෙන් පත් කරන ලදි.

❖ **පුරප්පාඩුව පැවැති මැතිවරණ කොමිෂන් සභාවේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුරු සඳහා පහත නම් සඳහාන් නිලධාරීන් පත් කරන ලදි.**

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක CS/ICTS/02/0940 හා 2024.08.06 දිනැති ලිපියෙන් පත් කරන ලද ඩී.ඩබ්.එම්.ටී.ආර්.දිසානායක මහතා 2024.08.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි මැතිවරණ කොමිෂන් සභාවේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තිය II ශ්‍රේණියේ තනතුරට පත් කරන ලදි.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක CS/ICTS/02/0974 හා 2024.08.06 දිනැති ලිපියෙන් පත් කරන ලද ඩබ්.ඩී.එම්.බී.ශාන්තකුමාර මහතා 2024.08.15 දින සිට ක්‍රියාත්මක වන පරිදි මැතිවරණ කොමිෂන් සභාවේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තිය II ශ්‍රේණියේ තනතුරට පත් කරන ලදි.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක CS/ICTS/02/0974 හා 2024.08.06 දිනැති ලිපියෙන් පත් කරන ලද ආර්.එම්.එස්.පී.රත්නායක මහතා 2024.08.20 දින සිට ක්‍රියාත්මක වන පරිදි මැතිවරණ කොමිෂන් සභාවේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තිය II ශ්‍රේණියේ තනතුරට පත් කරන ලදි.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක CS/ICTS/02/0519 හා 2024.08.13 දිනැති ලිපියෙන් ස්ථාන මාරු කරන ලද එච්.ඩබ්.දිලේකා මහත්මිය 2024.08.21 දින සිට ක්‍රියාත්මක වන පරිදි මැතිවරණ කොමිෂන් සභාවේ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තිය I ශ්‍රේණියේ තනතුරට පත් කරන ලදි.

### 6.2.2. නිදහස් කිරීම.

මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතුව සිට මැතිවරණ කොමිෂන් සභා සේවයෙන් නිදහස් කරන ලද මාණ්ඩලික නිලධාරීන් පහත දැක්වේ.

- රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක R/1/2/2010 II වෙළුම හා 2024.02.22 දිනැති ලිපිය මගින් පරිපාලන නිලධාරී එස්.ඒ.දර්ශ ප්‍රවීන මහතා 2024.02.19 දින සිට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට පත්කිරීම හේතුවෙන් මැතිවරණ කොමිෂන් සභාවෙන් නිදහස් කිරීම.

- රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක MPA/PSD/C2/40 හා 2024.02.06 දිනැති ලිපිය මගින් වයස අවු:55 සම්පූර්ණ වීම මත විශ්‍රාම වැටුප් ව්‍යස්ථා සංග්‍රහයේ 2:17 වන වගන්තිය ප්‍රකාරව 2024.05.10 දින සිට විශ්‍රාම ගැන්වීම අනුමත කරන ලද ශ්‍රී ලං.ක්‍ර.සේ.IIශ්‍රේණියේ එස්.පී.සෙනරත් මහත්මිය මැතිවරණ කොමිෂන් සභාවේ සේවයෙන් නිදහස් කිරීම.

- රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 1/104/638(ජී) හා 2024.10.15 දිනැති ලිපිය මගින් රජයේ භාෂා පරිවර්තක විශේෂ ශ්‍රේණියේ ඩබ්.ඒ.ගාමිණී මහතා, 2024.10.18 දින සිට ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත නිදහස් කිරීම.

- රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක CS/TCTS/02/0003 හා 2024.10.11 දිනැති ලිපිය මගින් වයස අවු:60 සම්පූර්ණ වීම මත විශ්‍රාම වැටුප් ව්‍යස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය ප්‍රකාරව 2024.10.19 දින සිට විශ්‍රාම ගැන්වීම අනුමත කරන ලද ශ්‍රී ලං.තො.තා.සේ.I පන්තියේ I ශ්‍රේණියේ එස්.ඒකනායක මහතා මැතිවරණ කොමිෂන් සභාවේ සේවයෙන් නිදහස් කිරීම.

- රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/3824 හා 2025.01.17 දිනැති ලිපිය මගින් වයස අවු:60 සම්පූර්ණ වීම මත විශ්‍රාම වැටුප් ව්‍යස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය ප්‍රකාරව 2024.12.05 දින සිට විශ්‍රාම ගැන්වීම අනුමත කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ බී.එම්.පී.ජී.පී.බී.බණ්ඩාර මහතා මැතිවරණ කොමිෂන් සභාවේ සේවයෙන් නිදහස් කිරීම.

- අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශ ලේකම්ගේ අංක PA/MAS/SU/33743 හා 2024.09.26 දිනැති ලිපිය මගින් වයස අවු:60 සම්පූර්ණ වීම මත විශ්‍රාම වැටුප් ව්‍යස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය ප්‍රකාරව 2024.12.16 දින සිට විශ්‍රාම ගැන්වීම අනුමත කරන ලද කළමනාකරණ සේවා නිලධාරී අධි ශ්‍රේණියේ එස්.එම්.ඒ.බී.සමරකෝන් මහතා මැතිවරණ කොමිෂන් සභාවේ සේවයෙන් නිදහස් කිරීම.

### 6.2.3. වැඩ බැලීම හා රාජකාරි ආවරණය කිරීම සඳහා කරන ලද පත් කිරීම්.

- සහකාර මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ) එස්.එච්.වයි.එස්.බොරලැස්ස මහතා ඕස්ට්‍රේලියාවේ ෆ්ලින්ඩර්ස් විශ්ව විද්‍යාලය මගින් ප්‍රදානය කරනු ලබන පශ්චාත් උපාධි පාඨමාලාවට සහභාගිවීම සඳහා 2024.01.08 දින සිට 2026.01.07 දක්වා කාලයට දිවයිනෙන් බැහැරව යාම හේතුවෙන් තාවකාලිකව එම තනතුරේ රාජකාරී ආවරණය සඳහා ඒ.එන්.එන්.නුස්රත් මහත්මිය පත් කරන ලදි.

❖ ඉන්දියාවේ නවදිල්ලි නුවර පැවැත්වෙන පුහුණු වැඩමුළුවකට සහභාගී වීම පිණිස පුත්තලම සහකාර මැතිවරණ කොමසාරිස් එස්.එල්.ආර්. ජයනායක මහතා 2024.01.07 දින සිට 2024.01.14 දින දක්වා දිවයිනෙන් බැහැරවන කාලය සඳහා එම තනතුරේ රාජකාරී ආවරණය කිරීම සඳහා අනුරාධපුර සහකාර මැතිවරණ කොමසාරිස් කේ.මුගුන්දන් මහතා පත් කරන ලදි.

❖ ජාත්‍යන්තර මැතිවරණ නිරීක්ෂණ වැඩසටහන 2024.01.05 දින සිට 2024.01.09 දින දක්වා බංගලාදේශ් මහ මැතිවරණය සඳහා දිවයිනෙන් බැහැරවූ නිලධාරීන්ගේ රාජකාරී ආවරණය කිරීම සඳහා පහත සඳහන් නිලධරයන් පත් කරන ලදී.

| නිලධාරියාගේ නම | රාජකාරී ආවරණය කිරීම |
|---|---|
| එච්.ආර්.පී.පීරිස් මහතා<br>අතිරේක මැතිවරණ කොමසාරිස්<br>(ජාතික මැතිවරණ) | බී.එම්.පී.ජී.පී.වී.බණ්ඩාර මහතා<br>අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන) |
| කේ.ජේ.එස්.මාධව මහතා<br>නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (ගම්පහ) | ජේ.ඒ.එස්.පී.ජයසිංහ මහතා<br>නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන) |

❖ ඉන්දියාවේ ජාතික ඡන්ද හිමියන්ගේ දින සැමරුම සඳහා 2024.01.23 දින සිට 2024.01.27 දින දක්වා දිවයිනෙන් බැහැර වූ, අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන) බී.එම්.පී.ජී.පී.වී. බණ්ඩාර මහතා දිවයිනෙන් බැහැරවන කාලය සඳහා අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන) තනතුරේ රාජකාරී ආවරණය කිරීම සඳහා නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන) ජේ.ඒ.එස්.පී.ජයසිංහ මහතා පත් කරන ලදි.

❖ ඉන්දුනිසියානු මැතිවරණ නිරීක්ෂණ වැඩසටහන සඳහා 2024.02.12 දින සිට 2024.02.15 දින දක්වා දිවයිනෙන් බැහැරවූ නිලධාරීන්ගේ රාජකාරී ආවරණය කිරීම සඳහා පහත සඳහන් නිලධරයන් පත්කරන ලදී.

| නිලධාරියාගේ නම | රාජකාරී ආවරණය කිරීම |
|---|---|
| බී.පී.සී.කුලරත්න මහතා<br>අතිරේක මැතිවරණ කොමසාරිස්<br>(නීති,විමර්ශන හා සැලසුම්) | බී.එම්.පී.ජී.පී.වී.බණ්ඩාර මහතා<br>අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන) |
| එම්.එම්.එස්.කේ.බණ්ඩාරමාපා මහතා<br>නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්<br>(කොළඹ නාගරික) | ආර්.එස්.වෙදගේ මහතා<br>සහකාර මැතිවරණ කොමසාරිස්<br>(කොළඹ දිස්ත්‍රික්) |

❖ වවුනියාව දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් ජේ.ජෙනිටන් මහතා මුලතිව් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ පුරප්පාඩුවට සුදුසු නිලධාරියෙක් පත් කරන තෙක් 2024.05.02 දින සිට වැඩ බැලීම සඳහා පත් කරන ලදි.

- ❖ යාපනය දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් ආර්.සී.අමල්රාජ් මහතා කිළිනොච්චි දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ පුරප්පාඩුවට සුදුසු නිලධාරියෙක් පත් කරන තෙක් 2022.05.30 දින සිට වැඩ බැලීම සඳහා පත් කරන ලදි.

- ❖ ඉන්දුනිසියානු මැතිවරණ නිරීක්ෂණ වැඩසටහන සඳහා 2024.05.04 දින සිට 2024.05.09 දින දක්වා දිවයිනෙන් බැහැරවූ නිලධාරීන්ගේ රාජකාරී ආවරණය කිරීම.

| නිලධාරියාගේ නම | රාජකාරී ආවරණය කිරීම |
|---|---|
| එස්.අච්චුදන් මහතා<br>අතිරේක මැතිවරණ කොමසාරිස්<br>(පළාත් පාලන) | ජේ.ඒ.එස්.පී.ජයසිංහ මහතා<br>නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන) |
| ඒ.එම්.කේ.එස්.අත්තනායක මහතා<br>සහකාර මැතිවරණ කොමසාරිස් (අම්පාර) | එන්.රේගන් මහතා<br>සහකාර මැතිවරණ කොමසාරිස්<br>(මොණරාගල) |

- ❖ දීප ව්‍යාප්ත සේවයේ නිලධාරීන් සඳහා වන ධාරිතා සංවර්ධන පුහුණු වැඩමුළුව සඳහා ගණකාධිකාරී(ගෙවීම්) වයි.ඩී.ගමගේ මහත්මිය 2024.05.12 දින සිට 2024.05.25 එම තනතුරේ රාජකාරී ආවරණය සඳහා සහකාර මැතිවරණ කොමසාරිස් ඒ.එන්.එන්.නුස්රත් මහත්මිය පත් කරන ලදි.

- ❖ Australia Award Regional Short Course- Governing in the Digital Age වැඩ සටහන සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී පී.ඩී.ඩී.මිනෝලි වික්‍රමසිංහ මහත්මිය 2024.06.22 දින සිට 2024.07.07 දින දක්වා දිවයිනෙන් බැහැරවන කාලය සඳහා එම තනතුරේ රාජකාරී ආවරණයට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී එච්.එල්.තිළිණි සාරංගා මහත්මිය පත් කරන ලදි.
- ❖ 12th FEMBoSA Conference වැඩමුළුව සඳහා නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්(පාලන) ජේ.ඒ.එස්.පී.ජයසිංහ මහතා 2024.09.03 දින සිට 2024.09.06 දින දක්වා දිවයිනෙන් බැහැරවන කාලය සඳහා එම තනතුරේ රාජකාරී ආවරණය සඳහා නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් කේ.ජේ.එස්.මාධව මහතා පත් කරන ලදි.

- ❖ 2024 Leadership academy for Women: Women Leading in the Digital Era වැඩ සටහන සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී පී.ඩී.ඩී.මිනෝලි වික්‍රමසිංහ මහත්මිය 2024.11.16 දින සිට 2024.11.22 දින දක්වා දිවයිනෙන් බැහැරවන කාලය සඳහා එම තනතුරේ රාජකාරී ආවරණය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී ඩී.ඩබ්.එම්.ටී.ආර්.දිසානායක මහතා පත් කරන ලදි.

- ❖ The Asia Pacific ICT Alliance (APICTA)Awards & Brunei Darussalam 2024 Democracy Action Partnership (DAP) වැඩ සටහන සඳහා මැතිවරණ කොමසාරිස් ජනරාල් එම්.කේ.එස්.එස්.රත්නායක මහතා 2024.12.03 දින සිට 2024.12.12 දින දක්වා දිවයිනෙන්

❖ The Asia Pacific ICT Alliance (APICTA)Awards වැඩ සටහන සඳහා සහකාර අධ්‍යක්ෂ (තො.ස.තා.) ඩබ්.ඒ.එන්ජන් නිශාන්ත මහතා 2024.12.03 දින සිට 2024.12.08 දින දක්වා දිවයිනෙන් බැහැරවන කාලය සඳහා සහකාර අධ්‍යක්ෂ (තො.ස.තා.) ආර්.කේ.ඩී.කේ.කේ.රත්නායක මහත්මිය සහකාර අධ්‍යක්ෂ (තො.ස.තා.) තනතුරේ රාජකාරී ආවරණය සඳහා පත් කරන ලදි.

❖ මුලතිව් දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් ජේ.ජෙනිටන් මහතා තාවකාලිකව මැතිවරණ කොමිෂන් සභාවට අනුයුක්ත කිරීම හේතුවෙන් 2024.12.02 දින සිට මැතිවරණ කොමිෂන් සභාවේ සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන) පී.රගුනාදන් මහතා වවුනියාව හා මුලතිව් කාර්යාල දෙකෙහි රාජකාරි ආවරණය සඳහා පත් කරන ලදි.

❖ මඩකලපුව දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් මක්කම නගරයේ වන්දනා ගමනක නිරතවීම සඳහා 2024.12.10 සිට 2025.01.24 දක්වා දිවයිනෙන් බැහැරවන කාලය තුළ මඩකලපුව සහකාර මැතිවරණ කොමසාරිස් තනතුරේ රාජකාරී ආවරණය සඳහා මොණරාගල සහකාර මැතිවරණ කොමසාරිස් එන්.රේගන් මහතා පත් කරන ලදි.

❖ වවුනියාව සහ මුලතිව් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයන්හි සහකාර මැතිවරණ කොමසාරිස් ධූරයේ රාජකාරී ආවරණය සඳහා 2024.12.12 දින සිට ත්‍රිකුණාමලය සහකාර මැතිවරණ කොමසාරිස් ආර්.සසීලන් මහතා පත් කරන ලදි.

❖ කොළඹ දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් තනතුරේ වැඩ බැලීම සඳහා 2024.12.12 දින සිට මැතිවරණ කොමිෂන් සභාවේ සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන) පී.රගුනාදන් මහතා පත් කරන ලදි.

### 6.2.4. මියගිය නිලධාරීන්

කොළඹ දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් ආර්.එස්. වෙදගේ මහතා 2024.12.08 දින අභාවප්‍රාප්ත විය.

## 6.3. පාලන අංශයේ කටයුතු

**ආයතන ශාඛාව**

ආයතන අංශය අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන) ගේ සහ සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන) ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. ඒ අනුව මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ පරිපාලන නිලධාරි මෙහෙයවීමෙන් හා ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරීන් 02 නෙකුගේ සහ කළමනාකරණ සේවා නිලධාරින් අට දෙනෙකුගෙන් සහ ලේඛන සහකාර නිලධාරිණියකගෙන් සමන්විතව ක්‍රියාත්මක වේ. තවද, පරිපාලන නිලධාරිණියගේ මෙහෙයවීම හා ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරිගේ සුපරීක්ෂණයෙන් සිදු වන පිළිගැනීමේ කවුළුවක් ද වේ. දිවයිනේ පිහිටි දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල 26 ක සහ මැතිවරණ මහලේකම් කාර්යාලයේ මාණ්ඩලික නොවන නිලධාරීන්ගේ සියලුම ආයතන කටයුතු, මැතිවරණ කොමිෂන් සභාවේ ආයතනික පරිපාලන කටයුතුද, පවිත්‍රතා හා ආරක්ෂක අංශ අධීක්ෂණයද මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරයවේ.

#### 6.3.1. කාර්ය මණ්ඩල කටයුතු

ආයතන අංශයට අනුයුක්තව සේවය කරන කළමනාකරණ සේවා නිලධාරින්ට පැවරී ඇති රාජකාරී කටයුතු පිළිබඳව 2024 වර්ෂයේදී නිලධාරීන්ගේ කාර්ය සාධන සැලැස්මක් සකස් කරන ලද අතර, මාස 03කට වරක් එහි ප්‍රගතිය සමාලෝචනය කිරීමට පියවර ගන්නා ලදී.

#### 6.3.1.1. කළමනාකරණ සේවා නිලධාරි සේවය

2024 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ කළමනාකරණ සේවා නිලධරයන් 08 අයෙකු මැතිවරණ කොමිෂන් සභාවෙන් පිටතට ස්ථාන මාරු ලබා ඉවත්ව ගිය අතර, එලෙස ස්ථාන මාරු වී ගිය නිලධරයන් 07 නෙකුගේ අනුප්‍රාප්තික නිලධරයන් සේවය සඳහා වාර්තා කරන ලදි.

අන්තර් දෙපාර්තමේන්තු ස්ථාන මාරුවීම් යටතේ මෙම කොමිෂන් සභාවට පැමිණීමට කැමැත්ත පළ කළ කළමනාකරණ සේවා නිලධරයන් 19 දෙනෙකු මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය මත ස්ථාන මාරු කර ගන්නා ලදී.

මැතිවරණ කොමිෂන් සභාවෙන් පිටතට අනුප්‍රාප්තිකයින් රහිතව කළමනාකරණ සේවා නිලධාරීන් 09 නෙකු ස්ථාන මාරු ලබා යන ලදී.

#### 6.3.1.2. සංවර්ධන නිලධාරි සේවය

අන්තර් දෙපාර්තමේන්තු ස්ථාන මාරුවීම් යටතේ මෙම කොමිෂන් සභාවට පැමිණීමට කැමැත්ත පළ කළ සංවර්ධන නිලධාරි සේවයේ නිලධරයන් 17 දෙනෙකු මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය මත ස්ථාන මාරු කර ගන්නා ලදී.

වාර්ෂිකව අලුතින් එකතුවන ඡන්ද සංඛ්‍යාව වැඩිවීම සහ ඡන්ද හිමියන් ගණන් ගැනීමේ ක්‍රමවේදය වෙනස්වීමත් නිසා මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති රාජකාරී බහුල වීම මත ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙනුවෙන් දැනට අනුමත සංවර්ධන නිලධාරි තනතුරුවලට අමතරව අලුතින් සංවර්ධන නිලධාරි තනතුරු 25ක් ඇති කර ගැනීම සඳහා කටයුතු කරන ලදී.

#### 6.3.1.3. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය

අන්තර් දෙපාර්තමේන්තු ස්ථාන මාරුවීම් යටතේ මෙම කොමිෂන් සභාවට පැමිණීමට කැමැත්ත පළ කළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධරයන් 01 අයෙකු මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය මත ස්ථාන මාරු කර ගන්නා ලදී.

#### 6.3.1.4. කාර්යාල සේවක සේවය

අන්තර් දෙපාර්තමේන්තු ස්ථාන මාරුවීම් යටතේ මෙම කොමිෂන් සභාවට පැමිණීමට කැමැත්ත පළ කළ කාර්යාල සේවක සේවයේ සේවකයින් 04 දෙනෙකු මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය මත ස්ථාන මාරු කර ගන්නා ලදී.

මැතිවරණ කොමිෂන් සභාවෙන් පිටතට අනුප්‍රාප්තිකයින් රහිතව කාර්යාල සේවක සේවයේ සේවකයින් 06 දෙනෙකු ස්ථාන මාරු ලබා යන ලදී.

**6.3.1.5. කාර්මික නිලධාරි (සිවිල්) තනතුරට බඳවා ගැනීම**

මෙම තනතුර සඳහා දැනට රාජ්‍ය සේවයේ නියුතු කාර්මික නිලධාරි (සිවිල්) තනතුරක සේවය කරන නිලධාරියකු ස්ථානමාරු කර ගැනීමට කොළඹ පිහිටි රජයේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වෙතින් තොරතුරු කැඳවුවද, ස්ථානමාරු ලබා පැමිණීමට නිලධාරීන් නොමැති වීම මත නිලධරයෙකු බඳවා ගැනීමට නොහැකි විය. මේ පිළිබඳව ලේකම් (රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය) වෙත දැන්වූ අතර, කාර්මික නිලධාරි (සිවිල්) තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටියක් අනුමත කර ගෙන ඒ අනුව නිලධරයෙකු බඳවා ගැනීමට අදාළ කටයුතු කරන ලෙසට දැනුම් දී ඇත. එබැවින් ඊට අදාළ කටයුතු දැනට සිදු වෙමින් පවතී.

**6.3.1.6. රාජ්‍ය සේවයෙන් ඉල්ලා අස්වීම**

ගම්පහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට අනුයුක්තව සේවය කල ලේඛන සහකාර III ඩබ්.ඒ.ඩී.ටී. චන්ද්‍රසිරි මහතා 2024.05.27 දින සිට පෞද්ගලික හේතුමත රාජ්‍ය සේවයෙන් ඉල්ලා අස්වන ලදි.

**6.3.1.7. සේවය අවසන් කිරීම.**

ගාල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට අනුයුක්තව සේවය කල කා.සේ.සේ. III කේ.පී. රොෂාන් සුසන්ත මහතා ව්‍යාජ අධ්‍යාන සහතික ඉදිරිපත් කර තිබීමේ හේතුව මත ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2024.03.21 දිනැති ලිපියෙන් කර ඇති දැනුම්දීම මත වහාම ක්‍රියාත්මක වන පරිදි ඔහුගේ සේවය අවසන් කරන ලදී.

**6.3.1.8. සේවයෙන් පහ කිරීම.**

නුවරඑළිය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ සේවය කළ කාර්යාල සේවක සේවයේ III ආර්. නාගරත්නම් මහතාට විරුද්ධව පැවති විනය පරීක්ෂණය අවසානයේ ලද විනය නියෝගයට අනුව ඔහු 2024.07.31 දින සිට සේවයේ පහ කිරීමට කටයුතු කරන ලදී.

**6.3.1.9. මියයාම්**

කොළඹ නාගරික මැතිවරණ කාර්යාලයට අනුයුක්තව සේවය කල ක.සේ.නි. I එස්.එම්.එල්. අශෝක මහතා හදිසි අසනීප තත්ත්වයක් මත 2024.07.15 දින මියයන ලදි.

මොණරාගල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට අනුයුක්තව සේවය කළ කා.සේ.සේ. III එම්. ක්‍රිශාන්තන් මහතා 2024.10.16 දින සිය දිවි හානි කර ගන්නා ලදී.

**6.3.1.10. විශ්‍රාම ගැන්වීම්**

මැතිවරණ කොමිෂන් සභාවේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 01 නිලධරයෙකු, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 01 නිලධරයකු, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ 01 නිලධරයකු කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධිශ්‍රේණියේ 01 නිලධරයෙකු, කළමනාකරණ සේවා නිලධාරි සේවයේ නිලධාරීන් 05 දෙනෙකු, කාර්යාල සේවක සේවයේ සේවක මහතුන් 01 අයෙකු හා රියදුරු සේවයේ සේවක මහතුන් 01 අයෙකු 2024 වර්ෂය තුල විශ්‍රාම ගන්නා ලදී. මෙලෙස විශ්‍රාම ලබා ගත් 11 දෙනාගෙන් 10 දෙනෙකුගේ විශ්‍රාම ලිපි ගොනුවල කටයුතු සිදු කර අවසන් කරන ලදී. 2024 වර්ෂයේ දෙසැම්බර් මාසයේ විශ්‍රාම යන ලද එක් නිලධරයෙකුගේ විශ්‍රාම ලිපිගොනුවල කටයුතු අවසන් අදියරේ පවතී. විශ්‍රාම ගත් නිලධාරීන් හා සේවක මහතුන් පිළිබඳ විස්තරාත්මක වාර්තාව **සටහන** 32 හි සඳහන් කර ඇත.

### 6.3.1.11. තනතුරෙන් මුදා හැරීම

කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ කේ.ඩී.එච්.එස්.එස්. ප්‍රේමරත්න මහතා ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරි තනතුරට පත්වීම් ලබා තිබීම නිසා එම පත්වීම් භාර ගැනීමට හැකිවන පරිදි දරන ලද තනතුරෙන් නිදහස් කිරිමට කටයුතු කරන ලදී.

තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියේ තනතුරකට පත්වීම මත තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සහකාර III ශ්‍රේණියේ නිලධරයන් 02 නෙකු ඉහත පත්වීම භාර ගැනීමට හැකි වන පරිදි මැතිවරණ කොමිෂන් සභාවේ සේවයෙන් මුදා හැරීමට කටයුතු කරන ලදි.

### 6.3.1.12. නව පත්වීම්

මෙම කොමිෂන් සභාවේ පැවති තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර පුරප්පාඩුවක් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට නව පත්වීම් ලද නිලධරයන් 01 අයෙකු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දීමට කටයුතු කරන ලදී.

### 6.3.1.13. දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු අනුමත කිරීම

රා.ප.ච.14/2022, 14/2022(I), 14/2022(II) හා 14/2022(III) අනුව දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු අනුමත කරන ලද ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල සේවයේ නියුතු නිලධරයන් සඳහා පහත පරිදි නිවාඩු අනුමත කරන ලදී.

| සේවය | වැටුප් රහිත දේශීය | වැටුප් රහිත විදේශීය |
|---|---|---|
| කළමනාකරණ සේවා නිලධාරි | 01 | 04 |
| සංවර්ධන නිලධාරි | 01 | 01 |
| තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සහකාර III | 01 | - |
| කා.සේ.සේ | 01 | 01 |

### 6.3.1.14. නිවාඩු කළමනාකරණ පද්ධතිය පවත්වා ගෙන යාම

2021 වර්ෂයේ සිට ප්‍රධාන කාර්යාලය සඳහා හඳුන්වා දෙන ලද නිවාඩු කළමනාකරණ පද්ධතිය (Leave ManagementSystem) මේ වනවිටත් ක්‍රියාත්මක වන අතර, නිවාඩු ලබා ගන්නා නිලධරයන් එම නිවාඩු පද්ධතිය හරහා නිවාඩු අයදුම් කරනු ලැබේ.

### 6.3.1.15. වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම

2024 වර්ෂය තුලදී මැතිවරණ කොමිෂන් සභාවට අනුයුක්තව පහත තනතුරු වල සේවයේ නියුතු නිලධරයන්ට පහත පරිදි වාර්ෂික වැටුප් වර්ධක 627 ක් ගෙවීම් කල යුතුව තිබු අතර එයින් 497කගේ වැටුප් වර්ධක නියමිත දිනට ගෙවීම් කිරීමට කටයුතු කරන ලදී.

| තනතුර | වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම අවසන් නිලධාරින් සංඛ්‍යාව | නොගෙවන ලද වාර්ෂික වැටුප් වර්ධක සංඛ්‍යාව |
|---|---|---|
| කළමනාකරණ සේවා නිලධාරි | 275 | 68 |
| සංවර්ධන නිලධාරි | 29 | 27 |
| තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සහකාර III | 06 | 05 |
| ලේඛන සහකාර | 34 | 04 |
| කා.සේ.සේ | 111 | 20 |
| රියදුරු | 42 | 06 |

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් නොවීම, ස්ථාන මාරු ලබා පැමිණි නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු ලැබී නොතිබීම, කාර්යසාධන වාර්තා සම්පුර්ණ කර ඉදිරිපත් නොකිරීම, සේවය ස්ථිර කර නොතිබීම හා දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා තිබීම යන හේතුමත ඉහත දක්වා ඇති නිලධාරීන් සංඛ්‍යාවන් සඳහා නියමිත පරිදි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමට නොහැකි වි ඇත.

### 6.3.1.16. වැන්දඹු, අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචිය

වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ පහත පරිදි ලියාපදිංචි කිරීමේ කටයුතු කරන ලදී.

| තනතුර | වැන්දඹු, අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචිය අවසන් නිලධාරින් සංඛ්‍යාව | වැන්දඹු, අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචිය අවසන් නොමැති නිලධාරින් සංඛ්‍යාව |
|---|---|---|
| කළමනාකරණ සේවා නිලධාරි | 336 | 26 |
| සංවර්ධන නිලධාරි | 34 | 22 |
| තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සහකාර III | 10 | 01 |
| කා.සේ.සේ | 113 | 18 |
| රියදුරු | 45 | 02 |

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත  අදාල අයදුම්පත්/ ලේඛන ඉදිරිපත් කර තිබුනද මෙතෙක් ලියාපදිංචිය තහවුරු නොකිරීම, නිලධාරින් විසින් අදාල තොරතුරු නිවැරදි බව සනාථ කර නොතිබීම, හා ස්ථාන මාරු ලබා පැමිණි නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු ලැබී නොතිබීම යන හේතුමත ඉහත දක්වා ඇති නිලධාරීන් සංඛ්‍යාව සඳහා ලියාපදිංචි කිරීම සිදුකර ගැනීම ප්‍රමාද වී ඇත.

## 6.4. පවිත්‍රතා කටයුතු

මැතිවරණ මහලේකම් කාර්යාල පරිශ්‍රයේ පවිත්‍රතා කටයුතු කරන ලද රිසෝස් එන්වයර්මන්ටල් ඇන්ඩ් මැනේජ්මන්ට් සර්විස් (පුද්)  සමාගම සමඟ අත්සන් කර තිබූ ගිවිසුමේ නිල කාලය 2024.02.29 දිනෙන් අවසන්වූ අතර, ඉදිරි වසරක කාලයක් සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මඟින් ජාතික තරඟකාරි ලංසු කැඳවීම යටතේ මිල ගණන් කැඳවීමට කටයුතු කරන ලදි. ඒ අනුව අවම මිළ ඉදිරිපත් කර තිබුණේ දීප්ති ක්ලිනින් සර්විසස් ආයතනයි. එබැවින් 2024.03.01 දින සිට 2025.02.28 දින දක්වා වූ කාලය සඳහා දීප්ති ක්ලිනින් සර්විසස් ආයතනය සමඟ පවිත්‍රතා කටයුතු ඉටු කර ගැනීම වෙනුවෙන් ගිවිසුමක් අත්සන් කරන ලදී.

## 6.5. ආරක්ෂක කටයුතු

මැතිවරණ මහලේකම් කාර්යාලය හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල සඳහා ආරක්ෂක සේවාව ලබා ගැනීම සඳහා ඩබ්.එම්. සෙකියුරිටි සර්විසස් ආයතනය සමඟ අත්සන් කර තිබූ ගිවිසුමේ නිල කාලය 2024.02.29 දිනෙන් අවසන්වූ අතර,ඉදිරි වසරක කාලයක් සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මඟින් ජාතික තරඟකාරි ලංසු කැඳවීම යටතේ මිල ගණන් කැඳවීමට කටයුතු කරන ලදි.ඒ අනුව අවම මිළ ඉදිරිපත් කර තිබුනේ අයන් ආම්ස් සිකියුරිටි සර්විසස් (පුද්) සමාගමයි. එබැවින් 2024.03.01 දින සිට 2025.02.28 දින දක්වා වූ කාලය සඳහා අයන් ආම්ස් සිකියුරිටි සර්විසස් සමාගම සමඟ ආරක්ෂක කටයුතු ඉටු කර ගැනීම වෙනුවෙන් ගිවිසුමක් අත්සන් කරන ලදී.

## 6.6. විදේශ පුහුණු සහ ශිෂ්‍යත්ව

පුත්තලම දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් එස්.එල්.ආර්. ජයනායක මහතා 2024.01.07 දින සිට 2024.01.14 දින දක්වා ඉන්දියාවේ පැවති මැතිවරණ සැලසුම්කරණය පිළිබඳ පුහුණු වැඩමුළුවට සහභාගී විය.

මැතිවරණ මහලේකම් කාර්යාලයේ ගණකාධිකාරී (ගෙවීම්) වයි.ඩී. ගමගේ මහත්මිය 2024.05.12 දින සිට 2024.05.25 දින දක්වා ඉන්දියාවේ පැවති දීප ව්‍යාප්ත සේවයේ නිලධාරීන් සඳහා වන ධාරිතා සංවර්ධන පුහුණු වැඩමුළුවට සහභාගී වූ අතර එය ඉතා ඵලදායී පුහුණුවක් බව අදාළ නිලධාරිණිය විසින් වාර්තා කර ඇත.

මැතිවරණ මහලේකම් කාර්යාලයේ තොරතුරු තාක්ෂණ නිලධාරී පී.ඩී.ඩී. වික්‍රමසිංහ මහත්මිය 2024.06.22 දින සිට 2024.07.07 දින දක්වා ඔස්ට්‍රේලියාවේ පැවති Australia Awards Regional Short Course – Governing  in the Digital Age පුහුණු පාඨමාලාවට  සහභාගී විය.

### 6.7 විදේශ සම්මන්ත්‍රණ හා නිල චාරිකා

මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති ආර්.එම්.ඒ.එල්. රත්නායක මහතා සහ අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන) බී.එම්.පී.ජී.පී.වී.බණ්ඩාර මහතා 2024.01.23 දින සිට 2024.01.27 දින දක්වා ඉන්දියාවේ පැවති ආසියානු මැතිවරණ බලධාරීන්ගේ සංගමයේ විධායක මණ්ඩල රැස්වීම, 14 වන ජාතික ඡන්ද හිමියන්ගේ දින සැමරුම හා 2024.01.26 දින පැවැත්වූ ජනරජ දින සමරුම සඳහා සහභාගීවීමට විදේශ ගත වූ අතර, විදේශ රටවල මැතිවරණ කළමනාකරණය පිළිබඳ අත්දැකීම් හුවමාරු කර ගැනීම සඳහා එම සැසි ඉතා වැදගත් විය.

මැතිවරණ කොමිෂන් සභාවේ අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති, විමර්ශන හා සැලසුම්) බී.පී.සී. කුලරත්න මහතා සහ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (කොළඹ නාගරික) එම්.එම්.එස්.කේ. බණ්ඩාර මාපා මහතා 2024.02.11 දින සිට 2024.02.16 දින දක්වා ඉන්දුනීසියාවේ පැවති ඉන්දුනීසියානු මැතිවරණ නිරීක්ෂණ වැඩසටහන සඳහා සහභාගීවීමට විදේශ ගත විය.

මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති ආර්.එම්.ඒ.එල්. රත්නායක මහතා 2024.03.13 දින සිට 2024.03.20 දින දක්වා රුසියානු ජනාධිපතිවරණ මැතිවරණ නිරීක්ෂණයට සහභාගී විය.

මැතිවරණ කොමිෂන් සභාවේ අතිරේක මැතිවරණ කොමසාරිස් (පළාත් පාලන) එස්.අච්චුදන් මහතා සහ අම්පාර දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් ඒ.එම්.කේ.එස්. අත්තනායක මහතා 2024.05.04 දින සිට 2024.05.09 දින දක්වා ඉන්දියාවේ පැවති ඉන්දියානු මැතිවරණ නිරීක්ෂණ වැඩසටහන සඳහා සහභාගී විය.

### 6.8 දේශීය පුහුණු

2024 ජූලි 03 සහ 04 දෙදින ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේදී මැතිවරණ ක්‍රමවේද පිළිබඳ පුහුණු වැඩමුළුව සඳහා දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් ඇතුළු නිලධරයන් තිස් දෙනෙකු සහභාගී කරවීමට ක්‍රියාකර ඇත.

දෙවන බස දෙමළ පැය 200 පුහුණු වැඩසටහනක් මැතිවරණ කොමිෂන් සභාවේදී පවත්වා ඇති අතර, ඒ සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් සිව් දෙනෙකු සහභාගී කරවීමට ක්‍රියාකර ඇත.

දෙවන බස දෙමළ පැය 100 පුහුණු වැඩසටහන් සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් සිව් දෙනෙකු සහභාගී කරවීමට ක්‍රියාකර ඇත.

දෙවන බස සිංහල පැය 100 පුහුණු වැඩසටහන් සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් තිදෙනෙකු සහභාගී කරවීමට ක්‍රියාකර ඇත.

2024 ජනවාරි 30 සහ 31 දින නිපුණතා සංවර්ධන අරමුදල (SDFL) ආයතනය මඟින් පවත්වන ලද මුදල් රෙගුලාසි 104 අලාභ වාර්තා කිරීම, හානි පූර්ණය හා ගිණුම් තැබීම පිළිබඳ පුහුණු පාඨමාලාව සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ කළමනාකරණ සේවා නිලධාරී කේ.ආර්. ඥානේන්ද්‍රම් මහතා සහභාගී කරවීමට ක්‍රියා කර ඇත.

2024 පෙබරවාරි 20 සහ 21 දින ජාතික ශ්‍රම අධ්‍යාපන ආයතනයේදී කාර්යාල සේවක සේවයේ නිලධරයන් සඳහා පවත්වන ලද පුහුණු වැඩමුළුව සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ සේවය කරන කාර්යාල සේවක සේවයේ මහත්ම මහත්මීන් 09 දෙනෙකු සහභාගී කරවීමට ක්‍රියාකර ඇත.

කොළඹ විශ්ව විද්‍යාලය මඟින් පවත්වන ලද Master of Cyber Security Degree පාඨමාලාව සඳහා කෑගල්ල දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් කේ.එච්.එම්.එස්.පී. කස්තුරිසිංහ මහතා සහභාගී කරවීමට ක්‍රියා කරන ලදී.

වැටුප් පරිවර්තනය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහනක් 2024 මාර්තු 15 දින මැතිවරණ කොමිෂන් සභාවේ නිලධරයන් 17 දෙනෙකුගේ සහභාගීත්වයෙන් රාජගිරිය, මැතිවරණ මහලේකම් කාර්යාලයේදී පැවැත්වීමට ක්‍රියා කර ඇත.

2024 මැයි මස 30 සහ 31 දෙදින නිපුණතා සංවර්ධන අරමුදල (SDFL) ආයතනය මඟින් පවත්වන ලද ගබඩා කළමනාකරණය හා මිලදී ගැනීම් පිළිබඳ පුහුණු පාඨමාලාව සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ ආර්.කේ.එස්. වීරසිංහ මහතා සහභාගී කරවීමට ක්‍රියා කර ඇත.

මොරටුව විශ්ව විද්‍යාලය මඟින් පවත්වන ලද CISCO Certified Network Associate (CCNA) පාඨමාලාව සඳහා තොරතුරු තාක්ෂණ නිලධාරී ජී.ඩී.ඩී.එම්. වික්‍රමසිංහ මහත්මිය සහභාගී කරවන ලදී.

2024 ජුනි 14 දින නිපුණතා සංවර්ධන අරමුදල (SDFL) ආයතනය මඟින් පවත්වන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ කළමනාකරණ සේවා නිලධාරී චන්දිම ජාගොඩආරච්චි මහතා සහභාගී කරවීමට ක්‍රියා කර ඇත.

නිපුණතා සංවර්ධන අරමුදල (SDFL) ආයතනය මඟින් පවත්වන ලද රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දෙසතියක පුහුණු පාඨමාලාව සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ කළමනාකරණ සේවා නිලධාරී කේ.ඩබ්.පී. මධුරංග මහතා සහභාගී විය.

කොළඹ විශ්ව විද්‍යාලය මඟින් පවත්වන ලද Master of Admin and Management පාඨමාලාව සඳහා මඩකලපුව දිස්ත්‍රි සහකාර මැතිවරණ කොමසාරිස් එම්.බී.එම්. සුෆ්යාන් මහතා සහභාගී වීමට ක්‍රියාකර ඇති බව වාර්තා වේ.

### 6.8.1. මැතිවරණ ක්‍රමවේද සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය (IFES) මඟින් පවත්වන ලද පුහුණු

2024 ජනවාරි 09 දින සිට 2024 ජනවාරි 12 දක්වා සහ 2024 ජනවාරි 16 දින සිට 2024 ජනවාරි 19 දින දක්වා BRIDGE පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුවක් මැතිවරණ කොමිෂන් සභාවේ නිලධරයන් 09 දෙනකුගේ සහ විදේශීය මැතිවරණ කළමනාකරණ ආයතනවල නියෝජිතයන්ද ඇතුළුව පහළොස් දෙනෙකුගේ සහභාගීත්වයෙන් වත්තල දී පැවැත්විණි.

ඡන්ද විමසීම්වලට අදාළ මෙහෙයුම් සැලැස්ම හා මැතිවරණ වියදම් සීමා පිළිබඳ පුහුණු වැඩමුළුවක් නිලධරයන් 63 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2024 අප්‍රේල් 03 දින සිට අප්‍රේල් 05 දක්වා කොළඹ, ගලධාරී හෝටලයේදී පැවැත්විණි.

වනිතා සංවර්ධන නිලධරයන්ගේ පුහුණු සංචිතයක් පිහිටුවීම සඳහා වූ පුහුණු වැඩසටහනක් වනිතා සංවර්ධන නිලධාරිණියන් 30 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2024.05.09 සහ 10 දෙදින කොළඹ දී පවත්වන ලදී.

මැතිවරණ මෙහෙයුම් සැලැස්ම පිළිබඳ දිස්ත්‍රික් තේරීම්භාර නිලධරයන් / දිසාපතිවරුන් / දිස්ත්‍රික් ලේකම්වරු සහ ඡන්ද විමසීම්වල මූලික කටයුතු සිදුකරනු ලබන මාණ්ඩලික නිලධරයන් / කමිටු ප්‍රධානීන් සහ ප්‍රමුඛ නිලධරයන් සඳහා වූ පුහුණු වැඩමුළු ගම්පහ, කුරුණෑගල, මාතලේ, යාපනය, බදුල්ල, අම්පාර, පොළොන්නරුව හා කෑගල්ල යන දිස්ත්‍රික්කයන් 08 හිදී පවත්වන ලදී.

**07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව**

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ ගිණුම් / නියමිත දිනට ඉදිරිපත් කොට තිබීම.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම) | අදාළ නොවේ | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | - | - |
| 1.6 | වෙනත් | අදාළ නොවේ | - | - |
| **2** | **පොත්පත් ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකට නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 3 | **මුල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මුල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා දී තිබීම | අනුකූල වේ | - | - |
| 3.2 | මුල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවවත් හරහා අනුමක වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ | - | - |
| 6.2 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) ඉ උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම. | අනුකූල වේ | - | - |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධරයෙකු පත්කර එම නිලධරයා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂනයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදුකිරීම | අනුකූල වේ | - | - |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 73 වන වගන්තිය යටතේ කාර්යාල පිහිටුවීම පිළිබඳ විස්තර සටහන

| පිහිටුවිය හැකි කාර්යාල වර්ගය | කාර්යාල පිහිටුවීමට බලය ඇති අය | කාර්යාල පවත්වාගෙන යා හැකි කාලය | කාර්යාල පිහිටුවිය හැකි බල ප්‍රදේශය | පිහිටුවිය හැකි කාර්යාල ගණන | අයදුම් පත්‍රයේ වර්ණය |
|---|---|---|---|---|---|
| නිවේදිත මධ්‍ය ඡන්ද කාර්යාල | අපේක්ෂක/ ඡන්ද නියෝජිත/ බලයලත් නියෝජිත | 2024.08.15 දින සිට 2024.09.22 දින මධ්‍යම රාත්‍රිය දක්වා | මැතිවරණ කොට්ඨාස බල ප්‍රදේශය | එක් කාර්යාලයක් පමණි | ලා රෝස |
| නිවේදිත ශාඛා ඡන්ද කාර්යාල (i) | අපේක්ෂක/ ඡන්ද නියෝජිත/ බලයලත් නියෝජිත/ ප්‍රාදේශීය නියෝජිත | 2024.08.15 දින සිට 2024.09.19 දින මධ්‍යම රාත්‍රිය දක්වා | එක් එක් ඡන්ද කොට්ඨාසය | ඡන්ද කොට්ඨාසයකට එකක් බැගින් | සුදු |
| නිවේදිත ශාඛා ඡන්ද කාර්යාල (ii) * | අපේක්ෂක/ ඡන්ද නියෝජිත/ බලයලත් නියෝජිත/ ප්‍රාදේශීය නියෝජිත | 2024.09.20 දින සිට 2024.09.22 දින මධ්‍යම රාත්‍රිය දක්වා | එක් එක් ඡන්ද ප්‍රදේශය | ඡන්ද ප්‍රදේශයකට එකක් බැගින් | කහ |
| සාමාන්‍ය පදිංචි නිවස, කාර්යාලය ලෙස | අපේක්ෂක/ බලයලත් නියෝජිත | 2024.08.15 දින සිට 2024.09.22 දින මධ්‍යම රාත්‍රිය දක්වා | මැතිවරණ කොට්ඨාස බල ප්‍රදේශය | එක් කාර්යාලයක් පමණි | ලා දම් |

* ඡන්ද ප්‍රදේශයක් සඳහා පිහිටුවන නිවේදිත ශාඛා ඡන්ද කාර්යාලය 2024.08.15 දින සිටම පවත්වාගෙන යා යුතු නම් එම කාර්යාලය පිහිටුවන ඡන්ද කොට්ඨාසය සඳහා නිවේදිත ශාඛා ඡන්ද කාර්යාලයක් වෙනත් ස්ථානයක පවත්වා ගෙන යා නොහැක.

ඡන්ද විමසීමේ දිනයට පෙරාතුව ම වූ දිනයත් ආරම්භව ඒ ඡන්ද විමසීමේ දිනයට ඉක්බිතිව ම එන දිනයෙන් අවසන් වන කාලය ඇතුළත ඒ මැතිවරණ කොට්ඨාසයෙහි එක් නිවේදිත මධ්‍ය ඡන්ද කාර්යාලයක් හා එක් එක් ඡන්ද ප්‍රදේශයෙහි එක් නිවේදිත ශාඛා ඡන්ද කාර්යාලයක් හැර යම් ඡන්ද කාර්යාලයක් නොතිබිය යුතු ය.

කාරුණු පැහැදිලි කිරීම

I. මැතිවරණ කොට්ඨාසය

අංක 1 කොළඹ මැතිවරණ කොට්ඨාසයේ සිට අංක 22 කෑගල්ල මැතිවරණ කොට්ඨාසය දක්වා වූ මැතිවරණ කොට්ඨාස 22 මෙම නමින් හැඳින්වේ. එක් එක් මැතිවරණ කොට්ඨාසය අදාළ පරිපාලන දිස්ත්‍රික්කයේ නමින් හැඳින්වෙන අතර වවුනියාව, මන්නාරම, මුලතිව් පරිපාලන දිස්ත්‍රික්ක තුනටම අදාළ බල ප්‍රදේශය අංක 11 වන්නි මැතිවරණ කොට්ඨාසය වශයෙන් ද, යාපනය සහ කිළිනොච්චි පරිපාලන දිස්ත්‍රික්ක දෙකට අදාළ බල ප්‍රදේශය අංක 10 යාපනය මැතිවරණ කොට්ඨාසය වශයෙන් ද හැඳින්වෙන අතර අම්පාර පරිපාලන දිස්ත්‍රික්කය අංක 13 දිගාමඩුල්ල මැතිවරණ කොට්ඨාසය වශයෙන් හැඳින්වේ.

II. ඡන්ද ප්‍රදේශය

උතුරු කොළඹ, මතුගම, රත්තොට, අම්බලන්ගොඩ ආදී වශයෙන් පැරණි මැතිවරණ කොට්ඨාස හඳුන්වනු ලබන්නේ ඡන්ද ප්‍රදේශය වශයෙනි. දිවයිනේ ඡන්ද ප්‍රදේශ 160 ක් ඇත.

III. ඡන්ද කොට්ඨාසය

යම් ඡන්ද පොළක දී ඡන්දය දීම සඳහා සුදුසුකම ලබා ඇති ඡන්ද හිමියන් පදිංචි ප්‍රදේශය ඡන්ද කොට්ඨාසය යනුවෙන් හැඳින්වේ. එක් ඡන්ද ප්‍රදේශයක ඡන්ද කොට්ඨාස ගණනාවක් ඇති අතර, අංක 1 සිට පිළිවෙලින් අංක කර ඇත. එක් එක් ඡන්ද කොට්ඨාසය අනුව ඡන්දහිමි නාමලේඛනය බෙදා වෙන් කළ හැකිය. දිවයිනේ මුළු ඡන්ද කොට්ඨාස ගණන 13,314 කි.

IV. ඡන්ද නියෝජිත

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනතේ 31(1) වගන්තිය අනුව අපේක්ෂකයා විසින් නාමයෝජනා දින හෝ එදිනට පෙර ඡන්ද විමසීමට අදාළව (මුළු දිවයින වෙනුවෙන්ම) තමාගේ නියෝජිත වශයෙන් පත්කරනු ලබන පුද්ගලයා මෙ නමින් හැඳින්වේ. අපේක්ෂකයකු වෙනුවෙන් එවැනි පත්කිරීමක් කරනු ලැබ නොමැති විටක ඒ අපේක්ෂකයා විසින් තම ඡන්ද නියෝජිතයා වශයෙන් තමාම පත්කර ගනු ලැබ ඇති ලෙස සලකනු ලැබේ.

V. බලයලත් නියෝජිත

මැතිවරණ කොට්ඨාසයකට එක් අයෙකු බැගින් අපේක්ෂකයා හෝ ඔහුගේ ඡන්ද නියෝජිතයා විසින් පත්කරනු ලබන පුද්ගලයා මෙ නමින් හැඳින්වේ. නාමයෝජනා දින සිට සතියක් ඇතුළත මෙම අය පිළිබඳ පත්කිරීම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියා වෙත ලිඛිතව දැනුම දිය යුතු ය. (32(1)වගන්තිය)

VI. ප්‍රාදේශීය නියෝජිත

බලයලත් නියෝජිතයා විසින් මැතිවරණ කොට්ඨාසයට අදාළ එක් එක් ඡන්ද ප්‍රදේශය සඳහා ප්‍රාදේශීය නියෝජිතයකු බැගින් පත් කළ හැකි අතර, එම පත්වීම පිළිබඳව නාමයෝජනා දින සිට සති දෙකක් ඇතුළත තේරීම්භාර නිලධාරියා වෙත ලිඛිතව දැනුම දිය යුතු ය. (32(2)(1)වගන්තිය)

04. මෙම සෑම කාර්යාලයක්ම නිවේදිත කාර්යාලයක් විය යුතු අතර, නිවේදිත යනුවෙන් අදහස් කරනු ලබන්නේ අදාළ දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරීට හෝ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් හා කාර්යාලය පිහිටුවනු ලබන පොලිස් බල ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිට දැනුම් දීම වන අතර ඡන්ද කාර්යාල පිහිටුවීම සඳහා නියම කරනු ලබන කොන්දේසිවලට එකඟව පිහිටුවනු ලබන කාර්යාල අවසරලත් නිවේදිත කාර්යාල ලෙස හඳුන්වනු ලැබේ. ඡන්ද ප්‍රචාරක රැස්වීම පැවැත්වෙන භූමියේ හැර අනිකුත් ස්ථානවල අත් පත්‍රිකා, දැන්වීම, චිත්‍ර හා ඡායාරූප ආදිය නාමයෝජනා කාලය ආරම්භ වූ දින සිට ඡන්ද විමසීම දිනයට පෙර දින දක්වා ප්‍රදර්ශනය කළ නොහැක. නිවේදිත ඡන්ද කාර්යාල පරිශ්‍රයක ඇතුළත සීමාව තුළ පමණක් සැරසිලි කිරීම, කොඩි, බැනර් ප්‍රදර්ශනය කිරීමට ඉඩ ලබා දෙන අතර, කිසිදු විටක මහා මාර්ගය හරහා මහා මාර්ගය මත, පදික වේදිකාවේ, විදුලි රැහැන් කණුවල සැරසිලි කිරීමට ඉඩ ලබා නොදේ. වෙනත් කිසිඳු ස්ථානයක මැතිවරණ ප්‍රචාරක පුවරු හෝ ධජ, පතාක යනාදිය ප්‍රදර්ශනයට ඉඩ දෙනු නොලැබේ. නිවේදිත කාර්යාල පිළිබඳව දැනුම දීම සඳහා මෙ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රවලින් අදාළ ආකෘති පත්‍රය සෑම කාර්යාලයක් වෙනුවෙන්ම පිටපත් තුනකින් (3) සම්පූර්ණ කර තේරීම්භාර නිලධාරී/ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු අතර. ඉන් එක් පිටපතක් තේරීම්භාර නිලධාරී/ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය විසින් රඳවා ගනු ලැබේ. ඉතිරි පිටපත් දෙක (2) අදාළ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කළ යුතු ය. එවිට පොලිස් ස්ථානාධිපති විසින් එම පිටපත් දෙක මගින් කාර්යාලය පිහිටුවීමට අවසරය ලබා දී එක් පිටපතක් පොලිස් ස්ථානයේ රඳවාගෙන එක් පිටපතක් පමණක් ඉල්ලුම්කරු වෙත ලබා දෙනු ඇත. එසේ ලබා දෙනු ලබන අවසරය ඇතුළත් ආකෘතිය සෑමවිටම කාර්යාලය පරීක්ෂාවට පැමිණෙන මැතිවරණ කාර්යාලයේ නිලධාරීන්ට හෝ පොලිස් නිලධාරීන්ට හෝ පහසුවෙන් නිරීක්ෂණය කළ හැකි අයුරින් තබා ගත යුතු වේ.

05. අපේක්ෂකයකුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයාට තම පදිංචි නිවසේ නැතහොත් ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වී ඇති නිවසේ ඡන්ද කාර්යාලයක් පිහිටුවීමට හිමිකම ඇති අතර, තම පදිංචි නිවස ජනාකීර්ණ බවෙන් අඩු ප්‍රදේශයක පිහිටා ඇත්නම් පමණක් ඉහතින් දක්වා ඇති පරිදි අනුමැතිය ලබා ගැනීමෙන් පසුව එම නිවස පිහිටා ඇති ග්‍රාම නිලධාරී වසම තුළ වෙනත් ස්ථානයක මැතිවරණ ප්‍රචාරක කාර්යාලය පිහිටුවා ගත හැකිය. අදාළ ග්‍රාම නිලධාරී වසමින් බැහැරව " නිවස" ලෙස ඡන්ද කාර්යාල පිහිටුවීමට අවසර දෙනු නොලැබේ.

06. මෙම කිසිදු කාර්යාලයක් රජය/ පළාත් සභා/ පළාත් පාලන ආයතන/ රාජ්‍ය සංස්ථා හෝ මණ්ඩල සතු ගොඩනැගිල්ලක, ඉඩමක, නිල නිවසක, රක්ෂිතයක පිහිටුවිය නොහැකිය. එසේ වුවද, ඉඩම සංවර්ධන ආඥාපනත යටතේ ලබා දී ඇති තවමත් රජය සතු ජනපද නිවාසයක හෝ රජය සතු නිවාස සංකීර්ණයක වූ නිවාසයක නිසි අවසරය සහිතව පදිංචි වී සිටින අපේක්ෂකයකුට ස්වකීය නිවසේ කාර්යාලයක් පැවැත්වීමට අවසර ලැබේ. තවද, මෙවැනි වාසස්ථානයක අපේක්ෂකයකු පදිංචි නැත්නම් එවැනි ස්ථානයක කාර්යාලයක් පැවැත්වීමට ඉඩ දිය නොහැක.

07. වෙනම ලෙස අවසරය ලබාගෙන පිහිටුවා ඇති අවසරලත් නිවේදිත ඡන්ද කාර්යාල භූමි තුළ මැතිවරණ කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආකාරයට ප්‍රචාරක පුවරු, කටවුට්, දැන්වීම, ඡන්ද සලකුණු ආදිය ප්‍රදර්ශනයට ඉඩ ලබා දීමට තීරණය කර ඇති නමුත් කාර්යාලයට යාබද විදුලි කණු, මහාමාර්ග, පදික වේදිකා, මායිම් තාප්ප ආදියෙහි කිසිදු ආකාරයක දැන්වීම, කටවුට්, ධජ, පතාක ප්‍රදර්ශනය කළ නොහැකිය. පෙර සඳහන් එකඟතාව මත ලබා දී ඇති අවසරය අයුතු ලෙස භාවිතා කිරීමේ ප්‍රයත්නවල දී වලංගු නීතිය අනුව එසේ කිසිදු ස්ථානයක දැන්වීම, ප්‍රචාරක පුවරු, ප්‍රදර්ශනය කළ නොහැකිය යන නියමය ක්‍රියාත්මක කරනු ලැබේ.

08. යම්කිසි අපේක්ෂකයකුගේ කාර්යාලයක වෙනත් අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන අයුරින් හෝ අගතියක් වන අයුරින් ඡායාරූප, ඡන්ද සලකුණු, පෝස්ටර්, කටවුට් සහ බැනර් ප්‍රදර්ශනය කිරීම සපුරා තහනමය. වෙනත් අපේක්ෂකයකුගේ හෝ කිසිදු වෙනත් දේශපාලනඥයකුගේ ඡායාරූප, නම, ඡන්ද ලකුණු, ආවේනික වැකි ප්‍රදර්ශනය කරනු ලබන්නේ නම් එය අනවසර කාර්යාලයක් ලෙස සලකා ඉවත් කරනු ලබනු ඇති අතර, නීති උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ද ගනු ලැබේ.

09. කිසිදු අවසරලත් ඡන්ද කාර්යාලයක් තේරීම්භාර නිලධාරී කාර්යාලය, මැතිවරණ කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ පොලිස් ස්ථාන වැනි සෘජුවම ඡන්ද විමසීම හා සම්බන්ධ රාජ්‍ය ආයතනවල සිට මීටර් 150 කට අඩු දුරකින් පිහිටුවීමට අවසර දෙනු නොලැබේ. නගර සභා සඳහා මෙම සීමාව මීටර් 100 දක්වා ද මහ නගර සභා සඳහා මීටර් 75 දක්වා ද අඩු කළ හැකිය. අපේක්ෂකයකුගේ නිවස මෙම සීමාව තුළ පිහිටා ඇත්නම් පෙර සඳහන් දුර සීමා පිළිබඳ නියමය එහි දී බල නොපැවැත් වේ. එමෙන්ම රජයේ පාසල්, රෝහල්, අධිකරණ සංකීර්ණ, පළාත් පාලන ආයතන, තැපැල් කාර්යාල වැනි පොදු මහජනතාව නිරතුරුව සේවා ලබා ගැනීමට පැමිණෙන රාජ්‍ය ආයතනවලට පැමිණෙන මහජනතාවට බාධාවන සේ එකී ආයතන ආසන්නයේම හෝ අධ්‍යාපන කටයුතුවල නිරතවන දරුවන්ට බාධාවන සේ රජයේ පාසල් ආසන්නයේම ඡන්ද කාර්යාල පිහිටුවීමෙන් වැළකී සිටින ලෙස ස්වකීය ප්‍රාදේශීය නියෝජිතයන්, ක්‍රියාකාරී ආධාරකරුවන් දැනුම්වත් කරන ලෙස සියලුම අපේක්ෂකයන්ගෙන්/ ඡන්ද නියෝජිතයන්/ බලයලත් නියෝජිතයන්ගෙන් හා පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. කෙසේ වුවද, රාජ්‍ය ආයතනවල හෝ පාසල්වල ක්‍රියාකාරිත්වයට බාධාවන සේ පිහිටුවන කාර්යාල ඉවත් කරනු ලැබීමට යටත් වේ.

10. සෑම අවසරලත් කාර්යාලයකම බිම් වර්ගඵලය අවම වශයෙන් 10'X10' ප්‍රමාණයේ හෝ විය යුතු ය. එනම්, අවම වශයෙන් වර්ග අඩි 100 ක බිම් ප්‍රමාණයකින් යුක්ත විය යුතු ය. එමෙන්ම කාර්යාලයක උස අවම වශයෙන් අඩි 8 ක් වත් විය යුතු වේ. තවද, අවසරලත් ඡන්ද කාර්යාල ලෙස හිස් ඉඩම් වල ඉදි කරනු ලබන වර්ගඵලය 10'X10' ට වඩා අඩු කුඩා තාවකාලික ටකරන් මඩු නැතහොත් එවැනි කුඩා පොල්අතු පැල්පත් හෝ අත්හැර දමා ඇති ගොඩනැගිලි පෙන්වමින් අපේක්ෂක ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කිරීම සඳහා ඉඩදෙනු නොලැබේ.එසේවුවද, යම් නාගරික ප්‍රදේශයක ස්ථිර කඩ කාමරයක් වැනි ගොඩනැගිල්ලක වර්ග ප්‍රමාණය වර්ග අඩි 75 දක්වා අඩු වුවද මැතිවරණ කොමිෂන් සභාව වෙත දන්වා එවැනි ස්ථානයක අවසරලත් ඡන්ද කාර්යාලයක් පිහිටුවීමට අනුමැතිය ඉල්ලා සිටියහොත් ඒ පිළිබඳව සලකා බැලිය හැකිය.

11. මෙලෙස පිහිටුවනු ලබන කාර්යාලයේ කිසිම විටක ශබ්ද විකාශන යන්ත්‍ර හෝ කටහඬ විස්තාරණය කිරීම හෝ ප්‍රතිඋත්පාදනය කරන මෙගා ෆෝන් වැනි යන්ත්‍ර හෝ භාවිතා කිරීම නොකළ යුතු ය. එසේ කිරීමට අවශ්‍ය වන්නේ නම් නීත්‍යානුකූලව අවසර ලබා ගත යුතු ය. සෑම කාර්යාලයක්ම අවම වශයෙන් දිනකට පැය 4 ක් වත් විවෘතව තැබිය යුතු අතර, පැය 0600 සිට පැය 2200 දක්වා වූ කාලසීමාවෙන් බැහැරව ඡන්ද කාර්යාල විවෘතව තැබීමෙන් වැළකිය යුතු ය.

12. තවද, මෙවැනි ඡන්ද කාර්යාල ඉදිරිපිට හෝ ආසන්නයේ හෝ පොදු මාර්ගවල වාහන තදබද ඇතිවන සේ නැතහොත් මහජනතාවට බාධා ඇතිවන සේ වාහන නවතා තැබීමෙන්, ආධාරකරුවන් විශාල ප්‍රමාණයක් එක් රැස්වීමෙන් වැළකිය යුතු අතර, කාර්යාල පරීක්ෂාවට පැමිණෙන පොලිස් නිලධාරීන්ට හා මැතිවරණ නිලධාරීන්ට ඒ සඳහා උපරිම සහාය ලබා දිය යුතු ය. ඔවුන්ට බාධා කිරීම ඡන්ද විමසීම පැවැත්වීමට බාධා කිරීමක් සිදු කළා සේ සලකා ක්‍රියා කරනු ලැබේ.

13. ආගමික සිද්ධස්ථාන සතු ඉඩම්වල හෝ ආගමික ස්ථාන සතු ගොඩනැගිලිවල ඡන්ද කාර්යාල පිහිටුවන්නේ නම් ඒ සඳහා විශේෂ අවසරයක් ලබාගත යුතු අතර, එවැනි ස්ථානවල ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනයට ඉඩ දෙනු නොලැබේ. කිසිම හේතුවක් නිසාවත් ආගමික වතාවත් සිදු කරන ස්ථානවල ඡන්ද කාර්යාල පිහිටුවීමට අවසර ලබා දෙනු නොලැබේ. 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම් පනතේ 78(2) උපවගන්තියේ සඳහන් අයුතු බලපෑම සම්බන්ධයෙන් වූ

නියමවලට අනනුකූල ක්‍රියා සිදුවිය හැකි ස්ථානවල දී ඡන්ද කාර්යාල පිහිටුවීමට හෝ ඡන්ද කාර්යාල ලෙස පවත්වාගෙන යාමට අවසරය ඉල්ලීමෙන් වැලකී සිටින ලෙස දන්වා සිටිනු ලැබේ.

14. මෙම නියම කිරීම හේතුවෙන් පූර්ව ඡන්ද විමසීම්වල දී කලක් තිස්සේම ඡන්ද කාර්යාල ලෙස පවත්වනු ලබන ස්ථානවල ඡන්ද කාර්යාල පිහිටුවීමට අපහසුතාවක් ඇතිවන්නේ නම හා ඡන්ද කොට්ඨාසය තුළ ඒ සඳහා සුදුසු වෙනත් ස්ථානයක් නැතිනම ඒ සම්බන්ධයෙන් තේරීම්භාර නිලධාරී වෙත කරුණු ඉදිරිපත් කර මැතිවරණ කොමිෂන් සභාවේ විශේෂ අනුමැතිය සඳහා ඉල්ලුම කිරීමට අවස්ථාව ලබා ගත හැකිය.

15. ඉහත දක්වා ඇති කොන්දේසි හා නියම පැනවීමට සිදුව ඇත්තේ ඡන්ද විමසීම කාලසීමාව තුළ ඡන්ද විමසීම හා බැඳි ගැටුම, පහරදීම, තුවාල කිරීම, මනුෂ්‍ය ඝාතන හා දේශපාලන පළිගැනීම වැනි නොමනා ක්‍රියා වැළැක්වීම හා මහජනතාවට ඇති විය හැකි අවහිරතා වැළැක්වීම සඳහා මෙන්ම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය වාතාවරණය ඇති කිරීම පිණිස මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

පිටපත් :-

1. පොලිස්පති - දැන ගැනීම සඳහා සහ අදාළ නිලධාරීන් දැනුවත් කිරීමට කාරුණික වනු පිණිස
2. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති - (පරිපාලන හා මැතිවරණ) - දැන ගැනීම සඳහා සහ අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කාරුණික වනු පිණිස
3. සියලුම දිස්ත්‍රික් තේරීම්භාර හා නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් හා ඡන්ද විමසීම නීති උල්ලංඝණය වීම පිළිබඳ විමර්ශනය කිරීමේ නිලධාරීන් - දැනගැනීම සඳහා සහ බලයලත් නියෝජිතයන් දැනුවත් කර ඔවුන් වෙත මෙම ලිපියේ පිටපතක් ලබා දීමට සහ ඉල්ලීම කරන අවස්ථාවන් හි දී නියමිත වර්ණයෙන් යුත් අයදුම්පත්‍ර ලබා දීම සඳහා යා කිරීම වස්
4. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් - කාරුණික දැන ගැනීම සඳහා
5. මැතිවරණ පැමිණිලි විමර්ශනය සඳහා වූ ස්ථාවර කමිටුවේ - දේශපාලන පක්ෂවල නිත්‍ය නියෝජිතයන් - කාරුණික දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
6. මැතිවරණ කොමිෂන් සභාව විසින් අනුමත - නිරීක්ෂණ සංවිධානවල විධායක අධ්‍යක්ෂවරුන් - කාරුණික දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
7. ප්‍රධාන සම්බන්ධීකරණ නිලධාරී - මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ පැමිණිලි විමර්ශන කාර්යාලය

ඇමුණුම 08

**මැතිවරණ කොමිෂන් සභාව**
**ජනාධිපතිවරණය - 2024/09/21**
**සමස්ත ප්‍රතිඵලය**

| **අපේක්ෂකයාගේ නම** | **පක්ෂයේ නම කෙටියෙන්** | **ලබාගත් ඡන්ද සංඛ්‍යාව** | **ප්‍රතිශතය** |
|---|---|---|---|
| 1 අනුර කුමාර දිසානායක | ජා.ජ.බ. | 5,634,915 | 42.31% |
| 2 සජිත් ප්‍රේමදාස | ස.ජ.බ | 4,363,035 | 32.76% |
| 3 රනිල් වික්‍රමසිංහ | ස්වාධීන අපේක්ෂක | 2,299,767 | 17.27% |
| 4 නාමල් රාජපක්ෂ | ශ්‍රී.ලං.පො.පෙ. | 342,781 | 2.57% |
| 5 අරියනේත්‍රිරන් පාක්කියසෙල්වම් | ස්වාධීන අපේක්ෂක | 226,343 | 1.70% |
| 6 දිලිත් ජයවීර | ශ්‍රී.ලං.කො.ප. | 122,396 | 0.92% |
| 7 කේ.කේ. පියදාස | ස්වාධීන අපේක්ෂක | 47,543 | 0.36% |
| 8 දිසානායක මුදියන්සේලාගේ බණ්ඩාරනායක | ස්වාධීන අපේක්ෂක | 30,660 | 0.23% |
| 9 සරත් ෆොන්සේකා | ස්වාධීන අපේක්ෂක | 22,407 | 0.17% |
| 10 විජයදාස රාජපක්ෂ | ජා.ප්‍ර.පෙ. | 21,306 | 0.16% |
| 11 අනුරුද්ධ පොල්ගම්පල | ස්වාධීන අපේක්ෂක | 15,411 | 0.12% |
| 12 සරත් කීර්තිරත්න | ස්වාධීන අපේක්ෂක | 15,187 | 0.11% |
| 13 කේ.ආර්. ක්‍රිෂාන් | අ.ජ.පෙ. | 13,595 | 0.10% |
| 14 අගම්පොඩි ප්‍රසන්ග සුරංජීව අනෝජ් ද සිල්වා | ප්‍ර.එ.ජා.පෙ. | 12,898 | 0.10% |
| 15 ප්‍රියන්ත වික්‍රමසිංහ | න.ස.ප. | 12,760 | 0.10% |
| 16 නාමල් රාජපක්ෂ | ස.ප. | 12,700 | 1.00% |
| 17 අක්මීමන දයාරතන හිමි | ස්වාධීන අපේක්ෂක | 11,536 | 0.09% |
| 18 නුවන් බෝපෙගේ | ජ.අ.සං. | 11,191 | 0.08% |
| 19 අජන්ත ද සොයිසා | රු.ජ.පෙ. | 10,548 | 0.08% |
| 20 වික්ටර් පෙරේරා | ස්වාධීන අපේක්ෂක | 10,374 | 0.08% |
| 21 සිරිපාල අමරසිංහ | ස්වාධීන අපේක්ෂක | 9,035 | 0.07% |
| 22 සිරිතුංග ජයසූරිය | එ.ස.ප. | 8,954 | 0.07% |
| 23 බත්තරමුල්ලේ සීලරතන හිමි | ජ.පෙ. | 6,839 | 0.05% |
| 24 අබුබකර් මොහමඩ් ඉන්ෆාස් | එ.ප්‍ර.ස. | 6,531 | 0.05% |
| 25 පේමසිරි මානගේ | ස්වාධීන අපේක්ෂක | 5,822 | 0.04% |
| 26 මහින්ද දේවගේ | ශ්‍රී.ලං.ස.ප. | 5,338 | 0.04% |

| අපේක්ෂකයාගේ නම | | ලබාගත් ඡන්ද සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|
| 27 කීර්ති වික්‍රමරත්න | අ.ජ.ප. | 4,676 | 0.04% |
| 28 පානි විජේසිරිවර්ධන | ස.ස.ප. | 4,410 | 0.03% |
| 29 ඕෂල හේරත් | අ.නි.පෙ. | 4,253 | 0.03% |
| 30 අනුරුද්ධ රොෂාන් රණසිංහ | ස්වාධීන අපේක්ෂක | 4,205 | 0.03% |
| 31 සරත් බණ්ඩාරනායක | ජා.සං.පෙ. | 4,070 | 0.03% |
| 32 කේ.ඒ. කුලරත්න | ස්වාධීන අපේක්ෂක | 4,013 | 0.03% |
| 33 ලලිත් ද සිල්වා | එ.ජා.නි.පෙ. | 3,004 | 0.02% |
| 34 පල්ලිමුල්ල කපුගමගේ අනුර සිඩ්නි ජයරත්න | ස්වාධීන අපේක්ෂක | 2,799 | 0.02% |
| 35 ජනක රත්නායක | එ.ලං.පො.ප. | 2,405 | 0.02% |
| 36 මයිල්වාගනම් තිලකරාජා | ස්වාධීන අපේක්ෂක | 2,138 | 0.02% |
| 37 සරත් මනමේන්ද්‍ර | න.සි.උරුමය | 1,911 | 0.01% |
| 38 ඒ.එස්.පී.ලියනගේ | ශ්‍රී.ලං.ක.ප. | 1,860 | 0.01% |

| | | |
|---|---|---|
| වලංගු ඡන්ද සංඛ්‍යාව | 13,319,616 | 97.80% |
| ප්‍රතික්ෂේපිත ඡන්ද සංඛ්‍යාව | 300,300 | 2.20% |
| ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව | 13,619,916 | 79.46% |
| ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව | 17,140,354 | - |

දිනය : 2024.09.22

වේලාව : ප.ව. 5.25

ආර්.එම්.ඒ.එල්. රත්නායක
සභාපති

එම්.ඒ.පී.සී. පෙරේරා
සාමාජික

අමීර් ෆායිස්
සාමාජික

ඒ. ෂන්මුගනාදන්
සාමාජික

මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක
සාමාජික

ඇමුණුම 09

**මැතිවරණ කොමිෂන් සභාව**
**ජනාධිපතිවරණය - 2024/09/21**
**අවසන් ප්‍රතිඵලය**

| අපේක්ෂකයාගේ නම | පක්ෂයේ නම කෙටියෙන් | ලබාගත් ඡන්ද සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|
| 1 අනුර කුමාර දිසානායක | ජා.ජ.බ. | 5,634,915 | 42.31% |
| 2 සජිත් ප්‍රේමදාස | ස.ජ.බ. | 4,363,035 | 32.76% |

දිනය : 2024.09.22
වේලාව : ප.ව. 7.40

ආර්.එම්.ඒ.එල්. රත්නායක
සභාපති

එම්.ඒ.පී.සී. පෙරේරා
සාමාජික

අමීර් ෆායිස්
සාමාජික

ඒ. ෂන්මුගනාදන්
සාමාජික

මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක
සාමාජික

මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො 02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

ඇමුණුම 10

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :PRE/2024/108 2024.10.14

# ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21

## 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 03 වන වගන්තිය යටතේ වූ නියමය ප්‍රකාරව ආදායම් වියදම් වාර්තා භාර දීම

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ විධිවිධාන ප්‍රකාරව ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිණිස පවත්වන ලද 2024 ජනාධිපතිවරණ ඡන්ද විමසීම සඳහා තරග කරනු ලැබූ සියලුම පිළිගත් දේශපාලන පක්ෂ අපේක්ෂකයන්, වෙනත් දේශපාලන පක්ෂවල අපේක්ෂකයන්, ඡන්දහිමියකු විසින් නාමයෝජනා කළ අපේක්ෂකයන් සඳහා සහ පිළිගත් දේශපාලන පක්ෂ, වෙනත් දේශපාලන පක්ෂ සහ අපේක්ෂයා නාමයෝජනා කළ ඡන්දහිමියන් විසින් 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 03 වන වගන්තිය ප්‍රකාරව මැතිවරණ ප්‍රචාරක ආදායම් හා වියදම් වාර්තා මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර දින විසි එකක් (21) ඇතුළත පිළිගත් දේශපාලන පක්ෂය හෝ වෙනත් දේශපාලන පක්ෂය හෝ අපේක්ෂකයා නාමයෝජනා කළ ඡන්දහිමියා විසින් හෝ අපේක්ෂකයා විසින් වෙන වෙනම සකස් කර 2024.10.13 දින මධ්‍යම රාත්‍රී 12.00 ට පෙර මැතිවරණ කොමිෂන් සභාව වෙත භාර දිය යුතුව තිබුණි.

**01.** මැතිවරණ කොමිෂන් සභාව වෙත ආදායම් වියදම් වාර්තා භාර දීමට අදාළ විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | වාර්තා භාරදුන් අපේක්ෂකයාගේ නම | අපේක්ෂකයා විසින් ආදායම් වියදම් වාර්තා භාරදුන් දිනය | වාර්තා ලබාදුන් අදාළ පිළිගත් දේශපාලන පක්ෂයේ නම / *වෙනත් දේශපාලන පක්ෂයේ / අපේක්ෂකයා නාමයෝජනා කළ ඡන්දහිමියාගේ නම | පිළිගත් දේශපාලන පක්ෂයේ නම / *වෙනත් දේශපාලන පක්ෂය / අපේක්ෂකයා නාමයෝජනා කළ ඡන්දහිමියා විසින් ආදායම් වියදම් වාර්තා භාර දුන් දිනය |
|---|---|---|---|---|
| 1 | මරක්කල මානගේ පේමසිරි මහතා | 2024.09.30 | හබරාදූව නානායක්කාර කණ්ඩම්බි කසුන් ගයාශාන් මහතා | 2024.09.30 |
| 2 | මහින්ද දේවගේ මහතා | 2024.10.01 | ශ්‍රී ලංකාවේ සමාජවාදී පක්ෂය | 2024.10.01 |
| 3 | කේ. ආනන්ද කුලරත්න මහතා | 2024.10.01 | ඩබ්.බී. රත්නායක මහතා | 2024.10.01 |
| 4 | විජයදාස රාජපක්ෂ මහතා | 2024.10.03 | ජාතික ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ | 2024.10.03 |
| 5 | සිරිතුංග ජයසූරිය මහතා | 2024.10.08 | එක්සත් සමාජවාදී පක්ෂය | 2024.10.08 |
| 6 | අබුබකර් මුහම්මදු ඉන්ෆාස් මහතා | 2024.10.08 | එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානය | - |
| 7. | ප්‍රියන්ත වික්‍රමසිංහ මහතා | 2024.10.09 | නව සමසමාජ පක්ෂය | 2024.10.09 |
| 8. | බියන්විලගේ ඇන්ටනී වික්ටර් පෙරේරා මහතා | 2024.10.10 | එච්.එම්. අසිත බණ්ඩාර මහතා | - |
| 9. | සරත් බණ්ඩාරනායක මහතා | 2024.10.10 | ජාතික සංවර්ධන පෙරමුණ | 2024.10.13 |
| 10. | ජනක රත්නායක මහතා | 2024.10.10 | එක්සත් ලංකා පොදුජන පක්ෂය | - |
| 11. | කේ.කේ.පියදාස මහතා | 2024.10.10 | අර්චනා රණතුංග මහත්මිය | - |
| 12. | සරත් ෆොන්සේකා මහතා | 2024.10.10 | චමීර දිනේෂ් ගාල්ලේආරච්චි මහතා | 2024.10.10 |
| 13. | පානි විජේසිරිවර්ධන මහතා | 2024.10.10 | සමාජවාදී සමානතා පක්ෂය | 2024.10.10 |
| 14. | කේ.ආර්.ක්‍රිෂාන් මහතා | 2024.10.11 | අරුණළු ජනතා පෙරමුණ | 2024.10.10 |
| 15. | නාමල් රාජපක්ෂ මහතා | 2024.10.11 | සමබිම පක්ෂය | - |
| 16. | ජල්තොටගේ දොන් කීර්ති වික්‍රමරත්න මහතා | 2024.10.11 | අපේ ජනබල පක්ෂය | 2024.10.12 |
| 17. | සරත් මනමේන්ද්‍ර මහතා | 2024.10.11 | නව සිහළ උරුමය | 2024.10.11 |

| | | | | |
|---|---|---|---|---|
| 18. | නුවන් බෝපගේ මහතා | 2024.10.12 | ජන අරගල සන්ධානය | 2024.10.12 |
| 19. | ඩී.එම්.බණ්ඩාරනායක මහතා | 2024.10.12 | දිගල්ලේ මුදියන්සේලාගේ ධනංජය බණ්ඩාර දිගල්ල මහතා | 2024.10.12 |
| 20. | දිලිත් සුසන්ත ජයවීර මහතා | 2024.10.12 | ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය | 2024.10.12 |
| 21. | ඒ.එස්.පී.ලියනගේ මහතා | 2024.10.13 | ශ්‍රී ලංකා කම්කරු පක්ෂය | 2024.10.13 |
| 22. | අනුරුද්ධ පොල්ගම්පල මහතා | 2024.10.13 | එච්.ආනන්ද සුනිල් ශාන්ත ප්‍රනාන්දු මහතා | 2024.10.13 |
| 23. | ඕෂල හේරත් මහතා | 2024.10.13 | අභිනව නිවහල් පෙරමුණ | 2024.10.13 |
| 24. | අජන්ත ද සොයිසා මහතා | 2024.10.13 | රුහුණු ජනතා පෙරමුණ* | 2024.10.13 |
| 25. | සිරිපාල අමරසිංහ මහතා | 2024.10.13 | මයිලන් අච්චිගේ දොන් අසංක නන්දන ශ්‍රීනාත් මහතා | 2024.10.13 |
| 26. | රනිල් වික්‍රමසිංහ මහතා | 2024.10.13 | වන්න ලලිත් වික්‍රමසිංහ මහතා | - |
| 27. | පල්ලිමුල්ල කපුගමගේ අනුර සිඩ්නි ජයරත්න මහතා | 2024.10.13 | එම්.එම්.ජී. නන්දික ප්‍රදීප් කුමාර මහතා | 2024.10.13 |
| 28. | ලලිත් ද සිල්වා මහතා | 2024.10.13 | එක්සත් ජාතික නිදහස් පෙරමුණ | 2024.10.13 |
| 29. | ලක්ෂ්මන් නාමල් රාජපක්ෂ මහතා | 2024.10.13 | ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ | 2024.10.13 |
| 30. | මයිල්වාගනම් තිලකරාජා මහතා | 2024.10.13 | ඒ.ෆ්‍රැන්සිස් මහතා | 2024.10.13 |
| 31. | අනුරුද්ධ රොෂාන් රණසිංහ | 2024.10.13 | සරත් නන්ද සිල්වා මහතා | 2024.10.13 |
| 32. | අනුර කුමාර දිසානායක මහතා | 2024.10.13 | ජාතික ජන බලවේගය | 2024.10.13 |
| 33. | අක්මීමන දයාරතන හිමි | 2024.10.13 | දෙල්කඳුර ආරච්චිලාගේ සංජීව කුමාර ගුණරත්න මහතා | 2024.10.13 |
| 34. | සජිත් ප්‍රේමදාස මහතා | 2024.10.13 | සමගි ජන බලවේගය | 2024.10.13 |
| 35. | අංගම්පොඩිගේ සුරංජීව අනෝජ් ද සිල්වා මහතා | 2024.10.13 | ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ | - |

*පිළිගත් දේශපාලන පක්ෂයක් නොවන වෙනත් දේශපාලන පක්ෂයකි.

**02.** පහත සඳහන් අපේක්ෂකයන්, පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන් සහ අපේක්ෂකයන් නාමයෝජනා කළ ඡන්දහිමියන් විසින් ආදායම් සහ වියදම් වාර්තා වෙන වෙනම සකස් කර භාර දී නොමැත.

| අනු අංකය | අපේක්ෂකයාගේ නම | පිළිගත් දේශපාලන පක්ෂයේ / අපේක්ෂකයා නාමයෝජනා කළ ඡන්දහිමියාගේ නම |
|---|---|---|
| 01 | බත්තරමුල්ලේ සීලරතන හිමි | ලේකම්, ජනසෙත පෙරමුණ |
| 02 | සරත් කීර්තිරත්න මහතා | සරත් අතුකෝරාල මහතා |
| 03 | අරියනේත්තිරන් පාක්කිය සෙල්වම් මහතා | තවචෙල්වම් සිවපරන් මහතා |

**03.** අපේක්ෂකයන් විසින් ආදායම් සහ වියදම් වාර්තා ලබා දී ඇතත් එම අපේක්ෂකයන්ගේ පහත සඳහන් පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන් හෝ අපේක්ෂකයන් නාමයෝජනා කළ ඡන්දහිමියන් විසින් ආදායම් සහ වියදම් වාර්තා ලබා දී නොමැත.

1. ලේකම්, ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් ජාතික පෙරමුණ
2. ලේකම්, එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී සන්ධානය
3. ලේකම්, එක්සත් ලංකා පොදුජන පක්ෂය
4. ලේකම්, සමබිම පක්ෂය
5. වන්න ලලිත් වික්‍රමසිංහ මහතා (අපේක්ෂකයා නාමයෝජනා කළ ඡන්දහිමියා)
6. එච්.එම්. අසිත බණ්ඩාර මහතා (අපේක්ෂකයා නාමයෝජනා කළ ඡන්දහිමියා)
7. අර්චනා රණතුංග මිය (අපේක්ෂකයා නාමයෝජනා කළ ඡන්දහිමියා)

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2403/13 - 2024 සැප්තැම්බර් මස 24 වැනි අඟහරුවාදා - 2024.09.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/07/17/01

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි**

මුද්‍රාව

**අනුර කුමාර දිසානායක**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර හා 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 10 වන වගන්තියේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අනුර කුමාර දිසානායක වන මම, මේ ප්‍රකාශනයෙන් -

(අ) අද දින මධ්‍යම රාත්‍රියේ සිට බලපැවැත්වෙන පරිදි, පාර්ලිමේන්තුව විසුරුවා හරින අතර, අභිනව පාර්ලිමේන්තුව වර්ෂ දෙදහස් විසිහතරක් වූ නොවැම්බර් මස විසිඑක් වැනි දින රැස්වීම සඳහා කැඳවන බව;

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගන්නා දිනය වශයෙන් වර්ෂ දෙදහස් විසිහතරක් වූ නොවැම්බර් මස දහහතර වැනි දිනය නියම කරන බව;

(ඇ) තේරීම්භාර නිලධරයන් විසින් නාමයෝජනා පත්‍ර භාර ගතයුතු වන්නේ යම් කාලසීමාවක් ඇතුළත ද, ඒ නාමයෝජනා කාලසීමාව වශයෙන් වර්ෂ දෙදහස් විසිහතරක් වූ ඔක්තෝබර් මස හතර වන දිනයෙන් ආරම්භව වර්ෂ දෙදහස් විසිහතරක් වූ ඔක්තෝබර් මස එකොළොස්වන දින දහවල් දොළහට අවසන් වන කාලසීමාව නියම කරන බව; සහ

1A - G 42737 — 359 (2024/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඇ) මෙහි උපලේඛනයේ I වන තීරයෙහි සඳහන් කර ඇත්තා වූ මැතිවරණ කොට්ඨාසය සඳහා තේරී පත්වීමට අපේක්ෂා කරන මන්ත්‍රී ධූර අපේක්ෂකයන්ගේ නාමයෝජනා කරනු ලැබිය යුතු එක් එක් ස්ථානය වශයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති ස්ථානය නියම කරන බව ;

මෙයින් සියල්ලෝම දැනගත යුතුය.

වර්ෂ දෙදහස් විසිහතරක් වූ සැප්තැම්බර් මස විසිහතර වන දින වූ මෙදින කොළඹ දී නිකුත් කරන ලදී.

ගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ආචාර්ය **එන්.එස්. කුමානායක,**
ජනාධිපති ලේකම්.

උපලේඛනය

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| *මැතිවරණ කොට්ඨාසය* | *නාමයෝජනා කරනු ලැබිය යුතු ස්ථානය* |
| අංක 01 - කොළඹ | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කොළඹ |
| අංක 02 - ගම්පහ | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ |
| අංක 03 - කළුතර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කළුතර |
| අංක 04 - මහනුවර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර |
| අංක 05 - මාතලේ | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතලේ |
| අංක 06 - නුවරඑළිය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - නුවරඑළිය |
| අංක 07 - ගාල්ල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල |
| අංක 08 - මාතර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මාතර |
| අංක 09 - හම්බන්තොට | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට |
| අංක 10 - යාපනය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - යාපනය |
| අංක 11 - වන්නි | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - වවුනියාව |
| අංක 12 - මඩකලපුව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මඩකලපුව |
| අංක 13 - දිගාමඩුල්ල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර |
| අංක 14 - ත්‍රිකුණාමලය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ත්‍රිකුණාමලය |
| අංක 15 - කුරුණෑගල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල |
| අංක 16 - පුත්තලම | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පුත්තලම |
| අංක 17 - අනුරාධපුරය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුරය |
| අංක 18 - පොළොන්නරුව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පොළොන්නරුව |
| අංක 19 - බදුල්ල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - බදුල්ල |
| අංක 20 - මොණරාගල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොණරාගල |
| අංක 21 - රත්නපුර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර |
| අංක 22 - කෑගල්ල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල |

EOG 09 - 0161

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

ඇමුණුම 12

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2403/22 - 2024 සැප්තැම්බර් මස 25 වැනි බදාදා - 2024.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පාර්ලිමේන්තු මැතිවරණය - 2024

**1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 16 වන වගන්තිය යටතේ ස්වාධීන කණ්ඩායම් විසින් ඇප මුදල් තැන්පත් කිරීම සහ ඒ ඒ මැතිවරණ කොට්ඨාස සඳහා දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් විසින් නාමයෝජනා කළ යුතු අපේක්ෂකයින් සංඛ්‍යාව**

ඉහත මැතිවරණය වෙනුවෙන් මැතිවරණ කොට්ඨාස සඳහා තෝරා පත්කර ගැනීමට නියමිත මන්ත්‍රීවරු සංඛ්‍යාව, නාම යෝජනා පත්‍රයක් මඟින් නාම යෝජනා කළ යුතු අපේක්ෂකයින් සංඛ්‍යාව සහ ස්වාධීන කණ්ඩායමක් විසින් තැන්පත් කළ යුතු ඇප මුදල් පහත උපලේඛනයේ දැක්වේ. පිළිගත් දේශපාලන පක්ෂ ඇප මුදල් තැන්පත් කළ යුතු නැත.

**උපලේඛනය**

| *මැතිවරණ කොට්ඨාසයේ අංකය හා නම* | *තෝරා පත්කර ගතයුතු මන්ත්‍රීවරු සංඛ්‍යාව* | *නාමයෝජනා පත්‍රයකට ඇතුළත් විය යුතු අපේක්ෂකයින් සංඛ්‍යාව* | *ස්වාධීන කණ්ඩායමක් විසින් තැන්පත් කළ යුතු ඇප මුදල* |
|---|---|---|---|
| 01. කොළඹ | 18 | 21 | රු. 42,000/- |
| 02. ගම්පහ | 19 | 22 | රු. 44,000/- |
| 03. කළුතර | 11 | 14 | රු. 28,000/- |
| 04. මහනුවර | 12 | 15 | රු. 30,000/- |
| 05. මාතලේ | 05 | 08 | රු. 16,000/- |
| 06. නුවරඑළිය | 08 | 11 | රු. 22,000/- |
| 07. ගාල්ල | 09 | 12 | රු. 24,000/- |
| 08. මාතර | 07 | 10 | රු. 20,000/- |
| 09. හම්බන්තොට | 07 | 10 | රු. 20,000/- |

1A - EPG 6885 — 104 (2024/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| මැතිවරණ කොට්ඨාසයේ අංකය හා නම | තෝරා පත්කර ගතයුතු මන්ත්‍රීවරු සංඛ්‍යාව | නාමයෝජනා පත්‍රයකට ඇතුළත් විය යුතු අපේක්ෂකයින් සංඛ්‍යාව | ස්වාධීන කණ්ඩායමක් විසින් තැන්පත් කළ යුතු ඇප මුදල |
|---|---|---|---|
| 10. යාපනය | 06 | 09 | රු. 18,000/- |
| 11. වන්නි | 06 | 09 | රු. 18,000/- |
| 12. මඩකලපුව | 05 | 08 | රු. 16,000/- |
| 13. දිගාමඩුල්ල | 07 | 10 | රු. 20,000/- |
| 14. ත්‍රිකුණාමලය | 04 | 07 | රු. 14,000/- |
| 15. කුරුණෑගල | 15 | 18 | රු. 36,000/- |
| 16. පුත්තලම | 08 | 11 | රු. 22,000/- |
| 17. අනුරාධපුරය | 09 | 12 | රු. 24,000/- |
| 18. පොළොන්නරුව | 05 | 08 | රු. 16,000/- |
| 19. බදුල්ල | 09 | 12 | රු. 24,000/- |
| 20. මොණරාගල | 06 | 09 | රු. 18,000/- |
| 21. රත්නපුර | 11 | 14 | රු. 28,000/- |
| 22. කෑගල්ල | 09 | 12 | රු. 24,000/- |

02. යාපනය සහ කිළිනොච්චිය යන පරිපාලන දිස්ත්‍රික්ක අයත් වන යාපනය මැතිවරණ කොට්ඨාසය සඳහා යාපනය දිසාපති/ දිස්ත්‍රික් ලේකම්වරයා තේරීම්භාර නිලධාරියා වේ. මන්නාරම, වවුනියාව සහ මුලතිව් යන පරිපාලන දිස්ත්‍රික්ක අයත් වන වන්නි මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරියා වන්නේ වවුනියාව දිස්ත්‍රික්කයේ දිසාපති/ දිස්ත්‍රික් ලේකම්වරයා ය. දිගාමඩුල්ල මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරියා, අම්පාර දිස්ත්‍රික්කයේ දිසාපති/ දිස්ත්‍රික් ලේකම්වරයා ය. අනෙකුත් ඒ ඒ පරිපාලන දිස්ත්‍රික්ක අයත් වන මැතිවරණ කොට්ඨාසවල දිසාපතිවරු/ දිස්ත්‍රික් ලේකම්වරු එම මැතිවරණ කොට්ඨාසවල තේරීම්භාර නිලධාරීන් ලෙස කටයුතු කරනු ඇත.

03. ඇප මුදල් තැන්පත් කිරීම, පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 10 වන වගන්තිය යටතේ මැතිවරණය පැවැත්වීම සඳහා දින නියම කරමින් නිවේදනය පල කරනු ලැබූ දින සිට ස්වාධීන කණ්ඩායම් ඒ ඒ නාමයෝජනා පත්‍ර අදාළ තේරීම්භාර නිලධාරී වෙත බාර දීමට අතර වූ කාලය තුළ, ඒ ඒ කණ්ඩායම විසින් නාමයෝජනා ඉදිරිපත් කරන ලද එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් රුපියල් දෙදහස බැගින් ගණන් බලා ලද මුදලක් වලංගු මුදලින් තේරීම්භාර නිලධාරී වෙත සතියේ වැඩ කරන දින වල සාමාන්‍ය කාර්යාල වේලාව තුළ තැන්පත් කළ යුතුය. 2024 සැප්තැම්බර් මස 28, 29 දිනවල සහ 2024 ඔක්තෝබර් මස 05, 06 දිනවල ඇප මුදල් භාරගනු නොලැබේ.

04. ඇප මුදල් බාර ගැනීම සඳහා අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හෝ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ හෝ වැඩපිළිවෙල යොදා ඇත.

05. නාමයෝජනා භාර ගැනීම 2024 ඔක්තෝබර් මස 05 සහ 06 දිනවල සිදුකරනු නොලැබේ.

**ආර්. එම්. ඒ. එල්. රත්නායක,**
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

**එම්. ඒ. පී. සී. පෙරේරා,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**අමීර් ෆායිස්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**ඒ. ෂන්මුගනාදන්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2024 සැප්තැම්බර් මස 25 වැනි දින,
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත
රාජගිරිය.

EPG 09 - 0189

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு

පොදු කාර්යාලය :011-2868441, 2868442, 2868443
பொது அலுவலகம்
General Office
ෆැක්ස්/தொலைநகல்/Fax:011-2868426
Web: www.elections.gov.lk e-mail: info@slelections.gov.lk

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය(10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய(10107)

| | | |
|---|---|---|
| මගේ අංකය : EC/ EDR/PE/2024/13<br>எனது இல. : | ඔබේ අංකය :<br>உமது இல.: | දිනය : 2024.10.03<br>திகதி : |

චක්‍රලේඛ අංක - PE/2024/05

තරග කරනු ලබන සියලුම දේශපාලන පක්ෂවල ලේකම්වරුන්/ බලයලත් නියෝජිතයින්, ස්වාධීන කණ්ඩායම් නායකයින් වෙත,

**පාර්ලිමේන්තු මැතිවරණය - 2024**
**මැතිවරණ ප්‍රචාරක කාර්යාල පිහිටුවීම**

2024.11.14 වන දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණයේ දී නිවේදිත මැතිවරණ ප්‍රචාරක කාර්යාල පවත්වා ගෙන යාමේ දී පිළිපැදිය යුතු කරුණු පිළිබඳව ඔබගේ අවධානය යොමු කිරීම වස් මෙම ලිපිය නිකුත් කරනු ලැබේ.

02. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 73(1) සහ (2) උපවගන්ති යටතේ පවත්වාගෙන යා හැකි මැතිවරණ ප්‍රචාරක කාර්යාල සම්බන්ධයෙන් වූ විධිවිධාන මෙසේ ය.

"73(1) යම් මැතිවරණ කොට්ඨාසයක යම් මැතිවරණයක බලයලත් නියෝජිතයෙකු වන හෝ කණ්ඩායම් නායකයකු වන නැතහොත් එකී බලයලත් නියෝජිතයාගේ හෝ කණ්ඩායමේ නායකයාගේ නියෝජිතයකු වන තැනැත්තකුට,

(අ) ඒ මැතිවරණ නාම යෝජනා කාල සීමාවේ පළමු දිනයෙන් ආරම්භව ඒ මැතිවරණයේ දී ඡන්ද විමසීමක් පවත්වනු ලබන දිනයට ඉහතින් ම වූ දිනයෙන් අවසන් වන කාල සීමාව ඇතුළත, ඒ මැතිවරණ කොට්ඨාසයේ එක් නිවේදිත මධ්‍ය මැතිවරණ කාර්යාලයක් හා එක් එක් ඡන්ද කොට්ඨාසයේ එක් නිවේදිත ශාඛා මැතිවරණ කාර්යාලයක් හැර, වෙනත් යම් මැතිවරණ කාර්යාලයක් නොතිබිය යුතු ය;

(ආ) ඒ ඡන්ද විමසීම පවත්වනු ලබන දිනට ඉහතින් ම වූ දිනයෙන් ආරම්භව ඒ දිනයට ඉක්බිතිව ම එළඹෙන දිනයෙන් අවසන් වන කාල සීමාව ඇතුළත, මැතිවරණ කොට්ඨාසයේ එක් නිවේදිත මධ්‍ය මැතිවරණ කාර්යාලයක් සහ ඒ මැතිවරණ කොට්ඨාසය සඳහා වූ යම් පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් නාමයෝජනා කරන ලද එක් එක් අපේක්ෂකයා වෙනුවෙන් එක් නිවේදිත ශාඛා මැතිවරණ කර්යාලයක් හැර වෙනත් යම් මැතිවරණ කාර්යාලයක් නොතිබිය යුතු ය;

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් බලයලත් නියෝජිතයකුගේ හෝ කණ්ඩායම් නායකයකුගේ හෝ අපේක්ෂකයකුගේ සාමාන්‍ය පදිංචි ස්ථානය මැතිවරණ කාර්යාලයක් ලෙස පාවිච්චි කිරීම ඒ උපවගන්තියේ විධිවිධාන කඩ කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය."

සභාපති
தவிசாளர்
දුරකථන/தொலைபேசி: 011-2868444
ෆැක්ස්/தொலைநகல் :011-2868445
E-mail: comelesl@sltnet.lk

මැතිවරණ කොමසාරිස් ජනරාල්
தேர்தல்கள் ஆணையாளர் நாயகம்
දුරකථන/தொலைபேசி:011-2885207
ෆැක්ස්/தொலைநகல் :011-2885208
e-mail: cge@elections.gov.lk

අතිරේක මැතිවරණ කොමසාරිස්
(නීති, විමර්ශන හා සැලසුම්)
மேலதிகத் தேர்தல்கள் ஆணையாளர்
(சட்டம் , விசாரணைகள் மற்றும் திட்டமிடல்)
දුරකථන/தொலைபேசி: 011-2867471
ෆැක්ස්/தொலைநகல்/Fax : 011-2868448

03. ඒ අනුව, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 73 වන වගන්තිය යටතේ පවත්වාගෙන යා හැකි මැතිවරණ ප්‍රචාරක කාර්යාල වර්ග හතරක් (4) පමණක් වන අතර, එවැනි කාර්යාල ස්ථාපිත කළ යුතු ආකාරය පහත දැක්වේ.

| පිහිටුවිය හැකි කාර්යාල වර්ගය | කාර්යාල පිහිටුවීමට බලය ඇති අය | කාර්යාල පවත්වාගෙන යා හැකි කාලය | කාර්යාල පිහිටුවිය හැකි බල ප්‍රදේශය | පිහිටුවිය හැකි කාර්යාල ගණන | අයදුම් පත්‍රයේ වර්ණය |
|---|---|---|---|---|---|
| නිවේදිත මධ්‍ය මැතිවරණ කාර්යාල | පක්ෂ ලේකම්/බලයලත් නියෝජිත/ස්වාධීන කණ්ඩායම් නායක/ බලයලත් නියෝජිතයාගේ හෝ කණ්ඩායම් නායකයාගේ හෝ නියෝජිත | 2024.10.04 දින සිට 2024.11.15 දින මධ්‍යම රාත්‍රිය දක්වා | මැතිවරණ කොට්ඨාස බල ප්‍රදේශය | එක් කාර්යාලයක් පමණි | කහ |
| නිවේදිත ශාඛා මැතිවරණ කාර්යාල (i) | පක්ෂ ලේකම්/බලයලත් නියෝජිත/ස්වාධීන කණ්ඩායම් නායක/ බලයලත් නියෝජිතයාගේ හෝ කණ්ඩායම් නායකයාගේ හෝ නියෝජිත | 2024.10.04 දින සිට 2024.11.12 දින මධ්‍යම රාත්‍රිය දක්වා | එක් එක් ඡන්ද කොට්ඨාසය | ඡන්ද කොට්ඨාසයකට එකක් බැගින් | සුදු |
| නිවේදිත ශාඛා මැතිවරණ කාර්යාල (ii) | අපේක්ෂක | 2024.11.13 දින සිට 2024.11.15 දින මධ්‍යම රාත්‍රිය දක්වා | එක් එක් මැතිවරණ කොට්ඨාසය | මැතිවරණ කොට්ඨාසයකට එකක් බැගින් එක් අපේක්ෂකයකුට | ලා රෝස |
| සාමාන්‍ය පදිංචි නිවස, මැතිවරණ කාර්යාලය ලෙස භාවිතා කිරීම | බලයලත් නියෝජිත/ ස්වාධීන කණ්ඩායම් නායක/අපේක්ෂක | 2024.10.04 දින සිට 2024.11.15 දින මධ්‍යම රාත්‍රිය දක්වා | එක් එක් අපේක්ෂකයා පදිංචි නිවස | මැතිවරණ කොට්ඨාසයකට එක් කාර්යාලයක් පමණි | ලා දම් |

කරුණු පැහැදිලි කිරීම

**I. මැතිවරණ කොට්ඨාසය**

අංක 1 කොළඹ මැතිවරණ කොට්ඨාසයේ සිට අංක 22 කෑගල්ල මැතිවරණ කොට්ඨාසය දක්වා වූ **මැතිවරණ කොට්ඨාස 22** මෙම නමින් හැඳින්වේ. එක් එක් මැතිවරණ කොට්ඨාසය අදාළ පරිපාලන දිස්ත්‍රික්කයේ නමින් හැඳින්වෙන අතර වවුනියාව, මන්නාරම, මුලතිව් පරිපාලන දිස්ත්‍රික්ක තුනටම අදාළ බල ප්‍රදේශය අංක 11 වන්නි මැතිවරණ කොට්ඨාසය වශයෙන් ද, යාපනය සහ කිළිනොච්චි පරිපාලන දිස්ත්‍රික්ක දෙකට අදාළ බල ප්‍රදේශය අංක 10 යාපනය මැතිවරණ කොට්ඨාසය වශයෙන් ද හැඳින්වෙන අතර අම්පාර පරිපාලන දිස්ත්‍රික්කය අංක 13 දිගාමඩුල්ල මැතිවරණ කොට්ඨාසය වශයෙන් හැඳින්වේ.

**II. ඡන්ද කොට්ඨාසය**

යම් ඡන්ද පොළක දී ඡන්දය දීම සඳහා සුදුසුකම් ලබා ඇති ඡන්ද හිමියන් පදිංචි ප්‍රදේශය ඡන්ද කොට්ඨාසය යනුවෙන් හැඳින්වේ. එක් ඡන්ද ප්‍රදේශයක ඡන්ද කොට්ඨාස ගණනාවක් ඇති අතර, අංක 1 සිට පිළිවෙලින් අංක කර ඇත. එක් එක් ඡන්ද කොට්ඨාසය අනුව ඡන්දහිමි නාමලේඛනය බෙදා වෙන් කළ හැකිය. දිවයිනේ මුළු ඡන්ද කොට්ඨාස ගණන 13,314 කි.

**III. බලයලත් නියෝජිත**

මැතිවරණ කොට්ඨාසයකට තරග කරනු ලබන යම් පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් භාරදෙනු ලබන නාමයෝජනා පත්‍රයක මුලින්ම නම සඳහන් අපේක්ෂකයා (15 (4) වගන්තිය)

**IV. ස්වාධීන කණ්ඩායම් නායකයා**

මැතිවරණ කොට්ඨාසයකට තරග කරනු ලබන ස්වාධීන කණ්ඩායමක් සම්බන්ධයෙන් වන විට නාමයෝජනා පත්‍රයේ මුලින්ම නම සඳහන් අපේක්ෂකයා (15(3) වගන්තිය)

04. මෙම සෑම කාර්යාලයක්ම නිවේදිත කාර්යාලයක් විය යුතු අතර, නිවේදිත යනුවෙන් අදහස් කරනු ලබන්නේ අදාළ දිස්ත්‍රික්කයේ භාරකාර නිලධාරීට/ නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්ට හා කාර්යාලය පිහිටුවනු ලබන පොලිස් බල ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිට දැනුම් දීම වන අතර මැතිවරණ කාර්යාල පිහිටුවීම සඳහා නියම කරනු ලබන කොන්දේසිවලට එකඟව පිහිටුවනු ලබන කාර්යාල අවසරලත් නිවේදිත කාර්යාල ලෙස හඳුන්වනු ලැබේ.

05. නිවේදිත කාර්යාල පිළිබඳව දැනුම් දීම සඳහා මේ සමඟ අමුණා ඇති ආකෘති පත්‍රවලින් අදාළ ආකෘති පත්‍රය සෑම කාර්යාලයක් වෙනුවෙන්ම පිටපත් තුනකින් (3) සම්පූර්ණ කර භාරකාර නිලධාරී/ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු අතර ඉන් එක් පිටපතක් භාරකාර නිලධාරී/ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය විසින් රඳවා ගනු ලැබේ. ඉතිරි පිටපත් දෙක (2) අදාළ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කළ යුතු ය. එවිට පොලිස් ස්ථානාධිපති විසින් එම පිටපත් දෙක මගින් කාර්යාලය පිහිටුවීමට අවසරය ලබා දී එක් පිටපතක් පොලිස් ස්ථානයේ රඳවාගෙන එක් පිටපතක් පමණක් ඉල්ලුම්කරු වෙත ලබා දෙනු ඇත. එසේ ලබා දෙනු ලබන අවසරය ඇතුළත් ආකෘතිය කාර්යාලය පරීක්ෂාවට පැමිණෙන මැතිවරණ කාර්යාලයේ නිලධාරීන්ට හෝ පොලිස් නිලධාරීන්ට හෝ පහසුවෙන් නිරීක්ෂණය කළ හැකි අයුරින් තබා ගත යුතු වේ.

06. නිවේදිත මැතිවරණ කාර්යාල පරිශ්‍රයක ඇතුළත සීමාව තුළ පමණක්, කාර්යාලය හැඳින්වෙන නාම පුවරුවක්, පක්ෂයේ/ ස්වාධීන කණ්ඩායමේ සළකුණ දැක්වෙන පුවරුවක් සහ අපේක්ෂකයන්ගේ ඡායාරූප සහිත පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට ඉඩ ලබා දෙන අතර මෙම පුවරු සියල්ලේම වර්ග ප්‍රමාණය වර්ග අඩි 60 නොඉක්ම විය යුතුය. තවද කාර්යාල ඇතුළත භූමියේ කොඩි 06 ක් ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව ඇත. එයට අමතරව වෙනත් කිසිදු සැරසිල්ලක් සිදු කිරීමට ඉඩ ලබා නොදෙන අතර කිසිදු විටක මහා මාර්ගය හරහා මහා මාර්ගය මත, පදික වේදිකාවේ, විදුලි රැහැන් කණුවල පදික වේදිකා, මායිම් තාප්ප ආදියෙහි කිසිදු ආකාරයක දැන්වීම්, කටවුට්, ධජ, පතාක ප්‍රදර්ශනය කළ නොහැකිය. මෙහි සඳහන් කර ඇති කාර්යාල සැරසීමේ අවසරය අයුතු ලෙස භාවිතා කිරීමේ ප්‍රයත්නවල දී වලංගු නීතිය අනුව එසේ කිසිදු ස්ථානයක දැන්වීම්, ප්‍රචාරක පුවරු, ප්‍රදර්ශනය කළ නොහැකිය යන නියමය ක්‍රියාත්මක කරනු ලැබේ.

07. යම් බලයලත් නියෝජිතයකුගේ හෝ කණ්ඩායම් නායකයකුගේ හෝ අපේක්ෂකයකුගේ හෝ සාමාන්‍ය පදිංචි ස්ථානය නැතහොත් ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වී ඇති නිවසේ මැතිවරණ කාර්යාලයක් පිහිටුවීමට හිමිකම් ඇති අතර, තම පදිංචි නිවස ජනාකීර්ණ බවෙන් අඩු ප්‍රදේශයක පිහිටා ඇත්නම් පමණක් ඉහතින් දක්වා ඇති පරිදි පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් පසුව එම නිවස පිහිටා ඇති ග්‍රාම නිලධාරී වසම තුළ වෙනත් ස්ථානයක මැතිවරණ ප්‍රචාරක කාර්යාලය පිහිටුවා ගත හැකිය. අදාළ ග්‍රාම නිලධාරී වසමින් බැහැරව " නිවස" ලෙස ඡන්ද කාර්යාල පිහිටුවීමට අවසර දෙනු නොලැබේ.

08. මෙම කිසිදු කාර්යාලයක් රජය/ පළාත් සභා/ පළාත් පාලන ආයතන/ රාජ්‍ය සංස්ථා හෝ මණ්ඩල සතු ගොඩනැගිල්ලක, ඉඩමක, නිල නිවසක, රක්ෂිතයක පිහිටුවිය නොහැකිය. එසේ වුවද, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ලබා දී ඇති තවමත් රජය සතු ජනපද නිවාසයක හෝ රජය සතු නිවාස සංකීර්ණයක වූ නිවාසයක නිසි අවසරය සහිතව පදිංචි වී සිටින අපේක්ෂකයකුට ස්වකීය නිවසේ කාර්යාලයක් පැවැත්වීමට අවසර ලැබේ. තවද, මෙවැනි වාසස්ථානයක අපේක්ෂකයකු පදිංචි නැත්නම් එවැනි ස්ථානයක කාර්යාලයක් පැවැත්වීමට ඉඩ දිය නොහැක.

09. යම්කිසි පක්ෂ/ අපේක්ෂක කාර්යාලයක වෙනත් පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධනය වන අයුරින් හෝ අගතියක් වන අයුරින් ඡායාරූප, ඡන්ද සලකුණු, පෝස්ටර්, කටවුට් සහ බැනර් ප්‍රදර්ශනය කිරීම සපුරා තහනම්ය. තවද අපේක්ෂකයෙකු නොවන වෙනත් කිසිදු දේශපාලනඥයකුගේ ඡායාරූප, නම්, ඡන්ද ලකුණු,

ආවේනික වැකි ප්‍රදර්ශනය කරනු ලබන්නේ නම් එය අනවසර කාර්යාලයක් ලෙස සලකා ඉවත් කරනු ලබනු ඇති අතර, නීති උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ද ගනු ලැබේ.

10. කිසිදු නිවේදිත කාර්යාලයක් තේරීම්භාර නිලධාරී කාර්යාලය, මැතිවරණ කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ පොලිස් ස්ථාන වැනි සෘජුවම මැතිවරණය හා සම්බන්ධ රාජ්‍ය ආයතනවල සිට මීටර් 150 කට අඩු දුරකින් පිහිටුවීමට අවසර දෙනු නොලැබේ. නගර සභා සඳහා මෙම සීමාව මීටර් 100 දක්වා ද මහ නගර සභා සඳහා මීටර් 75 දක්වා ද අඩු කළ හැකිය. අපේක්ෂකයකුගේ නිවස මෙම සීමාව තුළ පිහිටා ඇත්නම් පෙර සඳහන් දුර සීමා පිළිබඳ නියමය එහි දී බල නොපැවැත් වේ. එමෙන්ම රජයේ පාසල්, රෝහල්, අධිකරණ සංකීර්ණ, පළාත් පාලන ආයතන, තැපැල් කාර්යාල වැනි පොදු මහජනතාව නිරතුරුව සේවා ලබා ගැනීමට පැමිණෙන රාජ්‍ය ආයතනවලට පැමිණෙන මහජනතාවට බාධාවන සේ එකී ආයතන ආසන්නයේම හෝ අධ්‍යාපන කටයුතුවල නිරතවන දරුවන්ට බාධාවන සේ රජයේ පාසල් ආසන්නයේම මැතිවරණ කාර්යාල පිහිටුවීමෙන් වැළකී සිටින ලෙස ස්වකීය ප්‍රාදේශීය නියෝජිතයන්, ක්‍රියාකාරී ආධාරකරුවන් දැනුම්වත් කරන ලෙස සියලුම අපේක්ෂකයන්ගෙන්/ ඡන්ද නියෝජිතයන්/ බලයලත් නියෝජිතයන්ගෙන් හා පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

11. සෑම අවසරලත් කාර්යාලයකම බිම් වර්ගඵලය අවම වශයෙන් 10'X10' ප්‍රමාණයේ හෝ විය යුතු ය. එනම්, අවම වශයෙන් වර්ග අඩි 100 ක බිම් ප්‍රමාණයකින් යුක්ත විය යුතු ය. එමෙන්ම කාර්යාලයක උස අවම වශයෙන් අඩි 8 ක් වත් විය යුතු වේ. තවද, අවසරලත් මැතිවරණ කාර්යාල ලෙස හිස් ඉඩම් වල ඉදි කරනු ලබන වර්ගඵලය 10'X10' ට වඩා අඩු කුඩා තාවකාලික වකරන් මඩු නැතහොත් එවැනි කුඩා පොල්අතු පැල්පත් හෝ අත්හැර දමා ඇති ගොඩනැගිලි හෝ පෙන්වමින් අපේක්ෂක ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය කිරීම සඳහා ඉඩදෙනු නොලැබේ. එසේ වුවද, යම් නාගරික ප්‍රදේශයක ස්ථිර කඩ කාමරයක් වැනි ගොඩනැගිල්ලක වර්ග ප්‍රමාණය වර්ග අඩි 75 දක්වා අඩු වුවද මැතිවරණ කොමිෂන් සභාව වෙත දන්වා එවැනි ස්ථානයක අවසරලත් මැතිවරණ කාර්යාලයක් පිහිටුවීමට අනුමැතිය ඉල්ලා සිටියහොත් ඒ පිළිබඳව සලකා බැලිය හැකිය. එසේම නිවේදිත කාර්යාල ලෙස භාවිතා කිරීමට අනුමැතිය ලබා ගන්නා ලද තාවකාලික මඩු සඳහා එසේ නිවේදිත කාර්යාලයක් ලෙස පවත්වාගෙන යෑමට අනුමැතිය ලබා ගත් දේශපාලන පක්ෂය හෝ අපේක්ෂකයා විසින් පැය 24 පුරාවටම එම තාවකාලික මඩු සඳහා ආරක්ෂාව ලබා දිය හැකි වැඩ සැලැස්මක් සකස් කිරීම අත්‍යාවශ්‍ය වේ ය.

12. මෙලෙස පිහිටුවනු ලබන කාර්යාලයේ කිසිම විටක ශබ්ද විකාශන යන්ත්‍ර හෝ කටහඬ විස්තාරණය කිරීම හෝ ප්‍රතිඋත්පාදනය කරන මෙගා ෆෝන් වැනි යන්ත්‍ර හෝ භාවිතා කිරීම නොකළ යුතු ය. එසේ කිරීමට අවශ්‍ය වන්නේ නම් නීත්‍යානුකූලව අවසර ලබා ගත යුතු ය. සෑම කාර්යාලයක්ම අවම වශයෙන් දිනකට පැය 4 ක් වත් විවෘතව තැබිය යුතු අතර, පැය 0600 සිට පැය 2200 දක්වා වූ කාලසීමාවෙන් බැහැරව මැතිවරණ කාර්යාල විවෘතව තැබීමෙන් වැළකිය යුතු ය.

13. තවද, මෙවැනි මැතිවරණ කාර්යාල ඉදිරිපිට හෝ ආසන්නයේ හෝ පොදු මාර්ගවල වාහන තදබද ඇතිවන සේ නැතහොත් මහජනතාවට බාධා ඇතිවන සේ වාහන නවතා තැබීමෙන්, ආධාරකරුවන් විශාල ප්‍රමාණයක් එක් රැස්වීමෙන් වැළකිය යුතු අතර, කාර්යාල පරීක්ෂාවට පැමිණෙන පොලිස් නිලධාරීන්ට හා මැතිවරණ නිලධාරීන්ට ඒ සඳහා උපරිම සහාය ලබා දිය යුතු ය. ඔවුන්ට බාධා කිරීම් මැතිවරණය පැවැත්වීමට බාධා කිරීමක් සිදු කළා සේ සලකා ක්‍රියා කරනු ලැබේ.

14. ආගමික සිද්ධස්ථාන සතු ඉඩම්වල හෝ ආගමික ස්ථාන සතු ගොඩනැගිලිවල මැතිවරණ කාර්යාල පිහිටුවන්නේ නම් ඒ සඳහා විශේෂ අවසරයක් ලබාගත යුතු අතර, එවැනි ස්ථානවල ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනයට ඉඩ දෙනු නොලැබේ. කිසිම හේතුවක් නිසාවත් ආගමික වතාවත් සිදු කරන ස්ථානවල මැතිවරණ කාර්යාල පිහිටුවීමට අවසර ලබා දෙනු නොලැබේ.

15. මෙම නියම කිරීම් හේතුවෙන් පූර්ව මැතිවරණ/ ඡන්ද විමසීම්වල දී කලක් තිස්සේම මැතිවරණ කාර්යාල ලෙස පවත්වනු ලබන ස්ථානවල මැතිවරණ කාර්යාල පිහිටුවීමට අපහසුතාවක් ඇතිවන්නේ නම් හා ඡන්ද කොට්ඨාසය තුළ ඒ සඳහා සුදුසු වෙනත් ස්ථානයක් නැතිනම් ඒ සම්බන්ධයෙන් තේරීම්භාර නිලධාරී වෙත කරුණු ඉදිරිපත් කර මැතිවරණ කොමිෂන් සභාවේ විශේෂ අනුමැතිය සඳහා ඉල්ලුම් කිරීමට අවස්ථාව ලබා ගත හැකිය.

16. ඉහත දක්වා ඇති කොන්දේසි හා නියම පැනවීමට සිදුව ඇත්තේ මැතිවරණ කාලසීමාව තුළ මැතිවරණය හා බැඳි ගැටුම්, පහරදීම්, තුවාල කිරීම්, මනුෂ්‍ය ඝාතන හා දේශපාලන පළිගැනීම් වැනි නොමනා ක්‍රියා වැළැක්වීම හා මහජනතාවට ඇති විය හැකි අවහිරතා වැළැක්වීම සඳහා මෙන්ම නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සඳහා අවශ්‍ය වාතාවරණය ඇති කිරීම පිණිස මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

පිටපත් :-

1. පොලිස්පති - දැන ගැනීම සඳහා සහ අදාළ නිලධාරීන් දැනුම්වත් කිරීමට කාරුණික වනු පිණිස
2. සියලුම දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් -
   දැන ගැනීම සඳහා සහ අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කාරුණික වනු පිණිස
3. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන හා මැතිවරණ) –
   දැන ගැනීම සඳහා සහ අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කාරුණික වනු පිණිස
4. නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් -
   දැනගැනීම සඳහා සහ බලයලත් නියෝජිතයන් දැනුම්වත් කර ඔවුන් වෙත මෙම ලිපියේ පිටපතක් ලබා දීමට සහ ඉල්ලීම් කරන අවස්ථාවන් හී දී නියමිත වර්ණයෙන් යුත් අයදුම්පත්‍ර ලබා දීම සඳහා ක්‍රියා කිරීමට සහ අනුමැතිය ලබා ගැනීමේ ආකෘති පත්‍රවල කාර්යාල පිහිටුවන වසමේ ග්‍රාම නිලධාරී වාර්තාව ලබා දීමේදී මෙහි සඳහන් කරුණු පිළිබඳ සැලකිලිමත් වන ලෙස ග්‍රාම නිලධාරීන් දැනුම්වත් කිරීම සඳහා
5. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් - කාරුණික දැන ගැනීම සඳහා
6. මැතිවරණ කොමිෂන් සභාව විසින් අනුමත නිරීක්ෂණ සංවිධානවල විධායක අධ්‍යක්ෂවරුන් -
   කාරුණික දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා

ඇමුණුම 14

මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : PE/2024/27

2024.10.17

## පාර්ලිමේන්තු මැතිවරණය - 2024 නොවැම්බර් 14
## 2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ විධිවිධාන

පාර්ලිමේන්තු මැතිවරණය (2024) සඳහා තරග කරනු ලබන සියලුම දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් සහ අපේක්ෂකයින් 2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 03 වන වගන්තිය ප්‍රකාරව මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් කළ හැකි වියදම් සීමාව පහත පරිදි තීරණය කර ඇති බව මැතිවරණ කොමිෂන් සභාව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| අංකය | මැතිවරණ කොට්ඨාශය | එක් අපේක්ෂකයකුට වැය කළ හැකි උපරිම වියදම් සීමාව (රු) | පක්ෂයකට/ ස්වාධීන කණ්ඩායමකට වැය කළ හැකි උපරිම වියදම් සීමාව (රු) | ජාතික ලැයිස්තු අපේක්ෂකයකුට වැය කළ හැකි උපරිම වියදම් සීමාව (රු) |
|---|---|---|---|---|
| 1 | කොළඹ | 5,750,000 | 79,493,756 | 34,698 |
| 2 | ගම්පහ | 5,643,387 | 81,735,055 | 35,677 |
| 3 | කළුතර | 4,740,787 | 43,694,249 | 19,072 |
| 4 | මහනුවර | 5,146,844 | 50,825,081 | 22,185 |
| 5 | මාතලේ | 3,450,678 | 18,173,570 | 7,933 |
| 6 | නුවරඑළිය | 3,631,752 | 26,299,937 | 11,480 |
| 7 | ගාල්ල | 4,922,238 | 38,885,683 | 16,973 |
| 8 | මාතර | 4,487,585 | 29,543,265 | 12,895 |
| 9 | හම්බන්තොට | 3,469,460 | 22,840,614 | 9,970 |
| 10 | යාපනය | 3,954,580 | 23,430,887 | 10,227 |
| 11 | වන්නි | 1,673,243 | 9,913,964 | 4,327 |
| 12 | මඩකලපුව | 3,709,910 | 19,538,857 | 8,529 |
| 13 | දිගාමඩුල්ල | 3,765,829 | 24,791,707 | 10,821 |
| 14 | ත්‍රිකුණාමලය | 3,114,118 | 14,350,893 | 6,264 |
| 15 | කුරුණෑගල | 5,054,773 | 59,899,057 | 26,145 |
| 16 | පුත්තලම | 3,945,838 | 28,574,441 | 12,472 |
| 17 | අනුරාධපුරය | 4,080,241 | 32,233,904 | 14,070 |
| 18 | පොළොන්නරුව | 2,871,894 | 15,125,308 | 6,602 |
| 19 | බදුල්ල | 3,846,457 | 30,387,013 | 13,264 |
| 20 | මොණරාගල | 2,927,217 | 17,343,763 | 7,570 |
| 21 | රත්නපුරය | 4,354,755 | 40,136,329 | 17,519 |
| 22 | කෑගල්ල | 3,831,959 | 30,272,475 | 13,214 |

02. මැතිවරණ ප්‍රචාරක වියදම් ඇතුළත් වියදම් වාර්තාව මැතිවරණ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර දින විසි එකක් (21) ඇතුළත අදාල වන පරිදි පක්ෂ ලේකම්ගේ, ස්වාධීන කණ්ඩායම් නායකයාගේ සහ අපේක්ෂකයාගේ අත්සන, දිවුරුම් කොමසාරිස්වරයා හෝ සාමදාන විනිශ්චයකාරවරයා විසින් සහතික කොට මැතිවරණ කොමිෂන් සභාව වෙත භාර දෙනු ලැබිය යුතු ය.

03. අපේක්ෂකයා වෙනුවෙන් පිළිගනු ලැබූ හෝ භාරගනු ලැබූ පරිත්‍යාග හෝ දායකත්ව සහ එම පරිත්‍යාග හෝ දායකත්ව ද්‍රව්‍යමය වශයෙන් ලැබුණේ නම් ඒවායේ ඇස්තමේන්තු වටිනාකම, එකී දායකත්ව පරිත්‍යාග කරනු ලැබුවේ ත්‍යාග, ණය මුදල්, අත්තිකාරම් හෝ තැන්පතු වශයෙන් ද යන වග සඳහන් කළ යුතු ය.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

ඇමුණුම 15

**මැතිවරණ කොමිෂන් සභාව**
**පාර්ලිමේන්තු මැතිවරණය - 2024/11/14**
**සමස්ත ප්‍රතිඵලය**

| | පක්ෂයේ නම / ස්වාධීන කණ්ඩායම | පක්ෂයේ / කණ්ඩායමේ නම කෙටියෙන් | ලබාගත් ඡන්ද සංඛ්‍යාව | ප්‍රතිශතය | සභිකයන් | ජාතික ලැයිස්තු සභිකයන් | සභිකයන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| 1 | ජාතික ජන බලවේගය | ජා.ජ.බ. | 6,863,186 | 61.56% | 141 | 18 | 159 |
| 2 | සමගි ජන බලවේගය | ස.ජ.බ. | 1,968,716 | 17.66% | 35 | 5 | 40 |
| 3 | ඉලංකෙයි තමිල් අරසු කච්චි | ඉ.ත.අ.ක. | 257,813 | 2.31% | 7 | 1 | 8 |
| 4 | නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ | න.ප්‍ර.පෙ. | 500,835 | 4.49% | 3 | 2 | 5 |
| 5 | ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ | ශ්‍රී ලං.පො.පෙ. | 350,429 | 3.14% | 2 | 1 | 3 |
| 6 | ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය | ශ්‍රී ලං.මු.කො. | 87,038 | 0.78% | 2 | 1 | 3 |
| 7 | සර්වජන බලය | ස.බ. | 178,006 | 1.60% | 0 | 1 | 1 |
| 8 | එක්සත් ජාතික පක්ෂය | එ.ජා.ප. | 66,234 | 0.59% | 1 | 0 | 1 |
| 9 | ජනනායක තමිළ් තේසිය කූට්ටනි | ජ.ත.තේ.කූ. | 65,382 | 0.59% | 1 | 0 | 1 |
| 10 | අකිල ඉලංකෙයි තමිල් කොංග්‍රස් | අ.ඉ.ත.කො. | 39,894 | 0.36% | 1 | 0 | 1 |
| 11 | අහිල ඉලංගෙයි මහජන කොංග්‍රසය | අ.ඉ.ම.කො. | 33,911 | 0.30% | 1 | 0 | 1 |
| 12 | යාපනය - ස්වාධීන කණ්ඩායම 17 | යාපනය.ස්වා. කණ්. 17 | 27,855 | 0.25% | 1 | 0 | 1 |
| 13 | ශ්‍රී ලංකා කම්කරු පක්ෂය | ශ්‍රී.ලං.ක.ප. | 17,710 | 0.16% | 1 | 0 | 1 |
| 14 | එක්සත් ප්‍රජාතන්ත්‍රවාදී හඬ | එ.ප්‍ර.හඬ. | 83,488 | 0.75% | 0 | 0 | 0 |
| 15 | එක්සත් වාමාංශික පෙරමුණ | එ.වා.පෙ. | 50,836 | 0.46% | 0 | 0 | 0 |
| 16 | ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානය | ප්‍ර.ජා.ස. | 45,419 | 0.41% | 0 | 0 | 0 |
| 17 | තමිළ් මක්කල් විඩුදලෛප් පුළිකල් | ත.ම.වි.පු. | 34,440 | 0.31% | 0 | 0 | 0 |
| 18 | ජනඅරගල සංධානය | ජ.සං. | 29,611 | 0.27% | 0 | 0 | 0 |
| 19 | ඊලාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය | ඊ.ජ.ප්‍ර.ප. | 28,985 | 0.26% | 0 | 0 | 0 |
